


මහනුවර නගර සංවර්ධන සැලැස්ම 2019-2030

# මහනුවර

## නගර සංවර්ධන සැලැස්ම
## 2019~2030

වෙළුම 1



නාගරික සංවර්ධන අධිකාරිය
මධ්‍යම පළාත් කාර්යාලය

# මහනුවර නගර සංවර්ධන සැලැස්ම

# 2019-2030

## වෙළුම 1

මධ්‍යම පළාත් කාර්යාලය

නාගරික සංවර්ධන අධිකාරිය

## ලේඛන තොරතුරු

| | | |
|---|---|---|
| **වාර්තාවේ මාතෘකාව** | : | මහනුවර නගර සංවර්ධන සැලැස්ම |
| **සැලසුම් කලාප මායිම්** (ප්‍රකාශයට පත් කරන ලද) | : | මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය |
| **ගැසට් අංකය** | : | අංක 2129/96 |
| **පාර්ශවකරුවන්** | : | මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව, මහනුවර නගරය වෙත පැමිණෙන ජනතාව හා අදාළ ආයතන |
| **ඉදිරිපත් කරන ලද දිනය** | : | 2019 ජූනි 28 |
| **ලේඛනයේ තත්ත්වය** | : | අවසන් වාර්තාව |
| **කතෘ** | : | නාගරික සංවර්ධන අධිකාරිය මධ්‍යම පළාත් කාර්යාලය |

### ලේඛන ඉදිරිපත් කිරීමේ තොරතුරු

| පිටපත් අංකය | විස්තර | ඉදිරිපත් කළ දිනය | නිකුත් කිරීම සඳහා අනුමැතිය |
|---|---|---|---|
| 1 | කෙටුම්පත | 2018 නොවැම්බර් 26 | |
| 2 | අවසන් වාර්තාව | 2019 ජූනි 28 | |

මෙම වාර්තාව, බලයලත් පාර්ශවයන් විසින් නිකුත් කරනු ලබන අතර වාර්තාවේ සඳහන් අරමුණු සඳහා පමණක් භාවිතා කළ යුතුය. මෙම වාර්තාවේ සඳහන් කරුණු වෙනත් පාර්ශවයන් විසින් හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. මෙම වාර්තාවේ සඳහන් කරුණු වෙනත් පාර්ශවයක් විසින් හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් යොදාගෙන උද්ගතවන ගැටලු සහගත තත්ත්වයන් සම්බන්ධයෙන් අධිකාරිය වගකියනු නොලැබේ. එමෙන්ම මෙම වාර්තාවේ සඳහන් දත්ත හෝ තොරතුරු වෙනත් පාර්ශවයක් වෙත ලබා ගැනීම හෝ වෙනත් අරමුණක් සඳහා යොදා ගැනීම මඟින් ඇතිවන බලපෑම් සම්බන්ධයෙන්ද අධිකාරිය වගකියනු නොලැබේ. මෙම වාර්තාව තුළ රහසිගත තොරතුරු ඇතුළත් වන අතර එය බුද්ධිමය දේපලක් වේ. බලයලත් පාර්ශවයේ අනුමැතියක් නොමැතිව වෙනත් පාර්ශවයක් වෙත ලබාදීම සපුරා තහනම් වන අතර දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා වලින් පරිවර්තනය කරන ලද මෙම සැලැස්මෙහි කිසියම් පරස්පරතාවයක් ඇති වූ විට සිංහල පරිවර්තනයෙහි පවතින කරුණු බලාත්මක වේ.

## ගැසට් ප්‍රකාශනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2129/96 - 2019 ජූනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### මහනුවර මහ නගර සභාව, බල ප්‍රදේශය සමන්විත වන මහනුවර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මහනුවර මහ නගර සභාව, බල ප්‍රදේශයෙන් සමන්විත මහනුවර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද මහනුවර නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජූනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

### මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ජූනි මස 28 දින.

07 - 4555/14

# I. ඇමතිතුමාගේ පණිවිඩය



1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් පුළුල් සංවර්ධන සැලසුම් මධ්‍යම පළාතේ සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීම සඳහා කටයුතු කොට ඇත.

මෙම සංවර්ධන සැලසුම තුළින් අපේක්ෂා කරනු ලබන්නේ මහනුවර මහ නගර සහා බල ප්‍රදේශය සඳහා ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීමටයි. මහනුවර නගරය වාණිජ හා පරිපාලනමය වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රධානම නගරයක් වන අතර එය විශාල ජන සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. තවදුරටත් මහනුවර නගරය හා ඒ අවට ප්‍රදේශය සතු විශාල සම්පත් හා ආගමික හා සංස්කෘතික වශයෙන් පවතින අති විශාල විභවතාවයන්ද සංවර්ධනය සඳහා යොදාගත හැකිය.

අපගේ උත්සාහය මහනුවර දිස්ත්‍රික්කයට දිවයිනේ අනෙකුත් ප්‍රදේශ හා සමගාමීව සුදුසු ලෙස භෞතික සංවර්ධනයකට අවශ්‍ය පහසුකම් සැලසීමය.

මාගේ අවබෝධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් යොදා ගනිමින් විශිෂ්ට තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන්ද ලැබී ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයේ මෙම කාර්යය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුළින් මහනුවර සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

# II. නගරාධිපතිතුමාගේ පණිවිඩය



සිංහල රාජ වංශයේ අවසන් රාජධානිය වශයෙන් මෙන්ම අති උතුම් ශ්‍රී දළදා දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින ශ්‍රී දළදා මාළිගාව මෙම කන්ද උඩරට මහනුවර නගරයේ පිහිටා තිබීම හේතුවෙන් සමස්ථ ලෝකවාසින්ගේ වන්දනීය නගරයක් ලෙස මහනුවරට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. තවද, ශ්‍රී ලංකාවේ දෙවන අගනගරය ලෙසත්, කන්ද උඩරට රාජධානියේ අගනගරය ලෙසත් මහනුවරට වැදගත් ස්ථානයක් හිමිවේ. මහනුවර නගරයේ අඛණ්ඩව පැවත එන සංස්කෘතිමය ලක්ෂණ වලින් පරිපූර්ණ වූ නිසා ලොව එකම සජීවී ලෝක උරුම නගරය ලෙසින් ද 1988 වසරේ යුනෙස්කෝ සංවිධානය මඟින් පිදුම් ලැබූ නගරයකි.

ශ්‍රී ලංකාවේ තිබෙන සෙසු පළාත් පලන ආයතන වලට වඩා සාඩම්බරනීය ඉතිහාසයක් හිමි මෙම මහ නගර සභාවට වසර 150කට වැඩි පෞඩ ඉතිහාසයක්ද ඇත. මහනුවර නගර සීමාවේ වෙසෙන 150,000 පමණ වන නාගරික ජනතාවගේ හා දෛනිකව සංක්‍රමණය වන 500,000 පමණ ජනතාවගේ පොදු අවශ්‍යතාවයන් සපුරාලීම මහනුවර මහා නගර සභාවේ ප්‍රධාන වගකීමක් කොට සලකමි.

මධ්‍යම පළාතේ වාණිජ, පරිපාලනමය හා ආගමික මධ්‍යස්ථානය ලෙස ක්‍රියාකරන මහනුවර නගරයේ ආර්ථික, සාමාජයීය, භෞතික හා පාරිසරික අංශයන්ගේ අපේක්ෂිත සංවර්ධනයන් සැළකිල්ලට ගනිමින් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරි වර්ෂ 12 ක කාලයක් සඳහා මහනුවර නගර සංවර්ධන සැළැස්මක් සකස් කිරීම පිළිබඳව මහනුවර මහා නගරාධිපති වශයෙන් මා සතුටට පත්විමි.

මෙම සැළැස්ම පිළිබඳව මා අධ්‍යයනය කළ අතර, මහනුවර නගරයේ ඓතිහාසික, සංස්කෘතික හා ආගමික පිහිටීමට හානි නොවන අයුරින් නවීන ක්‍රම උපයෝගි කරගනිමින් ක්‍රියාත්මක කිරීමට සුදුසු පරිදි සාර්ථකව සකස් කර ඇති බව පෙනී යයි.

2030 වසර දක්වා ක්‍රියාත්මක කිරිමට යෝජිතව සකස් කරන ලද මෙම මහනුවර නගර සංවර්ධන සැලැස්මේ කටයුතු එලෙසින්ම ක්‍රියාත්මක කිරිමට හැකි වේවායයි ප්‍රාර්ථනය කරන අතර, මෙකී කටයුතු ක්‍රියාත්මක කිරීමේදී මහනුවර මහ නගර සභාවෙන් සිදුවිය යුතු සියළු කටයුතු ඉටුකිරිමට අප බලාපොරොත්තු වන බවද සඳහන් කරමි.

කේසර ඩී. සේනානායක,
මහනුවර මහා නගරාධිපති

## III. සභාපතිතුමාගේ පණිවිඩය



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමනාකරණය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. මහනුවර සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. මහනුවර නගරය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය මහනුවර නගරය හා ඒ අවට ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන මහනුවර නගරය සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුළින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුලින් මහනුවර නගරය ආකර්ෂණීය “කන්ද උඩරට තේජාන්විත අග නගරයක්” බවට පත් කිරීමට අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්යය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය

# IV. පෙරවදන

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයෙහි ඉදිරි වසර 12ක කාලයෙහි **භෞතික,සමාජයීය,ආර්ථික** හා පාරිසරික යන සංරචකයන්ගේ අපේක්ෂිත සංවර්ධනයන් සැලකිල්ලට ගනිමින් මෙම සංවර්ධන සැලැස්ම පිළියෙල කර ඇත. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයේ 2012 වර්ෂයේ ජීවත්වන වර්තමාන ජනගහනය 102,459ක් පමණ වන අතර දෛනිකව නගරයට පැමිණෙන ජනගහනය 325,000ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම නගරයක් ලෙසට මහනුවර නගරය සැලකෙන අතර මධ්‍යම පළාතෙහි ප්‍රධානතම වෙළඳ, අධ්‍යාපන, සෞඛ්‍ය, පාරිපාලන හා ආගමික මධ්‍යස්ථානය ලෙසද ක්‍රියා කරයි. ඓතිහාසික විකාශනයක් සහිතව සංවර්ධනය වී ඇති මහනුවර නගරයෙහි ඓතිහාසික තේජාන්විත බව නැවත ඇති කිරීම මෙම සැලසුමෙහි ප්‍රධානතම දැක්ම වේ. එම දැක්ම ලඟා කරගැනීම සඳහා අරමුණු හා පරමාර්ථ හඳුනා ගෙන ඇති අතර එම අරමුණු හා පරමාර්ථ වෙත ලඟා වීම සඳහා අවශ්‍ය උපාය මාර්ගික ව්‍යාපෘතිද මෙම සැලස්ම තුළ අන්තර්ගත කොට ඇත. මෙම සැලසුම 2019.06.28 දින සිට 2029.12.31 දක්වා කාල පරාසය සඳහා බලාත්මක වේ.

# V. පිදුම

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා මෙම සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී සෘජුව සහ වක්‍රව අප වෙත සහයෝගය ලබාදුන් සම්පත් දායකයන් වන මහනුවර මහ නගර සභාවේ නගරාධිපති කේසර සේනානායක මහතා, නාගරික කොමසාරිස් චන්දන තෙන්නකෝන් මහතා ඇතුලු මහ නගර සභාවේ සියලු කාර්යය මණ්ඩලයටද, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමන්ට,අධ්‍යක්ෂ ජනරාල්තුමන්ට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමන් (සැලසුම්), මධ්‍යම පළාත් කාර්යාලයේ නන් අයුරින් සහයෝගය ලබා දුන් සියලුම සේවක මහත්ම මහත්මීන්ටද, සංවර්ධන සැලසුම් අංශයට, සංවර්ධන හා පර්යේෂණ අංශයට, භූගෝලීය තොරතුරු පද්ධති අංශයට, පරිසර හා භූ දර්ශන අංශයට හා බලාත්මක අංශයටද, මූලික දත්ත රැස් කිරීමේ අදියරෙහි සිට ගැසට් පත්‍රයෙහි පලකිරීම අදියර දක්වා සියලු අදියරයන් වලදී සහයෝගය ලබාදුන් සියලුම රාජ්‍යය ආයතන, පෞද්ගලික ආයතන හා පුද්ගලයින් වෙත අපගේ කෘතඥතාවය මෙයින් පුද කර සිටිමු.

# VI. පටුන


ලේඛන තොරතුරු………………………………………………………………………………. i

ගැසට් ප්‍රකාශනය…………………………………………………………………………… ii

I. ඇමතිතුමාගේ පණිවිඩය………………………………………………………………… iii

II. නගරාධිපති තුමාගේ පණිවිඩය………………………………………………………… iv

III. සභාපති තුමාගේ පණිවිඩය …………………………………………………………. v

IV. පෙරවදන…………………………………………………………………………….. vi

V.පිදුම……………………………………………………………………………………….. vii

VI.පටුන……………………………………………………………………………………….. viii

VII.සිතියම් ලැයිස්තුව……………………………………………………………………... xi

VII.වගු අංක……………………………………………………………………………. xii

IX. රූප අංක……………………………………………………………………………. xiii

X.ඇමුණුම…………………………………………………………………………………….. xv

**පළමු කොටස**

1. හැඳින්වීම…………………………………………………………………………. 4

1.1. සංවර්ධන සැලැස්ම සැකසීමේ පසුබිම……………………………………………………... 4

1.2. සැලසුම් කණ්ඩායම…………………………………………………………………. 6

1.3. විෂය පථය……………………………………………………………………………. 9

1.4. සැලසුම් ක්‍රියාවලිය………………………………………………………………… 12

1.4.1.තොරතුරු අධ්‍යයනය……………………………………………………………... 13

1.4.2.විෂය පථය හා සීමාවන් හඳුනා ගැනීම……………………………………………… 13

1.4.3.ගැටලු හා විභවතාවයන් හඳුනා ගැනීම……………………………………………… 13

1.4.4.පාර්ශව කරුවන්ගේ අදහස් ලබා ගැනීම…………………………………………… 13

1.4.5.දැක්ම හා අරමුණු නිර්ණය කිරීම……………………………………………………… 14

1.4.6.සවිස්තරාත්මක විශ්ලේෂණය…………………………………………………………… 14

1.4.7.පරමාර්ථ නිර්ණය කිරීම…………………………………………………………… 14

1.4.8.උපක්‍රම නිර්ණය කිරීම……………………………………………………………. 14

2. මූලික අධ්‍යයනයන්…………………………………………………………………………... 16

2.1. අධ්‍යයන කලාපයන්…………………………………………………………………… 16

2.2. සැලසුම් හා තත්ත්ව සන්දර්භය…………………………………………………………. 19

2.3. සැලසුම් මායිම් නිර්ණය කර ගැනීම…………………………………………………….. 31

2.3.1. ක්‍රියාකාරීත්ව ප්‍රදේශයේ සීමාවන්…………………………………………………. 31

2.3.2. භූගෝලීය සීමාවන්…… 32
2.3.3. පරිපාලන සීමා මායිම්…… 32
3.සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය…….. 36

**දෙවන කොටස**

4. සංවර්ධන සැලැසුම් රාමුව…… 48
4.1. දැක්ම…… 48
4.2. දැක්මේ ප්‍රකාශය…….. 49
4.3. අරමුණු…….. 52
4.4 පරමාර්ථ…… 52
5. ශ.දු.අ.ත. විශ්ලේෂණය…... 56
6. සැලැස්ම…….. 102
6.1. සංකල්පිත සැලැස්ම…… 102
6.1.1. හැඳින්වීම…… 102
6.1.2. විකල්ප සංකල්පිතයන්…… 102
6.1.3.සංවර්ධන තීරය හා විශේෂිත නැඹුරුතාවයක් සහිත උප නාගරික මධ්‍යස්ථාන…… 106
6.1.4. සංකල්පිත සැලැස්ම සමඟ දැක්ම, අරමුණු හා පරමාර්ථ අතර පවතින සම්බන්ධතාවය……... 107
6.2. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම…….......... 109
6.2.1. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම විදහා දැක්වීම…….. 110
6.3. භෞතිය හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම…... 114
6.3.1. සේවා සැලසුම…… 114
6.3.1.1. සෞඛ්‍ය පහසුකම් සැලැස්ම…… 114
6.3.1.2. අධ්‍යාපන පහසුකම් සැලැස්ම…….. 117
6.3.1.3. නිවාස පහසුකම් සැලැස්ම…... 119
6.3.2. යෝජිත ප්‍රවාහන සැලසුම…… 122
6.3.2.1.හැඳින්වීම…… 122
6.3.2. 2. ප්‍රවාහන සැලසුම…….. 123
6.3.2. 3.යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය…….. 124
6.3.3.යෝජිත ජල සැපයුම් සැලසුම…….. 125
6.3.3.1.හැඳින්වීම…… 125
6.3.3. 2. ජල සැපයුම් සැලසුම…… 127
6.3.3. 3.යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය…….. 128
6.3.4. යෝජිත විදුලි සහ දත්ත රැහැන් සැලසුම…… 129
6.3.4.1.හැඳින්වීම…… 129

6.3.4. 2. විදුලි සහ දත්ත රැහැන් සැලසුම………………………………………………... 130

6.3.4. 3.යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය…. 131

6.3.5.යෝජිත ජලාපවහන හා මළාපවාහන සැලසුම……………………………………… 132

6.3.5.1.හැඳින්වීම………………………………………………………………… 132

6.3.5. 2. ජලාපවහන හා මළාපවාහන සැලසුම……………………………………… 134

6.3.5. 3.යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය…. 135

6.3.6. යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම……………………………………... 136

6.3.6.1.හැඳින්වීම……………………………………………………………… 136

6.3.6. 2. යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම……………………………. 137

6.3.6. 3.යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය…. 138

6.4. ආර්ථික සංවර්ධන උපක්‍රම………………………………………………………………….. 140

6.4.1. හැඳින්වීම……………………………………………………………………... 140

6.4.2. යෝජිත ආර්ථික සංවර්ධන සැලසුම………………………………………………. 142

6.4.3. යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය…. 143

6.5. තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම…………………………………………………………. 145

6.5.1. හැඳින්වීම……………………………………………………………………... 145

6.5.2. යෝජිත උපාය මාර්ග ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය… 145

6.5.2 භූ දර්ශන කළමණාකරණය……………………………………………………….. 146

6.5.3 ආපදා අවදානම් කළමණාකරණ සැලැස්ම……………………………………………. 147

6.5.4 විවෘත භූ භූමි සැලැස්ම……………………………………………………………. 151

6.6. සංස්කෘතිය හා උරුමය කළමනාකරණය කිරීමේ උපක්‍රම………………………………... 154

6.6.1. සංරක්ෂණ උපදෙස්………………………………………………………………. 155

6.6.2. සංස්කෘතිය හා උරුමයන් කළමණාකරණය කිරීමේ සැලැස්ම………………………… 157

6.7.ක්‍රියාත්මක කිරීමේ උපක්‍රම…………………………………………………………………….. 158

6.7.1.ප්‍රමුඛතා ව්‍යාපෘති…………………………………………………………………... 158

6.7.2.පායමාර්ගික ව්‍යාපෘති……………………………………………………………. 163

# VII. සිතියම් ලැයිස්තුව


සිතියම් අංක 2: 1. සංවර්ධන සැලැස්මේ අධ්‍යයන කලාපය.............................................................. 17

සිතියම් අංක 2: 2.මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයෙහි පරිපාලන සීමා මායිම්.................................. 33

සිතියම් අංක 5: 1. මහනුවර නගරය තුළ පිහිටා ඇති වන ව්‍යාප්තිය.............................................................. 69

සිතියම් අංක 5: 2. ප්‍රාදේශිය සම්බන්ධතාවය අනුව විසල් මහනුවර කලාපයේ නාගරික ධූරාවලිය.............. 81

සිතියම් අංක 6: 1.යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම.................................................................. 109

සිතියම් අංක 6: 2:සෞඛ්‍ය සේවා සැපයුම් සැලසුම.................................................................. 116

සිතියම් අංක 6: 3.අධ්‍යාපන සේවා සැපයුම් සැලසුම.................................................................. 118

සිතියම් අංක 6: 4.නිවාස සැපයුම් සැලසුම.................................................................. 120

සිතියම් අංක 6: 5.ප්‍රවාහන සැපයුම් සැලසුම.................................................................. 123

සිතියම් අංක 6: 6.යෝජිත ජල සැපයුම් සැලසුම.................................................................. 127

සිතියම් අංක 6: 7. යෝජිත විදුලි සැපයුම් සැලසුම.................................................................. 129

සිතියම් අංක 6: 8.යෝජිත ජලාපවහන හා මළාපවාහන සැලසුම.................................................................. 134

සිතියම් අංක 6: 9.යෝජිත අපද්‍රව්‍ය කළමණාකරණ සැලසුම.................................................................. 137

සිතියම් අංක 6: 10.යෝජිත ආර්ථික සංවර්ධන සැලසුම.................................................................. 142

සිතියම් අංක 6: 11.මහනුවර නගරය තුළ පවතින ජල මූලාශ්‍ර.................................................................. 149

සිතියම් අංක 6: 12.මහනුවර නගරය තුළ පවතින පහත්බිම්.................................................................. 150

සිතියම් අංක 6: 13.යෝජිත විවෘත භූමි සැලැස්ම.................................................................. 153

සිතියම් අංක 6: 14.සංස්කෘතිය හා උරුමයන් කළමණාකරණය කිරීමේ සැලැස්ම.................................... 157

# VIII. වගු අංක


වගු අංක 5: 1. සංචාරක කර්මාන්තය මඟින් සේවා අංශය ලද ආදායම -2016........................................... 59

වගු අංක 5: 2. ලෝක උරුම ගොඩනැගිලි සමීක්ෂණයට අනුව පරිහානි වී ඇති ගොඩනැඟිලි.................... 62

වගු අංක 5: 3. ඓතිහාසික නගර මාධ්‍ය කලාපය තුළ පවතින භාවිතයන්................................................ 63

වගු අංක 5: 4.මැද ඇළ අවට භූමි පරිබෝජන රටාව වෙනස් වීමේ ස්වභාවය............................................ 73

වගු අංක 5: 5. මැද ඇළ අවට භූමි පරිබෝජන රටාව වෙනස් වීමේ ස්වභාවය.......................................... 74

වගු අංක 5: 6. 2017 වර්ෂයේ මහනුවර නාගරික සංවර්ධනයන් අධිකාරිය වෙත ලැබුණු ගොඩනැඟිලි අයදුම්පත් හා ඉඩම් අනුබෙදුම් අයදුම්පත්................................................................................. 77

වගු අංක 5: 7. පෞද්ගලික බස් රථ මඟින් සපයනු ලබන ගමනාන්ත ප්‍රමාණය........................................... 82

වගු අංක 5: 8. මහවැලි ගඟෙන් ජලය ලබා ගන්න ස්ථාන හා ඒවායෙහි ජල ප්‍රමාණයන්............................ 84

වගු අංක 5: 9. ප්‍රධාන මාර්ග වල වාහන හා පදිකයන්ගේ ඝණත්වය........................................................ 85

වගු අංක 5: 10.මහනුවර නගරය තුළ පිහිටා ඇති හෝටල් ප්‍රමාණය......................................................... 94

වගු අංක 5: 11. ශ්‍රී දළදා මාළිගාව වෙත සාමාන්‍ය දිනකදී පැමිණෙන බැතිමතුන් සංඛ්‍යාව........................ 95

වගු අංක 5: 12.මහනුවර නගරයේ පවතින සුළු පරිමාණ ගෘහස්ථ කර්මාන්ත හා ස්ථාන......................... 99

වගු අංක 6: 1. විකල්ප සංකල්පිතයන් සඳහා බර තැබීම.......................................................................... 105

වගු අංක 6: 2. අඩු පහසුකම් නිවැසියන් හැට ලබා දීමට යෝජිත නිවාස ව්‍යාපෘති..................................... 120

වගු අංක 6: 3: ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා හඳුන්වා දෙනු ලබන ක්‍රමවේද....................... 138

වගු අංක 6: 4. මහනුවර නගර සහා සීමාව තුළ පිහිටි ක්‍රීඩා පිටි................................................................ 151

වගු අංක 6: 5: හඳුනාගත් විශේෂ ගොඩනැගිලි සඳහා අනුවර්ථන භාවිතයන්............................................ 155

# IX. රූප අංක


රූප අංක 1: 1.සැලසුම් ක්‍රියාවලිය.......... 12

රූප අංක 3: 1. ලෝක උරුම ගොඩනැඟිලි ආශ්‍රිත ගැටලු.......... 37

රූප අංක 3: 2. මහනුවර වැව වටා විහිදී ඇති කඳු පන්ති මත ඉදිකර ඇති ගොඩනැඟිලි.......... 39

රූප අංක 3: 3.මහනුවර නගරය තුළ වෘක්ෂ ලතා ඝනත්වයේ වික්ෂණය.......... 40

රූප අංක 3: 4. මහනුවර නගර තුළ රථවාහන වේගය.......... 42

රූප අංක 5: 1. දළදා මාළිගා පරිශ්‍රය.......... 57

රූප අංක 5: 2.ලෝක උරුම සංරක්‍ෂණ ගොඩනැඟිලි වල ව්‍යාප්තිය.......... 58

රූප අංක 5: 3. සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැඟිලි.......... 59

රූප අංක 5: 4.මහනුවර ඇසළ පෙරහැර.......... 60

රූප අංක 5: 5.ලෝක උරුම ගොඩනැඟිලි වල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ක්‍රමයෙන් හීන වීම.......... 61

රූප අංක 5: 6. හරස් වීදි වල නිර්මාණය වී ඇති කලබලකාරී පසුබිම.......... 64

රූප අංක 5: 7.මහනුවර වැව වටා ඉදිකර ඇති අවිධිමත් ඉදිකිරීම්.......... 65

රූප අංක 5: 8. මහනුවර නගරය හරහා ප්‍රධාන ජල මූලාශ්‍රයන් ගලා බසින ආකාරය.......... 67

රූප අංක 5: 9. නගර දර්ශනය විදහා දක්වන ස්ථාන.......... 71

රූප අංක 5: 10. මැද ඇළ පෝෂක ප්‍රදේශය.......... 73

රූප අංක 5: 11. මහනුවර නගයෙහි අතීත ස්වරූපය හා වර්තමාන ස්වරූපය.......... 74

රූප අංක 5: 12. අංශක 45ට වැඩි බෑවුම් වල ගොඩනැගිලි ව්‍යාප්තිය .......... 75

රූප අංක 5: 13. ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී කලාපය.......... 76

රූප අංක 5: 14. මහනුවර නගරය තුළ පිහිට ඇති දුම්රිය නැවතුම් පළවල් හා ස්ථාන.......... 82

රූප අංක 5: 15. මහනුවර නගරය තුළ පාසල් වල ව්‍යාප්තිය.......... 86

රූප අංක 5: 16. ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වෙනුවෙන් නගරය තුළ වෙන් කර ඇති ස්ථාන... 87

රූප අංක 5: 17. මහනුවර නගරය තුළ ප්‍රජා විනෝද හා විවෘත ස්ථාන වල පවතින අඩු පහසුකම්.......... 88

රූප අංක 5: 18.පදිකයින් ගැවසෙන ස්ථාන වල පවතින ගැටලු.......... 89

රූප අංක 5: 19. මහනුවර නගරය තුළ රථ වාහන නැවතීම සඳහා පවතින ස්ථාන.......... 90

රූප අංක 5: 20. මහනුවර නගරය තුල අඩු අදායම් ලාභී නිවාස වළ ව්‍යාප්තිය.......... 91

රූප අංක 5: 21. දළ දේශීය නිෂ්පාදනය 2015-2017.......... 95

රූප අංක 5: 22. දේශීය හා විදේශීය සංචාරකයන් මහනුවර නගරය තුළ රැඳීමේ ප්‍රමාණය.......... 96

රූප අංක 5: 23. මහනුවර නගරය තුල හඳුනාගෙන ඇති ඌන උපයෝජන ඉඩම.......... 97

රූප අංක 5: 24. ජාතික භෞතික සැලසුම 2050 කෙටුම්පතට අනුව යෝජිත ජනගහනය.......... 100

රූප අංක 6: 1.වර්තමාන සංවර්ධන නැඹුරුතාවය එලෙසම පවත්වාගෙන යාම.......... 102

රූප අංක 6: 2. මහනුවර නගරය තුළ පවතින සංවර්ධන පීඩනය .......... 103

රූප අංක 6: 3. පර්ෂද නගර සහිත මධ්‍යගත සංවර්ධනය ........................................................................ 104
රූප අංක 6: 4. සංවර්ධන තිරය හා විශේෂ නැඹුරුතාවයක් සහිත උප නාගරික මධ්‍යස්ථාන...................... 105
රූප අංක 6: 5. මහනුවර නගරය සඳහා යෝජිත විකල්ප සංකල්පිත සැලැස්ම.......................................... 109
රූප අංක 6: 6. පේරාදෙණියේ සිට කටුගස්තොට දක්වා වූ හරස් පැතිකඩ................................................ 110
රූප අංක 6:7. රිවර්ඩේල් මාර්ගයේ සිට පේරාදෙණිය මාර්ගය දක්වා වූ හරස් පැතිකඩ.............................. 110
රූප අංක 6:8. උඩවත්ත රක්ෂිත වනාන්තරයේ සිට ගුඩ්ෂෙඩ් නගරය දක්වා වූ හරස් පැතිකඩ.................. 111
රූප අංක 6: 9. වැව රවුම ඉහළ සීමාවේ සිට රජ පිහිල්ල දෙසට අදින ලද හරස් පැතිකඩ.......................... 112
රූප අංක 6: 10.වට්ටාරන්තැන්න මාර්ගයේ සිට නිත්තවෙල හංන්දිය දක්වා අදින හරස් පැතිකඩ........... 114
රූප අංක 6: 11.යෝජිත බහු විධ ප්‍රවාහන පර්යන්තය.................................................................................. 124

# X. ඇමුණුම


ඇමුණුම 1. ශ්‍රී දළදා මාළිගාව සහ ඒ අවට ප්‍රදේශයෙහි සීමාවන්........................................................... 207

ඇමුණුම 2. ගැටඹේ රාජෝපවනාරාමය සහඑම ප්‍රදේශයට අදාල නීති හා රෙගුලාසි............................... 214

ඇමුණුම 3. ලෝක උරුම ගොඩනැගිලි.................................................................................................. 216

ඇමුණුම 4. වරාතැන්න - හත්කින්ද පාරිසරික ආරක්ෂක ප්‍රදේශය හා ඒ ආශ්‍රිතව පනවා ඇති නීති .......... 218

ඇමුණුම 5. ජාතික භෞතික සැලැස්ම -2050 (කෙටුම්පත්) ...................................................................... 224

ඇමුණුම 6. මහනුවර නගර සංවර්ධන සැලැස්ම 2002-2016..................................................................... 225

ඇමුණුම 7.2008 - 2020 විසල් මහනුවර නගර සංවර්ධන සැලසුම.......................................................... 226

ඇමුණුම 8. 2030 විසල් මහනුවර උපාය මාර්ගික නගර සැලසුම............................................................ 227

ඇමුණුම 9. 2020 විසල් මහනුවර නගර සංවර්ධන සැලසුම..................................................................... 228

ඇමුණුම 10.අධ්‍යයන කලාපය තුළ මහා මාර්ග වල ව්‍යාප්තිය.................................................................. 229

ඇමුණුම 11. අධ්‍යයන කලාපය තුළ ජනගහන ව්‍යාප්තිය - 2012............................................................ 230

ඇමුණුම 12. අධ්‍යයන කලාපය තුළ ජන ඝණතත්වයේ ව්‍යාප්තිය - 2012............................................. 231

ඇමුණුම 13. මහනුවර මහ නගර සහා බල සීමාව තුළ අඩු පහසුකම් නිවාස ව්‍යාප්තිය.......................... 232

ඇමුණුම 14. අධ්‍යයන කලාපය තුළ ගොඩනැඟිලි ඝණත්වය 2012....................................................... 233

ඇමුණුම 15. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ කාණු පද්ධතියෙහි ව්‍යාප්තිය.......................... 234

ඇමුණුම 16. මහනුවර නගරය තුළ ක්‍රියාත්මක කෙරන අපජල ව්‍යාපෘතිය................................................ 235

ඇමුණුම 17. මහනුවර මහ නගර සභා සීමාව තුළ නායයෑමේ අවධානම් සහිත ස්ථාන............................ 236

ඇමුණුම 18: මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව............................................... 237

ඇමුණුම 19.අධ්‍යයන ප්‍රදේශය තුළ ස්වාභාවික ජල මාර්ගයන්හි ව්‍යාප්තිය............................................ 238

ඇමුණුම 20.අධ්‍යයන කලාපය තුළ සංවර්ධක පීඩනය............................................................................ 239

ඇමුණුම 21. මහනුවර මහ නගර සභා සීමාව තුළ පවතින පාරිසරික සංවේදීතාවය................................ 240

ඇමුණුම 22.පාර්ශවකරුවන්ගේ රැස්වීම තුලින් ඉදිරිපත් කරන ලද ගැටළු............................................... 241

ඇමුණුම 23:යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම විදහා දැක්වීමේ හරස්කඩ................................................ 242

ඇමුණුම 24:පවතින සෞඛ්‍ය සේවා සැපයුම් ප්‍රමිතිගත ප්‍රදේශය............................................................. 243

ඇමුණුම 25:පවතින අධ්‍යාපන සේවා සැපයුම් ප්‍රමිතිගත ප්‍රදේශය........................................................... 244

ඇමුණුම 26:පවතින විවෘත භූමි සැපයුම් ප්‍රමිතිගත ප්‍රදේශය.................................................................. 245



# 1 කොටස

# හැඳින්වීම

# 1

# 1. හැඳින්වීම

## 1.1. සංවර්ධන සැලැස්ම සැකසීමේ පසුබිම

නගරයක් තුළ පවතින ආර්ථික, සමාජයීය, පාරිසරික, දේශපාලනික හා සංස්කෘතික සාධක මත නගරයෙහි අනාගත සංවර්ධන දිශානතිය තීරණය වන අතර එය නගරයෙහි සංවර්ධනය කෙරෙහි අඩු වැඩි වශයෙන් බලපෑමක් සිදු කරනු ලබයි. සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා වූ මූලාරම්භය මෙම සංරචකයන්ගේ හව්‍යත්වය මත තීරණය වන අතර එමඟින් අනාගත සංවර්ධනයෙහි ප්‍රගමණය තීරණය වේ.

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත මඟින් ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනය නියාමනය කිරීමේ ප්‍රමුඛතම ආයතනය වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කොට ඇති අතර මේ ප්‍රදේශයේ සංවර්ධනය සඳහා සුදුසු යැයි විෂය භාර අමාත්‍යවරයාගේ නියමයකින් ප්‍රකාශයට පත් කරන ලද සංවර්ධන බල ප්‍රදේශ වල භෞතික ,ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් සංවර්ධනය කිරීම, ඒකාබද්ධ වූ සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම එහි ප්‍රධාන තම කාර්යයභාරය වේ.

1982 අංක 04 දරණ පනත මඟින් සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 08 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව එම පනතේ 3 (1) වගන්තියට අනුව 1979 මාර්තු මස 07 වන දින අංක 26/8 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය ප්‍රකාශයට පත් කර ඇත.

2003 මැයි මස 26 වන දින අංක 1290/01 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද 2002 අප්‍රේල් මස 27 දින සිට ක්‍රියාත්මක කරනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරීය කළමනාකරණ මණ්ඩලය මඟින් 2016 දෙසැම්බර් 31 දින සිට 2019 ජූනි 30 දක්වා තවදුරටත් දීර්ඝ කරන ලද 2002-2016 මහනුවර නගර සංවර්ධන සැලැස්මෙහි වලංගු කාලය 2019 ජූනි 30 වන දිනෙන් අවසන් වන බැවින් 2019 ජූලි 1 සිට මෙම සංවර්ධන සැලැස්ම බලාත්මක කෙරේ. නාගරික සංවර්ධන අධිකාරියේ මධ්‍යම පළාත් කාර්යාලය විසින් මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය ආවරණය වන ලෙස, ආර්ථික, සමාජයීය, භෞතික, පාරිසරික හා සංස්කෘතික යන සංරචක සැලකිල්ලට ගනිමින් 2017 වසරේදී මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම ආරම්භ කළ අතර 2019 ජනවාරි මස 01 වන දින සිට බල පැවැත්වෙන මෙම සංවර්ධන සැලැස්ම 2019 – 2030 කාල පරිච්ඡේදය දක්වා බලාත්මක කරනු ලැබේ.

ප්‍රදේශයෙහි  ව්‍යුහය, පාරිසරික සංවේදී වටපිටාව මෙන්ම ආකර්ෂණීය දර්ශනීය ස්ථාන හා සංස්කෘතික අංගයන්ගෙන් අනූන නිර්මිත පාරිසරික සාධකයන් මෙන්ම ස්වාභාවික පාරිසරික සාධකයන් ආරක්ෂා කර ගැනීම සඳහා සුවිශේෂී අවධානයක් යොමු කොට ඇති මෙම සංවර්ධන සැලැස්ම තුළින් අපේක්ෂිත වර්ෂයන් සඳහා සංවර්ධන උපාය මාර්ග හා මාර්ගෝපදේශයන්ද හඳුන්වාදී ඇත.

## 1.2. සැලසුම් කණ්ඩායම

**<u>ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ආයතන</u>**

1. මහනුවර මහ නගර සභාව

**<u>ප්‍රධාන උපදේශනාත්මක ආයතන</u>**

1. ශ්‍රී දළදා මාළිගාව
2. ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. මධ්‍යම පරිසර අධිකාරිය
4. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
5. මාර්ග සංවර්ධන අධිකාරිය
6. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
7. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
8. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
9. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
10. පළාත් සංචාරක මණ්ඩලය
11. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
12. ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය
13. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
14. මධ්‍යම සංස්කෘතික අරමුදල
15. ශ්‍රී ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය
16. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
17. උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය
18. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
19. ලෝක උරුම ගොඩනැගිල්ල සංරක්ෂණ කමිටුව
20. පේරාදෙණිය විශ්ව විද්‍යාලය, භූ විද්‍යා අංශය
21. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
22. ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය
23. කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව,ගන්නෝරුව
24. වාණිජ මණ්ඩලය

## අනෙකුත් පාර්ශවයන් කාණ්ඩායම්

1. පළාත් පාලන දෙපාර්තමේන්තුව
2. හන්තාන සුරැකීමේ සංවිධානය
3. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
4. දුම්බර බන්ධනාගාරය
5. වනජීවි දෙපාර්තමේන්තුව
6. ලක්සල, මහනුවර
7. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
8. ශ්‍රී ලංකා පොලිසිය
9. සිවිල් ආරක්ෂක බලගන මූලස්ථානය
10. මහනුවර මහ රෝහල
11. පේරාදෙණිය ශික්ෂණ රෝහල
12. ආයුර්වේද දෙපාර්තමේන්තුව, කුණ්ඩසාලේ
13. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,මහනුවර
14. සුවසෙවන (පුද්) රෝහල, මහනුවර
15. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
16. සුගතදාස ජාතික ක්‍රීඩා අධිකාරිය
17. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව
18. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය
19. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
20. ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව
21. කාන්තා වාණිජ මණ්ඩලය
22. මූල්‍ය ආයතන
    - මහජන බැංකුව
    - කොමර්ෂල් බැංකුව
    - ලංකා බැංකුව
    - සම්පත් බැංකුව
23. සිංහල වෙළඳ සංගමය
24. මහනුවර වෘත්තියවේදීන්ගේ සංගමය
25. කොන්ත්‍රාත් කරුවන්ගේ සංගමය
26. පෞද්ගලික ව්‍යාපාරිකයින්
27. මධ්‍යම පළාත් වාස්තු විද්‍යාඥයින්ගේ සංගමය
28. සංචාරක හෝටල් අයිතිකරුවන්ගේ සංගමය
29. ශ්‍රී ලංකා නීතිඥ සංගමය
30. පෞද්ගලික නිවාස සංවර්ධකයින්
    - හයිරු ඉංජිනේරු (පුද්) සමාගම, කටුගස්තොට
    - ප්‍රයිම් හෝම්ස් (පුද්) සමාගම, මහනුවර
    - රොටරි සමාජය

නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති ආචාර්ය ජගත් මුණසිංහ මහතාගේ මඟ පෙන්වීම යටතේ මධ්‍යම පළාත් හිටපු අධ්‍යක්ෂ වරුන් වන එම්.එම්.එල්.පී.විජේරත්න, එම්.පී.රණතුංග හා එන්.ඒ.එස්.එන් නිශ්ශංක යන මහත්වරුන්ගේ හා වත්මන් අධ්‍යක්ෂ ර්.එම්.එස්.බී.ඒකනායක මහතාගේ මෙහෙයවීම යටතේ මධ්‍යම පළාත් කාර්යාලය මඟින් පිළියෙල කරන ලද මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වන මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත සැලසුම් කණ්ඩායම මඟින් සිදු කරන ලදි.

**<u>නාගරික සංවර්ධන අධිකාරිය සැලසුම් කණ්ඩායම</u>**

| | | |
|---|---|---|
| 1. | ර්. එම්.එස්.බී.ඒකනායක මයා | අධ්‍යක්ෂ (මධ්‍යම පළාත) |
| 2. | එච්.ඩබ් සෝමරත්න මයා | නි. අධ්‍යක්ෂ (සැලසුම්) |
| 3. | බී.එච්.එම්.ආර්. බණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ(සැලසුම්) |
| 4. | ඒ.එම්. ඩී.බී. අතාවුද මයා | සහකාර අධ්‍යක්ෂ(සැලසුම්) |
| 5. | එම්.එල්.ආර්.පී. මුණසිංහ මිය | පාරිසරික සැලසුම් ශිල්පි |
| 6. | එම්. ආර්. අමරසිංහ මයා | සැලසුම් නිළධාරි |
| 7. | ඒ.ජී.වී.කේ. ජයසිංහ මිය | සැලසුම් නිළධාරි |
| 8. | එන්.ජී. සේනක අරුණසිරි | සැලසුම් නිළධාරි |
| 9. | ටී.ඩබ්.එම්.එම්.පී.කේ. විජේතුංග මිය | සැලසුම් නිළධාරි |
| 10. | පී.ජී.සී. පුෂ්පා කුමාරි මිය | සැලසුම් නිළධාරි |
| 11. | ඩී.යු. රත්නාලංකාර මිය | සැලසුම් නිළධාරි |
| 12. | ඒ.එස්.එෆ්. ඉෂානා මිය | සැලසුම් නිළධාරි |
| 13. | එන්.එච්.ඩී. විජේතුංග මයා | සහකාර සැලසුම් නිළධාරි |
| 14. | ඩබ්.එම්.ර්.ටී. වීසිංහ මෙනවිය | සහකාර සැලසුම් නිළධාරි |
| 15. | ජී.සී.එම්.කේ. මුණසිංහ මෙනවිය | සහකාර සැලසුම් නිළධාරි |
| 16. | ඩී.ජී.එච්.එස් ජයසිංහ මිය | යතුරු ලේඛිකා |
| 17. | ඒ.එම්.කේ.කේ.අබේසේකර මිය | යතුරු ලේඛිකා |
| 18. | එස්.කේ.ඩී. උදයදිවාකර මිය | යතුරු ලේඛිකා |

**<u>නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රධාන කාර්යාලයේ සහයෝගීතා අංශ</u>**

1. සංවර්ධන සැලසුම් අංශය
2. පර්යේෂණ හා සංවර්ධන අංශය
3. භූගෝලීය තොරතුරු පද්ධති අංශය
4. පරිසර හා භූදර්ශන අංශය

## 1.3. විෂය පථය

මහනුවර මහ නගර  සභා බල ප්‍රදේශයද ඇතුළත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක් ආවරණය වන පරිදි අධ්‍යයනයන් හා විශ්ලේෂණාත්මක අධ්‍යයනයන් සිදු කර මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා බල පැවැත්වෙන පරිදි මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

ශ්‍රී ලංකාවේ සියලු ජල මූලාශ්‍රයන්ගේ ආරම්භය වන මධ්‍යම කඳුකර ප්‍රදේශය අතිශය පාරිසරික සංවේදී කලාපයක් ලෙස 2050 ජාතික භෞතික  සැලසුම් කෙටුම්පතට අනුව  හඳුනාගෙන ඇත. එබැවින් මහනුවර නාගරික බල ප්‍රදේශය තුළ නේවාසික ජන ව්‍යාප්තිය සීමා වන පරිදිත් ඉතා විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘතීන් මෙම කලාපය තුළ ප්‍රවර්ධනය නොවන ලෙසත් මෙම සැලැස්ම සකස් කර ඇත.

2050 ජාතික භෞතික සැලසුම් කෙටුම්පතට අනුව මහනුවර අධි නාගරික කලාපය තුළ නේවාසික ජනගහනයේ ව්‍යාප්තිය 500,000ක් දක්වා සීමා කර ඇති අතර එය සැලකිල්ලට ගනිමින් මෙන්ම ජනගහනයේ  ඉසුලුම් ධාරිතා විශ්ලේෂණයට (Carrying Capacity Analysis) අනුව මහනුවර මහ නගර සභා බල සීමාවෙහි ජනගහනය 2030 වර්ෂය සඳහා 106,000 ක් ලෙස පුරෝකථනය කොට ඇත.

2050 ජාතික භෞතික සැලසුම් කෙටුම්පතට අනුව මහනුවර අධි නාගරික කලාපය තුළ දිස්ත්‍රික් අගනගරය ලෙස මහනුවර මහ නගර සභා බල සීමාව නම්කොට ඇති අතර මෙම සැලැස්ම තුළින්ද එය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යනු ඇත.

මේ වන විටත් ඉදිකිරීම් ආරම්භ කර ඇති මධ්‍යම අධිවේගී මාර්ගයේ ගලගෙදර හුවමාරුවෙන් මහනුවර නගරය කටුගස්තොට හරහා කොළඹ හා කුරුණෑගල යන ප්‍රධාන නගර සමඟ කාර්යක්ෂම ලෙස  සම්බන්ධවීම සිදු වනු ඇත. ඒ අනුව මහනුවර නගරයට අයත් කටුගස්තොට ප්‍රදේශයේ ඉදිරි සංවර්ධනය දිශානුගත කිරීම සිදු කරන ආකාරය පිළිබඳවද මෙම සංවර්ධන සැලැස්ම තුළින් අවධානය යොමු කොට ඇත.

2030 උපාය මාර්ගික නගර සංවර්ධන සැලැස්ම මඟින් මහනුවර නගරය ආශ්‍රිතව හඳුනාගනු ලැබූ පිළිමතලාවේ සිට පේරාදෙණිය, මහනුවර නගර මධ්‍යය හා මහයියාව හරහා කටුගස්තොට ප්‍රදේශයටත් තැන්නෙකුඹුර සිට කුණ්ඩසාලේ, පල්ලේකැලේ හරහා දිගන ප්‍රදේශය දක්වාත් ව්‍යාප්ත වන අධි ඝණත්ව සංවර්ධන තීරයන්ද, 2020 විසල් මහනුවර නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගෙන ඇති පොකුරු ප්‍රදේශයන් වන  මහනුවර නාගරික ප්‍රදේශය, පේරාදෙණිය ප්‍රදේශය, කටුගස්තොට ප්‍රදේශය හා කුණ්ඩසාලේ සිට දිගන දක්වා වූ ප්‍රදේශයන්ද මෙම සංවර්ධන සැලැස්මෙහි සංකල්පමය සැලැස්ම තුළට අන්තර්ගත කොට ඇත.

2008-2020 විසල් මහනුවර නගර සංවර්ධන සැලැස්ම, 2030 උපාය මාර්ගික නගර සංවර්ධන සැලැස්ම හා 2020 විසල් මහනුවර නගර සංවර්ධන සැලැස්ම යන සැලසුම් තුළින් හඳුනා ගන්නා ලද උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතීන් මෙන්ම නියාමන සැලසුම්ද මෙම සංවර්ධන සැලැස්ම තුළ අන්තර්ගත කොට ඇත.

ලෝක උරුම නගරයක් වූ මහනුවර නගරයෙහි ශ්‍රී දළදා මාළිගාව හා ඒ අවට ප්‍රදේශයෙහි පවතින සංස්කෘතික භූ දර්ශනය ආරක්ෂා කර ගැනීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම තුළින් සුවිශේෂී අවධානයක් යොමු කොට ඇති අතර ඒ අවට ප්‍රදේශයෙහි ගොඩනැගිලි වල උස, වර්ණ, ගොඩනැගිලි අමුද්‍රව්‍ය, දැන්වීම් පුවරු භාවිතය මෙන්ම ආලෝක බුබුළු වල වර්ණයන්ද පාලනය කිරීම සඳහා නීති හා රෙගුලාසි පද්ධතියක් හඳුන්වා දී ඇත.

1984 ජුනි මස 08 වන දින අංක 301 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ශ්‍රී දළදා මාළිගාව සහ ඒ අවට ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් ලෙස නම් කොට ඇති අතර එම ප්‍රදේශ සීමාවන් 2001 නොවැම්බර් මස 08 වන දින අංක 1209/19 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් තව දුරටත් පුළුල් කර ඇත (ඇමුණුම 01). 2000 පෙබරවාරි මස 23 වන දින අංක 1120/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ගැටඹේ රාජෝපවනාරාමය අවට ප්‍රදේශය පූජා භූමි ප්‍රදේශයක් ලෙස නම් කොට ඇත. ඒ අනුව එම ගැසට් ප්‍රකාශයන්හි පනවා ඇති නීති හා රෙගුලාසි මෙම සංවර්ධන සැලැස්ම තුළින්ද ඒ ආකාරයෙන්ම අන්තර්ගත කොට ඇත (ඇමුණුම 02)

1988දී යුනෙස්කෝ සංවිධානය විසින් මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස නම් කොට ඇති අතර 2003 මැයි මස 26 වන දින අංක 1290/01 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද 2002 අප්‍රේල් මස 27 දින සිට ක්‍රියාත්මක කරනු ලැබූ 2002-2016 මහනුවර මහ නගර සංවර්ධන සැලැස්ම තුළින් නම් කොට ඇති ලෝක උරුම ගොඩනැගිලි 490 මෙන්ම 2005 ජුලි මස 8 වන දින අංක 1401 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි 104ද මෙම සැලැස්ම තුළින් තවදුරටත් ඉදිරි සංරක්ෂණ කටයුතු හා ලෝක උරුම ගොඩනැගිලි ලෙස හඳුනාගෙන ඇත. (ඇමුණුම 03)

2007 ජුනි මස 19 වන දින අංක 2024/6 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් මහවැලි ගඟ ආශ්‍රිතව නම් කොට ඇති "වරාතැන්න - හත් කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය" හා ඒ ආශ්‍රිතව පනවා ඇති නීති රෙගුලාසි මෙම සැලැස්ම තුළින්ද ඒ ආකාරයෙන්ම අන්තර්ගත කොට ඇත. (ඇමුණුම 04)

මහනුවර නගරයේ ඓතිහාසික හා සංස්කෘතිකමය වටිනාකමක් සහිත පාරිසරික භූ දර්ශනය මෙන්ම කඳුකර ප්‍රදේශයන්හි දර්ශනීයත්වය ආරක්ෂා කර ගැනීම මෙන්ම එහි ස්වභාවික භූගෝලීය පිහිටීම පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමු කොට නීති හා රෙගුලාසි හඳුන්වා දීමත්, සංචාරක ආකර්ෂණය සහිත සැලසුම් සහගත නගරයක් තුළ තිරසාර ආර්ථිකයක්, ආකර්ෂණීය හා සුවපහසු ජීවන රටාවක් 2030 වන විට නිර්මාණය කිරීම සඳහාත් මෙම සැලැස්ම තුළින් වැඩි අවධානයක් යොමු කොට ඇත.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය

මහනුවර නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා ක්‍රමෝපායික සැලසුම් ක්‍රමවේදය අනුගමනය කරන ලද අතර එම ක්‍රමවේදයේදී අනුගමනය කළක්‍රියා පටිපාටිය පහත පරිදිවේ.

*රූප අංක 1. 1. සැලසුම් ක්‍රියාවලිය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය,මහනුවර, 2018*

### 1.4.1. තොරතුරු අධ්‍යයනය

පළමු පියවර වන පසුබිම් තොරතුරු අධ්‍යයනය යටතේ විසල් මහනුවර ප්‍රදේශයට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10කට අදාළව ජනගහනය, නිවාස, රැකියා, යටිතල පහසුකම්, භූ විෂමතාව හා පාරිසරික තත්වය පිළිබද තොරතුරු හැදෑරීම හා එම අංශ වලට අදාළව ප්‍රවණතා පිළිබදව අධ්‍යයනයක් සිදු කරන ලදී.

### 1.4.2. විෂය පථය හා සීමාවන් හඳුනා ගැනීම

මහනුවර නගරය කේන්ද්‍ර කරගත් කළාපය පෙර සිදු කරන ලද සැලසුම්මය මැදිහත්වීම් පිළිබදව අධ්‍යයනය කර ඒවායේ ප්‍රතිඵල ඇසුරින් මෙම සැලසුමේ දිශානතිය සඳහා අදාළ වන කරුණු හඳුනා ගැනීම මෙම අදියරේදී සිදු කරන ලදී. එමෙන්ම ජාතික භෞතික සැලසුම මඟින් මහනුවර නාගරික කලාපයන්ට අදාලව ඉදිරිපත් කර ඇති ප්‍රතිපත්තීන් ඔස්සේ නගරය සංවර්ධනය කල හැකි ආකාරයද හඳුනා ගන්නා ලදී. තවද ජාතික මට්ටමෙන් සිදු කරන ව්‍යාපෘති වලින් නගරයේ සංවර්ධනයට සිදු වන බලපෑමද හඳුනා ගන්නා ලදී.

### 1.4.3. ගැටලු හා විභවතාවයන් හඳුනා ගැනීම

පසුබිම් තොරතුරු අධ්‍යයනයේදී මහනුවර නාගරික ප්‍රදේශය හා සම්බන්ධ ගැටලු අතරින් නගරයේ හිතකර පැවැත්මට බාධා වන ප්‍රමුඛ සුවිශේෂී හා විශාල ගැටලු හඳුනා ගැනීම ක්ෂේත්‍ර සමීක්ෂණ හා විශ්ලේෂණාත්මක ක්‍රම මඟින් සිදු කරන ලදී.
එමෙන්ම නාගරික ප්‍රදේශයට ආවේණික සංවර්ධනයට යොදා ගත හැකි විභවතාවන් හඳුනා ගැනීමද සිදු කරන ලදී.

### 1.4.4. පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම

පාර්ශවකරුවන්ගේ වැඩමුළුවක් සංවිධානය කර නගරවාසින්, නගරය භාවිතා කරන්නන් හා නගරයේ පැවැත්මට දායක වන ආයතනය හා මහනුවර නාගරික ප්‍රදේශය පිළිබදව උනන්දුවක් දක්වන පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කළ ගැටලු ඇසුරින් ඩෙල්ෆි ක්‍රමවේදය භාවිතා කර මහනුවර නාගරික ප්‍රදේශය හා සම්බන්ධව තීරණාත්මක ගැටලු හඳුනාගන්නා ලදී.

මෙහිදී හඳුනාගත් ගැටලු හා පසුබිම් තොරතුරු විශ්ලේෂණයෙන් හඳුනාගත් ගැටලු අතරින් මෙම සංවර්ධන සැලැස්ම හරහා ප්‍රමුඛව සලකා බලනු ලබන ගැටලු මොනවාද යන්න විශ්ලේෂණාත්මකව හඳුනා ගන්නා ලදී .

### 1.4.5. දැක්ම හා අරමුණු නිර්ණය කිරීම

මහනුවර නාගරික කළාපය සංවර්ධනය කළ යුතු දිශාව අනුව දැක්මක් තීරණය කර එම දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා වන අරමුණු 04ක් තීරණය කර ගැනීම මෙහිදී සිදු කරන ලදී.

### 1.4.6. සවිස්තරාත්මක විශ්ලේෂණය

තීරණය කරගත් අරමුණු 04 සාක්ෂාත් කර ගැනීම සඳහා උපයෝගී වන නාගරික ප්‍රදේශයේ ඇති ශක්තීන් , දුබලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණාත්මක ක්‍රම හරහා හඳුනා ගැනීම මෙහිදි සිදු කරන ලදී. විශ්ලේෂණාත්මක ක්‍රම ලෙස පාරිසරික සංවේදීතා විශ්ලේෂණය, ඉසුලුම් ධාරිතා විශ්ලේෂණය, දෘශ්‍යතා විශ්ලේෂණය , සංවර්ධන පීඩන විශ්ලේෂණය, සුදුසුතා විශ්ලේෂණය නගරාන්තර සම්බන්ධතා විශ්ලේෂණය ආදී විශ්ලේෂණාත්මක ක්‍රම උපයෝගී කර ගන්නා ලදී.

### 1.4.7. පරමාර්ථ නිර්ණය කිරීම

නිර්ණය කරගත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශක්තින්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය හරහා හඳුනාගත් තොරතුරු ඇසුරෙන් අරමුණු 04 සඳහා වෙන වෙනම පරමාර්ථ නිර්ණය කිරීම සිදු කරන ලදී.

### 1.4.8. උපක්‍රම නිර්ණය කිරීම

පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා උපයෝගී කර ගනු ලබන නව රෙගුලාසි ව්‍යාපෘති නියමු සැලසුම් ආදීය හඳුනාගැනීම සිදු කරන ලදී. ඒවා පහත අංශ 07ක් යටතේ මෙම සංවර්ධන සැලැස්මේ මෙම වෙළුමෙහි 6 වෙනි පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කර ඇත.

1. සංකල්පිත සැලැස්ම
2. භූමි හා ගොඩනැගිලි සංවර්ධන උපක්‍රම
3. භෞතික හා සමාජයීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම
4. ආර්ථික සංවර්ධන උපක්‍රම
5. තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම
6. සංස්කෘතික හා උරුමයන් කළමණාකරණය කිරීමේ උපක්‍රම
7. ක්‍රියාත්මක කිරීමේ උපක්‍රම

# මූලික අධ්‍යයනයන්

# 2

# 2. මූලික අධ්‍යයනයන්

## 2.1. අධ්‍යයන කලාපයන්

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය ව.කි.මී. 26.45 ක් හෙවත් හෙක්ටයාර් 2,645 ක් පුරා ව්‍යාප්තවී ඇත. උතුරු අක්ෂාංශ $7^0 21''$ හා නැගෙනහිර දේශාංශ $80^0 48''$ත් අතර පිහිටා ඇති මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය කොළඹ සිට කි.මී.120ක් පමණ දුරකින් පිහිටා ඇති ශ්‍රී ලංකාවේ දෙවන ප්‍රධානතම නගරය වේ.

මහනුවර නගර සංවර්ධන සැලැස්ම මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයට බලාත්මක කෙරුනද එම සැලැස්ම සකස් කිරීමේදී මහනුවර නගර සභා බල ප්‍රදේශයද ඇතුළත් තුම්පනේ, පූජාපිටිය, අකුරණ, පාතදුම්බර, කුණ්ඩසාලේ, ගඟවටකෝර්ළය, හාරිස්පත්තුව, යටිනුවර, උඩුනුවර හා පාතහේවාහැට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10කින් හා ග්‍රාම නිලධාරී වසම් 747කින් සමන්විත ව.කි.මී 608ක් වූ කලාපයක් අධ්‍යයනය කොට සකස්කර ඇත. මෙම කලාපය පළාත් පාලන ආයතන 13කින් සමන්විත වන අතර එය මහ නගර සභාවකින්ද, නගර සභා 2කින්ද, ප්‍රාදේශීය සභා 11කින්ද සමන්විත වූ බල ප්‍රදේශයකි.

*සිතියම් අංක 2. 1. සංවර්ධන සැලැස්මේ අධ්‍යයන කලාපය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය,මහනුවර, 2018*

අධ්‍යයන කලාපය තුළ පිහිටා ඇති එකම මහ නගර සභාව මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය වන අතර එය උතුරින් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා පාතදුම්බර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයන්ගෙන්ද, නැගෙනහිරින් පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන්ද, (මහවැලි ගඟේ මාධ්‍ය රේඛාව) දකුණින් මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන්ද, (හන්තාන කඳුවැටිය) බටහිරින් යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන්ද මායිම්ව පිහිටා ඇත.

මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (කොටසක්), හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (කොටසක්) හා පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (කොටසක්) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වලින් සමන්විත වන මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සමස්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශ 45කින් හා නාගරික කලාප 21කින්ද සමන්විත වේ.

මෙම නගරය මුහුදු මට්ටමේ සිට මීටර් 500 - 600ක් පමණ උසකින් පිහිටා ඇති නිවර්තන වැසි වනාන්තර කලාපය තුළට අයත් වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය $24C^{0}$-$25C^{0}$ක් පමණ වන මි.මී. 1700 - මී.මී. 2400ක් පමණ වාර්ෂික වර්ෂාපතනය ලබන සෞම්‍ය දේශගුණයකින් සමන්විත වන ප්‍රදේශයකි.

## 2.2. සැලසුම් හා තත්ත්ව සන්දර්භය

මහනුවර නගරයේ ආරම්භය 14 වන ශත වර්ෂය දක්වා විහිදෙන අතර III වන වික්‍රමබාහු රජතුමා (1357 –1374) විසින් මහනුවර රාජධානිය රටේ අගනුවර ලෙස මුලින්ම තෝරාගන්නා ලදී. එතැන් සිට වසර 130 කාලයක් රජවරුන් තිදෙනෙකු විසින් අගනගරය ලෙස මහනුවර තෝරාගත් අතර එය අවසන් වුයේ I වන රාජසිංහ රජු (ක්‍රි.ව.1581 – ක්‍රි.ව.1592) සීතාවකපුර අගනගරය කර ගැනීමත් සමඟය. විමලධර්මසූරිය රජු (ක්‍රි.ව.1592 – ක්‍රි.ව.1604) නැවත මහනුවර අගනගරය ලෙස තෝරාගත් අතර, එතැන් සිට වසර 223 ක් රජවරුන් 09 දෙනෙකු විසින් මහනුවර අග නගරය ලෙස ගෙන රට පාලනය කරන ලද අතර, එය අවසන් වන්නේ 1815 දී ඉංග්‍රීසින් විසින් ශ්‍රී ලංකාවේ අවසන් රජු වන ශ්‍රී වික්‍රමසිංහ රාජසිංහ රජු නතුකර ගැනීමත් සමඟය.

බටහිර ආක්‍රමණිකයන්ගේ පැමිණීමත් සමඟ බෞද්ධාගමේ සිදු වූ පරිහානිය හේතුවෙන් මහනුවර රාජධානියේ රජවරුන්, විවිධ ආගමික ස්ථාන ඉදිකිරීමට පියවර ගන්නා ලදී. එහි වැදගත් පියවරක් ලෙස II විමලධර්මසූරිය යුගයේදී ශ්‍රී දළදා මාළිගාව ඉදිකරන ලද අතර, ඒ හා සමානව මාළිගාව අවට බෞද්ධ වෙහෙර විහාරද ඉදිකරන ලදී. එම සමකාලයේදී විවිධ ආගමික ඇදහීම් ව්‍යාප්ත වීමත් සමඟම හින්දු කෝවිල්, මුස්ලිම් පල්ලි මෙන්ම ක්‍රිස්තියානි දේවස්ථානද ස්ථානගත විය. මෙවැනි ව්‍යාප්තීන් සමඟ මහනුවර නගරය ඓතිහාසික, ආගමික මෙන්ම සංස්කෘතික වශයෙන් වැදගත් මධ්‍යස්ථානය බවට පත්විය.

1800 දී පමණ මහනුවර නගරය තුළ මහා මාර්ග ජාලකයක් (Grid Pattern) නිර්මාණය කරන ලද අතර එම මාර්ග ජාලා ඉපැරණි වලව් සඳහා ප්‍රවිශ්ට මාර්ගයන් සපයන ලදී. (උදා: දුනුවිල වලව්ව, නුගවෙල වලව්ව, පිළිමතලාව වලව්ව) යටත් විජිත යුගයේදී මහනුවර නගරය තුළ දුම්රිය හා මහාමාර්ග පද්ධතියක් වැඩි දියුණු වන අතර, වර්ෂ 1825දී මහනුවර කොළඹ ප්‍රධාන මාර්ගයද, 1826දී පේරාදෙණිය පාලමද, 1831දී මහනුවර මාතලේ මහා මාර්ගයද, 1847දී මහනුවර හාරගම මාර්ගයද, 1865 දි බණ්ඩාරනායක මාර්ගයද, 1878දී දුම්රිය මාර්ගය මාතලේ දක්වා පුළුල් කිරීමද සිදුවිය.

ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන මහනුවර පුරවයෙහි පවතින් ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා පාරිසරික සාධක මත නගරයෙහි පවතින සුවිශේෂීත්වය මෙන්ම සංවර්ධනය සඳහා පවතින ඉල්ලුමද පදනම් කරගනිමින් සංවර්ධන සැලසුම් කිහිපයක් මේ වන විට සැලසුම් කොට ඇත.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත 2050 ජාතික භෞතික සැලැසුම් කෙටුම්පතට අනුව මහනුවර බල ප්‍රදේශය මධ්‍යගත පාරිසරික සංවේදී කලාපයට අයත් වන ප්‍රදේශයක් ලෙසට හඳුනාගෙන ඇත. මහනුවර ආශ්‍රිත කලාපය අධි නාගරික කලාපයක් ලෙසත් මහනුවර දිස්ත්‍රික්කය අගනගරය ලෙසත් එම සැලැස්ම තුළින් තවදුරටත් හඳුන්වා දී ඇති අතර අධි නාගරික කලාපය තුළ අපේක්ෂිත ජනගහනය 500,000ක් දක්වා සීමා කර ඇත. (ඇමුණුම 05)

නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2002 - 2016 වර්ෂය සඳහා බලාත්මක කරනු ලැබූ මහනුවර නගර සංවර්ධන සැලැස්ම තුළින් සංවර්ධන කාර්යයන් ප්‍රවර්ධනය සඳහා මෙන්ම පාලනය කිරීම සඳහා රෙගුලාසි හා උපාය මාර්ග සහිතව කලාපීකරණ සැලසුමක් පිළියෙල කර ඇත. එම සැලැස්ම තුළින් ප්‍රධාන වශයෙන් පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම, ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීම හා අධි උස ගොඩනැගිලි පාලනය කිරීම ආදී අංශයන් කෙරෙහි අවධානය යොමු කොට ඇත. (ඇමුණුම 06)

මහනුවර නාගරික ප්‍රදේශයේ තදබදය කළමනාකරණය කිරීම පිණිස නගරය හා අවට ප්‍රදේශය ඇතුළත් ව.කි.මී. 273ක භූමි ප්‍රමාණයක් සැළකිල්ලට ගනිමින් පිළියෙළ කරන ලද 2008 – 2020 විසල් මහනුවර නගර සංවර්ධනය සැලසුම තුළින් මහනුවර නාගරික ප්‍රදේශය ලෝක උරුම නගරයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කොට ඇත. මහනුවර නාගරික ප්‍රදේශය තුළ ඒ වනවිටත් ස්ථානගතව තිබූ පරිපාලනමය කටයුතු, අධ්‍යාපනික මධ්‍යස්ථාන, රෝහල්, නාගරික බල ප්‍රදේශය තුළ පිහිටි සිංහ රෙජිමේන්තු මූලස්ථානය, බෝගම්බර සිර ගෙදර හා බෝගම්බර පිටාර බස් නැවතුම්පොළ ආදී නාගරික පහසුකම් ප්‍රධාන නගරයෙන් ඔබ්බට ගෙන යමින් විසල් මහනුවර කලාපයේ පිහිටි උප නගර තුළ ස්ථාපනය කිරීමට මෙම සැලසුම් මඟින් තවදුරටත් යෝජනා කර ඇති අතර මහනුවර නගරය කේන්ද්‍ර කරගනිමින් කුණ්ඩසාලේ, දිගන, කටුගස්තොට, පේරාදෙණිය, හා ඊරියගම යන නගර උප නගර වශයෙන් සංවර්ධනය කිරීමටද යෝජනා කර ඇත. (ඇමුණුම 07)

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හයක් අන්තර්ගත වන පරිදි සකස් කර ඇති 2030 උපාය මාර්ගික නගර සංවර්ධන සැලැස්ම මඟින් මහනුවර නගරය ආශ්‍රිතව හඳුනාගනුලැබූ මහනුවර නගරයේ පැවති උරුමයන් විනාශවීම, පාරිසරික සංවේදී ප්‍රදේශ වලට සංවර්ධන කාර්යයන් ව්‍යාප්තවීම හා රථවාහන තදබදය ආදී ගැටලු වලට පිලියම් ලෙස අධි ඝණත්ව සංවර්ධන තීරයන් පිළිමතලාවේ සිට පේරාදෙණිය, මහනුවර නගර මාධ්‍යය හා මහයියාව හරහා කටුගස්තොට ප්‍රදේශයටත් අනෙක් සංවර්ධන තීරය තැන්නෙකුඹුර සිට කුණ්ඩසාලේ, පල්ලේකැලේ හරහා දිගන ප්‍රදේශය දක්වාත් ව්‍යාප්ත වන පරිදි සංයුක්ත කිරීමට යෝජනා කර ඇත. (ඇමුණුම 08)

ප්‍රධාන මාර්ග දෙපස භූමි වල සංවර්ධන කටයුතු සඳහා ඇති අධික ඉල්ලුම, අධික රථ වාහන තදබදය, ලෝක උරුම ගොඩනැගිලි වල අනන්‍යතාවයට ඇති තර්ජන හා පාරිසරික වටිනාකමකින් යුතු ප්‍රදේශ වලට තර්ජන එල්ලවීම යන ගැටලු වලට විසඳුම් සෙවීමට 2020 විසල් මහනුවර නගර සංවර්ධන සැලසුම තුළින් අවධානය යොමු කොට ඇත. මේ හරහා මහනුවර නගර ප්‍රදේශය සංචාරක හා සංස්කෘතිමය කටයුතු වලට සම්බන්ධ පොකුරු ප්‍රදේශයක් ලෙසත්, පේරාදෙණිය ප්‍රදේශය උසස් අධ්‍යාපනික පොකුරු ප්‍රදේශයක් ලෙසත්, කටුගස්තොට ප්‍රදේශය වෙළෙඳ හා වාණිජ කටයුතු වලට අදාළ පොකුරු ප්‍රදේශයක් ලෙසත්, කුණ්ඩසාලේ සිට දිගන ප්‍රදේශය නිෂ්පාදන හා කර්මාන්ත ආශ්‍රිත පොකුරු ප්‍රදේශයක් ලෙසත් උපාය මාර්ගිකව සංවර්ධනය කිරීමට තවදුරටත් යෝජනා කර ඇත. (ඇමුණුම 09)

මහනුවර - කොළඹ (A 01) මාර්ගය, කටුගස්තොට - කුරුණෑගල (A 10) මාර්ගය, මහනුවර - යාපනය (A 09) මාර්ගය, මහනුවර - මහියංගන - පදියතලාව (A 26) මාර්ගය, මහනුවර - බදුල්ල (රජමාවත) (B 413) මාර්ගය සහ පේරාදෙණිය - බදුල්ල - චෙන්කලඩි මාර්ගය (A 05) යන මාර්ග මහනුවර නගරය හා සම්බන්ධ ප්‍රධාන මාර්ග පද්ධතිය වන අතර මෙයින් A 01, A 09 සහ A 26 යන මාර්ග මහනුවර නගර මධ්‍ය සංවර්ධන කළාපයට (CBD) සෘජුව සම්බන්ධ වේ. මහනුවර නගරය හා සම්බන්ධවන දුම්රිය මාර්ග 02 ක් පවතින අතර ඉන් එක මාර්ගයක් මහනුවර සිට පේරාදෙණිය දක්වාද ව්‍යාප්ත වේ. එය පේරාදෙණිය සිට කොළඹ දක්වා සහ පේරාදෙණිය සිට බදුල්ල දක්වා කොටස් දෙකකින් සමන්විත වන අතර අනෙක් දුම්රිය මාර්ගය මහනුවර සිට මාතලේ දක්වා ව්‍යාප්ත වේ. (ඇමුණුම 10)

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2012 ජන සංගණන වාර්තාවලට අනුව අධ්‍යයන කලාපයෙහි ජනගහනය 896,606ක් පමණ වන අතර එය දිවයිනේ මුළු ජන ගහනයෙන් 4.4%ක් ලෙසත් පළාත් ජනගනයෙන් 34.9%ක් ලෙසත් දිස්ත්‍රික් ජනගහනයෙන් 66 %ක් ලෙසත් වාර්තා වී ඇත. 2001 හා 2012 ජන හා සංඛ්‍යා ලේඛන තොරතුරු මත පදනම්ව ජනගහන වර්ධන වේගයන් සැලකුවිට මහනුවර දිස්ත්‍රික්කයේ වාර්ෂික ජනගහන වර්ධන වේගය 0.65%ක් වන අතර, අධ්‍යයන කලාපය තුළ ජනගහන වර්ධන වේගය 0.78%කි. ඒ අනුව 2017 වර්ෂය සඳහා අධ්‍යයන කලාපය තුළ පුරෝකථනය කරන ලද මුළු ජනගහනය 949,793ක් පමණ වේ. 2012 වර්ෂයේ මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයේ ජනගහනය 102,459 ක් පමණ වන අතර එය දිවයිනේ මුළු ජන ගහනයෙන් 0.5% ක් ලෙසත් පළාත් ජනගනයෙන් 3.9%ක් ලෙසත් දිස්ත්‍රික් ජනගහනයෙන් 7.4%ක් ලෙසත් අධ්‍යයන ප්‍රදේශයේ ජනගහනයෙන් 11.4%ක් ලෙසත් වාර්තා වී ඇත. මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ වාර්ෂික ජනගහන වර්ධන වේගය - 0.7% වන බැවින් ඒ අනුව 2017 වර්ෂ සඳහා මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ පුරෝකථ මුළු ජනගහනය 98,922ක් පමණ වේ. (ඇමුණුම 11)

අධ්‍යයන කලාපය තුළ 2012 වර්ෂයේ ජනගහන ඝණත්වය හෙක්ටයාර 1 කට පුද්ගලයන් 14 ක් පමණ වන අතර වැඩිම ජන ඝණත්වයක් මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ දක්නට ලැබේ. තවද වැඩි ජන ඝණත්වයක් මහනුවර දිගන මාර්ගය, පේරාදෙණිය අලදෙණිය මාර්ගය හා අකුරණ අලවතුගොඩ ආදී මාර්ගයන් ඔස්සේ ව්‍යාප්ත බව හඳුනාගත හැකිය. ජන සංගණන වාර්තාවලට අනුව, මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ 2012 වර්ෂයේ ජනගහන ඝණත්වය හෙක්ටයාර් 01 කට පුද්ගලයන් 38ක් පමණ වන අතර 2016 වර්ෂයේ නේවාසික කාර්යයන් සඳහා භාවිතා කරන භූමි ප්‍රමාණය හා සසඳන විට ජනගහන ඝණත්වය හෙක්ටයාර් 01කට පුද්ගලයින් 76ක් පමණ වේ. පූර්ණවත්ත බටහිර හා සුදුහුම්පොල බටහිර ආදී ග්‍රාම නිලධාරි කොට්ඨාසවලද ජන ඝණත්වය 122-246ත් අතර වැඩි අගයක් ගන්නා නමුත්, හෙක්ටයාර් 01කට පුද්ගලයන් 01-20ත් අතර අඩු ජනඝණත්ව ප්‍රමාණයක් නුවර දොඩම්වල, වෙල්අට, මහනුවර,හීරැස්සගල හා අම්පිටිය දකුණ ග්‍රාම නිලධාරි වසම් වල වාර්තා වී ඇත. (ඇමුණුම 12)

අධ්‍යයන කලාපය තුළ 2012 වර්ෂයේදී 428,547 (48%)ක් පමණ පුරුෂ ජනගහනයක් නියෝජනය කරන අතර 468,059 (52%)ක් පමණ ස්ත්‍රී ජනගහනයක් නියෝජනය කරයි. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ මුළු ජනගහනයෙන් 49,916 (49%)ක් පමණ පුරුෂ ජනගහනයක් නියෝජනය කරන අතර 52,543 (51%)ක් ස්ත්‍රී ජනගහනයක් නියෝජනය කරයි.

2012 වර්ෂයේදී අධ්‍යයන කලාපය තුළ 75.8%ක් සිංහල ජාතිකයින්ද, 18.4%ක් ශ්‍රී ලංකා යෝනක ජාතිකයින්ද, 7.9%ක් දෙමළ ජාතිකයින්ද, 0.4%ක් අනෙකුත් ජාතිකයින්ද වන අතර මහනුවර මහ නගරසභා බල ප්‍රදේශය තුළ ජීවත්වන මුළු ජනගහනයෙන් 70%ක් සිංහල ජාතිකයින්ද, 15.2%ක් ශ්‍රී ලංකා යෝනක ජාතිකයින්ද, 10%ක් ශ්‍රී ලංකා දෙමළ ජතිකයින්ද, 2.6%ක් ඉන්දියානු දෙමළ ජාතිකයින්ද, 0.6%ක් බර්ගර් ජාතිකයින්ද, 0.6%ක් මැලේ ජාතිකයින්ද වේ.

අධ්‍යයන කලාපය තුළ ජීවත් වන මුළු ජනගහනයෙන් 76.0%ක ප්‍රමාණයක් 2012 වර්ෂයේදී බෞද්ධ ආගමිකයන් වන අතර, 17.2% ක ප්‍රමාණයක් ඉස්ලාම් භක්තිකයන්ද, 4.9%ක ප්‍රමාණයක් හින්දු භක්තිකයන්ද, 1.8%ක ප්‍රමාණයක් රෝමානු කතෝලික භක්තිකයන්ද, 0.1%ක ප්‍රමාණයක් වෙනත් ආගමික භක්තිකයන් ද වන අතර මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන මුළු ජනගහනයෙන් 66.3% ක ප්‍රමාණයක් බෞද්ධ ආගමිකයන්ද, 16.7%ක ප්‍රමාණයක් ඉස්ලාම් භක්තිකයන්ද, 10.2%ක ප්‍රමාණයක් හින්දු භක්තිකයන්ද, 4.8%ක ප්‍රමාණයක් රෝමානු කතෝලික භක්තිකයන්ද, 1.9%ක් ප්‍රමාණයක් වෙනත් ආගමික භක්තිකයන් ලෙසද හඳුනාගත හැකිය.

මහනුවර නගරයෙහි ජලාධාර ප්‍රදේශය (Catchment) අධ්‍යයන කලාපය ලෙස හඳුනාගත හැකි අතර එම ප්‍රදේශයන්හි ජීවත්වන ජනතාව දෛනික අවශ්‍යතාවයන් සඳහා නගරය වෙත පැමිණේ.

2014 වර්ෂයේදී මහනුවර නගරය පිළිබඳව සිදු කරනු ලැබූ රථ වාහන සමීක්ෂණයට අනුව රැකියා, අධ්‍යාපනය හා සෞඛ්‍ය අවශ්‍යතාවයන් සඳහා මෙන්ම දේශීය /විදේශීය සංචාරකයන් ලෙසද 325,0000 කට ආසන්න ප්‍රමාණයක් දිනකට නගරය වෙත සංක්‍රමණය වන අතර දිනකට 56,000කට අසන්න රථ වාහන සංඛ්‍යාවක් නගරය වෙත පැමිණේ.

මහනුවර නගරය හා අධ්‍යයන කලාපය රාත්‍රී කාලයේදී පස්වරු 7.00 සිට 9.00 දක්වා පමණ වූ කාලසීමාවක් ක්‍රියාකාරී වන අතර විශේෂිත දින එනම් පොහොය නිවාඩු දින, සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සව නිවාඩු දින, විශේෂයෙන්ම ඇසළ පෙරහැර පවත්වනු ලබන දිනයන්හීදී රාත්‍රී ක්‍රියාකාරීත්වය පස්වරු 7.00 සිට 11.00 දක්වා පමණ දිගු වේ. එම දිනයේදී නගරයේ සංසරණ ජනගහනය සාමාන්‍ය දෛනික සංක්‍රමණික ජනගහනයට වඩා ලක්ෂ 200,000 – 300,000ත් අතර ප්‍රමාණයකින් වැඩි වේ.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ජන සංගණන වාර්තාවලට අනුව 2012 වර්ෂයේදී අධ්‍යයන කලාපය තුළ සම්පූර්ණ භූමි ප්‍රමාණයෙන් 60.11%ක ප්‍රමාණයක් නේවාසික භාවිතය සඳහා යොදාගෙන ඇති අතර නිවාස ඒකක සංඛ්‍යාව 218,302 ක් පමණ වේ. එය දිස්ත්‍රික් නිවාස ඒකක සංඛ්‍යාවෙන් 63.7% ක් පමණ අගයක් ගනී. ඒ අනුව මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයේ නිවාස ඒකක සංඛ්‍යාව 26,722ක් පමණ වන අතර එය අධ්‍යයන ප්‍රදේශයේ නිවාස ඒකක සංඛ්‍යාවෙන් 12.2%ක් පමණ වේ.

2015 වර්ෂයේදී සිදුකරන ලද භූමි පරිහරණ සමීක්ෂණයට අනුව සම්පූර්ණ භූමි ප්‍රමාණයෙන් 51.11%ක ප්‍රමාණයක් මහනුවර මහ නගරසභා සීමාව තුළ නේවාසික භාවිතය සඳහා යොදාගෙන ඇති අතර 2012 වර්ෂයේදී පදිංචි මුළු නිවාස ඒකක සංඛ්‍යාවෙන් 89% ක් ස්ථිර නිවාස ඒකක වන අතර, අර්ධ ස්ථිර නිවාස මුළු නිවාස ඒකක සංඛ්‍යාවෙන් 08%ක් පමණ වේ. සමස්ත නේවාසික ඒකක සංඛ්‍යාව 2001 වර්ෂයේ සිට 2012 වර්ෂ දක්වා නිවාස ඒකක සංඛ්‍යාව 6,110ක් පමණ වර්ධනය වී ඇත. මහනුවර මහ නගර සභා බල සීමා ප්‍රදේශය තුළ 57% ක් පමණ තනි මහල් නිවාස දක්නට ලැබෙන අතර මුඩුක්කු පැල්පත් නිවාස හා පේලි නිවාස 04% ක් පමණ ප්‍රතිශතයක් පවතී. තවද, අඩු පහසුකම්වලින් යුක්ත ජනාවාස 37ක් තුළ නිවාස ඒකක 2,176 ක් ඇති බවට හඳුනාගෙන ඇති අතර පිටකන්ද ග්‍රාම නිලධාරී වසම තුළ එවැනි නිවාස 11ක්ද, පූර්ණවත්ත බටහිර නිවාස 23 ක්ද, සුදුහුම්පල නැගෙනහිර නිවාස 11ක්ද, අම්පිටිය දකුණෙහි නිවාස 11ක්ද ව්‍යාප්තව පවතින අතර පේලි නිවාස ව්‍යාප්තියද තරමක් දුරට මහ නගර සභා බල ප්‍රදේශය තුළ දැකගත හැකිය. නිත්තවෙල එවැනි නිවාස 46ක්ද, පූර්ණවත්ත බටහිර නිවාස 195ක්ද, දෙයියන්වෙල නිවාස 42ක්ද, හීරැස්සගල නිවාස 200ක්ද ව්‍යාප්තව පවතී. (ඇමුණුම 13)

අධ්‍යයන කලාපයෙහි නිවාස ඝණත්වය හෙක්ටයාරයට නිවාස ඒකක 04ක් පමණ වන අතර වැඩි නිවාස ඝණත්වයක් මහනුවර මහ නගර සභා සීමාවෙහි දක්නට ලැබේ. මහනුවර මහ නගර සභා

බල ප්‍රදේශයෙහි නිවාස ඝණත්වය හෙක්ටයාරයකට නිවාස 09ක් පමණ අගයක් ගනී. ප්‍රදේශයේ අඩුම නේවාසික ඝණත්වයක් මල්වත්ත ග්‍රාම නිලධාරි වසම තුළ පවතින අතර එය හෙක්ටයාරයකට නිවාස 02 කි. පේරාදෙණිය උද්භිත උද්‍යානය සඳහා ග්‍රාම නිලධාරි වසමෙන් අක්කර 40ක් ප්‍රමාණයක් භාවිතා කිරීමත්, පේරාදෙණිය විශ්ව විද්‍යාලය දන්ත සායනය, පේරාදෙණිය ශික්ෂණ රෝහල සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික කාර්යාල, පාසල්, පොලිසිය මෙම ප්‍රදේශය තුළ ස්ථානගත වී තිබීම මෙයට විශේෂිත හේතුව වී ඇත. පුර්ණවත්ත බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හෙක්ටයාරයකට 96 ක් තරම් වු ඉතා ඉහළ අගයක නිවාස ඝණත්වයක් දක්නට ඇති අතර මහ නගර සභා කම්කරුවන් සඳහා නිවාස ලබාදීමත් සමඟ අඩු ආදායම් ලාභි පවුල් වැඩි වශයෙන් මෙම වසම තුළ පදිංචි වීමත් හේතුවෙන් මෙම ප්‍රදේශයේ ජන ඝණත්වය සීග්‍රයෙන් වර්ධනය වීමට හේතු වී ඇත. (ඇමුණුම 14)

2015 වර්ෂයේදී දළ දේශිය නිෂ්පාදනය සඳහා මධ්‍යම පළාතේ දායකත්වය 10.3% වන අතර එය සියලු පළාත් අතුරින් 04 වැනි ස්ථානය ගනු ලබයි. කෘෂිකාර්මික අංශයෙන් 13.8%ක්ද, කර්මාන්ත අංශයෙන් 7.9%ක්ද, සේවා අංශයෙන් 11.0%ක්ද ජාතික දළ දේශීය නිෂ්පාදන සඳහා දායකත්වය සපයනු ලැබේ. ඒ අනුව පළාත්ගත දළ දේශීය නිෂ්පාදනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයෙන් කෘෂිකාර්මික අංශය සඳහා 5.5%ක්ද, කර්මාන්ත අංශය සඳහා 22.8%ක්ද සේවා අංශය සඳහා 71.6%ක්ද දායකත්වය සපයනු ලබන බව පුරෝකථනය කළ හැකිය.

ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය 51.6%ක් පමණ වන අතර අධ්‍යයන කලාපය තුළ එය 47.4%ක් පමණ වේ. ඉන් 92.7%ක් පමණ රැකියා නියුක්තිකයන්ද ,7.3%ක් පමණ රැකියා වියුක්තිකයන්ද වන අතර මෙම ප්‍රදේශයෙහි විරැකියා අනුපාතිකය 7.3%ක පමණ අගයක් ගනී. ඒ අනුව මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජනගහනය මුළු ජනගහනයෙන් 46.9%ක ප්‍රමාණයක් වන අතර ඉන් විරැකියාවෙන් පෙලෙන ප්‍රමාණය ඉවත්කළ විට ආර්ථික වශයෙන් ක්‍රියාකාරී රැකියා නියුක්ත ප්‍රමාණය මුළු ජනගහනයෙන් 43.9%ක් පමණ වේ.

අධ්‍යයනය කලාපය අතුරින් මහනුවර මහ නගරසභා බල ප්‍රදේශය තුළ ආර්ථික/ වාණිජ/සේවා කාර්යයන් ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී ඇති අතර මහනුවර මහ නගර සභාවෙහි ආදායම් මාර්ග අතරින් ජලය සැපයීමෙන් ලබන ආදායම (14.0%) හැරුණු විට ප්‍රධානම ආදායම් මාර්ගය වරිපනම් බදු ආදායමයි. 2017 අයවැය ලේඛණයට අනුව එය 10.5%කි. 325,000 ක් පමණ වන දෛනික සංසරණ ජනගහනයට සේවා සැපයීම සඳහා අධ්‍යාපන, සෞඛ්‍ය, පරිපාලන හා ආගමික ස්ථාන නගර තුළ ව්‍යාප්ත වී පවතින අතර නගර මධ්‍යය කලාපය මහනුවර සිට පේරාදෙණිය දක්වාත්, මහනුවර සිට කටුගස්තොට දක්වාත් කටුගස්තොට නගරය ආශ්‍රිතව වාණිජ කාර්යයන් බහුලව ව්‍යාප්ත වී ඇත.

අධ්‍යයන කලාපය තුළද සංචාරක ආකර්ෂණීය ස්ථාන බහුල ලෙස පිහිටා ඇති අතර මහනුවර මහ නගරසභා බල ප්‍රදේශය ප්‍රධාන සංචාරක මධ්‍යස්ථාන ලෙස විශේෂයෙන් හඳුන්වාදිය හැකි ය. සමස්ත ලෝක වාසී බෞද්ධයන්ගේ ගෞරවයට හා පූජනීයත්වයට පාත්‍ර වූ ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ වැඩ සිටීම එයට ප්‍රධානතම හේතුව වන අතර සමස්තයක් ලෙස විදේශීය සංචාරකයන්ගෙන් 90% කට අධික ප්‍රමාණයක් එක් රාත්‍රියක් හෝ ගත කිරීම සඳහා මහනුවර නගරය වෙත පැමිණීම අනිවාර්යය වේ.

මහනුවර දළදා මාළිගාව ආශ්‍රිත ප්‍රදේශය හැරුණු විට පේරාදෙණිය උද්භිද උද්‍යානයද සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකාරී ස්ථානයක් ගනු ලබන අතර 2014 වර්ෂයේදී පමණක් මහනුවර ජාතික කෞතුකාගාරයේ සහ පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ආදායම පිළිවෙලින් රු.23,139ක් හා මිලියන 392,508ක් පමණ වේ. 2016 වර්ෂයේ වාර්ෂික සංචාරක සංඛ්‍යා ලේඛන දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගෙන් මහනුවර නගරය නරඹන්නට පැමිණ නගරය තුළ රැඳීමේ ප්‍රමාණය 77.47%ක පමණ අගයක් ගනු ලබයි. ශ්‍රී ලංකාවෙහි සංචාරකයන් විසින් රෑය ගත කිරීමේ ප්‍රමාණයෙන් පූජා නගරවල සංචාරකයන් රෑය ගතකිරීමේ ප්‍රමාණය 75.24% පමණ වන අතර මහනුවර නගරය තුළ පවතින හෝටල් වල විදේශීය සංචාරකයන් රෑය ගත කිරීමේ ප්‍රමාණය ඉන් 44.3%ක් ද, දේශීය සංචාරකයන් රෑය ගත කිරීමේ ප්‍රමාණය ඉන් 34.5%ක් ද වේ. එය සැලකිය යුතු මට්ටමක පැවතීම නගරය වෙත හිමි වී ඇති ශක්තියක් ලෙස හඳුනාගත හැකිය.

මහනුවර නගරය තුළ 334ක් පමණ හෝටල් ප්‍රමාණයක් ව්‍යාප්තව පවතින අතර කාමර 18,510ට ආසන්න සංඛ්‍යාවක් ඉන් සපයනු ලැබේ. නමුත් දැනට මහනුවර නගරය වෙත පැමිණෙන සංචාරකයින් නගරය තුළ එක් දිනක් හෝ අවම වශයෙන් රඳවා ගැනීමට හෝටල් හෝ වෙනත් සංචාරක කාමර 850කට වැඩි ප්‍රමාණයක අවශ්‍යතාවයක් පවතී.

අධ්‍යයන කලාපය තුළ ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, මහනුවර මහ නගර සභාව, එම ප්‍රදේශයන්හි නගර සභා, ප්‍රාදේශීය සභා හා ප්‍රජා ජල මණ්ඩලය මඟින් ජලය සපයනු ලැබේ. මෙම ප්‍රදේශය තුළ ජල යෝජනා ක්‍රමයන් 12ක් පමණ ක්‍රියාත්මක වන අතර ජල පිරිපහදු මධ්‍යස්ථාන 22ක් ස්ථාපිත කොට ඇත. දිනකට ජලය ඝණ ලීටර් 129,820ක් පමණ නිෂ්පාදනය කරනු ලබන අතර එමඟින් 76%ක පමණ ජනතාවකගේ දෛනික ජල අවශ්‍යතාවන් සම්පූර්ණ කරනු ලැබේ. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා පානීය ජල සම්පාදනය මහනුවර මහ නගරසභාව මඟින් පමණක් සිදුකරන ලබයි. ජල සම්පාදන ක්‍රියාවලිය සිදුකිරීම සඳහා මහවැලි ගඟ, රොස්නික් ජලාශය හා දුණුමඩලාව වැව ආදී ජල මූලාශ්‍රයන් මඟින් ජලය ලබා ගන්නා අතර දිනකට ජලය ඝණ මීටර් 36,000ක් පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලැබේ. ගැටඹේ හා වේල්ස්පාර්ක් යන ජල පවිත්‍රාගාර 02 මඟින් පිරිපහදු කරනු ලබන එම ජලය සමස්ත ජල සම්බන්ධතාවයන් ගෙන් 80.6%ක් නේවාසික අවශ්‍යතා සඳහා ද, ජල සම්බන්ධතාවයෙන් 17.1%ක් වාණිජ අවශ්‍යතා භාවිතයන් සඳහා ද ලබාදී ඇති අතර, 0.035%ක් තරම් ඉතා අඩු

ප්‍රමාණයක් කර්මාන්ත සඳහාද ලබා දී ඇත. සමස්ත ජල පරිභෝජනයෙන් 67%ක් තරම් ඉහළ ප්‍රතිශතයක් නේවාසික කටයුතු සඳහාද, 23%ක ප්‍රමාණයක් වාණිජ ක්‍රියාකාරකම් සඳහා ද, 0.03%ක ප්‍රමාණයක් කර්මාන්ත සඳහා ද භාවිතා වන අතර, රජයේ ආයතන 315 ක් සඳහා දිනකට ජලය ඝණ මීටර් 3,642 හෙවත් සමස්ත ජල පරිභෝජනයෙන් 7.76%ක් භාවිතා කෙරේ. නගර සභාව සතු ඝණ මීටර් 36,000ක ධාරිතාවය ප්‍රමාණවත් නොවන බැවින් දෛනිකව ජලය ඝණ මීටර් 10,000 -12,000ක් අතර ප්‍රමාණයක් ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මඟින් මිල දී ගනී.

ජාතික විදුලි බල පද්ධතියේ කිරිබත්කුඹුර හා පොල්ගොල්ල උපපොළ මඟින් මෙගාවොට් 50 ධාරිතාවයක් ලබා ගෙන මෘදු උපපොළ 16 ක් හා ප්‍රාථමික උපපොළ 03ක් උපයෝගී කරගෙන යටිපහන් (භූගත) තාරාපැති 180ක් හා උඩු පහන් (මතුපිට) තාරාපැති 10ක් මඟින් මහනුවර නගරය තුළ විදුලි බල සම්පාදන ක්‍රියාවලිය සිදු කරනු ලැබේ. විදුලි සම්බන්ධතා සංඛ්‍යාවෙන් 80.96%ක් ගෘහ ඒකක සඳහාද, 18%ක් වාණිජ ඒකක සඳහාද ලබා දී ඇති අතර විදුලිබල ධාරිතාවයන්ගෙන් 75%ක් පමණ ධාරිතාවයක් වැය කරමින් සමස්ත නාගරික බල ප්‍රදේශය සඳහා විදුලිය ලබා දී ඇති අතර ඉතිරි 25%ක ධාරිතාවක් භාවිතා කරමින් තව දුරටත් නව සම්බන්ධතාවයන් ලබා දීමේ හැකියාව ඇත.

අධ්‍යයන කළාපය තුළ දිස්ත්‍රික් රෝහල් 22ක්ද, මූලික රෝහල් 1ක්ද, ග්‍රාමීය රෝහල් 1ක්ද පවතී. ඒ අනුව සෞඛ්‍ය අංශයෙහි කේන්ද්‍රස්ථානය ලෙස මහනුවර නාගරික ප්‍රදේශය හැඳින්විය හැකි අතර මහ නගර සභා බල ප්‍රදේශය තුළ මහනුවර මහ රෝහල, පේරාදෙණිය ශික්ෂණ රෝහල, පේරාදෙණිය ළමා රෝහල, පේරාදෙණිය දන්ත රෝහල, මහනුවර ළය රෝහල, කටුගස්තොට ප්‍රාදේශීය රෝහල හා මහජන සෞඛ්‍ය නිලධාරි කාර්යාලය - මහ නගර සභාව ආදී ස්ථාන මඟින් සිදු කරනු ලැබේ. අයුර්වේද අංශය මඟින් නාගරික බල ප්‍රදේශය තුළ ආයුර්වේද මධ්‍යස්ථාන 14ක ප්‍රමාණයක් පවත්වාගෙන යන අතර, ඒ මඟින් ජනතාවට සේවාවන් ලබාදෙනු ලැබේ. සායන වර්ග 52ක් පමණ මහනුවර මහ රෝහලේ පවත්වනු ලබන අතර, ඒ සඳහා සායන 11,333ක පමණ ප්‍රමාණයක් වර්ෂය පුරා පවත්වනු ලැබේ. මේ සඳහා සහභාගි වී ඇති රෝගීන් ප්‍රමාණය වර්ෂ 2014 දී 915,000ක් පමණ වන අතර දැඩි සත්කාර ඒකක 13ක්, ශල්‍යාගාර 25ක් හදිසි ප්‍රතිකාර ඒකකයක් යන සේවාවන්ට අමතරව රසායනගාර පහසුකම්, ඊ.සී.ජී., X කිරණ සේවා පහසුකම්, MRI පහසුකම් වැනි පහසුකම් සියල්ලෙන්ම සමන්විත රෝහලක් ලෙස මහනුවර මහ රෝහල හඳුන්වා දිය හැකි වේ. මහනුවර මහ රෝහල ලංකාවේ දෙවන ස්ථානයේ පවතින බැවින් මෙම සියලු පහසුකම් වලින් පරිපූර්ණ වන අතර මෙහි බාහිර රෝගීන් 2017 වර්ෂයේදී ලක්ෂ 04ක් හා නේවාසික රෝගීන් ලක්ෂ 02කට ආසන්න ප්‍රමාණයක් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගෙන ඇත.

වර්ෂ 2014 දී අධ්‍යයන කලාපය තුළ 342ක් පමණ පාසැල් සංඛ්‍යාවක් පවතින අතර එහි 184,600කට ආසන්න ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබයි. ඉන් මහනුවර නගරය තුළ ප්‍රධාන

වශයෙන් රජයේ පාසැල් 41ක් පවතින අතර 65,076ක් පමණ ශිෂ්‍යයන් සංඛ්‍යාවක්ද 3,177ක් පමණ ගුරුවරුන් සංඛ්‍යාවක්ද සිටී. මෙම පාසැල් සංඛ්‍යාවෙන් ජාතික පාසැල් 06ක් හා පළාත් සභා පාසැල් 35ක් පමණ වේ. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ගුරු ශිෂ්‍ය ප්‍රමිති අනුපාතය 1:28 වන අතර මහනුවර නගරයේ සමස්ත පාසල්වල තත්වය සැලකීමේදී ගුරු ශිෂ්‍ය අනුපාතය 1:20 මට්ටමක පවතින බව පැහැදිලි වේ. තවද, අර්ධ රාජ්‍ය පාසැල් 07ක්ද, පෙර පාසැල් 28ක්ද, ජාත්‍යන්තර පාසැල් 09ක්ද, වෘත්තිය පුහුණු ආයතන 21ක්ද පමණ මහනුවර නගරය තුළ පවතින අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයට සුවිශේෂී ස්ථානයක් උසස් අධ්‍යාපන අංශය අතින් හිමිවී ඇත.

නගර සභා බල ප්‍රදේශය තුළ බ්‍රිතාන්‍ය පාලන සමයේ සිට අභ්‍යන්තරව කාණු පද්ධතියක් පැවති බවට හඳුනාගත හැකිය. එවා උමං කාණු පද්ධති ලෙස පවතින අතර සෑම මාර්ගයකම කාණු නොමැති බවත් විශේෂයෙන් වැසි ජලය ගලා යාම සඳහා පවතින කාණු ප්‍රමාණවත් නොමැති බවත් ගැටලු ලෙස හඳුනාගත හැකිය. මහනුවර නගරය තුළ නුවර වැව මහවැලි ගඟ ඇතුලු අනෙකුත් ජල මූලාශ්‍ර අපජලය එකතුවීම හේතුවෙන් දූෂණය වෙමින් පවතින අතර විශේෂයෙන් නුවර වැව ඒ අතර ප්‍රධාන ස්ථානයක් ගනු ලබයි. (ඇමුණුම 15)

මහනුවර නගරය තුළ දැනට පූතික වලවල් වල ඒකරාශී වන මළ ද්‍රව්‍ය ගලී මඟින් ගොහාගොඩට බැහැර කරනු ලබන අතර දිනකට මීටර් කියුබ් 50 – 60ත් අතර ප්‍රමාණයක් ගලී මඟින් බැහැර කරනු ලබයි. එසේ බැහැර කරනු ලබන ද්‍රව්‍ය මාස 03ක් පමණ ප්‍රතිචක්‍රීකරණය වූ පසු එහි අප ජලය මුදා හැරීම සිදු කරනු ලබයි. මහනුවර මහ නගර සභාව මෙම කටයුතුවල නිරතව සිටින අතර නගරය තුළ පවතින අවශ්‍යතාවය අනුව ශ්‍රී ලංකා ජනරජයේ සහ ජපාන රජයේ ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් සපයනු ලබන මූල්‍ය ආධාර මත ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය සහ මහනුවර මහ නගර සභාව ඒකාබද්ධව මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිමේ මූලික වැඩ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර එය අධ්‍යයන කලාපයෙන් මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයෙහි කොටසක් පමණක් ආවරණය වේ. එමඟින් නාගරික භූමි ප්‍රදේශයෙහි හෙක්ටයාර් 733ක් පමණ ආවරණය වන පරිදි දෛනික සංක්‍රමණිකයන් 150,000ක් ද, අඩු පහසුකම් සහිත ප්‍රජාවට වැසිකිලි 512ක් ද, නිවැසියන් 55,000ක් ද ව්‍යාපාර හා ගොඩනැඟිලි 12,600ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර මෙම ව්‍යාපෘතිය මඟින් සම්පූර්ණ වශයෙන් ග්‍රාම නිලධාරි වසම් 10ක් සහ කොටස් වශයෙන් ග්‍රාම නිලධාරී වසම් 16ක්ද ආවරණය කරනු ලබයි. 2019 වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත අතර ගන්නොරුව පිහිටි පිරිපහදු ඒකකයෙන් ධාරිතාව ඝණ මීටර 14,000ක් පිරිපහදු කිරිමටද නියමිතය. (ඇමුණුම 16)

වර්ෂ 2017 වන විට ශ්‍රී ලංකාවේ දෛනිකව අපද්‍රව්‍ය ටොන් 8000ක් පමණ ඉවත දමනු ලබන අතර අධ්‍යයන කලාපය තුළ ටොන් 240ක පමණ ප්‍රමාණයක් ඉවත දමනු ලැබේ. මේ අතුරින් මහනුවර නගරය තුළ සාමාන්‍යයෙන් දිනකට ටොන් 150ක් පමණ ඒකරාශී වීම හඳුනාගත හැකිය. දිරාපත්

වන කසළ ප්‍රමාණය 88%ක් වන අතර, දිරාපත් නොවන කසළ ප්‍රමාණය 12%ක් පමණ ප්‍රමාණයකින් යුක්ත වේ. මහනුවර නගරය තුළ හෝටල් ආශ්‍රිතව වැඩි වශයෙන් අපද්‍රව්‍ය ප්‍රමාණයක් බැහැර වන බව පැහැදිලි වන අතර, එය 26.79%ක් පමණ වේ. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය කළාප 06කට බෙදා කුණු කසළ ඒකරාශී කිරීම සිදුකරනු ලබන අතර දිරාපත් වන ද්‍රව්‍ය දැනට කටුගස්තොට, ගොහාගොඩ පිහිටි අක්කර 32 ක් පමණ වන භූමියට බැහැර කරනු ලබයි. එම ද්‍රව්‍ය පස් දමා පිරවීම සිදු කරනු ලබන අතර මෙම ගැටලුව මඟ හරවා ගැනීමේ අරමුණ සහිතව විශේෂ ව්‍යාපෘතියක් මේ වන විට හඳුනාගෙන ඇතත් එමඟින් මෙගාවොට් 10ක විදුලිබල ධාරිතාවක් උත්පාදනය කිරීමට ද බලාපොරොත්තු වේ.

අධ්‍යයන කලාපය තුළ ගඟවට කෝරළේ, යටිනුවර, කුණ්ඩසාලේ, පාතහේවාහැට, හා තුම්පනේ ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල නායයාමේ අවධානම් තත්වයන් හඳුනාගත හැකිය. ඒ අනුව මහනුවර මහ නගර සභා සීමාව තුළ නායයෑම් සිදු වීමේ අවධානම් සහිත ස්ථාන, මධ්‍යස්ථ ප්‍රමාණයේ අවධානම් ස්ථාන හා අවධානම් රහිත ස්ථාන ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ගොඩනැඟිලි සංවිධානය මඟින් හඳුනාගෙන ඇත. දෙවන රාජසිංහ මාවත, මාපනාවතුර, මහයියාව, ධර්මපාල මාවත, ධර්මාශෝක මාවත, බහිරවකන්ද පාර, ටොපෑස්, හිල්ටොප් හෝටල් අවට ප්‍රදේශය, හිල්වුඩ් බාලිකා විද්‍යාලය, ධර්මරාජ පිරිමි විද්‍යාලය, විද්‍යාර්ථ පිරිමි විද්‍යාලය හා පුෂ්පදාන බාලිකා විද්‍යාලය යන ප්‍රදේශයන්හි නාය යෑම සිදුවිය හැකි බව හඳුනාගෙන ඇත. මෙම ස්ථානයන්ගෙන් ධර්මරාජ විද්‍යාලය, විද්‍යාර්ථ විද්‍යාලය හා හිල්වුඩ් විද්‍යාලය යන ස්ථාන වල නාය යෑම අවම කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීම දැනටමත් ආරම්භ කර ඇත. (ඇමුණුම 17)

අධ්‍යයන කලාපය තුළ යටිනුවර, පූජාපිටිය, අකුරණ හා මහනුවර මහ නගර සභා සීමාව තුළ හදිසි ජල ගැලීමේ තත්වයන් හඳුනාගත හැකිය. වර්ෂා කාලය තුළ හදිසි ජල ගැලීම් තත්වයක් (Flash Flood) මහනුවර මහ නගර සභා සීමාව තුළ ස්ථාන කිහිපයක දක්නට ඇති අතර මහනුවර - කටුගස්තොට මාර්ගයේ මහයියාව ප්‍රදේශය, මහනුවර දුම්රියපොළ අවට ප්‍රදේශය සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කිංස්වුඩ් පිරිමි විද්‍යාලය සහ සීතාදේවි බාලිකා විද්‍යාලය අවට ප්‍රදේශය හඳුනාගත හැකිය. මහවැලි ගඟෙහි ජල පෝෂකයන් ලෙස ගලා බසින ජල මාර්ග ආශ්‍රිතව අනවසර ඉදිකිරීම් හා එම ජල මාර්ගවලට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් ස්වභාවික ජල වාහක රටාවට බාධා පැමිණීම තුළින් හදිසි ජල ගැලීම් තත්වයන් ඉහළ යාමක් සිදු වේ.

අධ්‍යයන කලාපය තුළ 60.11%ක් පමණ ගෙවතුද, 9.83%ක් පමණ කුඹුරුද, 7.32ක් පමණ තේ වතුද, 2.3%ක් පමණ ජල මූලාශ්‍ර ලෙසද හඳුනාගත හැකි අතර මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය හෙක්ටයාර් 2645කින් සමන්විත වන අතර හෙක්ටයාර් 2449.4ක ප්‍රමාණයක් හෙවත් මුළු භූමි ප්‍රමාණයෙන් 92.64%ක ප්‍රමාණයක් මේ වනවිට සංවර්ධන කාර්යයන් සඳහා යොදාගෙන ඇත. ඉතිරි ප්‍රමාණය වන මුළු භූමි ප්‍රමාණයෙන් 7.36%ක ප්‍රමාණයක් ජල මූලාශ්‍ර ,

වනාන්තර සහ කුඹුරු ඉඩම් ලෙස පවතී. මෙම ඉඩම් ප්‍රමාණය සංවර්ධන කාර්යයන් සඳහා යොදාගත නොහැකි අතර, පවතින තත්වයෙන්ම ආරක්ෂා කරගත යුතුය. (ඇමුණුම 18)

අධ්‍යයන කලාපයෙහි ඉඩම් වල වැඩි වටිනාකම මහනුවර මහනගර සහා සීමාව වෙත ලැබී ඇත. මහනුවර නගරයේ භූ විෂමතාවය අනුව ඉඩම් වටිනාකම තීරණය වන අතර, මහනුවර සීමා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති මහවැලි ගඟ, මහනුවර වැව, උඩවත්ත කැළේ, දළදා මාළිගාව, බහිරව කන්ද , හන්තාන කඳු පන්තිය යන සාධක ඉඩම්වල වටිනාකම කෙරෙහි සෘජුවම බලපා ඇත. ඊට අමතරව ලෝක උරුම නගරයක් වීම, අපරව්‍යුහ පහසුකම්වල ව්‍යාපෘතිය යන සාධක ද බලපා ඇත. පොදුවේ ඉඩම්වල වටිනාකම මිලියන 05 සිට මිලියන 06ට වැඩි අගය පරාසයක් තුළ ව්‍යාප්තව පවතින බැවින් ඉඩම්වල වටිනාකම අනුව ඉහළම වටිනාකමක් ගන්නා ප්‍රදේශ ලෙස මහනුවර දළදා වීදිය හඳුනාගත හැකි අතර එම ප්‍රදේශයෙහි පර්චසයක මිල මිලියන 10-11ත් අතර අගයක් ගනී. තවද ඩී.එස්. සේනානායක වීදිය, යටිනුවර වීදිය, කොටුගොඩැල්ල වීදිය ආශ්‍රිත ප්‍රදේශයන්හි පර්චස් එකක මිල මිලියන 07ත් 09ත් අතර අගයක් ගන්නා අතර මහනුවර වැව රවුම ප්‍රදේශය පර්චසයක මිල මිලියන 05- 06ත් අතර අගයක් ගනී.

මහනුවර නාගරික බල ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 2645ක් පමණ වන අතර එයින් හෙක්ටයාර් 10.23ක හෙවත් 39%ක පමණ ප්‍රමාණයක් රජයේ ඉඩම් වේ. රජයේ ඉඩම්වල සංයුතිය ප්‍රධාන වශයෙන් මහනුවර මහ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් රජයේ පාසැල් සතු ඉඩම් ලෙස හඳුනාගත හැකිය. ආගමික සිද්ධස්ථානවලට අයත් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 101ක් හෙවත් 3.62% ක් පමණ වේ. මෙම හෙක්ටයාර් 101 තුළ මහනුවර ශ්‍රී දළදා මාළිගාව, අස්ගිරිය, මල්වතු මහා විහාර, නාථ දේවාලය, කතරගම දේවාලය ඇතුලු අනෙකුත් දේවාල සහ අනෙකුත් රජමහා විහාර සතු ඉඩම්ද ඊට අයත් වේ.

අධ්‍යයන කලාපය මුහුදු මට්ටමේ සිට මීටර් 500 – 600 ක සීමාව තුළ පිහිටා ඇති අතර වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය $24^{0}C$ - $25^{0}C$ක් වැනි අගය පරාසයක් තුළ පිහිටා ඇත. මෙම ප්‍රදේශය මධ්‍යම නිවර්තන වැසි වනාන්තර කලාපයට අයත්වන අතර, වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 14000 – 17000 ක ඉහළ මට්ටම් පරාසයක පවතී. නිරිත දිග මෝසම් සුළං (මැයි - සැප්තැම්බර්) හා ඊසාන දිග මෝසම් සුළං (නොවැම්බර් - ජනවාරි) මඟින් සහ අන්තර් මෝසම් වැසි (අප්‍රේල්) ලෙස වර්ෂය පුරා වර්ෂාපතනය ලැබේ.

ජල විද්‍යාව හා භූරූපණ විද්‍යාවන් සැලකීමේදී ජල මූලාශ්‍ර සහ භූ රූපණ ලක්ෂණයන් එකිනෙකට සම්බන්ධ වීමෙන් අධ්‍යයන කලාපය තුළ පාරිසරික තත්වයන් නිර්මාණය වී ඇත. මෙම කලාපය තුළ වික්ටෝරියා ජලාශය මෙන්ම පොල්ගොල්ල වේල්ල පිහිටා ඇති අතර එමඟින් ජල විදුලි

උත්පාදනයට මහඟු සේවාවක් ඉටු කරනු ලැබේ. මහවැලි ගඟ පෝෂණය කිරීම හාලි ඇළ, හාලි ඇළ නිම්නයන්ද, මැද ඇළ, මැද ඇළ නිම්නයෙන්ද, හීන් පැන්කඳුර ඇළ , හීන්පැන් කඳුර නිම්නයෙන්ද මහවැලි ගඟ හා මනාව සම්බන්ධ වේ. මෙම ජල මූලාශ්‍රයන් පෝෂණය කිරීම සඳහා උඩවත්ත කැලය, වාකරවත්ත වානාන්තරය ඉවහල් වී ඇත. නිම්නයන් සහ කඳු මුදුන්වලින් සමන්විත මහනුවර නගරය හරිත ආවරණයන් තුළින් මෙන්ම ස්වභාවික ජල මාර්ග රටාව තුළින්ද එහි අලංකාරය තවත් වැඩිදියුණු කරයි. (ඇමුණුම 19)

## 2.3. සැලසුම් මායිම් නිර්ණය කර ගැනීම

මෙම සංවර්ධන සැලැස්මට අදාල සීමා නිර්ණය කිරීමේදී පහත සඳහන් අංශ පදනම් කර ගන්නා ලදී.

### 2.3.1. ක්‍රියාකාරීත්ව ප්‍රදේශයේ සීමාවන්

ප්‍රධාන පාසැල්, වෛද්‍ය සේවා, පරිපාලන සංකීර්ණ, විශ්ව විද්‍යාල හා සංචාරක ආකර්ෂණීය ස්ථාන නාගරික බල ප්‍රදේශය තුළ කේන්ද්‍රගතව පැවතීමෙන් දිනට 325,000ක පමණ ජන ප්‍රමාණයක් විවිධ කටයුතු සඳහා අවට ප්‍රදේශ වලින් මහනුවර නගරය වෙත පැමිණෙන බැවින් එම ප්‍රදේශය මහනුවර නගරයෙන් සේවා ලබා ගනු ලබන ජලාධාර ප්‍රදේශය (Catchment) ලෙසද වැඩි දුරටත් හඳුනාගත හැකිය.

මහනුවර නාගරික බල ප්‍රදේශය කේන්ද්‍ර කර ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක් පමණ වූ ප්‍රදේශයක් පුරා එම ජලාධාර ප්‍රදේශය (Catchment) ව්‍යාප්ත වන අතර එම ප්‍රදේශයේ තොරතුරු ආශ්‍රයෙන් සිදු කරනු ලැබූ සංවර්ධන පීඩක විශ්ලේෂණයට (Development Pressure Analysis) අනුව මහනුවර නගරයට ප්‍රවේශ වන ප්‍රධාන මාර්ග දෙපස එනම් කඩුගන්නාව සිට පිළිමතලාව හා පේරාදෙණිය ඔස්සේ මහනුවර දක්වාද, ගම්පොල සිට පේරාදෙණිය ඔස්සේ මහනුවර දක්වාද, දිගන සිට පල්ලෙකැලේ ඔස්සේ මහනුවර දක්වාද, ගලගෙදර සිට හැදෙණිය හා කටුගස්තොට ඔස්සේ මහනුවර දක්වාද, අකුරණ සිට කටුගස්තොට ඔස්සේ මහනුවර දක්වාද යන ප්‍රධාන මාර්ග දෙපස නාගරික ක්‍රියාකාරකම් බහුල ප්‍රදේශ ලෙස තවදුරටත් එම විශ්ලේෂණයන් හඳුනාගන්නා ලදී. (ඇමුණුම 20)

මේ හේතුවෙන් නගර මධ්‍යයේ ප්‍රධාන වශයෙන් නේවාසික නොවන ඉදිකිරීම් සඳහා වැඩි නැඹුරුතාවයක් පවතින අතර නේවාසික කාර්යයන් හා නාගරික ක්‍රියාකාරකම් මහනුවර නගරයෙන් ඔබ්බට එනම් කුණ්ඩසාලේ, ගඟවටකෝරළේ, පේරාදෙණිය ආදී ප්‍රදේශ පුරාත් ඓතිහාසික හා පාරිසරික වටිනාකමක් සහිත කඳුකර ප්‍රදේශ වලටත් ව්‍යාප්ත වීමේ වැඩි නැඹුරුවක් පවතින බව එම විශ්ලේෂණයෙන් වැඩි දුරටත් අනාවරණය වේ.

ඒ අනුව මහනුවර නාගරික කලාපයේ ක්‍රියාකාරීත්ව සීමාවන් මහනුවර මහ නගර සභා සීමාවට පමණක් සීමා නොවන අතර එය එම සීමාවෙන් ඔබ්බට ව්‍යාප්ත වී ඇති බව වැඩි දුරටත් හඳුනා ගත හැකිය.

### 2.3.2. භූගෝලීය සීමාවන්

ප්‍රධාන මාර්ගයන් ඔස්සේ මහනුවර නගරය වෙත ප්‍රවේශ වීමේදී එම මාර්ග ඔස්සේ වැටී ඇති ගලගෙදර, බලකඩුව, උඩුදුම්බර හා කඩුගන්නාව යන ප්‍රදේශ පසුකරත්ම වංගු හා බෑවුම් සහිත මාර්ග හා සුන්දර කඳුකර දර්ශනයන්ගෙන් අනූන වටපිටාව මහනුවර නගරයෙහි මංසලකුණු ලෙස හඳුනාගත හැකිය.

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයෙහි 1/3ක සීමාවක් දකුණු දෙසින් හන්තාන කන්ද හා එහි රක්ෂිතයටද මෙන්ම වාකරවත්ත රක්ෂිතයටද මායිම් වේ. අනෙත් 2/3ක සීමාව මහවැලි ගඟෙන් වට වී ඇති අතර මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය සුපැහැදිලි පාරිසරික හා භූගෝලීය සීමාවන්ගෙන් සීමා වී ඇත.

ප්‍රිම්රෝස්, බහිරවකන්ද හා උඩවත්ත කැලේ යන ස්වභාවික විභවතාවන් සහිත අනන්‍ය වූ භූ ලක්ෂණයන්ගෙන් හෙබි මහනුවර නාගරික ප්‍රදේශය අතිශය සංවේදී පාරිසරික සාධකයන්ගෙන් යුක්ත වන බැවින් පාරිසරික සංවේදීතා විශ්ලේෂණයක් සිදු කර ඒ අනුව සංවර්ධන කටයුතු සඳහා ඔබින භූමි වල සීමා මායිම් හඳුනා ගන්නා ලදී. (ඇමුණුම 21)

### 2.3.3. පරිපාලන සීමා මායිම්

නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙසටද මහනුවර නගරයේ පළාත් පාලන බල සීමාව ලෙසද නම් කොට ඇති මහනුවර මහ නගර සභා බල ප්‍රදේශ සීමාව මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (කොටසක්), හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (කොටසක්) හා පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (කොටසක්) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් සමන්විත වන සමස්ත ග්‍රාම නිලධාරී කොට්ඨාස 45කින්ද සමන්විත ප්‍රදේශයක් වේ.

මෙම සියලු කරුණු සැලකිල්ලට ගනිමින් මහනුවර මහ නගර සභා පළාත් පාලන ආයතනික සීමාව පරිපාලන සීමාව ලෙසත් මහනුවර නගර සංවර්ධන සැලැස්මෙහි සැලසුම් සීමාව ලෙසත් යොදා ගැනීමට සුදුසු බව තීරණය කරන ලදී.

*සිතියම් අංක 2. 2. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයෙහි පරිපාලන සීමා මායිම්*




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018

# සංවර්ධන සැලැස්ම් අවශ්‍යතාවය

# 3

# 3. සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

මහනුවර නගර සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම තුළින් අපේක්ෂිත අරමුණු වනුයේ වර්තමානය තුළ නගරයෙහි විද්‍යාමාන වන විභවතාවයන් හා අත්විඳිමින් පවතින ගැටලු හඳුනාගැනීම තුළින් නාගරික සංවර්ධනයේදී උද්ගතවන ගැටලු වලට උපායමාර්ගික විසඳුම් ලබාදීමත් අනාගත සංවර්ධනයන් මනා කළමණාකරණය කිරීමත් තුළින් ආර්ථික , සමාජයීය, පාරිසරික හා සංස්කෘතික යන සංරචකයන්ගේ ඒකාබද්ධතාවය සහිත උපාය මාර්ගික ව්‍යාපෘතීන් හා රෙගුලාසි සම්පාදනය කිරිමත්ය.

වර්තමානය තුළ පවතින විභවතාවයන් හා ගැටලු හඳුනාගැනීම සඳහා නගර නිර්මාණ වෘත්තිකයන් හා ප්‍රදේශයෙහි හඳුනා ගන්නා ලද පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම අරමුණු කරගනිමින් පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පවත්වන ලද අතර එහිදී සාකච්ඡාවට බඳුන්වූ කරුණු සැලකිල්ලට ගනිමින් මහනුවර නගරය තුළ පවතින ගැටලු හඳුනාගන්නා ලදී. පාර්ශවකරුවන් හා වෘත්තියවේදීන් විසින් ඔවුන් නියෝජනය කරනු ලබන විෂය පථයට අනුව ගැටලු කිහිපයක් හඳුනාගන්නා ලද අතර එකී ගැටලු ඩෙල්ෆි ක්‍රමවේදය (Delphi Technique) යොදා ගනිමින් වඩාත් සැලකිය යුතු හා සංවර්ධන ගැටලු ප්‍රමුඛතාකරණය කරන ලදී. (ඇමුණුම 22)

එලෙස හඳුනාගන්නා ලද ප්‍රමුඛතා ගැටලු වල සංදර්භය, විශාලත්වය හා වැදගත්කම යන අංශයන් යටතේ වැඩිදුර අධ්‍යයනයන් සිදු කරන ලදී.

මහනුවර රාජධානිය භූමි ප්‍රදේශයෙන් 2/3 ක ප්‍රමාණයක් මහවැලි ගඟ හා ඉතිරිව ඇති ප්‍රදේශය කඳු වළල්ලකින් සමන්විත වීම යන ස්වාභාවික ආරක්ෂාව පදනම් කරගනිමින් ස්ථාපනය කොට ඇති අතර පසුකාලීනව උඩරට රාජධානි සමයේදී සක්විති රජභවන යන සංකල්පය විද්‍යාමාන වන ලෙස වළාකුළු බැම්ම අතරින් දිස්වෙන දළදා මාළිගාව ඉදිකර ඇත. ශ්‍රී දළදා මාළිගාව හා අවට ප්‍රදේශය 1984 ජූනි මස 08 දිනැති අංක 301 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පූජනීය ප්‍රදේශයක් ලෙසට ප්‍රකාශයට පත්කර ඇති අතර ඉන් අනතුරුව 2001 නොවැම්බර් මස 08 දිනැති අංක 1209/19 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම මාළිගා පරිශ්‍රයේ සීමාවන් තව දුරටත් පුළුල් කර ඇත. තවද UNESCO සංවිධානය විසින් 1988 වර්ෂයේදී ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රය හා කන්ද උඩරට සුවිශේෂී වූ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ උරුමය සිහිගන්වන ගොඩනැගිලි සහ ව්‍යුහයන්ගෙන් සමන්විත ඓතිහාසික හා ගෘහ නිර්මාණාත්මක වටිනාකම් වලින් යුත් ගොඩනැගිලි 490 ක් ලෝක උරුම ස්මාරක ලෙසට ප්‍රකාශයට පත්කර ඇත. ලෝක උරුම ගොඩනැඟිලි ලෙස නම් කරන ලද ගොඩනැඟිලි 490න් 387හෙවත් 79%ක් පූජා භූමි කලාපය තුළ එනම් නගර මධ්‍ය තුළ ස්ථාපිතව පවතී. නාගරික සංවර්ධන අධිකාරිය මධ්‍යම පළාත් කාර්යාලය මඟින් 2017 වර්ෂයේදී දියත් කරනු ලැබූ ලෝක උරුම ගොඩනැඟිලි පිළිබඳ

සමීක්ෂණයට අනුව 40%ක් පමණ ගොඩනැඟිලි වර්තමානය වන විට ඒවායේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති බවටත් 60%ක් පමණ ගොඩනැඟිලි වල කොටසක් පමණක් විනාශ වී ඇති බවටත් අනාවරණය කර ගන්නා ලදී.

එම ගොඩනැඟිලි නිසි ප්‍රමිතියකින් යුතුව අලුත් වැඩියා කටයුතු සිදු නොකිරීම, නඩත්තු නොකිරීම එකී ගොඩනැඟිලි වල ඊට ආවේණික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගුණාංග හීනවී යාම ආදී දෑ මෙම පරිහානියට හේතු පාදකවී ඇති අතර ඇතැම් ලෝක උරුම ගොඩනැඟිලි වල උඩුමහලේ ක්‍රියාකාරිත්වයක් නොවීම, අවිධිමත් වර්ණ භාවිතය , අවිධිමත් ගොඩනැඟිලි අමුද්‍රව්‍ය භාවිතය හා අවිධිමත් දැන්වීම් පුවරු භාවිතය හේතුවෙන් ලෝක උරුම නගරයෙහි පෙර පැවති අනන්‍යතාවය පරිහානියට පත්වීම තවදුරටත් සිදුවී ඇත.

*රූප අංක 3. 1. ලෝක උරුම ගොඩනැගිලි ආශ්‍රිත ගැටලු*

උඩුමහලේ ක්‍රියාකාරිත්වයක් නොවීම




අළුත් වැඩියා කටයුතු සිදු නොකිරීම




අවිධිමත් දැන්වීම් පුවරු භාවිතය




අවිධිමත් වර්ණ භාවිතය



අවිධිමත් ගොඩනැගිලි අමුද්‍රව්‍ය භාවිතය




නිසි නඩත්තුවක් නොකිරීම



*මූලාශ්‍රය: ලෝක උරුම ගොඩනැගිලි පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය-මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2018*

පූජා භූමි කලාපය තුළ මෙම ගොඩනැගිලි විදී 09ක් පුරා ව්‍යාප්තව පවතින අතර එයින් කොළඹ විදියෙහි ගොඩනැගිලි 80%ක් පමණ, කොටුගොඩැල්ල වීදියෙහි ගොඩනැගිලි 73%ක් පමණ, යටිනුවර වීදියෙහි ගොඩනැගිලි 66%ක් පමණ, කන්දේ වීදියෙහි ගොඩනැගිලි 60%ක් පමණ හා හරස් විදියෙහි ගොඩනැගිලි 92%ක් පමණ ආදී වශයෙන් ඒවායේ ව්‍යුහයන්ගේ හා ඓතිහාසික හා ගෘහනිර්මාණාත්මක වටිනාකම පරිහානියට ලක්වී ඇති බව එම සමීක්ෂණය මඟින් තවදුරටත් අනාවරණය වී ඇත.

ලෝක උරුම ගොඩනැගිලි පමණක් වෙන්ව ගත්කල මහනුවර උරුමය ලෙස හඳුනාගත නොහැකි අතර එය ශ්‍රී දළදා මාළිගාව හා අවට පරිශ්‍රය මෙන්ම නීල හරිත වටපිටාවකින් අනූන කඳු පංතිය සහිත සෞම්‍ය දේශගුණයකින්ද සමන්විත වේ. නාගරික සංවර්ධනය හේතුවෙන් කඳු පංති වල ව්‍යාප්තව පවතින ගොඩනැගිලි නගර දර්ශනයට හානි ගෙන දීමත් කඳු පංති වල පවතින නීල හරිත බව ක්‍රමයෙන් ක්ෂයවීමත් තවදුරටත් සිදු වෙමින් පවතී. තවද බෞද්ධයාගේ මුදුන්මල්කඩ බඳු ශ්‍රී දළදා මාළිගාව හා අවට පරිසරය කාගේත් නෙතට රසඳුනකි, ශාන්තියකි. නමුත් අවිධිමත් සංවර්ධන ක්‍රියාකලාපයන් හේතුවෙන් ශ්‍රී දළදා මාළිගාව හා ඒ අවට පරිශ්‍රයහි පවතින පාරිසරික භූ දර්ශනය ක්‍රමයෙන් වියැකී යාම එහි ස්වකීය අනන්‍යතාවයට තර්ජනයක් වී ඇත. ඒ බව මහනුවර වැව වටා විහිදී ඇති කඳු පංතීන් මත ඉදිකර ඇති ගොඩනැගිලි මොනවට පැහැදිලි කරනු ලැබේ.

*රූප අංක 3. 2. මහනුවර වැව වටා විහිදී ඇති කඳු පන්තීන් මත ඉදිකර ඇති ගොඩනැඟිලි*



*මූලාශ්‍රය: නගර දර්ශනය සඳහා පවතින ගැටලු අශ්‍රිතව සිදු කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය-මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2017*

ඒ අනුව **"කන්ද උඩරට උරුමයන්ගේ ප්‍රතිරූපය හීනවී යාම"** වර්තමානය තුළ මහනුවර දක්නට ඇති ප්‍රධානතම ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය.

එබැවින් දිනෙන් දින පැන නගින නාගරික සංවර්ධනයේ අභියෝග ක්‍රමවත් ලෙස කළමණාකරණය කිරීම තුළින් උරුමයන්ගේ ප්‍රතිරූපය ප්‍රතිස්ථාපනය කිරීම, සංචාරක ආකර්ෂණය වැඩි කිරීම හා මහනුවර නගරයෙහි ස්වකීය අනන්‍යතාවය ආරක්ෂා කිරීම ඉවහල්වනු ඇත.

මහනුවර නගරය තුළ ඊට ආවේණික ස්වභාවික පාරිසරික සංඝටකයන්ගෙන් යුක්ත වන අනූන නිර්මාණයකි. උඩවත්ත රක්ෂිතය හා වාකරාවත්ත ආදී ස්වාභාවික වනාන්තර නගරයෙහි ස්වාභාවික ජෛව විවිධත්ව ගුණාංග වලින් පොහොසත් කිරීමට සමත් වී ඇති අතර හෙක්ටයාර් 28ක් පමණ ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව පවතින මෙම වනාන්තර සමස්ත භූමියෙන් 11%ක් පමණ අගයක් ගනී. මහනුවර නගර සීමාවෙන් 2/3 ක පමණ ප්‍රමාණයක් මහවැලි ගංගාවෙන් වටවී ඇති අතර එය මහනුවර නගරයෙහි පවතින ප්‍රධානතම ජලජ සම්පත වේ. මුහුදු මට්ටමේ සිට මීටර් 500 – 600ත් අතර ප්‍රදේශයක් තුළ නගරයෙහි භූ විෂමතාවය ව්‍යාප්තව ඇති අතර ඉහළ කඳු මුදුන් වලින් ආරම්භ වී ගලා බසින හාලි ඇළ, දුනුමඩලාව ඇළ, දෙනිය ඇළ, මැද ඇළ, හල් ඔය,පිඟා ඔය ආදී ජලජ මූලාශ්‍ර තවදුරටත් නගරය වටා ගලා බසින මහවැලි ගඟ පෝෂණය කරනවා සේම පාරිසරික සමතුලිතතාවය රැක ගැනීමටද ඉවහල් වේ.

නමුත් වර්තමානය වන විට නාගරිකරණය වීම හා සංවර්ධනයේ ප්‍රගමනයන් හේතුවෙන් මහනුවර නගරය තුළ සිදුවෙමින් පවතින **"පාරිසරික හායනය"** අනෙක් ප්‍රධානතම ගැටලුව ලෙසට හඳුනාගත හැකිය. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී 93% ක් පමණ පැවති වෘක්ෂලතා සණත්වය නිදහසට පෙර යුගය වන විට 52%ක් දක්වා ක්‍රමයෙන් හීනවී ඇත. එය නිදහසින් පසු යුගය වන විට 35% දක්වා තවදුරටත් පහත වැටී ඇති අතර එය මහනුවර නගරයෙහි පාරිසරික සමතුලිතතාවයට දැඩි තර්ජනයක් වී ඇත.

*රූප අංක 3. 3. මහනුවර නගරය තුළ වෘක්ෂලතා සණත්වයෙහි විකාශනය*




මූලාශ්‍රය : මහනුවර නගර සංවර්ධන අධ්‍යයනය , නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව , මොරටුව විශ්වවිද්‍යාලය, 2014

සංවර්ධන ඉලක්ක පසුකරමින් නාගරීකරණය වන මහනුවර නගරය තුළ සංවර්ධන පීඩනය වැඩි අගයක් ගනු ලබන අතර (ඇමුණුම් 20) ඊට සාපේක්ෂව පාරිසරික සංවේදීතාවයද අඩු අගයක් ගනු ලබයි. (ඇමුණුම් 21)

මෙවැනි හේතූන් මත මහනුවර නගරය තුළ පාරිසරික හායනය දිනෙන් දින වර්ධනය වන ගැටලුවක් බවට පත්වී ඇති නමුත් ස්වාභාවික පරිසරයෙහි හා නිර්මිත පරිසරයෙහි සුසංයෝගයන් තුළින් පාරිසරික සංවේදීතාව ආරක්ෂා කර ගැනීම හරහා සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීමට මෙන්ම තිරසාර පාරිසරික පද්ධතියක් ස්ථාපිත කිරීමට හැකියාව පවතී.

මහනුවර නගරය ශ්‍රී ලංකාවේ දෙවන ප්‍රධානතම නගරය ලෙසට හැඳින්විය හැකි අතර මධ්‍යම පළාත තුළ ප්‍රධානතම අධ්‍යාපන, සෞඛ්‍ය හා පරිපාලන මධ්‍යස්ථානයක් ලෙසට සේවා

දායකත්වයක් සපයනු ලැබේ. ශ්‍රී දළදා මාළිගාව, ජනප්‍රිය පාසැල්, ජාතික මට්ටමේ රෝහල් මෙන්ම ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථාන රැසක්ම නගර මධ්‍ය තුළ ස්ථාපන වී තිබීම නිසාම නගරය වෙත 325,000කට ආසන්න දෛනික ජනගහනයක් සංක්‍රමණය වන බව 2014 වර්ෂයේදී සිදු කරනු ලැබූ රථවාහන අධ්‍යයනයට අනුව අනාවරණය වී ඇත.

ඒ අනුව 90000ක් (27.7%) පමණ ප්‍රමාණයක් රැකියා අවශ්‍යතාවයන් සඳහාත්, 63000ක් (19.4%) පමණ ප්‍රමාණයක් අධ්‍යාපන අවශ්‍යතාවයන් සඳහාත්, 7500ක් (2.3%) පමණ ප්‍රමාණයක් සෞඛ්‍ය අවශ්‍යතාවයන් සඳහාත්, 6000ක් (1.8%) පමණ ප්‍රමාණයක් ශ්‍රී දළදා මාළිගාව වන්දනාමාන කිරීම සඳහාත්, 2000ක් (0.6%) පමණ ප්‍රමාණයක් කච්චේරිය සඳහාත්, 25,000ක් (7.8%) පමණ ප්‍රමාණයක් පොදු වෙළඳපොලහි අවශ්‍යතාවයන් සඳහාත්, 2,500ක් (0.8%) පමණ ප්‍රමාණයක් KCC සඳහාත්, 129000ක් (39.6%) පමණ ප්‍රමාණයක් අනෙකුත් අවශ්‍යතාවයන් සඳහාත් මහනුවර නගරය වෙත පැමිණෙන බව වැඩිදුරටත් එම අධ්‍යයනයෙන් අනාවරණ කර ඇත.

දෛනිකව නගරය වෙත පැමිණෙන රථ වාහන ප්‍රමාණය 56000කට ආසන්න අගයක් ගන්නා අතර එයින් 6720 ක් (12%) පමණ ප්‍රමාණයක් වෑන් රථද, 5600ක් (10 %) පමණ ප්‍රමාණයක් බස් රථද, 7280ක් (13%) පමණ ප්‍රමාණයක් බඩු ප්‍රවාහනය කරන රථද, 36400ක් (65%) පමණ ප්‍රමාණයක් අනෙකුත් වාහන ලෙසද හඳුනා ගත හැකිය. ඒ අනුව නගරය වෙත සැලකිය යුතු ජනගහනයක් මෙන්ම රථවාහන ප්‍රමාණයක්ද පැමිණෙන බව අනාවරණය කර ගත හැකිය.

භූගෝලීය පිහිටීම මත මෙන්ම මාර්ග වල පවතින පටු බව හේතුවෙන් සතියේ දින වල මෙන්ම සති අන්ත දිනයන්හිදීද වැඩි රථ වාහන තද බදයක් පවතින බව අනාවරණය කර ගත හැකි අතර, මුදුනත් වේලාවන්හිදීද එය තව දුරටත් වැඩිමනාත්තව නගරය තුළ සිදුවෙමින් පවතී. පෙරවරු 6.45 සිට 9.30 දක්වා කාල පරාසය තුළ රථ වාහන වේගය පැයට කිලෝමීටර් 16.7ට අඩු මෙන්ම 25.7ට වැඩි වේග පරාසයන් තුළ ව්‍යාප්තව පවතී. ඒ අනුව වැව රවුම ප්‍රදේශය, කටුගස්තොට- මාතලේ මාර්ගය, ඩී.එස්. සේනානායක මාවතේ සිට මහායියාව දක්වා මාර්ගයන් තුළ මෙන්ම පරණ පේරාදෙණිය මාර්ගයේ උඩත් සීමාවෙහිද රථවාහන වේගය පැයට කිලෝමීටර් 16.7ට අඩු අගයක් ගනු ලැබේ.

පස්වරු 1.00 සිට 5.30 දක්වා කා ල පරාසය තුළද රථ වාහන වේගය පැයට කිලෝමීටර් 16.7ට අඩු මෙන්ම 25.7ට වැඩි වේග පරාසයන් තුළ ව්‍යාප්තව පවතී. ඒ අනුව පරණ පේරාදෙණිය මාර්ගයේ උඩත් සීමාවේ සිට මහායියාව දක්වා රථවාහන වේගය පැයට කිලෝමීටර් 16.7ට අඩු අගයක් ගනු ලැබේ. අනෙකුත් ප්‍රධාන මාර්ගයහි රථවාහන වේගය පැයට කිලෝමීටර් 16.7 සිට 25.7 දක්වා වේග පරාසයක් තුළ ව්‍යාප්තව පවති.

*රූප අංක 3. 4.මහනුවර නගර තුළ රථවාහන වේගය*




*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - මධ්‍යම පළාත් කාර්යාලය, 2017 (2014 වර්ෂයේ මහනුවර නගර ආශ්‍රිතව සිදු කරනු ලැබූ රථවාහන පිළිබඳ සමීක්ෂණයෙහි තොරතුරු ඇසුරෙන්)*

ඒ අනුව මනනුවර නගර තුළ අත්විඳිමින් පවතින අනෙකුත් ප්‍රධානතම ගැටලුව ලෙස **"රථවාහන තද බදය"** හඳුනාගත හැකි අතර ඒ හේතුවෙන් නගරයට පැමිණෙන්නන් මෙන්ම නගර තුළ ජීවත්වන හුදෙක් ජනී ජනයා දැඩි අපහසුතාවයකට ලක්ව පවතී. තවද දෛනික කාර්යයන් සිදු කර ගැනීමේදී ඇතිවන අපහසුතාවන් මෙන්ම සේවාවන් ලබා ගැනීමේදී කාර්යක්ෂමතාවයෙහි අඩු බවද නගරය තුළ කලබලකාරී මෙන්ම නොසන්සුන් වාතාවරණක් ඇති කිරීමට හේතු වී ඇත. භූගෝලීය පිහිටීම අතින් සුවිශේෂී මෙම නගරය තුළ දැඩි වේලාවක් රථ වාහන මාර්ගයන් තුළ රඳා පැවතීම හේතුවෙන් නගරය තුළ වායු දූෂණය වැඩි වීමටද වක්‍ර ආකාරයෙන් හේතු වන බව හඳුනාගත හැකිය.

එමෙන්ම සුමට ප්‍රවහනයක් ලබා දීම තුළින් මහනුවර නගරය වෙත පැමිණෙන දෙස් විදෙස් ජනයාට මෙන්ම නගරය තුළ ජීවත් වන ජනයාටද දෛනික කාර්යයන් කාර්යක්ෂම කරගැනීමට පිටු වහලක් වනවා සේම නගරය තුළ සුවපහසු වටපිටාවක් ඇති කිරීමටද හැකියාව ලැබේ.

මෙලෙස හඳුනා ගන්නා ලද ප්‍රධාන ගැටලු මහනුවර මහ නගර සහා බල ප්‍රදේශයෙහි සංවර්ධන කාර්යයන් සඳහා බලපෑම් සිදු කරනු ලබන අතර එම ගැටලු විධිමත් ලෙස විසඳීම සිදු නොවීම හේතුවෙන් තව දුරටත් එම ගැටලු ව්‍යාප්ත වීමට වැඩි ඉඩකඩක් පවතී. ශ්‍රී ලංකාවේ සියලුම ජල මූලාශ්‍රයන් ආරම්භ වන මධ්‍යම කඳුකරයෙහි අතිශය පරිසරික සංවේදී කලාපයක් තුළ මහනුවර නගරය පිහිටා ඇති අතර එම නගරය තුළ පාරිසරික ගැටලු උද්ගත වීම තුළින් රටෙහි අනෙකුත් ප්‍රදේශ වෙතද එය ව්‍යාප්ත වීමට වැඩි ඉඩකඩක් ඇත. එමෙන්ම මහනුවර නගරය තුළ ස්වකීය අනන්‍යතාවයක් සහිත සංස්කෘතික භූ දර්ශනය පරිහානියට පත්වීමෙන් මහනුවර නගරය වෙත හිමිවී ඇති සංචාරක ආකර්ෂණය අඩු වීමටද හේතු විය හැකි අතර එය මහනුවර නගරයෙහි මෙන්ම රටෙහි ආර්ථිකයටද බලපෑම් එල්ල විය හැකිය. එසේම විධිමත් යටිතල පහසුකම් පද්ධතියක් නොතිබීම හේතුවෙන් නගරය භාවිතා කරන්නන් මෙන්ම නගරය වෙත පැමිණෙන්නන් හටද අපහසුතා සිදුවිය හැකි අතර මහජන හිතකාමී නගරයක් නොවීමටද එය හේතු විය හැකිය.

මෙම ගැටලු විසඳීම මඟින් මහනුවර මහ නගර සහා බල ප්‍රදේශයෙහි භෞතික, සාමාජයීය, ආර්ථික, සංස්කෘතික හා පාරිසරික යන අංශයන්ගෙන් අනූන නගරයක් බවට පත් කර ගත හැකි අතර ඒ තුළින් **"කන්ද උඩරට තේජාන්විත අග නගරය"** යන දැක්ම වෙත ලඟා විය හැකිය.



# 2

## කොටස

# සංවර්ධන සැලසුම් රාමුව

# 4

# 4. සංවර්ධන සැලැසුම් රාමුව

## 4.1. දැක්ම



"කන්ද උඩරට තේජාන්විත
අග නගරය"

## 4.2. දැක්මේ ප්‍රකාශය

මහනුවර මහ නගර සහා නගර සංවර්ධන සැලැස්ම මඟින් ප්‍රකාශ වන **"කන්ද උඩරට තේජාන්විත අග නගරය"** යන දැක්ම කන්ද උඩරට, තේජාන්විත හා අග නගරය යන වාග් ඛණ්ඩයන් තුනෙන් පිළිබිඹු වන අර්ථයන් ඔස්සේ වඩාත් නිවැරදි ලෙස අර්ථකථනය කල හැකිය.

**කන්ද උඩරට** හෙවත් සෙංකඩගල පුරවරය සිංහල රාජධානි වංශකතාවේ අවසන් රාජධානිය විදහා දක්වනු ලබයි. එවකට පැවති මෙම රාජධානිය ස්වාභාවික වනාන්තර වලින් යුක්ත කඳු පන්තීන්ගෙන් වටවූ තැනිතලා භූමියක පිහිටා ඇති අතර මහවැලි ගඟෙන් වට වී තිබීම හේතුවෙන් එය ස්වාභාවික ආරක්ෂාවන්ගෙන් අනූන සෞම්‍ය දේශගුණයකින් යුතු ප්‍රදේශයකි. එබැවින් කන්ද උඩරට යන්නෙන් එවකට පැවති නීල හරිත වටපිටාවෙන් සමන්විත ස්වභාවික පරිසරය පිළිබිඹු කරයි.

**තේජාන්විත** බව මෙම පුරවරයේ විද්‍යාමාන වන ඓතිහාසික ශ්‍රී විභූතිය මත රඳා පවතින අතර එය ආගමික හා සංස්කෘතික වටිනාකමකින් යුක්ත වේ. ශ්‍රී දළදා මාලිගාව පරිශ්‍රයේ පිහිටි දිය අගල වටා ඇති වලාකුළු බැම්ම අතරින් දිස්වෙන මාළිගය "වලාකුළු අතරින් දිස්වෙන ආලකමන්දවක්" හෙවත් කුවේරයාගේ විමානය එනම් ශක්‍ර භවන ලෙස එවකට හඳුන්වා දී ඇති අතර එය තේජාන්විත භාවයේ අපූර්වතම නිර්මාණයකි. ශ්‍රී දළදා මාලිගාව හා පාරිසරික භූ දර්ශනය, උඩරට ගෘහ නිර්මාණ ශිල්පය හා ඊට අදාළ ගොඩනැඟිලි ආදී සියලුම ස්පෘශ්‍ය උරුමයන් (Tangible Heritage) මෙන්ම කළා ශිල්ප, දළදා පෙරහැර ආදී අස්පෘශ්‍ය උරුමයන් (Intangible Heritage) මහනුවර නගරයෙහි තේජාන්විත භාවය ඉස්මතු කරයි. එබැවින් තේජාන්විත යන්නෙන් උරුම වී ඇති සියලුම ස්පෘශ්‍ය උරුමයන් (Tangible Heritage) හා අස්පෘශ්‍ය උරුමයන් (Intangible Heritage) නිරූපණය කරනු ලැබේ.

**අග නගරය** යන්නෙන් දිනෙන් දින වැඩි දියුණු වන මහජන අවශ්‍යතාවයන් හා සේවා අවශ්‍යතාවයන්ගෙන් අනූන සේවාදායකයන් වෙත කාර්යක්ෂම වූත් ආකර්ශනීය වූත් සේවයක් ලබාදීම සඳහා නිර්මාණය වූ නාගරික සැකැස්මක් සහිත කේන්ද්‍රගත සේවා මධ්‍යස්ථානයක් මෙන්ම නගරය වෙත ගලා එන විනිමය ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා ගෙන යනු ලබන බව අදහස් කරයි. එබැවින් අග නගරය යන්නෙන් මධ්‍යම පළාතේ ස්වයංපෝෂිත ආර්ථිකයක් සහිත මහජන හිතකාමී සේවාවන්ගෙන් අනූන වටපිටාවක් සහිත මධ්‍යම පළාතේ ප්‍රධානතම අග නගරය යන්න අදහස් වේ.

හන්තාන, බහිරවකන්ද හා ප්‍රීම්රෝස් වැනි කඳු පන්තීන් මෙන්ම උඩවත්ත රක්ෂිතය, වාකරවත්ත ආදී වනාන්තර වලින්ද සමන්විත ස්වභාව සෞන්දර්යයේ කදිම නිර්මාණයක් වන මෙම නගරය තුළ වර්තමානයේදී උද්ගතව ඇති පාරිසරික තර්ජන හේතුවෙන් නීලහරිත වටපිටාවකින් සමන්විත පරිසරය සංරක්ෂණය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් ඇත. එමෙන්ම නගරය වටා ගලා බසින මහවැලි ගඟෙන් මෙන්ම නගරය හරහා ගලා බසින කුඩා දිය දහාරවන් ගෙන් පාරිසරික සමතුලිතභාවය සුරැකෙන අතර වර්තමානය තුළ උද්ගතව පවතින ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් ජලජ පරිසරයද සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවයක්ද පවතී. එබැවින්, මහනුවර නගර සංවර්ධන සැලැස්ම තුළින් විද්‍යාමාන වන දැක්ම, පාරිසරික සංරක්ෂණය හා ආරක්ෂණය තුළින් **"නීල හරිත පරිසරය"** සුරැකිය යුතුය යන අංශය කෙරෙහිද අවධානය යොමු කොට ඇත.

එමෙන්ම, මහනුවර රාජධානියෙන් උරුමය ලද ශ්‍රී දළදා මාළිගාව හා ඒ අවට ඇති පාරිසරික භූ දර්ශනය, ඉපැරණි වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් සමන්විත ගොඩනැඟිලි, කළා ශිල්ප ආදී උරුමයන්ගෙන් අනූන මෙම නගරය දෙස් විදෙස් විශාල පිරිසකගේ අවධානයට පාත්‍ර වී ඇති සංචාරක කේන්ද්‍රස්ථානයක් වේ. වර්තමානය වන විට උද්ගතව පවතින සංවර්ධන නැඹුරුතාවයන් ආදී හේතූන් මත එම උරුමයන් පරිහානියට පත්වන අතර එම උරුමයන් සංරක්ෂණය හා ආරක්ෂණය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මෙම සංවර්ධන සැලැස්ම තුළින් විද්‍යාමාන වන දැක්ම, **"කන්ද උඩරට උරුමයන්ගේ ප්‍රතිරූපය"** වැඩි දියුණු කිරීම මඟින් මහනුවර නගරයෙහි අද්විතීයත්වය සුරැකිය යුතු බවටද අවධානය යොමු කොට ඇත.

මහනුවර නගරය පෙරටු කරගෙන ඇති ආර්ථික, සමාජයීය, පාරිසරික, සංස්කෘතික හා ඓතිහාසික වටිනාකම් හේතුවෙන් මෙම නගරය දෙස් විදෙස් විශාල පිරිසකගේ අවධානයට පාත්‍ර වී තිබීමත් දිනෙන් දින සිදු වන නාගරීකරණයත් හේතුවෙන් සේවාවන් ලබා ගැනීම සඳහා වැඩි ජන සංඛ්‍යාවක් නගරය වෙත පැමිණේ. ඒ වෙනුවෙන් නගරය තුළ පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, රථ වාහන තදබදය, නාගරික ක්‍රියාවලිය විධිමත් නොවීම ආදී ගැටළු පවතින අතර මහනුවර නගර සංවර්ධන සැලැස්ම තුළින් විද්‍යාමාන වන දැක්ම, නාගරික වැසියන් හා නගරයට පැමිණෙන්නන් හට **"සුව පහසු ජීවන රටාවක්"** ලබා දිය යුතුය යන අංශය කෙරෙහිද අවධානය යොමු කොට ඇත.

ස්වකීය සම්පත් වලින් අනූන මහනුවර නගරය දෙස් විදෙස් සංචාරකයන්ගේ නෙත් සිත් පිනවන සංචාරක කේන්ද්‍රස්ථානයක් වේ. එමෙන්ම නීල හරිත පරිසරය සහිත සෞම්‍ය දේශගුණය, උරුමයන්ගෙන් සමන්විත සංස්කෘතික පසුබිම හා සේවාවන්ගෙන් අනූන නාගරිකයක් වීම යන හේතූන් මත සංචාරක ආකර්ෂණය ඇඳ බැඳ ගැනීම සඳහා අවස්ථාවක් පවතී. එමෙන්ම මහනුවර යුගයේ සිට පැවත එන කලා ශිල්ප, අත්කම් භාණ්ඩ හා අනෙකුත් කුඩා පරිමාණ ගෘහස්ත නිෂ්පාදන සඳහා මහනුවර නගරය තුළ වෙළඳපොළක් ගොඩනැඟීම සඳහාද අවස්ථාව පවතී. එබැවින්, මහනුවර නගර සංවර්ධන සැලැස්ම තුළින් විද්‍යාමාන වන දැක්ම, පවතින සම්පත්

උපයෝජනය කිරීමත්, පවතින ගැටලු මඟින් ආර්ථිකය කෙරෙහි වක්‍ර ආකාරයෙන් ඇතිවන බලපෑම් මඟහැර ගැනීමත් තුළින් **"ස්වයංපෝෂිත ආර්ථිකයක්"** ගොඩනැගිය යුතුය යන අංශය කෙරෙහිද අවධානය යොමු කොට ඇත.

සෙංකඩගල ශ්‍රී විභූතිය විදහාපාන දිය අගල සහිත වලාකුළු බැම්ම අතරින් දිස්වෙන ආලකමන්දාවක් බඳු මාලිගය, ජල රැළි නන්වන දිව්‍ය සාගරය බඳු කිරි මුහුද සහිත දියරැළි බැම්ම, නීල හරිත වටපිටාවෙන් සමන්විත සංස්කෘතික හා පාරිසරික භූ දර්ශනය නැවත පුනර්ජීවනය කිරීම තුළින් සමාජයීය සහජීවනය සහිත මනා කළමනාකරණයකින් යුතු භෞතික සංවර්ධනය තුළින් ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා ගමන් කිරීම මහනුවර නගර සංවර්ධන සැලැස්ම තුළින් පිළිබිඹුවන දැක්මෙහි සරල අර්ථයි.

## 4.3 අරමුණු

අරමුණ 01 කන්ද උඩරට අද්විතීයත්වය සුරැකීම සඳහා උරුමයන්ගේ ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම.

අරමුණ 02 ස්වභාවික පරිසරය හා නිර්මිත පරිසරයෙහි සුසංයෝගය තුළින් නීල හරිත පරිසරයක් නිර්මාණය කිරීම.

අරමුණ 03 නාගරික ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම තුළින් නගර වැසියන් හා නගරය භාවිතා කරන්නන් සඳහා සුව පහසු ජීවන රටාවක් ලබා දීම.

අරමුණ 04 පවතින සම්පත් උපයෝජනය කිරීම තුළින් ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගීම.

## 4.4 පරමාර්ථ

**අරමුණ 01**

I. ලෝක උරුම නගරය තුළ ව්‍යාප්තව පවතින ලෝක උරුම ගොඩනැගිලි වර්ෂ 2030 වන විට 100%ක් සංරක්ෂණය කිරීම.

II. ඓතිහාසික නගර මධ්‍ය කලාපය තුළ ලෝහ භාණ්ඩ අලෙවි සැල් හා තොග බඩු අලෙවි සැල් අධෛර්යමත් කිරීම තුළින් වර්ෂ 2030 වන විට කටුගස්තොට නගරය ඒ සඳහා විශේෂ නැඹුරුතාවයක් ඇති නගරයක් ලෙසට දියුණු කිරීම.

III. ඓතිහාසික නගර මධ්‍ය කලාපය වර්ෂ 2030 වන විට මහනුවර නගරයට ආවේණික සංස්කෘතික අංගයන් පැවැත්වීම වෙනුවෙන් හා සංස්කෘතික භූ දර්ශනය ඉස්මතු වන ලෙස ජනනය කිරීම.

**අරමුණ 02**

I. මහනුවර නගරය තුළ 35%ක් පමණ පවතින වෘක්ෂ ලතා ඝණත්වය වර්ෂ 2030 වන විට 50%ක් දක්වා වැඩි කිරීම.

II. වර්ෂ 2030 වන විට පේරාදෙණියේ සිට කටුගස්තොට දක්වා හඳුනාගත් බිම් තීරුවකට සංවර්ධන කටයුතු සීමා කිරීම.

III. මහනුවර නගරය තුළ වර්ෂ 2030 වනවිට නගරය දර්ශනය ආරක්ෂා කර ගැනීම සඳහා කඳු පංතිවල උඩත්මායිමේ සිට 1/3ක ප්‍රමාණයක් සංරක්ෂණය කිරීම.

IV. වර්ෂ 2030 වන විට මහනුවර නගරය තුළ පැවති ජල මූලාශ්‍ර 100% ක් නැවත ප්‍රතිස්ථාපනය කිරීම.

V. මහනුවර නගරය තුළ 1/3ක පමණ ප්‍රදේශයක් ආවරණය වන අපජල කළමණාකරන ක්‍රමවේදය වර්ෂ 2030 වන විට පර්ෂද නගර හා පේරාදෙණියේ සිට කටුගස්තොට දක්වා හඳුනාගන්නා ලද සංවර්ධන තීරය ආවරණය වන ලෙස ක්‍රියාත්මක කිරීම.

**අරමුණ 03**

I. වර්ෂ 2030 වන විට නගර මධ්‍ය තුළ බහුවිධ ප්‍රවාහන පර්යන්තයක් ප්‍රතිස්ථාපනය කිරීම හා පර්ෂද රථවාහන නැවතුම් ස්ථාන ගැටඹේ, කටුගස්තොට හා තැන්නේකුඹුර යන ප්‍රදේශයන්හි ස්ථාපනය කිරීම.

II. පේරාදෙණිය හා කටුගස්තොට යන පර්ෂද නගර අතර පොදු ප්‍රවාහන සේවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වර්ෂ 2030 වන විට වැඩි දියුණු කිරීම.

III. වර්ෂ 2030 වනවිට පේරාදෙණිය නගරය උසස් අධ්‍යාපන, සෞඛ්‍ය හා පර්යේෂණ අංශ වෙත විශේෂ නැඹුරුතාවයක් ඇති නගරයක් ලෙසට දියුණු කිරීම.

IV. වර්ෂ 2030 වන විට හෙක්ටයාර් 130ක් ප්‍රජා හා විනෝද කටයුතු කටුතු වෙනුවෙන් වෙන් කිරීම.

V. අක්කර 80ක ප්‍රමාණයක් පුරා ව්‍යාප්තව පවතින අඩු පහසුකම් සහිත නේවාසික ප්‍රදේශ වර්ෂ 2030 වන විට පහසුකම් සහිත නේවාසික ප්‍රදේශ බවට පත් කිරීම.

**අරමුණ 04**

I. ඓතිහාසික නගර මධ්‍ය කලාපය තුළ වර්ෂ 2030 වන විට මහනුවරට ආවේණික සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙනුවෙන් විශේෂ නැඹුරුතාවයක් ඇති කලාපයක් ලෙසට දියුණු කිරීම.

II. වර්ෂ 2030 වන විට සංචාරකයින් මහනුවර නගරය තුළ රැඳීමේ ප්‍රමාණය 86% ක් දක්වා වැඩි කිරීමට අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම.

III. මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට හෙක්ටයාර් 46ක් පමණ ඌණ උපයෝජන ඉඩම් සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීම.

# ශ.දු.අ.ත. විශ්ලේෂණය හා දත්ත විශ්ලේෂණයේ සාරාංශය

5

# 5. ශ.දු.අ.ත. විශ්ලේෂණය හා දත්ත විශ්ලේෂණයේ සාරාංශය

**අරමුණු 0 1: කන්ද උඩරට අද්විතීයත්වය සුරැකීම සඳහා උරුමයන්ගේ ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම.**

**S**

1. ලෝක පූජිත ශ්‍රී දළදා මාළිගාව නගර මධ්‍ය තුළ පිහිටා තිබීම
2. ලෝක උරුම ගොඩනැඟිලි සහ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ගොඩනැඟිලි 490ක් මහනුවර නගරය තුළ පිහිටා තිබීම
3. සංස්කෘතික ත්‍රිකෝණය තුළ සංචාරක කර්මාන්තය මඟින් සේවා අංශය ලද ආදායම 49%ක් වීම
4. විශේෂ කාල වකවානු වලට අයත් වන සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැඟිලි නගරය තුළ ව්‍යාප්ත වී තිබීම
5. වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍ය මහනුවර නගරය තුළ පැවැත්වීම

**W**

1. ලෝක උරුම ගොඩනැඟිලි වල පවතින වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ක්‍රමයෙන් හීන වීම
2. ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණය කිරීම සඳහා ශක්තිමත් නීති රීති පද්ධතියක් නොමැති වීම
3. ඓතිහාසික නගර මධ්‍ය කලාපය තුළ අනුකූල භාවිතයන් හේතුවෙන් නුසුදුසු පරිසරයක් නිර්මාණය වීම
4. මාළිගාව අවට හා නුවර වැව ආශ්‍රිතව ඉදිකිරීම සඳහා වැඩි ඉල්ලුමක් පැවතීම

**O**

1. යුනෙස්කෝ සංවිධානය විසින් 1988 වර්ෂයේදී ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම
2. ජාතික වශයෙන් ප්‍රමුඛතාවයක් ලබා දී ඇති උරුමයන් සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතීන් කිහිපයක් ක්‍රියාත්මක වීම
3. ශ්‍රී දළදා මාළිගාව හා ඒ අවට ප්‍රදේශය පූජා භූමි ප්‍රදේශයක් ලෙසට නම් කිරීම

**T**

**ශක්තීන්**

1. ලෝක පූජිත ශ්‍රී දළදා මාළිගාව නගර මධ්‍ය තුළ පිහිටා තිබීම

කන්ද උඩරට අද්විතීයත්වය විදහාපාන ප්‍රබලතම සාධකය ශ්‍රී දළදා මාළිගාව වන අතර එය කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ ආරාධනාවකට අනුව දේවේන්ද්‍ර මූලාචාර්ය විසින් නිම කරන ලද අපූර්වතම නිර්මාණයකි. දළදා මාළිගාව පරිශ්‍රයෙහි පිහිටි දිය අගල වටා ඇති වලාකුළු බැම්මත්, මහනුවර වැව හෙවත් කිරි මුහුද වටා ඉදිකොට ඇති දියරැලි බැම්මත් අහසේ වලාකුළු අතර රැඳෙන ආලක මන්දාවක් පරිද්දෙන් දිස් වෙන මාළිගයේ පත්තිරිප්පුවත් එවකට පැවති කලා ශිල්ප ඥාණය මනාව ඉස්මතු කරයි. පහත පෙන්වා ඇති රූපයේ එය මොනවට විදහා දැක්වෙන අතර මෙවැනි අද්විතීය නිර්මාණයක් වන ලෝක පූජිත ශ්‍රී දළදා මාළිගාව නගර මධ්‍යයේ පිහිටා තිබීම මහනුවර නගරයට හිමිවී ඇති සුවිශේෂී ශක්තියක් ලෙස හැඳින්විය හැක.

*රූප අංක 5. 1. ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රය*



ක

*මූලාශ්‍රය:ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, 2018*

2. ලෝක උරුම ගොඩනැඟිලි සහ පුරාවිද්‍යාත්මක වටිනා කමක් ඇති ගොඩනැඟිලි 490ක් මහනුවර නගරය තුළ පිහිටා තිබීම

මහනුවර මහනගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම සංස්කෘතික අරමුදල හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගොඩනැඟිලි හා ස්ථානවල පවතින ඓතිහාසික වටිනාකම් හා ගෘහ නිර්මාණ ශිල්පීය වටිනාකම් සැලකිල්ලට ගනිමින් ලෝක උරුම ගොඩනැඟිලි හඳුනා ගන්නා ලද අතර එලෙස හඳුනාගන්නා ලද ලෝක උරුම ගොඩනැඟිලි 490ක ප්‍රමාණයක් 2003 මැයි මස 26 වන දින අංක 1290/01 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් 2002 අප්‍රේල් මස 27 දින සිට ක්‍රියාත්මක කරනු ලැබූ 2002-2016 මහනුවර මහනගර සභා නගර සංවර්ධන සැලැස්ම තුළින් ප්‍රකාශයට පත් කර ඇත. එම ගොඩනැඟිලි පහත පෙන්වා ඇති රූපයේ පරිදි පිහිටා පිහිටා

ඇති අතර එම ගොඩනැඟිලි අතර 2005 ජූලි මස 8 වන දින අංක 1401 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද පුරාවිද්‍යාත්මක ගොඩනැඟිලි 104ද අන්තර්ගතවන අතර ඒ තුළින් මහනුවර නගරය සඳහා සුවිශේෂී ඓතිහාසික වටිනාකමක් හිමි වී ඇත.

*රූප අංක 5. 2. ලෝක උරුම සංරක්ෂණ ගොඩනැඟිලි වල ව්‍යාප්තිය*




*මූලාශ්‍රය:* නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර. 2016

3. සංස්කෘතික ත්‍රිකෝණය තුළ සංචාරක කර්මාන්තය මඟින් සේවා අංශය ලද ආදායම 49%ක් වීම.

අනුරාධපුරය, පොළොන්නරුව හා මහනුවර කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවා ඇති සංස්කෘතික ත්‍රිකෝණය තුළ මහනුවර නගරය හා ඒ ආශ්‍රිත ලෝක උරුම නගරය වෙත ප්‍රධාන ස්ථානයක් හිමි වී ඇත. පහත දක්වා ඇති වගුවට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් 2016 වර්ෂයෙහි ප්‍රකාශිත සංඛ්‍යා ලේඛන වලට අනුව සේවා අංශයෙහි වාර්ෂික ආදායම සංචාරක කර්මාන්තය මත 49.25% පමණ වන අතර එය වාර්ෂික අදායම් ප්‍රභවයන්හි වැඩිම අගයක් ගෙන තිබේ.

වගු අංක 5. 1. සංචාරක කර්මාන්තය මඟින් සේවා අංශය ලද ආදායම -2016

| සංචාරක කර්මාන්තය මඟින් සේවා අංශය ලද ආදායම -2016 | | |
|---|---|---|
| ආදායම ලැබීමේ ප්‍රභවය | ආදායම (රු.මි.) | % |
| සංස්කෘතික ත්‍රිකෝණය | 3363.3 | 49.25 |
| වන ජීවී උද්‍යාන | 1445.9 | 21.17 |
| සත්වෝද්‍යාන | 841.1 | 12.32 |
| උද්භිද උද්‍යාන | 594.3 | 8.70 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව | 551.4 | 8.07 |
| කෞතුකාගාර | 33.6 | 0.49 |
| **එකතුව** | 6829.6 | 100 |

*මූලාශ්‍රය:* සංචාරක සංවර්ධන අධිකාරිය, 2016

4. විශේෂ කාල වකවානු වලට අයත් වන සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැඟිලි නගරය තුළ ව්‍යාප්ත වී තිබීම

මෙලෙස හඳුනාගෙන ඇති ලෝක උරුම ගොඩනැඟිලි බ්‍රිතාන්‍ය, පෘතුග්‍රීසි, ලන්දේසි, උඩරට, ගොතික් හා ශ්‍රී ලාංකික සම්භාව්‍ය ලෙස වර්ග කල හැකි වීමත් එවැනි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ රැසකගේ සංකලනයක් ලෙස පැවතීමත් නගරය වෙත වටිනාකමක් එක් කරන්නට සමත් වී ඇති අතර එය පහත පෙන්වා ඇති රූප වලින් මොනවට පැහැදිලි වේ.

*රූප අංක 5. 3. සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැගිලි*

බ්‍රිතාන්‍ය සම්භවයක් සහිත තැපැල් කාර්යාල ගොඩනැඟිල්ල



බ්‍රිතාන්‍ය සම්භවයක් සහිත මහනුවර පොලිස් මූලස්ථානය



උඩරට සම්භවයක් සහිත ඇහැලේපොල වලව්ව



උඩරට සම්භවයක් සහිත මගුල් මඩුව



*මූලාශ්‍රය: ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය,2018*

5. වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍ය මහනුවර නගරය තුළ පැවැත්වීම

සෙංකඩගල ඇසළ පෙරහැර මංගල්‍යයය මහනුවර නගරය තුළ පමණක් නොව ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන සුවිශේෂිතම සංස්කෘතික මංගල්‍ය ලෙස හඳුන්වාදිය හැකිය. මෙම මංගල්‍ය ශ්‍රී දළදා මාළිගාව සහ හතර මහා දේවාල මඟින් සංවිධානය කෙරෙන අතර ඉන් ප්‍රධානතම පෙරහැර ලෙස දළදා පෙරහැර හැඳින්විය හැකිය. නාථ දේවාල පෙරහැර, විෂ්ණු දේවාල පෙරහැර, කතරගම දේවාල පෙරහැර හා පත්තිනි දේවාල පෙරහැර සෙසු පෙරහැර ලෙස වීදි සංචාරය කෙරේ. පෙරහැර මංගල්‍යයට අයත්වන පෙරහැර ලෙස ඇතුලේ පෙරහැර, කුඹල් පෙරහැර, රන්දෝලි පෙරහැර හා දවල් පෙරහැර ලෙස හැඳින්විය හැකි අතර නිකිණි මස පවත්වනු ලබන මෙම පෙරහැර මංගල්‍යයට නගරයේ සංසරණ ජනගහනය සාමාන්‍ය දෛනික සංක්‍රමණික ජනගහනයට වඩා ලක්ෂ 200,000 – 300,000ත් අතර ප්‍රමාණයකින් වැඩි වේ. ඒ අනුව මෙම ඇසළ පෙරහැර මංගල්‍ය මහනුවර නගරය වෙත හිමි වී ඇති සුවිශේෂී අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය.

*රූප අංක 5. 4. මහනුවර ඇසළ පෙරහැර*



*මූලාශ්‍රය: fos media student blog විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය 2013 - 2018*

**දූර්වලතා**

1. ලෝක උරුම ගොඩනැඟිලි වල පවතින වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ක්‍රමයෙන් හීන වීම

ලෝක උරුම ගොඩනැඟිලි වල පවතින වාස්තු විද්‍යාත්මක වටිනාකම, පුරාවිද්‍යාත්මක වටිනාකම ආදී කරුණු සැලකිල්ලට ගනිමින් ඒවා A ශ්‍රේණිය, B ශ්‍රේණිය, C ශ්‍රේණිය හා D ශ්‍රේණිය ආදී වශයෙන් වර්ග කර ඇති නමුත් වර්තමනය වන විට ඒවායෙහි පවතින වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා පුරාවිද්‍යාත්මක ලක්ෂණ ක්‍රමයෙන් හීන වී ගොස් ඇත. නවීණ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ආරෝපණය වීම, ඇතැම් පුරා විද්‍යාත්මක ගොඩනැඟිලි විධිමත් ලෙස නවීකරණය කර නොමැති වීම හා නඩත්තු කටයුතු වල පවතින අවිධිමත් භාවය මෙම ගොඩනැඟිලි වල පුරාවිද්‍යාත්මක ලක්ෂණ හීන වී යාමට හේතුවී ඇති බව හඳුනාගත හැකිය. මීට අමතරව ඇතැම් ලෝක උරුම ගොඩනැඟිලි වල පෙන්වා ඇති නාම පුවරු , ආලේප කර ඇති වර්ණකයන්, භාවිත කර ඇති අමුද්‍රව්‍ය හා ගොඩනැඟිලි වල අභ්‍යන්තරයේ සිදු කර ඇති වෙනස්කම් නිසා මෙම ගොඩනැඟිලි වල පවතින වස්තු විද්‍යාත්මක ලක්ෂණ හා පුරාවිද්‍යාත්මක ලක්ෂණ තවදුරටත් වියැකී යාමට හේතු වී ඇති අතර එය පහත සඳහන් රූප වලින් තව දුරටත් පැහැදිලි වේ.

*රූප අංක 5. 5. ලෝක උරුම ගොඩනැඟිලි වල පවතින වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ක්‍රමයෙන් හීන වීම*






*මූලාශ්‍රය:* පුරාවිද්‍යාත්මක ගොඩනැඟිලි පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2018

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් 2017 වර්ෂයේ සිට සිදුකරමින් පවතින ලෝක උරුම ගොඩනැඟිලි සමීක්ෂණයට අනුව දැනට පරිහානියට පත්ව ඇති ගොඩනැඟිලි හා පරිහානියට පත්වෙමින් පවතින ගොඩනැඟිලි හඳුනාගෙන ඇති අතර ඒවායෙහි ප්‍රතිශතාත්මක අගයන් පහත පරිදි වේ.

*වගු අංක 5. 2. ලෝකඋරුම ගොඩනැඟිලි පිළිබඳව සිදු කරනු ලබන සමීක්ෂණයට අනුව දැනට පරිහානියට පත්ව ඇති ගොඩනැඟිලි*

| නම | A | A | B | B | C | C | D | D | ගොඩනැඟිලි සංඛ්‍යාව | පරිහානියට පත්ව ඇති ගොඩනැඟිලි ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ වීදිය | 33 | 21 | 30 | 25 | 33 | 30 | 12 | 12 | 109 | 88 (80%) |
| කොටුගොඩැල්ල වීදිය | 12 | 8 | 23 | 15 | 11 | 10 | 3 | 3 | 49 | 36 (73%) |
| යටිනුවර වීදිය | 4 | 3 | 16 | 10 | 5 | 3 | 2 | 2 | 27 | 18 (66%) |
| කන්දේ වීදිය | 1 | 1 | 4 | 2 | 3 | 1 | 2 | 2 | 10 | 6 (60%) |
| හරස් වීදිය | 2 | 2 | 7 | 7 | 3 | 2 | 1 | 1 | 13 | 12 (92%) |
| දේව වීදිය | 13 | 8 | 3 | 2 | 2 | 1 | 0 | 0 | 18 | 11 (61%) |

| | | | |
|---|---|---|---|
| | ලෝක උරුම ගොඩනැඟිලි ප්‍රමාණය | | වෙනස්වීම් වලට භාජනය වී ඇති ප්‍රමාණය |

*මූලාශ්‍රය:* පුරාවිද්‍යාත්මක ගොඩනැඟිලි පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය- නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2018

2. ලෝක උරුම ගොඩනැගිලි සංරක්ෂණය කිරීම සඳහා ශක්තිමත් නීතිරීති පද්ධතියක් නොමැති වීම

1984 ජුනි මස 08 වන දින අංක 301 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ශ්‍රී දළදා මාළිගාව සහ ඒ අවට ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් ලෙස නම් කොට ඇති අතර එම ප්‍රදේශ සීමාවන් 2001 නොවැම්බර් මස 08 වන දින අංක 1209/19 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් තව දුරටත් පුළුල් කර ඇති නමුත් ගොඩනැඟිලි සංරක්ෂණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ඊට ඇතුළත් කර නොමැති වීමත් 2002 – 2016 මහනුවර නගර සංවර්ධන සැලැස්මට පුරාවිද්‍යාත්මක ගොඩනැඟිලි වල නාම ලේඛණය පමණක් ඇතුළත් කර තිබීමත් දුර්වලතාවයක් ලෙසට හඳුනාගත හැකිය.

3. ඓතිහාසික නගර මධ්‍ය කලාපය තුළ අනුකූල භාවිතයන් හේතුවෙන් නුසුදුසු පරිසරයක් නිර්මාණය වීම.

හරස් වීදි තුළ වාණිජ, නේවාසික, ආයතනික, ආගමික, අධ්‍යාපනික හා අනෙකුත් වශයෙන් මෙම ප්‍රදේශය තුළ පවතින භාවිතයන් පහත පරිදි හඳුනාගත හැකිය.

*වගු අංක 5. 3. ඓතිහාසික නගර මධ්‍ය කළාපය තුළ පවතින භාවිතයන්*

| භාවිතය | ගොඩනැඟිලි ප්‍රමාණය | % |
|---|---|---|
| වාණිජ භාවිතයන් | 317 | 65% |
| නේවාසික භාවිතයන් | 110 | 22.5% |
| ආයතනික භාවිතයන් | 28 | 5.5% |
| ආගමික භාවිතයන් | 14 | 3% |
| අධ්‍යාපනික භාවිතයන් | 08 | 1.5% |
| වෙනත් භාවිතයන් | 13 | 2.5% |
| එකතුව | 490 | 100 |

*මූලාශ්‍රය:* පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය-2018

ඒ අනුව බැලීමේදී 65%කට ආසන්න ප්‍රමාණයක් මෙම ප්‍රදේශය තුළ වාණිජ භාවිත වලට යොමු වී ඇති බවක් දක්නට ලැබේ. නමුත්, මෙම ප්‍රදේශය තුළ රථවාහන නැවැත්වීමේ ස්ථාන ප්‍රමාණවත් තරම් නොමැති වීමත් ඒ තුළින් නිර්මාණය වන තද බදයත් හේතුවෙන් නුසුදුසු හා කලබලකාරී පරිසරයක් නිර්මාණය වීමට හේතු වී ඇත.

2014 වර්ෂයේදී මහනුවර ආශ්‍රිතව සිදු කරනු ලැබූ ප්‍රවාහන අධ්‍යයනයට අනුව නගර මධ්‍යයෙහි වාහන නැවතීමේ ස්ථාන 2,585ක් පමණ පවතින් අතර එයින් වාහන නැවතීමේ ස්ථාන 825කට පමණ ආසන්න ප්‍රමාණයක් මාර්ගය මත නැවතුම් ස්ථාන ලෙස යොදා ගනී. මෙලෙස මාර්ගය මත වාහන නවතා තැබීමේ ස්ථාන ප්‍රමාණයට අනුව 18%ක ප්‍රමාණයක් එනම් ස්ථාන 118ක පමණ පැය 08කට වඩා වැඩි වෙලාවක් වාහන නවතා තබන බවටත් අනෙකුත් සියලුම වාහන විනාඩි 30 සිට 105 දක්වා වේලාවක් නවතා තබන බවටත් හඳුනාගෙන ඇත.

ඒ අනුව බැලීමේදී මෙම වීදි වල වාණිජ භාවිතයන් බහුල වන බැවින් ඒ සඳහා ප්‍රමාණවත් වාහන නැවතිමේ ස්ථාන නොමැතිවීමත්, ලෝක උරුම ගොඩනැඟිලි විශාල ප්‍රමාණයක් පැවතීම හේතුවෙන් වාහන නවතා තැබීමේ ස්ථානයන් වෙන් කිරීමට හැකියාවක් නොමැතිවීමත් හේතුවෙන් මෙම ප්‍රදේශය තුළ නුසුදුසු හා තදබදකාරී ස්වරූපයක් ගොඩනැගීමට හේතුවී ඇත. එය පහත පෙන්වා ඇති රූපයෙන් තව දුරටත් පැහැදිලි වේ.

*රූප අංක 5. 6. හරස් වීදි වල නිර්මාණය වී ඇති කලබලකාරී පසුබිම*



*මූලාශ්‍රය: විසල් මහනුවර නගර සංවර්ධන කෙටුම්පත් සැලැස්ම, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

**අවස්ථා**

1. යුනෙස්කෝ සංවිධානය විසින් 1988 වර්ෂයේදී ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම

1988 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර පුරවිද්‍යාත්ම වටිනාකම, වාස්තු විද්‍යාත්මක වටිනාකම, සංස්කෘතික වටිනාකම, ඉදිකිරීම් තාක්ෂණය, අමුද්‍රව්‍ය තාක්ෂණය, මේ තුළ ඇති උපයෝගීතාවය, ගොඩනැඟිල්ලේ සන්දර්භය හා සංස්කෘතික පරිසරය, ගොඩනැඟිල්ලේ වර්තමාන භාවිතය, ගොඩනැඟිල්ලේ නිර්මලතාවය හා සන්දර්භමය වටිනාකම ආදී කරුණු සැලකිල්ලට ගනිමින් ඒ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැඟිලි 490ක් ලෝක උරුම ගොඩනැඟිලි ලෙස ප්‍රකාශයට පත් කර ඇත. මේ අනුව මෙම නම් කිරීම මහනුවර නගරය වෙත හිමි වී ඇති සුවිශේෂී අවස්ථාවක් ලෙසට හඳුනාගත හැකිය.

2. ජාතික වශයෙන් ප්‍රමුඛතාවයක් ලබා දී ඇති උරුමයන් සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතින් කිහිපයක් ක්‍රියාත්මක වීම

වර්තමානය වන විට විශේෂ ව්‍යාපෘතීන් හරහා ඇතැම් ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණය කර ඇති අතර තවත් ගොඩනැඟිලි කිහිපයක් මේ වන විට ජාතික වශයෙන් වැදගත් අනාගත සංරක්ෂණය ව්‍යාපෘතීන් ලෙසද හඳුනාගෙන ඇත. එලෙස සංරක්ෂණය කර ඇති ගොඩනැඟිලි අතර ‘ක්ලොක් ඉන්’ ගොඩනැඟිල්ල, හරස් වීදි වල පවතින අංක 41, 43, හා 45 දරන ගොඩනැඟිලි, ගිරාගම වලව්ව, බේක් හවුස් ගොඩනැඟිල්ල, ඕක්රේ ගොඩනැඟිල්ල, ඕල්ඩ් එම්පයර් ගොඩනැඟිල්ල, ක්වීන්ස් හෝටලය, කැෆේ චෝක් වැනි ගොඩනැඟිලි හඳුනාගත හැක.

බෝගම්බර බන්ධනාගාරය, ඇහැලේපොළ වලව්ව හා නීතිඥ කාර්යාල ගොඩනැඟිල්ල වැනි ලෝක උරුම ගොඩනැඟිලි ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතීන් ලෙස වර්තමානය වන විට හඳුනාගෙන ඇත. මේ තුළින් ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණය කිරීමට පියවර ගෙන තිබීම ලෝක උරුම නගරයෙහි අද්විතීයත්වය ආරක්ෂා කිරීමට ඉවහල් වනු ඇත.

3. ශ්‍රී දළදා මාළිගාව හා ඒ අවට ප්‍රදේශය පූජා භූමි ප්‍රදේශයක් ලෙසට නම් කිරීම

1984 ජුනි මස 08 වන දින අංක 301 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ශ්‍රී දළදා මාළිගාව සහ ඒ අවට ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් ලෙස නම් කොට ඇත. එම ප්‍රදේශ සීමාවන් 2001 නොවැම්බර් මස 08 වන දින අංක 1209/19 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් තව දුරටත් පුළුල් කර ඇත. එලෙස පූජා භූමි ප්‍රදේශයක් ලෙසට නම් කර තිබීමද මෙම නගරය වෙත සුවිශේෂී වටිනාකමක් හිමි වීමට හේතු වී ඇත.

4. මාළිගාව අවට හා නුවර වැව ආශ්‍රිතව ඉදිකිරීම සඳහා වැඩි ඉල්ලුමක් පැවතීම

මාළිගාව හා නුවර වැව ආශ්‍රිතව පවතින පාරිසරික භූ විෂමතාවය මත ගොඩනැඟී ඇති අලංකාරය හේතුවෙන් තරු පන්තියේ හෝටල්, ආපනශාලා හා නිවාඩු නිකේතන ආදී භාවිතයන් සඳහා වැඩි ඉල්ලුමක් පවතී. ඒ හේතුවෙන් එම ප්‍රදේශයන්හි ඉඩම් වල වටිනාකම ඉතා ඉහළ අගයක් ගන්නා අතර එය මිලියන 05 - 06ත් අතර අගය පරාසයක් තුළ ව්‍යාප්තව පවතී. නමුත් මෙවැනි ඉදිකිරීම් හේතුවෙන් මාළිගාව අවට මෙන්ම නුවර වැව වටා ඇති පාරිසරික භූ දර්ශනයට දැඩි තර්ජනයක් එල්ල වී තිබීම පහත රූපයේ පෙන්වා ඇති පරිදි හඳුනාගෙන ඇති අතර එය දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

*රූප අංක 5. 7. මහනුවර වැව වටා ඉදිකර ඇති අවිධිමත් ඉදිකිරීම්*



*මූලාශ්‍රය:* ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර

**අරමුණු 02: ස්වභාවික පරිසරය හා නිර්මිත පරිසරයෙහි සුසංයෝගය තුළින් නීල හරිත පරිසරයක් නිර්මාණය කිරීම**

**S**

1. නගරය හරහා ගලා බසින දිය දහරාවන් කිහිපයක් මහවැලි ගඟට සම්බන්ධ වීම
2. භූමි පරිහරණ රටාවෙන් 11%ක් පමණ ස්වාභාවික වනාන්තර සඳහා වෙන් වී තිබීම
3. ස්වභාවික සම්පත් වලින් සමන්විත ආරක්ෂාවක් නගරයට හිමිවි තිබීම
4. නැරඹුම් ස්ථාන කිහිපයක් නගරය තුළ පිහිටා තිබිම
5. මළ අපවහන හා අපජල කළමණාකරන ව්‍යාපෘතිය මඟින් නගර සභා බල ප්‍රදේශයෙන් 1/3ක ප්‍රදේශයක් ආවරණය වීම.

**W**

1. ක්‍රම ක්‍රමයෙන් වෘක්ෂ ලතා ඝණත්වය හීන වී යාම
2. නාගරික ප්‍රවණතාවයන් හේතුවෙන් ජල මූලාශ්‍ර වලට හානි පැමිණීම
3. පවතින අවිධිමත් ඉදිකිරීම් හේතුවෙන් නැරඹුම් ස්ථාන වලට බාධා පැමිණීම
4. අංශක 45ට වඩා වැඩි බෑවුම් වල ගොඩනැගිලි ව්‍යාප්තිය .




**O**

1. මහනුවර නගරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය ජාතික භෞතික සැලසුම මඟින් මධ්‍යම පාරිසරික සංවේදී කලාපයක් ලෙස නම් කිරීම

**T**

1. නගරය වෙත නාගරික ප්‍රවණතාවයන් හා සංවර්ධනයන් සඳහා විශේෂ ඉල්ලුමක් පැවතීම

**ශක්තීන්**

1. නගරය හරහා ගලා බසින දිය දහරාවන් කිහිපයක් මහවැලි ගඟට සම්බන්ධ වීම

ජල විද්‍යාව හා භූ රූපන විද්‍යාවන් සැලකීමේදී ජල මූලාශ්‍ර සහ භූ රූපන ලක්ෂණයන් එකිනෙකට සම්බන්ධ වීමෙන් නගරය තුළ පාරිසරික තත්වයන් නිර්මාණය වී ඇත. නගරයේ සංවර්ධනය සහ පරිසරයේ සමතුලිතතාවය රැක ගැනීම සඳහා මහවැලි ගඟ හා ඊට සම්බන්ධ වන අතු ගංගා වශයෙන් හාලි ඇළ, හාලි ඇළ නිම්නයන්ද, මැද ඇළ, මැද ඇළ නිම්නයෙන්ද, හීන් පැන්කඳුර ඇළ , හීන්පැන් කඳුර නිම්නයෙන්ද මහවැලි ගඟ හා මනාව සම්බන්ධ වන අතර ඒ බව පහත පෙන්වා ඇති රූපයෙන් තව දුරටත් පැහැදිලි වේ. තවද මහනුවර නගර මධ්‍ය හරහා ගලා බසින දුනුමඩලාව ඇළ, සියඹලාන්ගේ ඇළ, දෙනිය ඇළ, දන්ගේ ඇළ, එල්ලාවල ඇළ, මැද ඇළ, හීන්පැන්කඳුර ඇළ, හල් ඔය, පුසිය ඔය හා පිහා ඔයද මහවැලි ගඟ පෝෂණය කරනු ලැබේ. භූමි පරිහරණ රටාව තුළද මුළු භූමි ප්‍රමාණයෙන් 4.3%ක ප්‍රමාණයක් ජල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන අතර නගර මධ්‍ය තුළ පවතින පාරිසරික සමතුලිතතාවය රැක ගැනීමට මෙන්ම ප්‍රධානතම ජල මූලාශ්‍රය වන මහවැලි ගඟ පෝෂණය කිරීමටද එය හේතු වී ඇත.

*රූප අංක 5. 8. මහනුවර නගරය හරහා ප්‍රධාන ජල මූලාශ්‍රයන් ගලා බසින ආකාරය*




*මූලාශ්‍රය :* විසල් මහනුවර සැලැස්ම කෙටුම්පත 2030, නාගරික සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර

2. භූමි පරිහරණ රටාවෙන් 11%ක් පමණ ස්වාභාවික වනාන්තර සඳහා වෙන් වී තිබීම.

නගරය තුළ ගලා බසින මෙන්ම නගරය වටා ගලා බසින ජල මූලාශ්‍රයන් පෝෂණය කිරීම සඳහා උඩවත්ත රක්ෂිතය හා වාකරවත්ත කැලය ඉවහල් වී ඇති අතර එය හෙක්ටයාර 282ක පමණ ප්‍රමාණයක් පුරා ව්‍යාප්තව පවතී. පහත රූපයෙහි පෙන්වා ඇති පරිදි එම රක්ෂිත දෙක ස්ථාන ගත වී ඇති අතර එය සමස්ත භූමි පරිහරණ රටාවෙන් 11%ක පමණ ප්‍රමාණයක් වන අතර එය දැක බලා ගැනීම සඳහා සංචාරකයන් මෙන්ම විවිධ පාරිසරික හිතෛශීන්ද පැමිණේ. එම වනාන්තර තුළ ඊට ආවේනික ඒකදේශීය වෘක්ෂලතාවන් මෙන්ම ජීවීන්ද දක්නට ලැබෙන අතර උඩවත්ත රක්ෂිතය තුළ ඒකදේශීය පක්ෂීන් 80ක් පමණ ඇති බවට වාර්තා වී ඇත. ඒ අනුව එය මහනුවර නගරය වෙත හිමි වී ඇති සුවිශේෂී වටිනාකමක් ලෙස හඳුනාගත හැකිය.

*රූප අංක **5.1.** මහනුවර නගරය තුළ පිහිටා ඇති වන ව්‍යාප්තිය*




*මූලාශ්‍රය:* විසල් මහනුවර සැලැස්ම 2030 කෙටුම්පත, නාගරික සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර

3. ස්වභාවික සම්පත් වලින් සමන්විත ආරක්ෂාවක් නගරයට හිමිවී තිබීම

ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ වලට අනුව මහනුවර මධ්‍යම උස් බිම් කලාපයට අයත් වේ. මහනුවර මහ නගර සහා බල ප්‍රදේශයෙන් තුනෙන් දෙකක් පමණ මහවැලි ගඟෙන් මායිම් වන අතර, දකුණු ප්‍රදේශය හන්තාන කඳු පන්තියෙන් මායිම් වේ. මහනුවර දිස්ත්‍රික්කය කඳුකර භූමියක් ලෙස පවතින අතර, මහනුවර නගර සභා බල ප්‍රදේශය පටු නිම්නයක් තුළ පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට උස මීටර් 500 සිට 600 දක්වා වූ පරාසයක් තුළ මහනුවර නගරය පිහිටා ඇති අතර භූ විද්‍යාත්මක ලක්ෂණ අනුව මෙම ප්‍රදේශය ප්‍රාග් කේම්බ්‍රියානු උස් බිම් ශ්‍රේණියට අයත් වන ක්වාට්ස් පෙල්ස්පා, ගානට්, ක්වාට්සයිට්, චානොකයිට්ස්, ගානට් සිල්මනෙට් හා ක්‍රිස්ටලයින් ටයිම්ටොන් වන පාෂාණ වලින් සමන්විත වේ. එබැවින් ස්වභාවික පිහිටීම අනුව නගරයට ස්වභාවික ලෙස ආරක්ෂාව හිමිවී ඇත.

4. නැරඹුම් ස්ථාන කිහිපයක් නගරය තුළ පිහිටා තිබීම

මහනුවර නගරය වටා විහිදී ඇති හන්තාන, බහිරව කන්ද හා ගන්නෝරුව කඳු පන්තීන් හේතුවෙන් නගරයේ ස්වභාව අලංකාරය වැඩි වී ඇති අතර එම අලංකාරය නගරය පුරා ඇවිද යාමේදී තැනින් තැන දර්ශනය වේ. කටුගස්තොට පාලම, මහනුවර ඔරලෝසු කණුව, දළදා මාළිගාව හා නුවර වැව පරිශ්‍රය මහනුවර දුම්රිය ස්ථානය, ගැටඹේ පාලම, ගැටඹේ හා පේරාදෙණිය පාලම වැනි ස්ථාන නගර දර්ශනය වන ස්ථාන ලෙස හඳුනාගත හැකි අතර මෙවැනි ස්ථාන නගරය පුරා ව්‍යාප්ත වී තිබීම තුළින් නගරයට පැමිණෙන්නන් ආකර්ෂණය කර ගැනීමට හැකියාව ලැබෙනවා සේම නගරයෙහි පවතින අද්විතීයත්වය ඉස්මතු කරලීමටද හැකියාව ලැබේ. පහත රූපයෙහි පෙන්වා ඇති පරිදි ස්වභාවික පිහිටීම තුළින් මෙවැනි ස්ථාන නිර්මාණය වී තිබීම නගරයට ලැබී ඇති සුවිශේෂී වටිනාකමක් ලෙස හඳුනාගත හැක.

*රූප අංක 5. 9. නගර දර්ශනය විදහා දක්වන ස්ථාන*




*මූලාශ්‍රය:* නගර දර්ශනය විදහා දක්වන ස්ථාන පිළිබඳ වූ ක්ෂේත්‍ර සමීක්ෂණය, නා.සං.අධි., 2017

5. මළ අපවහන හා අපජල කළමණාකරන ව්‍යාපෘතිය මඟින් නගර සහා බල ප්‍රදේශයෙන් 1/3ක ප්‍රදේශයක් ආවරණය වීම.

මහනුවර නගරය තුළ මේ වන විට මළ අපවහන පද්ධතිය මධ්‍යගත පද්ධතියකට සම්බන්ධ කිරීම මෙන්ම විධිමත් මළ අපවහන පද්ධතියක් සකස් කිරීම මූලික කරගනිමින් ක්‍රියාත්මක වන මළ අපවහන හා අපජල කළමනාකරණ ව්‍යාපෘතිය තුළින් මහනුවර මහ නගර සභා බල සීමාවෙන් 1/3 ක පමණ ප්‍රදේශයක් එනම් නාගරික භූමි ප්‍රදේශයෙහි හෙක්ටයාර් 733ක් පමණ ආවරණය වන පරිදි දෛනික සංක්‍රමණිකයන් 150,000ක්, අඩු පහසුකම් සහිත ප්‍රජාවට වැසිකිලි 512ක්, නිවැසියන් 55,000ක් සහ ව්‍යාපාර හා ගොඩනැගිලි 12,600ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරිමට යෝජිත ය. මෙම ව්‍යාපෘතිය මඟින් සම්පූර්ණ වශයෙන් ග්‍රාම නිලධාරි වසම් 10ක් සහ කොටස් වශයෙන් ග්‍රාම නිලධරී වසම් 16ක්ද ආවරණය කරනු ලබයි. 2019 වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කිරිමට නියමිත අතර ගන්නොරුවේ පිහිටි පිරිපහදු ඒකකයෙන් ධාරිතාව ඝණ මිටර 14,000ක් පිරිපහදු කිරිමටද නියමිතය. තවද, ක්‍රියාත්මක කිරිමට යෝජිත මැද ඇල ප්‍රතිසංස්කරණය කිරිමේ ව්‍යාපෘතිය මඟින්ද නගරයෙහි පාරිසරික සංවේදිතාවය තවදුරටත් වැඩි කර ගැනිමට හැකිවිම නගරය වෙත හිමිවි ඇති වරප්‍රසාදයක් ලෙසට හඳුනා ගත හැකිය.

**දුර්වලතා**

1. ක්‍රම ක්‍රමයෙන් වෘක්ෂ ලතා ඝණත්වය හීන වී යාම

මහනුවර රාජධානි සමයේදී අස්ගිරි විහාරය, ශ්‍රී දළදා මාලිගාව අවට, අම්පිටිය හා වටපුළුව ආදී ප්‍රදේශ වල ව්‍යාප්තව පැවති නේවාසික ඒකක හැරුණු කොට අනෙකුත් සියළුම ස්ථාන වනාන්තර ලෙස පැවති නමුත් ක්‍රම ක්‍රමයෙන් ජනාවාස ව්‍යාප්තිය මෙන්ම නාගරිකරණය විමත් සමඟම වෘක්ෂ ලතා ව්‍යාප්තිය හීනවි ගොස් ඇත. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී 93% ක් පමණ පැවති වෘක්ෂලතා ඝණත්වය නිදහසට පෙර යුගය වන විට 52%ක් දක්වා ක්‍රමයෙන් හීනවි ඇති අතර එය නිදහසින් පසු යුගය වන විට 35% දක්වා තවදුරටත් පහත වැටීම මහනුවර නගරයෙහි පාරිසරික සමතුලිතතාවයට දැඩි තර්ජනයක් වි ඇත.

2. නාගරික ප්‍රවණතාවයන් හේතුවෙන් ජල මූලාශ්‍ර වලට හානි පැමිණිම

මහනුවර නගරය මධ්‍ය හරහා ජල මූලාශ්‍ර කිහිපයක්ම ගලා බසින අතර ඒවා වර්තමානය වන විට දැඩි තර්ජනයකට ලක් වී ඇති අතර ජල පෝෂක ප්‍රදේශයන්හි පවතින සංවර්ධන කාර්යයන් වලින් පවතින බලපෑම් ලෙස අප ජලය, කැලි කසල ජල මූලාශ්‍රයන්ට එකතු කිරීම මෙන්ම මල පද්ධතීන්ද ජල මූලාශ්‍ර වෙත යොමු කර ඇති බවට හඳුනා ගත හැකිය. එමෙන්ම ඇල මාර්ගය ආවරණය වන පරිදි අවිධිමත් ඉදිකිරිම් සිදු කර තිබිමද මහනුවර නගරයෙහි බහුලව දැකිය හැකි ලක්ෂණයකි. මහනුවර නගරය තුළ සපයනු ලබන අධ්‍යාපනික, සෞඛ්‍ය හා අනෙකුත් සේවාවන්

නිසා නගරයෙහි ඉඩම් සඳහා දැඩි ඉල්ලුමක් පැවතීම හේතුවෙන් ඉඩම්වල මිල ප්‍රමාණයන්ද ඉහල අගයක් ගෙන ඇත. එබැවින් මධ්‍යම පාන්තික ජනයා විසින් වෙන්කරන ලද රක්ෂිත එනම් ඇළ රක්ෂිත, දුම්රිය රක්ෂිත තුළ තමන්ගේ ව්‍යාපාරික ස්ථාන මෙන්ම නිවෙස්ද ඉදි කිරීම හේතුවෙන් ජල පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ප්‍රදේශ අනවසරයෙන් අත්පත් කරගෙන ඇති ආකාරයක් මහනුවර නගරයෙහි දක්නට ලැබේ. මැද ඇළ එයට ප්‍රධානතම නිදසුනක් වන අතර මැද ඇළ පෝෂක ප්‍රදේශය පහත පරිදි හඳුනා ගත හැකිය.

*රූප අංක 5. 10. මැද ඇළ පෝෂක ප්‍රදේශය*



*මූලාශ්‍රය:* ස්වභාවික ජල මූලාශ්‍ර දූෂණය වීම හේතුවෙන් සමාජීය හා පාරිසරික වශයෙන් ඇති වී ඇති බලපෑම, ශ්‍රී ලංකාවේ මැද ඇළ

*වගු අංක 5. 4.මැද ඇල අවට භූමි පරිභෝජන රටාව වෙනස් වීමේ ස්වභාවය*




*මූලාශ්‍රය:* ස්වභාවික ජල මූලාශ්‍ර දූෂණය වීම හේතුවෙන් සමාජීය හා පාරිසරික වශයෙන් ඇති වී ඇති බලපෑම, ශ්‍රී ලංකාවේ මැද ඇළ

*වගු අංක 5. 5. මැද ඇල අවට භූමි පරිබෝජන රටාව වෙනස් වීමේ ස්වභාවය*

| භූමි පරිබෝජන වර්ගය | වෙනස්වීමේ ප්‍රමාණය 1972-2014 දක්වා |
|---|---|
| වනාන්තර | - 4.76% |
| ලඳු කැලෑ | - 26.3% |
| ගෙවතු | + 38.09% |
| කුඹුරු | - 100% |
| වගාබිම් | - 34.4% |
| නාගරික ප්‍රදේශ | + 251.2% |

*මූලාශ්‍රය:* ස්වභාවික ජල මූලාශ්‍ර දූෂණය වීම හේතුවෙන් සමාජීය හා පාරිසරික වශයෙන් ඇති වී ඇති බලපෑම, ශ්‍රී ලංකාවේ මැද ඇළ

ඉහත අධ්‍යයනයට අනුව මැද ඇල දෙපස භූමි පරිභෝජන රටාව දෙස බැලීමේදී 1972 සිට 2014 දක්වා වනාන්තර, ලඳු කැලෑ, කුඹුරු හා වගාබිම් ප්‍රමාණයන්හි අඩු වීමක් දක්නට ලැබෙන අතර ගෙවතු හා නාගරික ප්‍රදේශයන්හි වැඩි වීමක් දක්නට ලැබේ. එවැනි හේතු සාධක මත මැද ඇළ මෙන්ම අනෙකුත් ජල මුලාශ්‍රයන් විනාශ වීමට හේතු පාදක වී ඇති අතර මෙම තත්වය නගරයෙහි ස්වභාව අලංකාරයට මෙන්ම මධ්‍යම පාරිසරික සංවේදී කලාපය වෙතද බලපෑම් එල්ල වන බැවින් එය මහනුවර නගරයෙහි පවතින දුර්වලතාවයක් ලෙසට හඳනා ගත හැකිය.

3. පවතින අවිධිමත් ඉදිකිරීම් හේතුවෙන් නැරඹුම් ස්ථාන වලට බාධා පැමිණීම

මහනුවර නගරය තුළ පිහිටි ස්වාභාවික ස්ථාන හා විචිත්‍රත්වය ඉස්මතු වන ලෙසට දර්ශනය වන ස්ථාන කිහිපයක්ම ව්‍යාප්තව පවතින අතර ඒම ස්ථාන කටුගස්තොට පාලම, මහනුවර ඔරලෝසු කණුව, ශ්‍රී දළදා මාළිගාව, නුවර වැව පරිශ්‍රය, මහනුවර දුම්රිය ස්ථානය, ගැටඹේ පාලම, ගැටඹේ හා පේරාදෙණිය පාලම ආදී ස්ථාන වල ව්‍යාප්තව පවතින බව හඳුනාගත හැකිය. මෙම ස්ථාන වලට දර්ශණය වන කඳු පංති හා ඒ අවට පරිසරයෙහි විචිත්‍රත්වයට හානි වන ලෙසට ඉදිකිරීම් ව්‍යාප්තවිම නගරයෙහි පාරිසරික සමතුලිතතාවයට මෙන්ම නරයෙහි අද්විතීයතත්වයට තර්ජනයක් වී ඇති ආකාරය පහත රුපයෙන් මොනවට පැහැදිලි වේ..

*රූප අංක 5. 11. මහනුවර නගයෙහි අතීත ස්වරූපය හා වර්තමාන ස්වරූපය*





*මූලාශ්‍රය : ලංකාපුර.කොම් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ, 2018*

4. අංශක 45ට වඩා වැඩි බෑවුම් වල ගොඩනැගිලි ව්‍යාප්ත වීම

මහනුවර නගරයෙහි භූගෝලීය පිහිටීම දෙස බැලීමේදී මුහුදු මට්ටමේ සිට මීටර් 500-600ක පමණ උසකින් පිහිටා ඇත. ඒ අනුව ජනාවාස ව්‍යාප්තිය හා අනෙකුත් සංවර්ධනයන් දෙස බැලීමේදී බොහෝ සංවර්ධනයන් කඳු සහිත ප්‍රදේශයන් වෙත ව්‍යාප්ත වෙමින් පවතී. එය නගරයේ පාරිසරික සමතුලිතතාවයට මෙන්ම නගරයෙහි  අලංකාරයටද බාධාකාරී තත්වයක් මින් නිර්මාණය වේ.

මහනුවර නගරය හා ඒ අවට ප්‍රදේශය දෙස බැලීමේදී අංශක 45ට වඩා ආනතියක් ඇති ස්ථාන වල ඉදිකිරීම් ව්‍යාප්ත වී තිබීම හේතුවෙන්  දැනටමත් කඳු ප්රදේශ වෙත සංවර්ධනයන් බොහෝ ලෙස ව්‍යාප්තවී ඇති ආකාරය පහත රූපයෙන් පැහැදිලි වේ.

මහනුවර නගරය මධ්‍යම පාරිසරික සංවේදී කලාපය තුළ පිහිටා තිබීම නිසා මෙලෙස කඳු සහිත ප්‍රදේශ වලට සංවර්ධනයන් ව්‍යාප්තව වීම ගැටලුකාරී වනවා සේම එය මහනුවර නගරය තුළ පවතින පාරිසරික තර්ජනයක් ලෙසද හඳුනා ගත හැකිය.

*රූප අංක 5. 12. අංශක 45ට වඩා වැඩි බෑවුම් වල ගොඩනැගිලි ව්‍යාප්තිය*




*මූලාශ්‍රය: නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය 2013*

**අවස්ථා**

1. මහනුවර නගරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය ජාතික භෞතික සැලසුම මඟින් මධ්‍යම පාරිසරික සංවේදී කළාපයක් ලෙස නම් කිරීම

2002-2050 ජාතික භෞතික සැලසුම් කෙටුම්පතට අනුව මුහුදු මට්ටමේ සිට මීටර් 300කට වඩා උසැති බිම් ප්‍රදේශය පාරිසරික සංවේදී කලාපයක් ලෙසට පහත සිතියමේ දැක්වෙන පරිදි හඳුනාගෙන ඇත. මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වන ගංගා ඇළ දොළ හා ජල පෝෂක ප්‍රදේශ වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විශාල පරිමාණයේ ව්‍යාපෘතීන් හා සංවර්ධනයන් මෙන්ම පවතින ජනාවාසද මෙම කලාපය තුළ අධෛර්යමත් කෙරෙන අතර මහනුවර දිස්ත්‍රික්කය තුළ ජනගහනය 500,000කට ආසන්න ප්‍රමාණයකට පවත්වා ගත යුතු බවට සඳහන් කර ඇත. ඒ අනුව මහනුවර නගරය තුළ ගංගා, ඇළ, දොළ හා ජල පෝෂක ප්‍රදේශ බහුලව ව්‍යාප්තව ඇති හෙයින් ජාතික භෞතික සැලසුම මඟින් එලෙස නම් කර තිබීම මෙම නගරය වෙත ලැබී ඇති වරප්‍රසාදයක් ලෙසට හඳුනාගත හැකිය.

*රූප අංක 5. 13. ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී කලාපය*




*මූලාශ්‍රය:* ජාතික භෞතික සැලසුම් කෙටුම්පත 2050, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

**තර්ජන**

1. නගරය වෙත නාගරික ප්‍රවණතාවයන් හා සංවර්ධනයන් සඳහා විශේෂ ඉල්ලුමක් පැවතීම.

මහනුවර නගරය තුළ ඇති වැදගත්කම මත නගරය වෙත දෙස් විදෙස් ආකර්ෂණය හිමිවනවා සේම සංවර්ධන කාර්යන් සඳහාද ආයෝජකයන් මෙන්ම ව්‍යාපාරිකයන්ගේද ආකර්ෂණය හිමි වී ඇත. අනාගත දැක්මට අනුව මෙන්ම ජාතික භෞතික සැලසුමට අනුව මහනුවර නගරය තුළ මහා පරිමාණ සංවර්ධන කාර්යයන් සීමා කිරීමක් කරනු ලැබේ. නමුත්, මහනුවර දිස්ත්‍රික්කය තුළ ප්‍රකාශයට පත්කරන ලද නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශ වල ඉඩම් අනුබෙදුම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වැඩිම ඉල්ලුමක් මහනුවර නගර සභා සීමා වෙත හිමිවී ඇති බව පහත දක්වා දක්වා ඇති ගොඩනැගිලි අයදුම් පත් හා ඉඩම් අනුබෙදුම් අයදුම්පත් වගුවෙන් හඳුනා ගත හැකි අතර එය නගරයෙහි පවතින පාරිසරික සංවේදී බවට තර්ජනයක් ලෙස හඳුනාගත හැකිය.

*වගු අංක 5. 6. 2017 වර්ෂයේ මහනුවර නාගරික සංවර්ධනයන් අධිකාරිය වෙත ලැබුණු ගොඩනැගිලි අයදුම්පත් හා ඉඩම් අනුබෙදුම් අයදුම්පත්*

| පළාත් පාලන ආයතනය | % | පළාත් පාලන ආයතනය | % | පළාත් පාලන ආයතනය | % |
|---|---|---|---|---|---|
| මහනුවර නගර සභාව | 52.52 | වත්තේගම | 0.94 | පාතහේවාහැට | 2.52 |
| ගඟවටකෝරළය | 21.07 | පාතදුම්බර | 1.52 | ගම්පොල | 2.2 |
| කුණ්ඩසාලේ | 4.72 | තුම්පනේ | 2.2 | නාවලපිටිය | 0.63 |
| හාරිස්පත්තුව | 4.08 | උඩුනුවර | 0.94 | කඩුගන්නාව | 1.89 |
| අකුරණ | 1.26 | යටිනුවර | 2.83 | උඩපළාත | 0.63 |

*මූලාශ්‍රය :* නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017

**අරමුණු 03: නාගරික ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම තුළින් නගර වැසියන් හා නගරය භාවිතා කරන්නන් සඳහා සුව පහසු ජීවන රටාවක් ලබා දීම.**

1. මධ්‍යම පළාතේ පිහිටා ඇති ප්‍රධාන පරිපාලන, සෞඛ්‍ය, අධ්‍යාපන සහ සේවා මධ්‍යස්ථානයක් වීම.
2. නගර අභ්‍යන්තර සහ අන්තර් නගර අතර සම්බන්ධතාවයක් පැවතීම.
3. මහනුවර නගරය තුළ බහුවිධ ප්‍රවාහන මාධ්‍යන් මධ්‍යගතව පිහිටා තිබීම
4. මහනුවර නගර සීමාව තුළ සෙසු පහසුකම් වර්ධනය කිරීමේ හඳුනා ගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වෙමින් පැවතීම.
5. මහනුවර නගරය තුළ විධිමත් ජල නිෂ්පාදනය හා ජල සැපයමක් පැවතීම.




1. මහනුවර නගරය තුළ විහිදී ඇති ප්‍රධාන මාර්ග දෙපස පාසල් රැසක් පිහිටා තිබීම.
2. ප්‍රජා විනෝද කටයුතු වෙනුවෙන් හෙක්ටයාර 129.7ක භූමි ප්‍රමාණයක අවශ්‍යතාවයක් පැවතීම.
3. නගර මධ්‍ය තුළ ඇවිද යාම සඳහා වූ ආකර්ශනීය පසුබිමක් නොමැති වීම.
4. මාර්ගය දෙපස හෝ රථ ගාල් වල වාහන නැවතා තැබීම සඳහා 150%ක ඉල්ලුමක් පැවතීම.
5. පොදු ප්‍රවාහන සේවා භාවිතා කිරීම අඩු මට්ටමක පැවතීම.
6. අඩු පහසුකම් සහිත නිවාස නගරය පුරා ව්‍යාප්තව පැවතීම.

1. යෝජිත අධිවේගී මාර්ගය

**ශක්තීන්**

1. මධ්‍යම පළාතේ පිහිටා ඇති ප්‍රධාන පරිපාලන, සෞඛ්‍ය, අධ්‍යාපන සහ සේවා මධ්‍යස්ථානයක් වීම.

මහනුවර මහරෝහල ශ්‍රී ලංකාවේ දෙවන විශාලම රෝහල වන අතර විශාල පිරිසකට ඉන් සේවාවන් ලබාදෙනු ලැබේ. මීට අමතරව පේරාදෙණිය ශික්ෂණ රෝහල, පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල, පේරාදෙණිය දන්ත රෝහල, මහනුවර ළය රෝහල සහ කටුගස්තොට ප්‍රාදේශීය රෝහල මඟින්ද සෞඛ්‍ය සේවාවන් සපයනු ලැබේ. මහනුවර මහරෝහල රෝහල් වාට්ටු 78කින් යුක්ත වන අතර, 2016 වර්ෂයේ ඇඳන් සංඛ්‍යාව 2200කට අසන්න වූ ඇඳන් සංඛ්‍යාව 2017 වර්ෂයේ දී 2300ට ආසන්න සංඛ්‍යාවක් දක්වා වර්ධනය වී අතර බාහිර රෝගීන් 2017 වර්ෂයේදී ලක්ෂ 04ක් හා නේවාසික රෝගීන් ලක්ෂ 02කට අසන්න ප්‍රමාණයක් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගෙන ඇත. ආයුර්වේද අංශය මඟින් නාගරික බල ප්‍රදේශය තුළ ආයුර්වේද මධ්‍යස්ථාන 14ක ප්‍රමාණයක් පවත්වාගෙන යන අතර, එමඟින් ජනතාවට සේවාවන් ලබාදෙනු ලැබේ. මහනුවර මහ රෝහල මඟින් සියළුම අංශවල ප්‍රතිකාර කටයුතු සිදුකරන අතර, ලංකාවේ විවිධ ප්‍රදේශවලින් මෙහි සේවාව බලාපොරොත්තුවෙන් විශාල ජනතාවක් දිනකට මහනුවර නගරය වෙත පැමිණෙන අතර එය 7,500ක පමණ ආසන්න ප්‍රමාණයක් වන බව ඇස්තමේන්තු කල හැක.

මහනුවර නගරය තුළ ප්‍රධාන වශයෙන් රජයේ පාසැල් 41ක් පවතින පාසැල් සංඛ්‍යාවෙන් පවතින අතර එහි 184,568කට ආසන්න ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබයි. ඉන් මහනුවර නගරය තුළ ප්‍රධාන වශයෙන් රජයේ පාසැල් 41ක් පවතින අතර 65,076ක් පමණ ශිෂ්‍යයන් සංඛ්‍යාවක්ද 3,177ක් පමණ ගුරුවරුන් සංඛ්‍යාවක්ද අනියුක්තව සිටින අතර මහනුවර නගරය ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානයක් මෙන්ම උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් වන බැවින් නගරය වෙත අධ්‍යාපන අවශ්‍යතාවයන් සඳහා දිනකට 63,000ක් පමණ ප්‍රමාණයක් පැමිණේ.

මහනුවර නගරය මධ්‍යම පළාතේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වන අතර සේවා අවශ්‍යතාවයන් සපයන ස්ථාන රැසකගෙන් මෙම නගරය සමන්විත වී ඇත. සංස්ථා, මණ්ඩල, සමුපකාර, පෞද්ගලික ආයතන, රාජ්‍ය හා පෞද්ගලික බැංකු, රාජ්‍ය ආයතන ආදී සේවා මධ්‍යස්ථාන 6111ක පමණ ප්‍රමාණයක් නගරය තුළ දැක ගත හැකිය.

මේ අනුව මහනුවර නගරය ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානයක්, සෞඛ්‍ය මධ්‍යස්ථානයක්, අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගත හැකි අතර එය ශ්‍රී ලංකාවේ දෙවන ප්‍රධානතම අග නගරය වීම තවත් එක් සුවිශේෂීතාවයක් ලෙස හඳුනා ගත හැකිය.

2. නගර අභ්‍යන්තර සහ අන්තර් නගර අතර සම්බන්ධතාවයක් පැවතීම

ප්‍රධාන වශයෙන් මහනුවර නගරයට ප්‍රවේශවන මාර්ග අතරින් නුවර - කොළඹ (A 01) මාර්ගය, කටුගස්තොට - කුරුණෑගල (A 10) මාර්ගය, නුවර - යාපනය (A 09) මාර්ගය, නුවර - මහියංගන - පදියතලාව (A 26) මාර්ගය, නුවර - බදුල්ල (රජමාවත) (B 413) මාර්ගය සහ පේරාදෙණිය - බදුල්ල - චෙන්කලඩි මාර්ගය (A 05) මාර්ගය යන මාර්ග මහනුවර නගරය හා සම්බන්ධ ප්‍රධාන මාර්ග පද්ධතිය වේ. මෙයින් A 01, A 09 සහ A 26 යන මාර්ග මහනුවර නගර මධ්‍ය සංවර්ධන කළාපයට ඍජුව සම්බන්ධ වේ. මෙම සම්බධතාවය හේතුවෙන් නගරය වෙත ශක්තිමත් අන්තර් හා අභ්‍යන්තර සම්බන්ධතාවයක් හිමි වී ඇති බව පහත රූපයෙන් හඳුනාගත හැකිය.

*සිතියම් අංක 5. 2. මහනුවර නගරය තුළ පවතින අන්තර් හා අභ්‍යන්තර සම්බන්ධතාවයන්*




*මූලාශ්‍රය:.නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2018*

3. මහනුවර නගරය තුළ බහුවිධ ප්‍රවාහන මාධ්‍යයන් මධ්‍යගතව පිහිටා තිබීම

මහනුවර නගරය තුළ පොදු බස් රථ නැවතුම් ස්ථාන 03 ක් වර්තමානය වන විට ක්‍රියාත්මක වන අතර ගුඩ්ෂෙඩ් බස් රථගාල, ඔරලෝසු කණුව අසල රථ ගාල හා ටොරින්ටන් රථ ගාල ඒ අතර ප්‍රධාන වේ.

*වගු අංක 5: 7. පෞද්ගලික බස් රථ මඟින් සපයනු ලබන ගමනාන්ත ප්‍රමාණය*

| බස් නැවතුම්පල | පෞද්ගලික බස් රථ මඟින් සපයනු ලබන ගමනාන්ත ප්‍රමාණය | |
|---|---|---|
| | නගර අභ්‍යන්තර | අන්තර් නගර |
| ගුඩ්ෂෙඩ් බස් රථ ගාල | 98 | 28 |
| ඔරලෝසු කනුව බස් රථ ගාල | 63 | 1 (ඒ/සී කොළඹ) |
| ටොරින්ටන් බස් රථ ගාල | 15 | |

*මූලාශ්‍රය:* මහනුවර ප්‍රවාහන සේවාව වැඩි දියුණු කිරීමේ වැඩසටහන, 2014

මහනුවර නගරය හා සම්බන්ධවන දුම්රිය මාර්ග 02 ක් පවතින අතර ප්‍රධාන මාර්ගය මහනුවර සිට පේරාදෙණිය දක්වාද, එතැන් සිට පේරාදෙණිය සිට කොළඹ දක්වා සහ පේරාදෙණිය සිට බදුල්ල දක්වා ලෙස මාර්ගය කොටස් 02 කට බෙදේ. අනෙක් මාර්ගය මහනුවර සිට මාතලේ දක්වා විහිදෙන අතර එම මාර්ගවල දෛනික දුම්රිය ගමන් වාරයන් 05ක් වන පරිදි ක්‍රියාත්මක වේ. මහනුවර නගර සීමාව තුළ දුම්රිය නැවතුම් පළවල් 06ක් සහ දුම්රිය නැවතුම් ස්ථාන 5ක් පිහිටා තිබෙන අතර මහනුවර ප්‍රධාන දුම්රිය නැවතුම් ස්ථානය හා ප්‍රධාන බස් නැවතුම් පොල යාබඳව නගර මධ්‍යයේ පැවතීම හේතුවෙන් බහුවිධ ප්‍රවාහනය මධ්‍යගතව පිහිටා ඇති බව හඳුනා ගත හැකිය. එය ප්‍රවාහන අංශයෙන් නගරය වෙත හිමිවී ඇති ශක්තියක් ලෙසට හඳුනා ගත හැකි අතර නගරය මධ්‍ය හරහා දුම්රිය මාර්ගය විහිදීමද සුවිශේෂී ලක්ෂණයක් වේ. එය පහත දක්වා ඇති රූපයේ පරිදි හඳුනා ගත හැකිය.

*රූප අංක 5. 14.: මහනුවර නගරය තුළ පිහිටා ඇති දුම්රිය නැවතුම් පලවල් හා ස්ථාන*




*මූලාශ්‍රය: මහනුවර ප්‍රවාහන සේවාව වැඩි දියුණු කිරීමේ වැඩසටහන, 2014*

4. මහනුවර නගර සීමාව තුළ හඳුනා ගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වෙමින් පැවතීම

මහනුවර නගරය දෙස් විදෙස් බොහෝ පාර්ශවයන්ගේ අවධානයට ලක් වූ නගරයක් ලෙස හඳුනා ගත හැකි අතර නගරය වෙත දේශීය මෙන්ම විදේශීය ආධාර මත ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන් බොහෝ ප්‍රමාණයකගේ අවධානයට ලක්වූ නගරයක් ලෙසට හඳුනා ගත හැකිය. ඒ අනුව වර්තමානය වන විට නගරය තුළ ක්‍රියත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන් ලෙස,

1. ශ්‍රී දළදා මාලිගාවෙහි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර I
2. ළමාගාර මාවතෙහි පදික මංතීරු වැඩි දියුණු කිරීමේ ව්යාපෘතිය
3. පේරාදෙණියේ සිට විලියම් ගොපල්ලව මාවත සංවර්ධනය කිරීම
4. ටෝමලින් පාර්ක්හි රථගාල සංවර්ධනය කිරීම
5. බහුකාර්යය මගී පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය
6. බෝගම්බර බන්ධනාගාර පරිශ්‍රය ඉදිරිපස සෙසු පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
7. මහනුවර අප ජල කළමණාකරණ ව්‍යාපෘතිය

ඉන් ප්‍රධාන ව්‍යාපෘතීන් ලෙස හඳුනාගත හැකි අතර මෙවැනි ව්‍යාපෘතීන් රැසක් මේ වන විට මහනුවර නගරය තුළ ක්‍රියාත්මක වෙමින් පැවතීම නගරය භාවිතා කරන්නන් සඳහා පහසුකම් ඉහළ නැංවීමට හේතු වී තිබේ.

5. මහනුවර නගරය තුළ විධිමත් ජල නිෂ්පාදනයක් හා ජල සැපයුමක් පැවතීම

මහනුවර නගර මායිමෙන් ගලා බසින මහවැලි ගඟ මඟින් නගර සීමාවෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් ආවරණය වේ. ඒ අනුව නගර සීමාව තුළ පිහිටා ඇති පොල්ගොල්ල, කොන්ඩදෙණිය හා ගැටඹේ යන ස්ථාන තුනෙන් ජල පිරි පහදුව සඳහා ජලය ලබා ගන්නා අතර මහනුවර මහා නගර සභාවෙන් පිටත නමුත් නගර සභා ආසන්න සීමාව තුළ එනම් හාරගම, බලගොල්ල හා මීවතුර යන ස්ථාන වලද ජල පිරි පහදුව සඳහා ජලය ලබා ගනී. මහනුවර නගර සීමාව තුළින් ලබා ගනු ලබන ජල ප්‍රමාණය දිනකට ඝන මීටර් 86,000ක් පමණ වන අතර එය මහනුවර නගරයෙන් ලබා ගනු ලබන සමස්ත ජල ප්‍රමාණයෙන් 63%ක් පමණ වේ. තවද, මහනුවර නගර සීමාව පිටතින් ලබා ගනු ලබන ජල ප්‍රමාණය දිනකට ඝන මීටර් 50,500ක් පමණ වන අතර එය මහනුවර නගරයෙන් ලබා ගනු ලබන සමස්ත ජල ප්‍රමාණයෙන් 37%ක් පමණ වේ. ඒ අනුව මහනුවර නගරයෙහි නිෂ්පාදිත සමස්ත ජල ප්‍රමාණයෙන් වැඩිම ප්‍රමාණයක් මහනුවර නගර සීමාව තුළින් ලබා ගැනීම මහනුවර නගරය වෙත ලැබී ඇති තවත් සුවිශේෂීත්වයක් ලෙසට හඳුනාගත හැකි අතර එය පහත වගුවෙන් වැඩිදුරටත් පැහැදිලි වේ.

*වගු අංක 5. 8.මහවැලි ගඟෙන් ජලය ලබා ගන්න ස්ථාන හා ඒවායෙහි ජල ප්‍රමාණයන්*

| ප්‍රදේශය | ජලය ලබා ගන්නා ස්ථාන | ප්‍රමාණය (දවසකට ඝන මීටර්) | % |
|---|---|---|---|
| මහනුවර මහ නගර සභාව තුළ | පොල්ගොල්ල | 10,000 | 63% |
| | කොන්ඩදෙනිය | 40,000 | |
| | ගැටඹේ | 36,000 | |
| | එකතුව | 86,000 | |
| මහනුවර මහ නගර සභාවෙන් පිටත | හාරගම | 2,000 | 37% |
| | බලගොල්ල | 10,500 | |
| | මීවතුර | 32,000 | |
| | මීවතුර | 6,000 | |
| | එකතුව | 50,500 | |
| එකතුව | | 136,500 | |

*මූලාශ්‍රය: ජල කර්මාන්ත අංශය, මහනුවර මහ නගර සභාව , 2017*

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා පානීය ජල සම්පාදනය මහනුවර මහ නගර සභාව මඟින් පමණක් සිදුකරනු ලබන අතර ජල සම්පාදන ක්‍රියාවලිය සිදුකිරීම සඳහා ගැටඹේ මහවැලි ගඟ, රොස්නික් ජලාශය හා දුණුමඩලාව වැව යන මූලාශ්‍රයන් මඟින් ජලය ලබා ගනී. ඉහත මූලාශ්‍ර මඟින් දිනකට ජලය ඝන මීටර් 36,000 ක් පමණ ලබාගන්නා අතර, ගැටඹේ හා වේල්ස්පාර්ක් යන ජල පවිත්‍රාගාර 02 මඟින් පිරිපහදු කරනු ලබයි. නගර සභාව සතු ඝන මීටර් 36,000ක ධාරිතාවය ප්‍රමාණවත් නොවන බැවින් දෛනිකව ජලය ඝන මීටර් 10,000 -12,000ක් අතර ප්‍රමාණයක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් මිල දී ගනී. ඒ අනුව අපේක්ෂිත ජනගහනය සඳහාත්, පවතින ජනගහනය සඳහාත්, මහනුවර නගරය තුළ විධිමත් ජල සැපයුමක් ලබා දිය හැකි බවට හඳුනාගත හැකිය.

**දුර්වලතා**

1. මහනුවර නගරය තුළ විහිදී ඇති ප්‍රධාන මාර්ග දෙපස පාසල් රැසක් පිහිටා තිබීම

මහනුවර නගරය වෙත අධ්‍යාපනික වශයෙන් වැදගත් ස්ථානයක් හිමිවී තිබීම හේතුවෙන් නගරය තුළ ජනප්‍රිය පාසල් විශාල ප්‍රමාණයක් පිහිටා ඇත. ඒ අනුව අධ්‍යාපනික අවශ්‍යතාවයන් සඳහා දිනකට මහනුවර නගරය වෙත 63,000කට ආසන්න ප්‍රමාණයක ජනතාවක් පැමිණේ. දිනකට පැමිණෙන පිරිසෙන් 71.4%ක් පමණ ප්‍රමාණයක් පෞද්ගලික වාහන වලින් පැමිණෙන අතර 25.4%ක් පමණ ප්‍රමාණයක් පෞද්ගලික පාසල් වෑන් රථ වලින්ද, 3.2%ක පමණ ප්‍රමාණයක්

වෙනත් ක්‍රමයන් වලින් අධ්‍යාපනික අවශ්‍යතා සඳහා නගරය වෙත පැමිණේ. මේ අනුව පැහැදිලි වනුයේ අධ්‍යාපනික අවශ්‍යතාවයන් සඳහා පැමිණෙන පිරිසෙන් බහුතරයක් පෞද්ගලික වාහන වලින් පහත වගුවෙන් පෙන්වා ඇති පරිදි පැමිණෙන බවත් එය වාහන තද බදයට වක්‍ර ආකාරයෙන් ඉවහල් වන බවත්ය.

*වගු අංක 5. 9. ප්‍රධාන මාර්ග වල වාහන හා පදිකයන්ගේ ඝණත්වය*

| මාර්ග | පැය 24 තුළ | |
|---|---|---|
| | වාහන | පදිකයන් |
| සිරිමාවෝ බණ්ඩාරනායක මාවත | 18.3% | 20.0% |
| විලියම් ගොපල්ලව මාවත | 19.0% | 34.2% |
| කටුගස්තොට පාර | 30.6% | 34.2% |
| පොල්ගොල්ල පාර | 3.6% | 1.3% |
| සිරිමල්වත්ත පාර | 3.8% | 1.8% |
| හේවාහැට පාර | 17.3% | 16.3% |
| අම්පිටිය පාර | 7.4% | 6.6% |

*මූලාශ්‍රය :* කුමාරගේ, 2014

ඉහත ගණනය කිරීම් වලට අනුව පැය 24ක් තුළ සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, විලියම් ගොපල්ලව මාවත හා කටුගස්තොට පාර තුළ වැඩිම පදිකයන් හා වාහන සංඛ්‍යාවක් දක්නට ලැබේ. විලියම්ගොපල්ලව මාවත, කටුගස්තොට පාර හා සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ආදී මාර්ගයන් දෙපස පාසල් වැඩි වශයෙන් පහත රූපයේ පරිදි පිහිටා ඇති අතර පාසල් ව්‍යාප්තිය හා ප්‍රධාන මාර්ග වල වාහන හා පදිකයන්ගේ ඝණත්වය සංසන්දනය කිරීම්දී වාහන ඝණත්වය වැඩි වීම සඳහා පාසල් වල ව්‍යාප්තිය බලපා ඇති බව අනාවරණය කර ගත හැකිය.

*රූප අංක 5. 15. මහනුවර නගරය තුළ පාසල් වල ව්‍යාප්තිය*




*මූලාශ්‍රය:* පාසල් වල ව්‍යාප්තිය පිලිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017

2 . ප්‍රජා විනෝද කටයුතු වෙනුවෙන් හෙක්ටයාර 129.7ක භූමි ප්‍රමාණයක අවශ්‍යතාවයක් පැවතීම

2012 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව නගරය තුළ 102,459ක් පමණ ජන සංඛ්‍යාවක් ජීවත් වන බවට වාර්තා කර ඇත. ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වෙනුවෙන් වෙන් කළ යුතු භූමි ප්‍රමාණයන් පිළිබඳ සම්මතයන්ට අනුව පුද්ගලයන් 1,000ක් වෙනුවෙන් හෙක්ටයාර 1.4ක භූමි ප්‍රමාණයක් වෙන් කළ යුතු අතර වර්තමානය වන විට මහනුවර නගරයෙහි ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වෙනුවෙන් වෙන් කරන ලද භූමි ප්‍රමාණය හෙක්ටයාර 18.7ක් පමණ වන බව ක්ෂේත්‍ර සමීක්ෂණ වලින් අනාවරණය වී ඇත. එම ස්ථාන වල ව්‍යාප්තිය පහත රූපයේ පරිදි හඳුනාගත හැකිය. වර්තමාන ජනගහනය වෙනුවෙන් ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වෙනුවෙන් පවත්වා ගතයුතු භූමි ප්‍රමාණයන්හි සම්මතයන්ට අනුව ප්‍රමාණවත් තරම් භූමි ප්‍රමාණයක් නොමැති වීම මහනුවර නගරය තුළ හඳුනාගත හැකි දුර්වලතාවයක් ලෙස දැක්විය හැක.

*රූප අංක 5. 16. ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වෙනුවෙන් මහනුවර නගරය තුළ වෙන් කර ඇති ස්ථාන*




*මූලාශ්‍රය:* ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වෙනුවෙන් නගරය තුළ වෙන් කර ඇති ස්ථානයන් පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය මධ්‍යම පළාත් කාර්යාලය මහනුවර 2017

නව සංවර්ධන සැලැස්මට අනුව මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට මහජනතාව 106,000ක් පමණ ප්‍රමාණයක් රදවා තබා ගැනීමට අපේක්ෂා කරනු ලබන අතර ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වෙනුවෙන් නගරය තුළ ඒ වෙනුවෙන් වෙන් කළ යුතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 148.4ක් පමණ වේ. ඒ අනුව අපේක්ෂිත ජනගහනය වෙනුවෙන් ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වෙනුවෙන් තවදුරටත් හෙක්ටයාර 129.7ක පමණ භූමි ප්‍රමාණයක් වෙන් කළ යුතුව ඇත. තවද වර්තමානය තුළ පවතින ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වල පවතින අඩු පහසුකම් හේතුවෙන් මහජන ආකර්ෂණය ඉතා අඩු මට්ටමක පැවතීමත් මෙම නගරය තුළ පවතින දුර්වලතාවයක් ලෙසට හැදින්විය හැකිය. ඒ බව පහත රූප වලින් මොනවට පැහැදිලි වේ.

*රූප අංක 5.17.. මහනුවර නගරය තුළ ප්‍රජා විනෝද කටයුතු හා විවෘත ස්ථාන වල පවතින අඩු පහසුකම්*



*මූලාශ්‍රය* : නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017

3. නගර මධ්‍යය තුළ ඇවිද යාම සඳහා වූ ආකර්ෂණීය පසුබිමක් නොමැති වීම

මහනුවර නගරය වෙත දිනකට 325,000කට ආසන්න මහ ජනතාවක් ප්‍රමාණයක් පැමිණෙන බවට අනාවරණය වී ඇති නමුත් නගරයෙහි ඇවිද යාම සඳහා පවතින ආකර්ෂණය මෙන්ම පහසුකම්ද ඉතා අඩු මට්ටමක පවතී. නගරය තුළ පදිකයන්ගේ ඝණත්වය පිළිබඳව සිදු කරනු ලැබූ අධ්‍යයනයන්ට අනුව ගුඩ්ෂෙඩ් ප්‍රදේශය, දළදා වීදිය ප්‍රදේශය, මහනුවර රෝහල දක්වා වූ ගමන් මාර්ගය හා මහනුවර වැව රවම ආශ්‍රිත ප්‍රදේශය හඳුනාගත හැකිය.

ඒ අනුව නගරය පුරා පදිකයන්ගේ විහිදීමක් දක්නට නොමැති අතර නගර මධ්‍යයට පමණක් එය සීමා වී ඇති බව නගරය තුළ පදිකයන් ඇවිද යාම පිළිබඳව අවධානය යොමු කිරීමේදී තව දුරටත් හඳුනාගත හැකිය. තවද ආබාධිත පුද්ගලයන් ඇවිද යාමේදී බාධාකාරී ලෙසට ඇතැම් ස්ථාන පැවතීම, අනාරක්ෂිත ස්ථාන හා සැගවුණු නමුත් පදිකයන් භාවිත කරන මාර්ගයන් පැවතීම ඒවා වැඩි දියුණු කර නොතිබීම, පටු මාවත් පැවතීම හා අවිධිමත්ව රථවාහන නවතා තැබීම නගරය තුළ ඇවිද යාම සඳහා පවතින ආකර්ෂණය හා පහසුකම් ඉතාමත් අඩු මට්ටමක පැවතීමට හේතු වී ඇත.

*රූප අංක 5.18. පදිකයින් ගැවසෙන ස්ථාන වල පවතින ගැටලු*



4. මාර්ගය දෙපස හෝ රථ ගාල් වල වාහන නැවතා තැබීම සඳහා 150%ක ඉල්ලුමක් පැවතීම

මහනුවර නගරය වෙත දිනකට 56,000කට ආසන්න ප්‍රමාණයක් රථ වාහන ඇතුළු වන අතර දිනකට 14,700කට ආසන්න ප්‍රමාණයක් නගර සීමාව තුළ නවතා තබන බවට ඇස්තමේන්තු ගත කළ හැකිය. නගර මධ්‍යය තුළ රථවාහන නැවතීමේ ස්ථාන සැපයීම ආසන්න වශයෙන් 3,225ක පමණ ප්‍රමාණයක් වේ. මාර්ගයෙන් පිටත නැවතීම් ආසන්න වශයෙන් 1,760ක් පමණ වන අතර මාර්ගය මත රථ වාහන නැවතීම් ආසන්න වශයෙන් 1,465ක් පමණ වන බවට ඇස්තමේන්තු ගත කළ හැකිය. ඒ අනුව නගර මධ්‍යය තුළ රථවාහන නැවතීම සඳහා පවතින ඉල්ලුම 150%ක් පමණ වන අතර එය ප්‍රමාණාත්මක වශයෙන් 4,850ක් පමණ අගයක් ගනී.

නගර මධ්‍යයෙන් පිටත රථවාහන නැවතීමේ ස්ථාන සැපයීම ආසන්න වශයෙන් 2,585ක පමණ ප්‍රමාණයක් වේ. මාර්ගයෙන් පිටත නැවතීම් ආසන්න වශයෙන් 1,760ක් පමණ වන අතර මාර්ගය මත රථ වාහන නැවතීම් ආසන්න වශයෙන් 825ක් පමණ වන බවට ඇස්තමේන්තු ගත කළ හැකිය. ඒ අනුව නගර මධ්‍යයෙන් පිටත සීමාව තුළ රථවාහන නැවතීම සඳහා පවතින් ඉල්ලුම 150%ක් පමණ වන අතර එය ප්‍රමාණාත්මක වශයෙන් 3,900ක් පමණ අගයක් ගනී. වර්තමානය වන විට රථ වාහන නැවතීම සඳහා ප්‍රමාණවත් තරම් ඉඩ පහසුකම් නොමැති වීම නගරයෙහි පවතින දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

*රූප අංක 5.19. මහනුවර නගරය තුළ රථ වාහන නැවතීම සඳහා පවතින ස්ථාන*




*මූලාශ්‍රය:* මහනුවර නගරය තුළ රථ වාහන නැවතීම සඳහා පවතින් ස්ථාන පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණය

5. පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීම අඩු මට්ටමක පැවතීම

මහනුවර නගරය වෙත දිනකට 325.000 කට ආසන්න ජන ප්‍රමාණයක් පැමිණෙන අතර එයින් 90,000ක් පමණ ප්‍රමාණයක් රැකියා අවස්ථා සඳහාද 60,000 ක පමණ ප්‍රමාණයක් අධ්‍යාපනික අවශ්‍යතා සඳහාද වේ. පොදු ප්‍රවාහන භාවිතය මහනුවර නගරය තුළ 64% ක් පමණ වන අතර දුම්රිය භාවිතය 2%ක පමණ අඩු අගයක් ගනී. එය ජාතික මට්ටමේ භාවිතයට වඩා ඉතා අඩු ප්‍රමාණයක් වීම දුර්වලතාවයක් ලෙසට හඳුනාගත හැකිය.

6. අඩු පහසුකම් සහිත නිවාස අක්කර 78ක පමණ ප්‍රමාණයක් පුරාවට නගරය පුරා විසිරී තිබීම.

මහනුවර නගරය තුළ අඩු පහසුකම් සහිත නිවාස ව්‍යාප්තියක් පවතින අතර එවැනි ස්ථාන 36ක් පමණ මේ වන විට හඳුනාගෙන ඇත. එම නිවාස අක්කර 80ක පමණ ප්‍රදේශයක් පුරාවට ව්‍යාප්තව ඇති අතර නිවාස ඒකක 2,176ක් පමණ එම ස්ථාන වල පවතින බවට ඇස්තමේන්තු කළ හැකිය. එම නිවාස ප්‍රමාණයෙන් 71%ක පමණ නිවාස ඒකක වල ජීවත් වන ජනතාව පර්චස් 06ට අඩු භූමි භාගයක ජීවත් වේ. එම අඩු ආදායම් ලාභී නිවාස පිහිටා ඇති ඉඩම් වල හිමිකාරීත්වය දෙස බැලීමේදී 47%ක පමණ ප්‍රමාණයක් මහනුවර මහනගර සභාව සතු ඉඩම්, 20%ක් පමණ පෞද්ගලික ඉඩම්, 16%ක් පමණ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත්වන ඉඩම්, 11%ක් පමණ ආගමික ස්ථාන වලට අයත් ඉඩම්, 4%ක් පමණ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් වන ඉඩම්, 2%ක් පමණ රජය සතු ඉඩම් ලෙස හඳුනාගත හැකිය.

*රූප අංක 5. 20.මහනුවර නගරය තුළ අඩු ආදායම් ලාභී නිවාස වල ව්‍යාප්තිය*




*මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය 2016*

මෙලෙස අඩු අදායම් ලාභී නිවාස නගරය පුරා ව්‍යාප්තව පැවතීම නාගරික නේවාසික ව්‍යාප්තියට ගැටලුකාරී තත්වයක් උදා කරන අතර එය මහනුවර නගරය තුළ පවතින දුර්වලතාවයක් ලෙසට හඳුනාගත හැකිය.

**අවස්ථා**

1. යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය

ජාතික භෞතික සැලසුම් 2050 කෙටුම්පත ට අනුව යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය කඩවත සිට පොතුහැර හරහා දඹුල්ල දක්වාද, පොතුහැර සිට ගලගෙදර දක්වාද ඉදිකිරීමට යෝජිත වේ.

ඒ අනුව ගලගෙදර පිවිසුම් මාර්ගය හරහා මධ්‍යම අධිවේගී මාර්ගයට ප්‍රවේශවීමේ හැකියාවක් පවතී. එය මහනුවර නගරයට හිමිවී ඇති වරප්‍රසාදයක් ලෙසට හඳුනාගත හැකිය.

**අරමුණු 04: පවතින සම්පත් උපයෝජනය කිරීම තුළින් ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගීම.**

**S**

1. දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණීය ස්ථාන නගරය තුළ පිහිටා තිබීම.
2. ශ්‍රී ලංකාවේ සමස්ත හෝටල් සංඛ්‍යාවෙන් 10%ක් පමණ මහනුවර නගරය තුළ පිහිටා තිබීම.
3. ජාතික දළ දේශීය නිෂ්පාදනය සඳහා මධ්‍යම පළාතේ දායකත්වය 04 වැනි ස්ථානයේ පැවතීම.
4. විශේෂ කාලවලදී පවත්වනු ලබන උත්සව වෙනුවෙන් විශාල පිරිසක් නගරය වෙත පැමිණීම.
5. දේශීය හා විදේශීය සංචාරකයන් මහනුවර නගරය තුළ රැඳීමේ ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම.

**W**

1. හෙක්ටයාර 46ක් පමණ ඌණ උපයෝජන ඉඩම් ලෙස පැවතීම.
2. දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා මහනුවර නගරය තුළ හෝටල් කාමර සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.

**O**

1. මහනුවර නගරය වටා සංචාරක ආකර්ෂණීය ස්ථාන රැසක් පිහිටා තිබීම.
2. සුළු හා ගෘහස්ථ කර්මාන්ත නගරය වටා පිහිටා තිබීම.
3. මහනුවර නගරය කේන්ද්‍ර කරගත් අධි නාගරික කලාපයක් ලෙසට ජාතික භෞතික සැලසුම මඟින් හඳුනාගෙන තිබීම.

**T**

**ශක්තීන්**

1. දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණීය ස්ථාන නගරය තුළ පිහිටා තිබීම.

   මහනුවර නගරය තුළ දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගන්නා ලද ස්ථාන රැසක් පිහිටා තිබෙන අතර ඒවා අතරින් ශ්‍රී දළදා මාළිගාව ඉන් ප්‍රධාන තැනක් හිමිවේ. අනෙකුත් ස්ථාන ලෙසට

   ගැලිසන් ආදාහනාගාරය
   උඩවත්ත කැළය හා වාකරවත්ත
   බහිරවකන්ද විහාරය
   මහනුවර දර්ශන ස්ථාන (view point)
   වේල්ස් උද්‍යානය
   ගැටඹේ විහාරය
   යුධ ආදාහනාගාරය
   පේරාදෙණිය, උද්භිත උද්‍යානය
   ලෝක බෞද්ධ කෞතුකාගාරය
   මහනුවර නුවර වැව රවුම
   ආදී ස්ථාන හඳුනාගත හැකිය.

2. ශ්‍රී ලංකාවේ සමස්ත හෝටල් සංඛ්‍යාවෙන් 10%ක් පමණ මහනුවර නගරය තුළ පිහිටා තිබීම.

   මහනුවර නගරය තුළ තරු පන්තියේ හෝටල් විශාල ප්‍රමාණයක් පිහිටා ඇති අතර ඒවා තරු 5 පන්තියේ සිට කුඩා පරිමාණයේ ආගන්තුක නිවාස දක්වා වූ පරාසයක් තුළ විහිදී ඇත. ඒවා අතර මධ්‍යම පළාතේ තරු පහේ පන්තියේ හෝටල් ප්‍රමාණයෙන් හෝටල් 02ක් පමණ මහනුවර නගරය තුළ පිහිටා ඇත.

   ශ්‍රී ලංකාවේ සමස්ත හෝටල් ප්‍රමාණයෙන් 10%ක් හා සමස්ත හෝටල් කාමර සංඛ්‍යාවෙන් 10.2%ක් පමණ මහනුවර නගරය තුළ පිහිටා තිබීම නගරය වෙත හිමිවී ඇති ශක්තියක් ලෙසට හඳුනාගත හැකිය.

*වගු අංක 5. 10.මහනුවර නගරය තුළ පිහිටා ඇති හෝටල් ප්‍රමාණය*

| හෝටල් වර්ග | ශ්‍රී ලංකාවේ මුළු හෝටල් | මධ්‍යම පළාත තුළ පිහිටි හෝටල් | % | මහනුවර | % |
|---|---|---|---|---|---|
| තරු 5 හෝටල් | 13 | 3 | 23 | 2 | 67 |
| තරු 4 හෝටල් | 13 | 4 | 31 | 1 | 25 |
| තරු 3 හෝටල් | 13 | 5 | 38 | 2 | 40 |
| තරු 2 හෝටල් | 39 | 7 | 18 | 5 | 71 |
| තරු 1 හෝටල් | 31 | 7 | 23 | 3 | 43 |
| හෝටල් (වර්ග නොකල) | 140 | 25 | 18 | 12 | 48 |
| කුඩාපරිමාණයේ හෝටල් | 19 | 3 | 16 | 1 | 33 |
| කුඩාපරිමාණයේ ආගන්තුක නිවාස | 25 | 8 | 32 | 4 | 50 |
| BB ඒකක | 92 | 22 | 24 | 15 | 68 |
| ආගන්තුක නිවාස | 292 | 79 | 27 | 42 | 53 |
| පෞරාණික නිවාස | 48 | 13 | 27 | 7 | 54 |
| තානායම් | 368 | 34 | 09 | 23 | 68 |
| විදේශ නියෝජිත ආයතන | 487 | 10 | 02 | 10 | 100 |
| සංචාරක වෙළඳ සැල් | 144 | 37 | 26 | 26 | 70 |

*මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය, 2017*

3. දළ දේශීය නිෂ්පාදනය සඳහා මධ්‍යම පළාතේ දායකත්වය 03 වැනි ස්ථානයේ පැවතීම.

2015 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදනය සඳහා මධ්‍යම පළාතේ දායකත්වය 10.3% වන අතර එය සියලු පළාත් අතරින් 04 වැනි ස්ථානය ගනු ලබයි. කෘෂිකාර්මික අංශයෙන් 13.8%ක්ද, කර්මාන්ත අංශයෙන් 7.9%ක්ද සේවා අංශයෙන් 11.0%ක්ද ජාතික දළ දේශීය නිෂ්පාදන සඳහා දායකත්වය සපයනු ලැබේ. ඒ අනුව පළාත් දළ දේශීය නිෂ්පාදනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයෙන් කෘෂිකාර්මික අංශය සඳහා 5.5%ක්ද, කර්මාන්ත අංශය සඳහා 22.8%ක්ද සේවා අංශය සඳහා 71.6%ක්ද දායකත්වය සපයනු ලබන බව පුරෝකථනය කළ හැකිය.

*රූප අංක 5.21. දළ දේශීය නිෂ්පාදනය 2015 - 2017*

**Share of PGDP in the overall GDP**




*මූලාශ්‍රය:* වාර්ෂික සංඛ්‍යා ලේඛන වාර්තාව, මහ බැංකුව -2016

4. විශේෂ කාලවලදී පවත්වනු ලබන උත්සව වෙනුවෙන් විශාල පිරිසක් නගරය වෙත පැමිණීම.

මහනුවර නගරය තුළ පවත්වනු ලබන විශේෂිත උත්සව ලෙස දළදා පෙරහැර , විශේෂිත ධාතු ප්‍රදර්ශන, අලුත් සහල් මංගල්‍යය, නානු මුර මංගල්‍ය ආදී උත්සව හැඳින්විය හැකි අතර දෛනිකව දළදා මාළිගය වෙත පැමිණෙන බැතිමතුන් ප්‍රමාණය 5000කට ආසන්න වන අතර විශේෂ අවස්ථාවලදී 5000 සිට 50000 ඉක්මවා යන බව ගණනය කර ඇත.

*වගු අංක 5. 11. ශ්‍රී දළදා මාළිගාව වෙත සාමාන්‍ය දිනකදී පැමිණෙන බැතිමතුන් සංඛ්‍යාව*

| දිනය | වේලාව | | | | |
|---|---|---|---|---|---|
| | පෙ.ව 5.00 පෙ.ව 8.00 | පෙ.ව 8.00 පෙ.ව 11.00 | පෙ.ව 11.00 ප.ව 2.00 | ප.ව 2.00 ප.ව 5.00 | ප.ව 5.00 ප.ව 8.00 |
| සාමාන්‍ය දිනකදී | 950 – 1100 | 800 – 1200 | 500 – 600 | 400 – 800 | 600 – 950 |
| පෝය දිනකදී | 2500 – 8500 | 10000 – 15000 | 7000 – 9000 | 8000 – 10000 | 6000 – 9000 |
| වෙනත් නිවාඩු දිනකදී | 3500 - 7000 | 8000 - 11000 | 6000 - 7000 | 4000 - 7000 | 3000 – 6000 |

*මූලාශ්‍රය : ශ්‍රී දළදා මාළිගාව සංවර්ධන ව්‍යාපෘතිය , නාගරික සංවර්ධන අධිකාරිය මහනුවර, 2016*

මීට අමතරව දිනකට විදේශීය සංචාරකයින් 600 – 700ත් අතර ප්‍රමාණයක් පැමිණෙන අතර එය නගරය වෙත හිමිවී ඇති ශක්තියක් ලෙසට වැඩිදුරටත් හඳුනාගත හැකිය.

5. දේශීය හා විදේශීය සංචාරකයන් මහනුවර නගරය තුළ රැඳීමේ ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම.

2016 වර්ෂයේ වාර්ෂික සංචාරක සංඛ්‍යා ලේඛන දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගෙන් මහනුවර නගරය නරඹන්නට පැමිණ නගරය තුළ රැඳීමේ ප්‍රමාණය 77.47%ක පමණ අගයක් ගනු ලබන අතර එය ශ්‍රී ලංකාවේ සමස්ත රැඳීමේ ස්ථාන වලින් වැඩිම අගයක් ගනු ලබන ස්ථානය බවට පත් වී ඇත. ශ්‍රී ලංකාවෙහි සංචාරකයන් විසින් රැය ගත කිරීමේ ප්‍රමාණයෙන් පූජා නගරවල සංචාරකයන් රැය ගත කිරීමේ ප්‍රමාණය 75.24% පමණ වන අතර මහනුවර නගරය තුළ පවතින හෝටල් වල විදේශීය සංචාරකයන් රැය ගත කිරීමේ ප්‍රමාණයෙන් 44.3%ක් ද, දේශීය සංචාරකයන් රැය ගත කිරීමේ ප්‍රමාණයෙන් 34.5%ක් ද වේ. එය සැලකිය යුතු මට්ටමක පැවතීම නගරය වෙත හිමි වී ඇති ශක්තියක් ලෙස හඳුනාගත හැකිය.

*රූප අංක 5.22. දේශීය හා විදේශීය සංචාරකයන් මහනුවර නගරය තුළ රැඳීමේ ප්‍රමාණය*

**Monthly Occupancy Rates in Tourist Hotels by Region - 2016**

Table 13

| Resort Region | No. of Units ** | Rooms ** | Jan | Feb | Mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec | Annual O/R |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **Colombo City** | 34 | 4,319 | 70.80 | 76.28 | 77.89 | 71.91 | 73.89 | 69.89 | 78.64 | 84.87 | 69.90 | 74.29 | 77.51 | 86.11 | 76.75 |
| | | | | | | | | | | | | | | | |
| **Greater Colombo** | 62 | 3,184 | 81.88 | 77.62 | 78.98 | 70.81 | 72.09 | 67.335 | 78.97 | 76.77 | 69.80 | 72.86 | 74.80 | 80.34 | 75.18 |
| 1. North of Colombo | 52 | 2,711 | 83.89 | 78.85 | 79.35 | 74.88 | 70.22 | 69.35 | 78.35 | 77.69 | 70.20 | 71.83 | 74.21 | 81.21 | 75.84 |
| 11. South of Colombo | 10 | 473 | 79.87 | 76.39 | 78.61 | 66.73 | 73.84 | 65.32 | 79.58 | 75.85 | 69.30 | 73.89 | 75.38 | 79.47 | 74.52 |
| | | | | | | | | | | | | | | | |
| **South Coast** | 142 | 8,437 | 81.57 | 79.21 | 76.91 | 72.54 | 61.82 | 67.99 | 78.24 | 72.85 | 73.65 | 67.06 | 76.93 | 82.08 | 74.24 |
| 1. Up to Galle | 81 | 5,739 | 83.27 | 81.21 | 77.27 | 73.13 | 65.14 | 68.41 | 77.32 | 73.13 | 73.30 | 70.54 | 77.63 | 81.04 | 75.12 |
| 11. Beyond Galle | 61 | 2,698 | 79.87 | 77.21 | 76.54 | 71.94 | 58.49 | 67.56 | 79.15 | 72.57 | 74 | 63.57 | 76.23 | 83.12 | 73.35 |
| | | | | | | | | | | | | | | | |
| **East Coast** | 25 | 1,121 | 77.80 | 81.52 | 80.87 | 73.14 | 61.94 | 71.64 | 78.94 | 79.81 | 74.70 | 71.89 | 69.13 | 77.65 | 74.92 |
| | | | | | | | | | | | | | | | |
| **High Country** | 32 | 1,178 | 76.74 | 79.81 | 81.24 | 76.82 | 67.63 | 69.34 | 80.31 | 75.87 | 70.60 | 73.11 | 68.32 | 83.17 | 75.24 |
| | | | | | | | | | | | | | | | |
| **Ancient Cities** | 82 | 3,990 | 81.51 | 81.00 | 79.49 | 75.00 | 63.96 | 69.87 | 76.39 | 79.27 | 71.34 | 70.29 | 75.56 | 81.85 | 75.46 |
| 1. Kandy Area | 31 | 1,651 | 83.84 | 82.78 | 82.78 | 72.25 | 67.81 | 73.54 | 75.48 | 84.79 | 73.60 | 69.87 | 78.25 | 84.67 | 77.47 |
| 11.Anuradhapura Area | 16 | 400 | 80.78 | 82.56 | 81.44 | 76.53 | 66.74 | 72.58 | 74.31 | 81.42 | 73.20 | 67.29 | 74.26 | 84.35 | 76.28 |
| 111.Polonnaruwa/ Giritale | 11 | 530 | 81.56 | 83.32 | 79.23 | 75.65 | 59.96 | 64.62 | 76.03 | 73.15 | 70.20 | 69.74 | 75.39 | 81.15 | 74.17 |
| 1V. Habarana/Sig./Damb. | 24 | 1,403 | 79.87 | 75.32 | 74.51 | 75.58 | 61.34 | 68.73 | 79.75 | 77.73 | 68.40 | 74.25 | 74.35 | 77.24 | 73.92 |
| | | | | | | | | | | | | | | | |
| **Northern Region** | 5 | 107 | 73.47 | 73.02 | 69.78 | 66.38 | 63.14 | 65.48 | 71.32 | 70.88 | 67.50 | 66.56 | 73.25 | 74.16 | 69.58 |
| | | | | | | | | | | | | | | | |
| **All Area*** | 382 | 22,336 | 80.06 | 79.02 | 78.29 | 72.91 | 65.84 | 68.87 | 77.43 | 77.31 | 71.20 | 70.57 | 74.49 | 81.11 | 74.76 |

*මූලාශ්‍රය:* සංචාරක සංවර්ධන අධිකාරිය, 2016

**දුර්වලතා**

I. හෙක්ටයාර 46ක් පමණ ඌණ උපයෝජන ඉඩම් ලෙස පැවතීම.

මහනුවර නගර තුළ ඉඩම් වල වටිනාකම පර්වසය රුපියල් ලක්ෂ 05 සිට 60 දක්වා වූ අගය පරාසයක් තුළ ව්‍යාප්ත වන අතර 50%ක් පමණ ප්‍රමාණයක් රජයේ ඉඩම් ලෙස හඳුනාගත හැකිය. මහනුවර නගය තුළ සම්පූර්ණ භූමි ප්‍රදේශය හෙක්ටයාර 2645ක් පමණ වන අතර හඳුනාගෙන ඇති ඌන උපයෝජන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 45.43ක් පමණ අගයක් ගනී. ඉඩම් වල වටිනාකම ඉතා ඉහළ අගයක් ගන්නා නගරයක් තුළ මෙලෙස ඌන උපයෝජන ඉඩම් පැවතීම නගරය තුළ ඇති තවත් එක් දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

*රූප අංක 5.23. මහනුවර නගරය තුළ හඳුනාගෙන ඇති ඌන උපයෝජන ඉඩම්*




*මූලාශ්‍රය:* මහනුවර නගරය තුළ ඉඩම් වල වටිනාකම පිලිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017

II. දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා මහනුවර නගරය තුළ හෝටල් කාමර සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.

මහනුවර නගරය තුළ 334ක් පමණ හෝටල් ප්‍රමාණයක් ව්‍යාප්තව පවතින අතර කාමර 18,510ට ආසන්න සංඛ්‍යාවක් ඉන් සපයනු ලැබේ. වර්ෂ 2011 හා 2016 අතර කාල පරාසය තුළ ශ්‍රී ලංකාවේ පෞරාණික නගරයන් තුළ සංචාරකයින් රැදීමේ ප්‍රමාණය 71.7% සිට 75.46%ක් දක්වා 3.76%ක ප්‍රමාණයකින් වැඩි වී ඇත. ඒ අනුව සංචාරකයින් පෞරාණික නගරයන් තුළ රැදීමේ අගයෙහි සාමාන්‍ය අගය 0.75%කින් වාර්ෂිකව වැඩි වී ඇති බව උපකල්පනය කළ විට 2030 වර්ෂයේදී සංචාරකයින් පෞරාණික නගරයන් තුළ රැදීමේ ප්‍රමාණය 10.53%කින් වැඩි විය හැකි බව පුරෝකථනය කළ හැකිය. ඒ අනුව වර්ෂ 2030 වන විට මහනුවර නගරය ආශ්‍රිත පෞරාණික කලාපය තුළ සංචාරකයන් රැදීමේ ප්‍රමාණය 86%කින් ඉහළ නැගිය හැකි බව අනාවරණය කර ගත හැකි නමුත් දැනට මහනුවර නගරය වෙත පැමිණෙන සංචාරකයින් නගරය තුළ එක් දිනක් හෝ අවම වශයෙන් රඳවා ගැනීමට හෝටල් හෝ වෙනත් සංචාරක කාමර 850කට වැඩි ප්‍රමාණයක අවශ්‍යතාවයක් පවතී.

**අවස්ථා**

1. මහනුවර නගරය වටා සංචාරක ආකර්ෂණීය ස්ථාන රැසක් පිහිටා තිබීම.

මහනුවර නගරය අවට සංචාරක ආකර්ෂණීය ස්ථාන රැසක් පිහිටා තිබෙන අතර ඇම්බැක්කේ, බලන, ගඩලාදෙණිය, රිවස්ටන්, පින්නවල, නුවරඑළිය, දඹුල්ල, සීගිරිය, මාතලේ අළුවිහාරය ආදී ස්ථාන ප්‍රමුඛත්වයක් ගනී. මෙම ස්ථාන වලට මහනුවර නගරයේ සිට ඉතා ඉක්මනින් ළගාවිය හැකි අතර මහනුවර නගරය මෙම ස්ථාන වලට කේන්ද්‍ර ගතව පිහිටීම නිසා සංචාරකයන් වැඩි වශයෙන් ආකර්ෂණය කරගත හැක.

2. මහනුවර නගරය අවට සුළු පරිමාණ ගෘහස්ථ කර්මාන්ත පැවතීම.

ස්වකීය අද්විතීයත්වයක් සහිත මහනුවර නගරය සුළු පරිමාණ ගෘහස්ථ කර්මාන්ත වලට ඉතා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශයක් ලෙසට හඳුනාගත හැකි අතර පිත්තල බඩු වාත්තු කිරීම, රිදී හා පිත්තල බඩු නිෂ්පාදනය, රත්තරං හා රිදී බඩු නිෂ්පාදනය, ලාක්ෂා හා ලී බඩු නිෂ්පාදනය, ඇඳුම් නිෂ්පාදනය, පැදුරු නිෂ්පාදනය, බෙර නිෂ්පාදනය, පලිඟු ආශ්‍රිත නිෂ්පාදනය, අනෙකුත් සැරසිලි, චිත්‍ර ඇඳීම, ඇත්දළ හා සේසත් නිෂ්පාදනය ආදී නිෂ්පාදන වලට මහනුවර නගරය ප්‍රසිද්ධියක් උසුලනු ලැබේ. එබැවින් නගරය පුරා ව්‍යාප්තව පවතින කුඩා වෙළඳසැල් වෙත සංචාරකයන්ගේ දැඩි ආකර්ෂණයක් පවතින බවටද හඳුනාගත හැකිය.

*වගු අංක 5. 12. මහනුවර නගරය පුරා ව්‍යාප්තව පවතින සුළු පරිමාණ ගෘහස්ථ කර්මාන්ත හා ප්‍රසිද්ධියට පත් ස්ථාන*

| සුළු පරිමාණ ගෘහස්ථ කර්මාන්ත | ප්‍රසිද්ධිය පත් ස්ථාන |
|---|---|
| පිත්තල බඩු වාත්තු කිරීම | මඩවල, කිරිවවුල, ඇම්බැක්කේ |
| රිදී හා පිත්තල බඩු නිෂ්පාදනය | දන්තුරේ, උල්ලදුපිටිය, අරත්තන, නිලාවෙල, පිලවෙල, මැදවල |
| රත්තරං හා රිදී බඩු නිෂ්පාදනය | ඇම්බැක්කේ, නිලාවෙල |
| ලාක්ෂා හා ලී බඩු නිෂ්පාදනය | ගුන්නෑපාන, ඇම්බැක්කේ, හපුවිද |
| ඇඳුම් නිෂ්පාදනය | තලගුනේ |
| පැදුරු නිෂ්පාදනය | හේනවෙල |
| බෙර නිෂ්පාදනය | කුරුගල, කුරුගන්දෙනිය |
| පලිඟු ආශ්‍රිත නිෂ්පාදනය | කිරිවවුල |
| අනෙකුත් සැරසිලි | කුළුගම්මන |
| චිත්‍ර ඇඳීම | නිලාගම |
| ඇත්දළ | කුණ්ඩසාලේ, මාවනැල්ල |
| සේසත් නිෂ්පාදනය | උන්වෙරුව |

*මූලාශ්‍රය:* ජීවන්ත මාගමගේ, මහනුවර යුගයේ කල ශිල්ප හා අත්කම් භාණ්ඩ, 2017

3. මහනුවර නගරය කේන්ද්‍ර කරගත් අධි නාගරික කලාපයක් ලෙසට ජාතික භෞතික සැලසුම් මඟින් හඳුනාගෙන තිබීම.

ජාතික භෞතික සැලසුම් 2050 කෙටුම්පත මඟින් මහනුවර නගරය කේන්ද්‍ර කරගත් අධි නාගරික කලාපය තුළ ජනගහනය 500,000ක පමණ ප්‍රමාණයක් අපේක්ෂා කරනු ලබන අතර එම කලාපය තුළ මහනුවර නගරය ප්‍රධාන අගනගරයක් ලෙසට හඳුනාගෙන තිබීම අවස්ථාවක් ලෙසට හඳුනාගෙන ඇත.

*රූප අංක 5.24. ජාතික භෞතික සැලසුම 2050 කෙටුම්පත් ට අනුව යෝජිත ජනගහනය*




*මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම කෙටුම්පත, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව 2050*

# සැලැස්ම

# 6

# 6. සැලැස්ම

## 6.1 සංකල්පිත සැලැස්ම

### 6.1.1. හැඳින්වීම

මහනුවර මහ නගර සහා බල ප්‍රදේශයෙහි අනාගත සංවර්ධනයන්හි භාවමය ප්‍රතිරූපය මහනුවර නගර සංවර්ධන සැලස්මෙහි සංකල්පිත සැලැස්ම තුළින් හඳුනාගත හැකිය. මහනුවර නාගරික බල ප්‍රදේශය මහනුවර දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන පරිපාලන කේන්ද්‍රය වන බැවින් සංකල්පිත සැලැස්ම සකස් කිරීමේදී විසල් මහනුවර නාගරික කලාපය කේන්ද්‍ර කරගත් අධ්‍යයන කලාපය පිළිබඳව අවධානය යොමු කරන ලදී. එමඟින් අධ්‍යයන කලාපය තුළ අනාගත සංවර්ධන දිශානතිය, සංවර්ධන නැඹුරුතාවය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින හා හඳුනාගන්නා ලද ව්‍යාපෘතීන් හා ජාතික භෞතික සැලැස්ම කෙටුම්පත් 2050 මඟින් හඳුනාගෙන ඇති සංකල්පිත සැලැස්ම ආදී කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර විකල්ප සංකල්පිත සැලැසුම් හඳුනාගන්නා ලදී.

ඒ අනුව මහනුවර නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගන්නා ලද කන්ද උඩරට උරුමයන්ගේ ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම, නීල හරිත පරිසරය ආරක්ෂා කර ගැනීම, සුව පහසු ජීවන රටාවක් ප්‍රතිස්ථාපනය කිරීම හා ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා ගමන් කිරීම යන අංශයන් පිළිබඳවද අවධානය යොමු කරමින් **"කන්ද උඩරට තේජාන්විත අග නගරය"** යන දැක්ම වෙත ළඟා විය හැකි සංකල්පිත සැලැස්ම තෝරාගන්නා ලදී.

### 6.1.2. විකල්ප සංකල්පිතයන්

#### *6.1.2.1. වර්තමාන සංවර්ධන නැඹුරුතාවය එලෙසම පවත්වාගෙන යාම*

වර්තමානය වන විට මහනුවර නගරය තුළ පවතින නාගරික ප්‍රවණතාවයත්, සංවර්ධන පීඩනයෙහි දිශානතියත් ඒ ආකාරයෙන්ම පවතවාගෙන යාමත් එමඟින් සංවර්ධන දිශානතියට හෝ පීඩනයට කිසිදු බාධාවක් සිදු නොකරමින් ස්වභාවික ලෙස නගරයෙහි සංවර්ධනය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමත් මෙම විකල්ප සංකල්පිතය මඟින් අදහස් කෙරේ.

මෙම විකල්ප සංවර්ධන සැලැස්මට අනුව නගර මධ්‍යය මෙන්ම පේරාදෙණිය කොළඹ පාර, කටුගස්තොට මාතලේ පාර හා තැන්නේකුඹුර-මහියංගන පාර යන ප්‍රධාන මාර්ග ඔස්සේද සංවර්ධන නැඹුරුතාවය ව්‍යාප්ත විය හැකි බවට හඳුනා ගත හැකිය. සංවර්ධන පීඩනය පිළිබඳ අධ්‍යයනයට අනුව එම සංවර්ධනය පාරිසරික සංවේදී කලාප මෙන්ම ස්වාභාවික විපත් වලට ගොදුරු විය හැකි ප්‍රදේශ වලටද ව්‍යාප්ත වීමට වැඩි ඉඩකඩක් පවතින බවට නිරීක්ෂණය වේ.

*රූප අංක 6. 1. වර්තමාන සංවර්ධන නැඹුරුතාවය එලෙසම පවත්වාගෙන යාම*




*මූලාශ්‍රය : විසල් මහනුවර සැලැස්ම කෙටුම්පත් -2030 , නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017*

*රූප අංක 6. 2: මහනුවර නගරය තුළ පවතින සංවර්ධන පීඩනය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර. 2017*

### 6.1.2.2. පර්ෂද නගර සහිත මධ්‍යගත සංවර්ධනය

මෙම විකල්ප සංවර්ධන සැලැස්මට අනුව මහනුවර නගර මධ්‍යය කේන්ද්‍ර කරගනිමින් පේරාදෙණිය, කටුගස්තොට හා දිගන යන කුඩා නාගරිකයන් තුළ වාණිජ සංවර්ධනයක් සිදුවෙමින් පවතින අතර එය පේරාදෙණිය නගරය කේන්ද්‍ර කර ගනිමින් හැදෙණිය, අලදෙණිය දෙසටත් කුණ්ඩසාලේ නගරය කේන්ද්‍ර කර ගනිමින් මඩවල , මැණික්හින්න, පල්ලේකැලේ දෙසටත් වර්ධනය සිදුවිය හැකි බවට හඳුනාගත හැකිය. නමුත්, භූගෝලීය පසුබිමට අනුව පේරාදෙණිය නගරය තුළ පවතින භූමි පරිහරණ රටාව හා සංවර්ධිත නැඹුරුතාවය සැලකිල්ලට ගැනීමේදී එය පාරිසරික සංවේදී කලාපයට මෙන්ම ස්වාභාවික ආපදා වලට නැඹුරුවිය හැකි ප්‍රදේශ වලට ව්‍යාප්ත වීමට ඉඩකඩ පැවති බවට නිරික්ෂණය වේ.

*රූප අංක 6. 3: පර්ෂද නගර සහිත මධ්‍යගත සංවර්ධනය*




*මූලාශ්‍රය : විසල් මහනුවර සැලැස්ම කෙටුම්පත-2030 , නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2017*

### 6.1.2.3. සංවර්ධන තීරය හා විශේෂිත නැඹුරුතාවයක් සහිත උප නාගරික මධ්‍යස්ථාන

පිළිමතලාව - කටුගස්තොට හා කුණ්ඩසාලේ - දිගන සංවර්ධන තීරයන් ලෙසට හඳුනාගනු ලබන අතර ඒ සඳහා භූමියේ බෑවුම, සංවර්ධන පීඩනය, පාරිසරික සංවේදිතාවය, ස්වාභාවික ආපදා වලට ගොදුරු විය හැකි ප්‍රදේශ, භූමියෙහි ඒකාබද්ධතාව, පදනම් කරගනිමින් මෙම තීරයන් දෙක හඳුනාගෙන ඇත. තවද, මහනුවර නගර මධ්‍යය, කුණ්ඩසාලේ, කටුගස්තොට හා පේරාදෙණිය දැනට පවතින භූමි පරිභෝජන නැඹුරුතාවය දෙස සැලකිල්ලට ගනිමින් ඒවා විශේෂිත නාගරික ප්‍රදේශ ලෙසට හඳුනාගෙන ඇත. මෙලෙස හඳුනාගනු ලබන ස්ථානයකට සංවර්ධනය සීමා කිරීම

තුළින් වර්ධනය වන යටිතල පහසුකම් ප්‍රමාණය මත සංවර්ධන ව්‍යාප්තීන් ඉහළ ප්‍රදේශ වලට මෙන්ම පාරිසරික සංවේදී කලාප වලට ව්‍යාප්ත වීම පාලනය කිරීමට හැකියාවක් ලැබේ.

*රූප අංක 6. 4:සංවර්ධන තීරය හා විශේෂිත නැඹුරුතාවයක් සහිත උප නාගරික මධ්‍යස්ථාන*




*මුලාශ්‍රය : විසල් මහනුවර සැලැස්ම කෙටුම්පත-2030 , නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2017*

සංවර්ධන සැලැස්මෙහි දැක්ම මඟින් පිළිබිඹු වන අරමුණු පදනම් කර ගනිමින් වඩාත් ගැලපෙන සංවර්ධන සංකල්පය හඳුනාගන්නා ලදී.

*වගු අංක 6. 1. විකල්ප සංකල්පිතයන් සඳහා බර තැබීම*

| | මහනුවර උරුමය සංරක්ෂණය කිරීම | නීල හරිත පරිසරයක් ගොඩනැගීම | සුවපහසු ජීවන රටාවක් ප්‍රතිස්ථාපනය | කාර්යක්ෂම ආර්ථිකයක් ගොඩනැගීම | එකතුව |
|---|---|---|---|---|---|
| වර්තමාන සංවර්ධන නැඹුරුතාවය එලෙසම පවත්වාගෙන යාම | 3- | 3- | 1+ | 2+ | 3- |
| පර්ෂද නගර සහිත මධ්‍යගත සංවර්ධනය | 1+ | 1+ | 2+ | 2+ | 6+ |
| සංවර්ධන තීරය හා විශේෂිත නැඹුරුතාවයක් සහිත උප නාගරික මධ්‍යස්ථාන | 2+ | 3+ | 2+ | 2+ | 9+ |

*මුලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය , මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර ,2017*

ඒ අනුව දැක්ම වෙත ළඟා විය හැකි සංකල්පිත සැලැස්ම ලෙස "සංවර්ධන තීරය හා විශේෂිත නැඹුරුතාවයක් සහිත උප නාගරික මධ්‍යස්ථාන" හඳුනාගන්නා ලදී. මෙහිදී පල්ලෙකැලේ හා දිගන උප නාගරික නගර මහනුවර මහ නගර සභා සීමාවට අයත් නොවන බැවින් මහනුවර මහ නගර සභා සීමාව සඳහා පහත පරිදි විස්තරාත්මක සංකල්පිත සැලැස්ම පිළියෙල කර ඇත.

### 6.1.3. සංවර්ධන තීරය හා විශේෂිත නැඹුරුතාවයක් සහිත උප නාගරික මධ්‍යස්ථාන

*රූප අංක 6. 5:මහනුවර නගරය සඳහා යෝජිත විකල්ප සංකල්පිත සැලැස්ම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය , මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017*

### 6.1.4. සංකල්පිත සැලැස්ම සමග දැක්ම, අරමුණු හා පරමාර්ථ අතර පවතින සම්බන්ධතාවය

මහනුවර මහ නගර සහා බල ප්‍රදේශය වර්තමානය වන විට මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව වර්ෂ 2030 වන විටත් මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රධානතම නාගරික මධ්‍යය කලාපය ලෙස මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය ක්‍රියාකාරී වේ. මෙම නාගරික ප්‍රදේශය වාණිජ, පරිපාලනමය හා ප්‍රවාහන මාධ්‍යයන් වෙත වැඩි නැඹුරුතාවයක් දක්වනු ලබන කලාපයක් ලෙස තවදුරටත් හැඳින්විය හැකිය.

ශ්‍රී දළදා මාළිගය කේන්ද්‍ර කර ගත් අවට කලාපය මෙන්ම ඓතිහාසික නගර මධ්‍යය කලාපය තුළ ව්‍යාප්තව පවතින ලෝක උරුම ගොඩනැඟිලි සියල්ලම සංරක්ෂණය කිරීම තුළින් හා ඉන් බැහැරව පවතින සුවිශේෂී ගොඩනැඟිලි සඳහා අනුවර්තක භාවිතයන් ලබා දීම තුළින් නගරයෙහි පවතින් ශ්‍රී විභූතිය ආරක්ෂා වනු ඇති අතර ඒ තුළින් ඓතිහාසික නාගරික කලාපයෙහි වීදි දර්ශනයද පුනර්ජීවනය වේ. මේ තුළින් **"කන්ද උඩරට උරුමයන්ගේ ප්‍රතිරූපය"** නැවත පුනර්ජීවන කිරීමක් සිදුවනු ඇත.

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ කඳු ආශ්‍රිතව ව්‍යාප්තව පවතින අවිධිමත් ඉදි කිරීම් සීමා කිරීම තුළින්ද වාකරවත්ත හා උඩවත්ත රක්ෂිතය ඒ ආකාරයෙන්ම සංරක්ෂණය කිරීම හා පවතින ජල මූලාශ්‍ර නැවත ස්ථාපනය කිරීම තුළින්ද නගරයෙහි පාරිසරික සමතුලිතතාවය සුරැකි නගරයක් ලෙස හඳුනාගත හැකිවනු ඇත. එමෙන්ම සංවර්ධන කටයුතු කටුගස්තොට හා පේරාදෙණිය අතර බිම් තීරුවකට සීමා වීමත් කඳු වල උඩත් මායිමේ සිට තුනෙන් එකක ප්‍රමාණයක් ඉදිකිරීම සඳහා අනුබල නොදීම හේතුවෙන් නගරය තුළ **"නීල හරිත පරිසරයක්"** ගොඩනැගීමට හැකි වනු ඇත.

මෙසේ එකට ඒකරාශී වී ඇති ක්‍රියාකාරකම් හේතුවෙන් උත්ගත වී ඇති ගැටලු අවම කිරීම තුළින් ක්‍රියාකාරී නාගරිකයක් නිර්මාණය කිරීම උදෙසා කටුගස්තොට හා පේරාදෙණිය විශේෂිත කාර්යයන් සඳහා වූ උප නාගරික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය වේ. ඒ අනුව කටුගස්තොට නගර මධ්‍ය කලාපය තොග බඩු අලෙවිය හා වාණිජ කාර්යන් වෙනුවෙනුත්, පේරාදෙණිය නගර මධ්‍යය කලාපය උසස් අධ්‍යාපනික, පර්යේෂණ හා සෞඛ්‍ය අංශයන් වෙනුවෙන් හා මහනුවර මධ්‍යය කලාපය මහජන උපයෝගීතාවයන් සැපයීම සඳහා විශේෂිත නැඹුරුතාවයක් ඇති උප නාගරික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය වේ.

තවද, නගර මධ්‍ය කලාපය තුළ දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පල යා කෙරෙමින් ප්‍රධාන බහුවිධ ප්‍රවාහන පර්යන්තය නිර්මාණය වන අතර එයට පහසුකම් සැපයීම සඳහා තැන්නේකුඹුර, පේරාදෙණිය හා කටුගස්තොට යන උප නාගරික මධ්‍යස්ථාන තුළ පර්ෂද නැවතුම් පළවල්ද ඉදිකරනු ඇත. පේරාදෙණිය හා කටුගස්තොට සම්බන්ධ කෙරෙමින් පවතින දුම්රිය මාර්ගය ද්විත්ව මංතීරු මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට නියමිත අතර A1 (කොළඹ-මහනුවර) හා A9 ( මහනුවර-යාපනය) මාර්ගයන්ද මෙම නාගරික කලාපය තුළ ප්‍රධාන කොඳු නාරටිය ලෙස ක්‍රියාත්මක වනු ඇත.මෙම පර්ෂද නගර අතර අන්තර් සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා

අතුරු මංමාවත් වැඩි දියුණු කිරීම තුළින් මහනුවර නාගරිකය තුළ ජීවත්වන ජනතාවට මෙන්ම මහනුවර නාගරිකය වෙත පැමිණෙන ජනතාවට **"සුව පහසු ජීවන රටාවක්"** ලබා දීමට හැකියාව ලැබෙනු ඇත.

මහනුවර මහ නගර සහා බල ප්‍රදේශයෙහි අනාගත ආර්ථිකය සේවා අංශය හා සංචාරක කර්මාන්තය මත රදා පවතිනු ඇත. ඒ අනුව කටුගස්තොට, පේරාදෙණිය හා නගර මාධ්‍යය කලාපය මහජන උපයෝගීතා සඳහා විශේෂ නැඹුරුතාවයක් ඇති කේන්ද්‍රස්ථාන වශයෙනුත් ඓතිහාසික නගර මධ්‍ය කළාපය හා පූජා භූමි කලාපය සංචාරක කර්මාන්තය වෙත විශේෂිත නැඹුරුතාවයක් ඇති කලාපයක් වශයෙන් සංවර්ධනය වීම තුළින් **"ස්වයංපෝෂිත ආර්ථිකයක්"** කරා ලඟා වීමට හැකියාව ලැබෙනු ඇත.

## 6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

*සිතියම් අංක 6. 1: යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර ,2018*

## 6.2.1.යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම විදහා දැක්වීම

මහනුවර නගරය තුළ ජීවත් වන ජනතාව මෙන්ම මහනුවර නගරය වෙත පැමිණෙන ජනතාවට සුවපහසු ජීවන රටාවක් ලබාදීමටත් වාහන තදබදය අවම කරමින් සුමට ප්‍රවාහන පහසුකම් සලසා දීමටත් , නගරය පුරා ව්‍යාප්තව පවතින ලෝක උරුම ගොඩනැඟිලි මෙන්ම මහනුවර නගරය තුළ පවතින උරුමයන් ආරක්ෂා කර ගැනීමටත් ස්වාභාවික පරිසරය ආරක්ෂා වන ලෙස සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීමත් යන කරුණු පදනම් කර ගනිමින් 2018 – 2030 වර්ෂය සඳහා වන යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම මෙම නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුන්වාදී ඇත.

එමෙන්ම “කන්ද උඩරට තේජාන්විත අගනගරය” යන දැක්ම වෙත ළඟාවිය හැකි නගරය තුළ ඇවිද යාමේදී විවිධත්වයකින් යුත් මහනුවර නගරයෙහි පවතින ස්වකීය අනන්‍යතාවය සුරැකෙන ලෙස යෝජිත ඉඩම් පරිහරණ රටාව පවතින බව හඳුනාගත හැකිය. (ඇමුණුම 23)

*රූප අංක 6. 6: පේරාදෙණියේ සිට කටුගස්තොට දක්වා වූ හරස් පැතිකඩ*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2018*

$A_1$ සිට $A_2$ පේරාදෙණිය නගරය සිට කටුගස්තොට දක්වා ගමන් කරනු ලබන මහවැලි ගඟ මායිම තුළ පවතින බිම් තීරයන්හි සංචාරක කර්මාන්තයට හා නේවාසික භාවිතයන්ට අවැසි වන ඉඩම් පරිහරණයක් දක්නට ලැබෙන අතර බිම් කට්ටි ආවරණයෙන් 35%ක් පමණ විවෘත භූමි ලෙස පවතිනු ඇත. ගොඩනැඟිලි වල උසෙහි සාමාන්‍ය අගය බිම් මහල හා තවත් එක් මහලක් හෝ උපරිම මහල් දෙකක් වන අතර එම කලාපය තුළ නේවාසික ඒකකද වැඩි වශයෙන් ව්‍යාප්තව පවතී.

*රූප අංක 6. 7: රිවර්ඩේල් මාර්ගයේ සිට පේරාදෙණිය මාර්ගය දක්වා වූ හස්ත පැතිකඩ*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර, 2018*

ඒ අනුව $B_1$ සිට $B_2$ දක්වා වූ හරස්කඩට අනුව රිවර්ඩෙල් මාර්ගයේ සිට ජෝර්ජ් ඊ. ද සිල්වා මාර්ගය දක්වා පැමිණීමේදී භූමියේ උස ක්‍රමයෙන් වැඩිවීමක් දක්නට ලැබෙන අතර ගොඩනැඟිලි වල උසෙහි සාමාන්‍ය අගය බිම් මහල හා තවත් එක් මහලක් හෝ දෙකක් වේ. තවද එහි සිට අනිවත්ත මාර්ගය දක්වා පැමිණීමේදී කිසිදු බාධාවකින් තොරව හන්තාන කඳු රක්ෂිතය මෙන්ම කටුගස්තොට සිට නගර මධ්‍යය දක්වා ව්‍යාප්ත වන අධි ඝණත්ව ගොඩනැඟිලි සහිත සංවර්ධන ප්‍රදේශය දැක ගත හැකි වනු ඇත. මෙම ප්‍රදේශය තුළ ශාක ඝණත්වය ඉතා ඉහළ අගයක් ගන්නා අතර නගරයෙහි අනෙකුත් ප්‍රදේශ වලට සාපේක්ෂව විශාල පරිමාණයෙහි ඉඩම් කට්ටි වීමක් දැක ගත හැකිය. එමෙන්ම බිම් මහල හා තවත් එක් මහලක් වන නේවාසික ගොඩනැඟිලි ද දැකගත හැක.

එහි සිට පේරාදෙණිය මාර්ගය දක්වා පැමිණීමේදී භූමියෙහි උස ක්‍රමයෙන් අඩුවන අතර ගොඩනැඟිලි වල උස ප්‍රිම්රෝස් කඳු පංතිය ආවරණය නොවන ලෙස පවතී. එමෙන්ම මෙම ප්‍රදේශය තුළ ශාක ඝණත්වය තරමක් දුරට අඩුවන අතර ගොඩනැඟිලි වල ඝණත්වය වැඩි වනු ඇත.

පේරාදෙණිය මාර්ගයේ සිට විලියම්ගොපල්ලව මාවත දක්වා පැමිණීමේදී භූමියේ උස අඩුවන අතර ගොඩනැඟිලි වල උස තරමක් දුරට වැඩිවන බව දැකගත හැකිය. නමුදු ප්‍රිම්රෝස් කඳු පංතිය හා හන්තාන කඳු පංතිය ආවරණය නොවන ලෙස පවතී. එමෙන්ම මෙම ප්‍රදේශයේ සිට දෙපස බැලීමේදී එම කඳු පංති වල 1/3 ක ප්‍රමාණයක් ශාක ඝණත්වයෙන් ශේෂව පවතින බවට දැක ගත හැකිය. තවද මෙම ප්‍රදේශයෙහි ගොඩනැඟිලි වල ඝණත්වය ඉතා ඉහළ අගයක් ගන්නා අතර එය වාණිජ ගැඹුරුතාවයකින් යුක්ත වන බවට දැකගත හැකිය.

*රූප අංක 6. 8: උඩවත්ත රක්ෂිත වනාන්තරයේ සිට ගුඩ්ෂෙඩ් නගරය දක්වා වූ හරස් පැතිකඩ*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර* ,2018

උඩවත්ත රක්ෂිතයේ සිට ගුඩ්ෂෙඩ් නගරය දක්වා අඳින ලද $C_1$ සිට $C_2$ දක්වා වූ හරස්කඩ අනුව මහනුවර නගරයෙහි පාරිසරික, සංස්කෘතික සමාජීය හා ආර්ථික වශයෙන් ඉඩම් පරිහරණ රටාවෙහි පවතින විවධත්වය හඳුනාගත හැකිය.

ඒ අනුව උඩවත්ත රක්ෂිතය නගර මධ්‍යයේ ඒ ආකාරයෙන්ම සුරක්ෂිතව පවතින අතර ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රය වෙත පැමිණීමේදී නගරය තුළ පවතින ඓතිහාසික බව මොනවට දැකගත හැකිවේ. මාළිගා පරිශ්‍රයේ සිට බැලීමේදී නිරුපද්‍රිත උඩවත්ත රක්ෂිතය දර්ශනය වන අතර මාළිගා පරිශ්‍රය තුළ මාළිගයට ගැළපෙන ප්‍රෞඪ උරුමයන්ගෙන් සමන්විත භාවිතයන් දැකගත හැකිවනු ඇත. එමෙන්ම මාළිගය පරිශ්‍රයේ සිට නගර මධ්‍යය වෙත පැමිණීමේදී ලෝක උරුම නගරයක දර්ශනය වන ලෝක උරුම ගොඩනැඟිලි වලින් සමන්විත සංචාරක ආකර්ෂණය ලබාගත හැකි භාවිතයන්ගෙන් අනූන කලාපයක් ලෙසට දැකගත හැකිය. තවද මෙම ප්‍රදේශයෙහි ගොඩනැඟිලි වල උස සීමාවීමක්ද දක්නට ලැබේ. ඓතිහාසික නගර මධ්‍යයේ සිට ගුඩ්ෂෙඩ් බස්නැවතුම්පල දෙස පැමිණීමේදී නගරයෙහි උද්දීපනයක් දක්නට ලැබෙන අතර එම ප්‍රදේශය තුළ විවෘත භූමි විනෝද කටයුතු වලට නැඹුරු ස්ථාන දැකගත හැකිය. ගුඩ්ෂෙඩ් බස්නැවතුම්පල ප්‍රදේශයෙහි ප්‍රවාහන හා උපයෝගීතාවයන් වෙත විශේෂ නැඹුරුතාවයන් පවතින අතර පොදු ප්‍රවාහන සේවයට විශේෂිත නැඹුරුතාවයක් ලෙස පවතින කලාපයක් ලෙස දැකගත හැකි වනු ඇත. මෙම ප්‍රදේශයෙහි පවතින ගොඩනැඟිලි වල ඝණත්වය ඉහළ අගයක් ගන්නා අතර ගොඩනැඟිලි වල උසද ඉහළ අගයක් ගනී. තවද මෙම ප්‍රදේශයෙහි භූ අලංකරණයක් දැක ගත හැකි අතර එය මහජනතාවගේ සිත් ආකර්ෂණය කර ගන්නා සුළුවේ.

*රූප අංක 6. 9:වැව රවුම ඉහළ සීමාවේ සිට රජපිහිල්ල දෙසට අඳින ලද හරස් පැතිකඩ*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර* , 2018

වැව රවුම ඉහළ සීමාවේ සිට වැව මධ්‍යය, මල්වත්ත විහාරය හරහා රජපිහිල්ල දෙසට අඳින ලද $D_1$ සිට $D_2$ දක්වා වූ හරස්කඩ අනුව මහනුවර නගරයෙහි පවතින පාරිසරික භූ දර්ශනයෙහි පවතින විවිධත්වය දැක ගත හැකිය. වැව රවුම ඉහළ සීමාවේ පවතින භූමි පරිහරණ රටාවට අනුව එය සංචාරක කටයුතු ප්‍රවර්ධනය කරනු ලබන ඉඩම් පරිහරණ රටාවක් පවතින බවට හඳුනාගත

හැකිය. එහි ගොඩනැඟිලි වල ඝණත්වය අඩු මට්ටමේ පවතින අතර බහුල වශයෙන් වෘක්ෂලතා ඝණත්වයක් දැකගත හැකිය.

එය වැව රවුම අසල සිට බැලීමේදී ගොඩනැඟිලි වලින් පාරිසරික දර්ශනය අවහිර නොවූ නීල හරිත පරිසර පද්ධතියකින් පවතින බවට දැකිය හැකි අතර ගොඩනැඟිලි වල සාමාන්‍ය උස බිම් මහල හා තවත් මහලකින් සමන්විත වන බවටද දැකගත හැකිය. මහනුවර වැව පවතින ප්‍රදේශයේ සිට රජපිහිල්ල දෙසට ගමන් කිරීමේදී ක්‍රම ක්‍රමයෙන් භූමියෙහි උස වැඩි වන අතර ගොඩනැඟිලි වල උස බිම් මහල හා තවත් මහලකට සීමාවේ. මෙම ප්‍රදේශය තුළද ගොඩනැඟිලි වල ඝණත්වය ඉතා අඩු අගයක් ගන්නා අතර වෘක්ෂලතා ඝණත්වය බහුල වශයෙන් දැක ගත හැකිය. මෙම ප්‍රදේශයෙහිද සංචාරක කර්මාන්තයට ගැලපෙන ඉඩම් පරිහරණ රටාවක් පවතින අතර ඊට අදාළ ගොඩනැඟිලි ස්ථාපනය වීමෙන් පසු මහනුවර වැව අසල සිට බැලීමේදී පාරිසරික දර්ශනයට අවහිර නොවන ලෙස ඒවා ඉදිකර ඇති බව දක්නට ලැබේ.

*රූප අංක 6. 10: වට්ටාරන්තැන්න මාර්ගයේ සිට නිත්තවෙල හන්දිය දක්වා අඳින ලද හරස් පැතිකඩ*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*, 2018

වට්ටාරන්තැන්න මාර්ගයේ සිට නිත්තවෙල හන්දිය දක්වා පැමිණීමේදී ($E_1$ සිට $E_2$) ගොඩනැගලි වල ඝණත්වය අඩු මට්ටමක පවතින අතර ගොඩනැඟිලි වල උසෙහි සාමාන්‍ය අගය බිම් මහල හා තවත් එක් මහලකට හෝ දෙකකට පමණක් සීමාවේ. එමෙන්ම බිම් කට්ටි වල විවෘත ප්‍රදේශය 35% ක් පමණ වන අතර නේවාසික ඒකක බහුල වශයෙන් මෙම ප්‍රදේශය තුළ දැකගත හැකිය. නිත්තවෙල හන්දිය අවට ප්‍රදේශය තුළ අධි උස ගොඩනැඟිලි පවතින අතර ගොඩනැඟිලි වල ඝණත්වයද ඉහළ අගයක් ගනී. එම ප්‍රදේශයේ සිට නැවතත් වටපුළුව ප්‍රදේශය දක්වා ගමන් කිරීමේදී භූමියෙහි උස ක්‍රමයෙන් අඩුවන අතර ගොඩනැඟිලි වල ඝණත්වයද අඩු මට්ටමක පවතින නේවාසික කලාපයක් දැකගත හැකිය.

ඒ අනුව මහනුවර නගරය තුළ ගමන් කිරීමේදී විවිධත්වයකින් යුතු ඉඩම් පරිහරණ රටාවක් දැකගත හැකිය.

## 6.3 භෞතීය හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම

නීල හරිත පරිසරයක් ඇති කිරීම හා සුව පහසු ජීවන රටාවක් ගොඩනැගීම යන අරමුණු පදනම් කරගනිමින් "කන්ද උඩරට තේජාන්විත අගනගරය" යන දැක්ම කරා ගමන් කිරීමේ උපක්‍රමිකයන් භෞතීය හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම යටතේ විග්‍රහ කෙරේ. යෝජිත සේවා සැලසුම, යෝජිත ප්‍රවාහන සැලසුම, යෝජිත ජල සැපයුම් සැලසුම, යෝජිත විදුලි සහ දත්ත රැහැන් සැලසුම, යෝජිත අපද්‍රව්‍ය හා මළාප්‍රවාහන සැලසුම හා යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමණාකරන සැලසුම ආදී සැලසුම් මෙම භෞතික හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම යටතේ හඳුනාගෙන ඇත.

### 6.3.1. සේවා සැලසුම

මහනුවර නගරය වෙත වර්ෂ 2030 වන විට පැමිණෙන ජනතාව මෙන්ම මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට ජීවත්වනු ලබන ජනතාව සඳහා ලබා දීමට අපේක්ෂිත සෞඛ්‍ය, අධ්‍යාපනික හා නේවාසික යන අංශයන් අදාළ කරගනිමින් මෙම සැලැස්ම පිළියෙළ කර ඇත. වර්ග කිලෝමීටර් 26.45කින් සමන්විත වන මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ වර්ෂ 2012දී ජනගහනය 102,459ක ප්‍රමාණයක් වන අතර වර්ෂ 2030දී ජනගහනය 106,000ක් පමණ වන බව පුරෝකථනය කළ හැකිය. ඒ අනුව සෞඛ්‍ය, අධ්‍යාපනික හා නේවාසික අවශ්‍යතාවයන් තවදුරටත් මෙහිදී විග්‍රහ කර ඇත.

#### *6.3.1.1. සෞඛ්‍ය පහසුකම් සැලසුම*

මහනුවර නගරය තුළ වර්තමානය වන විට මහනුවර මහ රෝහල, පේරාදෙණිය ශික්ෂණ රෝහල, පේරාදෙණිය ළමා රෝහල, පේරාදෙණිය දන්ත රෝහල, මහනුවර ළය රෝහල, ප්‍රාදේශීය රෝහල-කටුගස්තොට හා මහනුවර සෞඛ්‍ය නිලධාරී කාර්යාලය - මහනුවර මහ නගර සභාව ආදී ස්ථාන රැසකින් සෞඛ්‍ය සේවාවන් ඉටු කරනු ලැබේ. මහනුවර මහ රෝහල ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම රෝහල වන බැවින් ඒ සඳහා ජාතික මට්ටමේ ප්‍රමුඛතාවයක් පවතී.

2016 වර්ෂයේදී මහනුවර මහ රෝහලේ ඇඳන් සංඛ්‍යාව 3,633ක් පමණ වන අතර එය කොළඹ ජාතික රෝහලට පමණක් දෙවෙනි වේ. එමෙන්ම මහනුවර දිස්ත්‍රික්කයෙහි සමස්ත රෝහල් වල ඇඳන් සංඛ්‍යාව 6,597ක් පමණ වන අතර පුද්ගලයන් 1,000ක් සඳහා තිබිය යුතු සම්මත ඇඳන් අනුපාතිකයට අනුව මහනුවර දිස්ත්‍රික්කයෙහි අනුපාතිකය 2016 වර්ෂයේදී 4.6ක් පමණ වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයෙහි සම්මතයන්ට අනුව පුද්ගලයන් 1,000ක් සඳහා තිබිය යුතු සම්මත ඇඳන් අනුපාතිකය 3.5ක් වන බැවින් මහනුවර දිස්ත්‍රිකය තුළ එම සම්මත ඇඳන් අනුපාතිකයක් වර්තමානය වන විට පවතින බව නිගමනය කළ හැකිය. (ඇමුණුම 24)

2012 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ජන සංඝණන වාර්තාවලට අනුව 2012 වර්ෂයේදී මහනුවර මහ නගර සභා සීමාව තුළ ජනගහනය 102,459ක් පමණ වේ. 2012 වර්ෂයේ පැවති 2,254ක් පමණ වන ඇඳන් සංඛ්‍යාවට අනුව මහනුවර මහ රෝහල මඟින් පමණක් පුද්ගලයන් 1,000ක් සඳහා ඇඳන් 22ක් බැගින් සපයනු ලබන අතර 2030 වර්ෂය සඳහා 106,000ක පුරෝකථන ජනගහනයක් සඳහා අවශ්‍ය සෞඛ්‍ය සේවාවන් මේ වන විටත් පවතින බව ඒ අනුව නිගමනය කළ හැකිය.

මහනුවර මහරෝහල අක්කර 58.7ක පමණ ප්‍රමාණයක් පුරා ව්‍යාප්තව පවතින අතර ඉන් අක්කර 27ක් පමණ රෝහල් කටයුතු සඳහා යොදා ගනු ලැබේ. අනික් කොටස් අනවසර පදිංචිකරුවන් පදිංචි වන බව හඳුනාගෙන ඇත. එමෙන්ම මහනුවර මහරෝහල සඳහා පමණක් දිනකට 7,500කට ආසන්න සංඛ්‍යාවක් මහනුවර නගරය වෙත පැමිණෙන අතර එය නගරය තුළ මාර්ග තදබදය ඉහළ යාමට හේතුවක් වී ඇත. එමෙන්ම රෝහල් පරිශ්‍රයෙහි රථවාහන නැවතීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් නොපැවතීමත් මෙම තදබදයට හේතු වී ඇත.

ඒ අනුව මහනුවර නගර සීමාව තුළ තව දුරටත් මහනුවර මහරෝහල ඇතුළු අනෙකුත් පෞද්ගලික හා රජයට අනුබද්ධ රෝහල් ව්‍යාප්ත වීම සඳහා ඉඩ ලබා නොදෙන අතර ජාතික වශයෙන් පවතිනු ලබන අවශ්‍යතාවයන් සඳහා පේරාදෙණිය උප නාගරිකය සෞඛ්‍ය හා පර්යේෂණ අංශයන් වෙත විශේෂ නැඹුරුතාවයක් ඇති නගරයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලැබේ. එමෙන්ම අක්කර 05ක පමණ ඉඩම් ප්‍රමාණයක් තුළ නේවාසික පදිංචිකරුවන් සඳහා මහල් නිවාස ක්‍රමයක් හඳුන්වාදීම තුළින් ඉතිරි ඉඩම් ප්‍රමාණය අනවසර පදිංචිකරුවන්ගෙන් නිදහස් කර ගනිමින් එම ඉඩම් ප්‍රමාණය රෝහලේ පවත්නා තදබදය හා අපහසුතාවයන් අවම කිරීමට යොදා ගත හැකි අතර එම ඉඩ ප්‍රමාණය රෝහල් පරිශ්‍රය තුළ පවතින වාහන තද බදය අඩු කිරීම සඳහාත් වාහන 500ක් පමණ නැවතීමටත් සුදුසු වන පරිදි රථවාහන නැවතුම්පලක් ඉදි කිරීමටද යෝජනා කරනු ලැබේ.

තවද රෝහල වෙත පැමිණෙන්නන් සඳහා අවශ්‍ය පදික මංමාවත් මෙන්ම හඳුනාගන්නා ලද විකල්ප මාර්ග වැඩි දියුණු කිරීම තුළින් වාහන තද බදය අවම කිරීමත්, ගුඩ්ෂෙඩ් බස් නැවතුම හා මහනුවර දුම්රිය ස්ථානය අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැංවීමටත් යෝජනා කෙරේ. ඒ තුළින් නගරයෙහි පවතින වාහන තද බදය අවම කිරීම තුළින් රෝහල භාවිතා කරන්නන් සඳහා පහසුකම් සලසා දීමට අපේක්ෂා කෙරේ.

*සිතියම් අංක 6. 2: සෞඛ්‍ය සේවා සැපයුම් සැලසුම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර , 2018*

### 6.3.1.1. අධ්‍යාපන පහසුකම් සැලසුම

මහනුවර නගරය තුළ රජයේ පාසැල් 41ක්ද, 65,076ක් පමණ ශිෂ්‍යයන් සංඛ්‍යාවක්ද 3,177ක් පමණ ගුරුවරු සංඛ්‍යාවක්ද සිටී. එම පාසැල් සංඛ්‍යාව අතරින් ජාතික පාසැල් 06ක් හා පළාත් සභා පාසැල් 35ක් නගරය තුළ පවතී. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ගුරු ශිෂ්‍ය ප්‍රමිති අනුපාතය 1:28 වන අතර මහනුවර නගරයේ සමස්ත පාසල්වල තත්වය සැලකීමේදී ගුරු ශිෂ්‍ය අනුපාතය 1:20 මට්ටමක් පවතින බව පැහැදිලි වේ. තවද, අර්ධ රාජ්‍ය පාසැල් 07ක්ද, පෙර පාසැල් 28ක්ද, ජාත්‍යන්තර පාසැල් 09ක්ද, වෘත්තිය පුහුණු ආයතන 21ක්ද පමණ පවතින මහනුවර නගරය තුළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයට සුවිශේෂී ස්ථානයක් උසස් අධ්‍යාපනය අංශය අතින් හිමිවී ඇත. 2030 වර්ෂය සඳහා 106,000ක පුරෝකථන ජනගහනයකට අවශ්‍ය ගුරු ශිෂ්‍ය අනුපාතය මේ වන විටත් පවතින බව ඒ අනුව නිගමනය කළ හැකිය. (ඇමුණුම 25)

මහනුවර නගර සීමාව තුළ තවදුරටත් වැඩිවන ජනගහනය සඳහා අවශ්‍ය අධ්‍යාපනික පහසුකම් ලබා දීමට මෙන්ම නගරය තුළ ජනප්‍රිය පාසල් සඳහා පවතින තරගකාරීත්වය හේතුවෙන් එම පාසැල් තවදුරටත් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ඉඩ අවකාශය නගරය තුළ නොමැති වීම වර්තමානයේදී පවතින ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය. දෛනිකව මහනුවර නගරය වෙත අධ්‍යාපනික අවශ්‍යතාවයන් සඳහා පැමිණෙන ශිෂ්‍යන් අතරින් 71.4%ක් පමණ පෞද්ගලික වාහන වලින් පැමිණේ. එමෙන්ම පාසැල් විශාල ප්‍රමාණයක් මහනුවර නගර සීමාව තුළ ප්‍රධාන මාර්ග වලට යාබදව පිහිටා තිබීම හේතුවෙන් රථවාහන තදබදය තවදුරටත් වැඩි වීමට හේතු වී ඇත.

මෙම සංවර්ධන සැලැස්ම තුළින් මහනුවර නගර සීමාව තුළ පවතින පාසැල් වල ශිෂ්‍යය ප්‍රමාණය ඉහළ යන ආකාරයේ සංවර්ධන කාර්යයන් සඳහා අවසර ලබා නොදේ. අපේක්ෂිත ජනගහනය හා ජනප්‍රිය පාසැල් සඳහා පවතින තරඟකාරීත්වය හේතුවෙන් වැඩිවන ශිෂ්‍යය සංඛ්‍යාව සඳහා අවශ්‍ය ප්‍රාථමික අංශයන් නගර සීමාවෙන් පිටත එනම් ඊරියගම, පිළිමතලාව, කුණ්ඩසාලේ හා පල්ලෙකැලේ ආදී ප්‍රදේශ වෙත ප්‍රවර්ධනය කෙරේ. ජාතික වශයෙන් පවතිනු ලබන අවශ්‍යතාවයන් සඳහා පේරාදෙණිය පර්ෂද නගරය උසස් අධ්‍යාපනික හා පර්යේෂණ අංශයන් වෙත විශේෂ නැඹුරුතාවයක් ඇති නගරයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලැබේ. ඒ අනුව ගන්නොරුව හා ඊරියගම ප්‍රදේශය තුළ නව උසස් අධ්‍යාපන ආයතනයන් සඳහා පහසුකම් සපයනු ලැබේ.

*සිතියම් අංක 6. 3:අධ්‍යාපන සේවා සැපයුම් සැලසුම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර* , 2018

### 6.3.1.2. නිවාස පහසුකම් සැලසුම

වර්ෂ 2001දි මහනුවර නගර සභා බල ප්‍රදේශය තුළ පවුල් ඒකක 20,612ක් සඳහා නිවාස ඒකක 20,612ක් ව්‍යාප්තව ඇති නමුත් නිවාස ඒකක 660ක නිවාස හිඟයක් පැවතී ඇත. එය වර්ෂ 2012 වන විට පවුල් එකක සංඛ්‍යාව 25,062ක් දක්වා වර්ධන වීම හේතුවෙන් නිවාස එක්ක 26,722ක් දක්වා තවදුරටත් වර්ධනය වී ඇත. ඒ අනුව වර්ෂ 2012 වන විට නිවාස 1,660ක අතිරික්තයක් පැවතී ඇත. එමඟින් පවුල් සංඛ්‍යාවට ප්‍රමාණවත් පරිදි නිවාස පහසුකම් ඇති බව පෙන්නුම් කළද ඒ අනුව නිවාස වර්ධනයක් ජනගහන වර්ධන වේගයට වඩා වැඩි වේගයකින් සිදු වී නොමැත. එකම නිවාස තුළ ඒකක කිහිපයකට බෙදා වෙන් කිරීමක් සිදුවන බව නිගමනය කළ හැකිය. සාමාන්‍ය පවුලක සාමාජික සංඛ්‍යාව 04ක් ලෙස සැලකීමේදී 2030 වර්ෂය සඳහා පුරෝකථන කරන ලද 106,000ක ජනගහනයකට නිවාස ඒකක 26,500ක් පමණ ඉදි කළ යුතු බවට ඇස්තමේන්තු කළ හැකිය. ඒ අනුව මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ මේ වන විට නිවාස හිඟයක් නොපවතින බවට නිගමනය කළ හැකිය.

නමුත් මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ මුඩුක්කු පැල්පත් නිවාස හා පේලි නිවාස 4% ක් පමණ ප්‍රතිශතයක් පවතින අතර අඩු පහසුකම් වලින් යුක්ත ජනාවාස 37ක් තුළ නිවාස ඒකක 2,176 ක් ඇති බව හඳුනාගෙන ඇත. එම නිවාස ඒකක අක්කර 80ක පමණ ප්‍රදේශයක් තුළ ව්‍යාප්තව ඇති අතර එම ප්‍රදේශයේ ජීවත් වන 71% පමණ පිරිසක් පර්චස් 06කට අඩු භූමි ප්‍රමාණයක් පරිභෝජනය කරන බැවින් එය මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය.

ඒ අනුව වාහන තද බදය, අඩු අදායම් ලාභී නිවාස නගරය පුරා ව්‍යාප්තව පැවතීම ආදී ගැටලු අවම කරමින් සුවපහසු ජීවන රටාවක් මහනුවර නගර වැසියන්ට හා නගරය වෙත පැමිණෙන්නන් හට ලබා දීමට හැකි වන අතර ඒ තුළින් "කන්ද උඩරට තේජාන්විත අගනගරය" යන දැක්ම කරා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම මෙම සැලසුම තුළින් ලැබෙනු ඇත.

මෙම සංවර්ධන සැලැස්ම තුළින් මහනුවර නගර සීමාව තුළ අක්කර 80ක ව්‍යාප්ත වී පවතින අඩු ආදායම් ලාභී නිවාස වෙනුවෙන් අක්කර 25ක භූමි ප්‍රදේශයක් නිවාස ව්‍යාපෘතීන් වෙනුවෙන්ද අක්කර 15ක් එම ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය භූමි අලංකරණයන් හා අනෙකුත් රක්ෂිත ප්‍රදේශ ලෙසද යොදාගැනීමට අපේක්ෂා කෙරේ. තවද, ඉන් අක්කර 40ක පමණ ප්‍රමාණයක් මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා අවශ්‍ය අනෙකුත් සංවර්ධන කාර්යයන් වෙනුවෙන් යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

| | | |
|---|---|---|
| අඩු ආදායම් ලාභී නිවාස පවතින ස්ථාන | - | 37 |
| භූමි ප්‍රමාණය | - | 80 අක්කර |
| නිවාස ඒකක ගණන | - | 2176 |
| යෝජිත නිවාස සඳහා වෙන් කරනු ලබන භූමි ප්‍රමාණය | - | අක්කර25 අලංකරණය සඳහා |
| වෙන් කරනු ලබන භූමි ප්‍රමාණය | - | අක්කර 15 |
| සංවර්ධනයන් සඳහා නිදහස් කෙරෙන ඉඩම් ප්‍රමාණය | - | අක්කර 40 |

*වගු අංක 6: 2..අඩු පහසුකම් නිවැසියන් හැට ලබා දීමට යෝජිත නිවාස ව්‍යාපෘති*

| භූමිය | අක්කර | ඒකක ගණන |
|---|---|---|
| විලියම් ගොපල්ලව මාවත | 07 | 700 |
| මහයියාව | 10 | 1000 |
| නාථ දේවාල ඉඩම | 02 | 200 |
| බෝගම්බර | 03 | 300 |
| කටුගස්තොට මැණික්කුඹුර (පෞද්ගලික ඉඩම) | 03 | 300 |
| **එකතුව** | 25 | 2500 |

*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර* , 2018

ඒ අනුව මෙම සේවා සැලැස්ම යෝජිත ප්‍රවාහන සැලැස්ම, යෝජිත අපද්‍රව්‍ය හා මළප්‍රවාහන සැලැස්ම, යෝජිත ඝණ අපද්‍රවය කළමනාකරණ සැලැස්ම, යෝජිත පරිසර සංරක්ෂණ සැලැස්ම ආදී සැලසුම් සමඟද සංයුක්ත වන අතර මෙම ව්‍යාපෘතීන් හරහා නාගරික ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම, අඩු ආදායම් ලාභී නිවැසියන් සඳහා පහසුකම් සැලසීම හා වාහන තද බදය අවම කිරීමත් තුළින් නගර වැසියන් හා නගරය භාවිතා කරන්නන් වෙත සුව පහසු ජීවන රටාවක් ලබා දීම යන අරමුණ ඉෂ්ඨ කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. ඒ තුළින් වර්ෂ 2030 වනවිට පේරාදෙණිය නගරය උසස් අධ්‍යාපන, සෞඛ්‍ය හා පර්යේෂණ අංශ වෙත විශේෂ නැඹුරුතාවයක් ඇති නගරයක් ලෙසට දියුණු කිරීම හා අක්කර 80ක ප්‍රමාණයක් පුරා ව්‍යාප්තව පවතින අඩු පහසුකම් සහිත නේවාසික ප්‍රදේශ වර්ෂ 2030 වන විට පහසුකම් සහිත නේවාසික ප්‍රදේශ බවට පත් කිරීම යන පරමාර්ථ ඉෂ්ට කරගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

*සිතියම් අංක 6. 4: නිවාස සැපයුම් සැලසුම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර , 2018*

## 6.3.2. යෝජිත ප්‍රවාහන සැලසුම

### *6.3.2.1. හැඳින්වීම*

වර්ග කිලෝමීටර් 26.45කින් සමන්විත වන මහනුවර මහ නගර සහා බල ප්‍රදේශය තුළ වර්ෂ 2012දී ජනගහනය 102,459ක ප්‍රමාණයක් වන අතර වර්ෂ 2030දී ජනගහනය 106,000ක් පමණ වන බව පුරෝකථනය කළ හැකිය. ඒ අනුව මහනුවර මහ නගර සහා බල ප්‍රදේශය තුළ වර්ෂ 2030දී අපේක්ෂිත ප්‍රවාහන අංශයෙහි අනාගත දිශානතිය මෙම සැලැස්ම තුළින් ඉදිරිපත් කර ඇත.

වර්ෂ 2030දී මහනුවර මහ නගර සහා බල ප්‍රදේශය තුළ ජනගහනය 106,000ක් පමණ වන බවත් දෛනික සංක්‍රමණික ජනගහනය 403,000ක් වන බව පුරෝකථනය කළ හැකි අතර මහනුවර නගරය තුළ වර්ෂ 2014දී 60%ක් පමණ ප්‍රමාණයක් පොදු ප්‍රවාහන සේවය (බස් රථ) භාවිත කරන බවටත්, 02%ක් පමණ ප්‍රමාණයක් දුම්රිය භාවිත කරන බවටත්, 37%ක් පමණ පෞද්ගලික වාහන භාවිතා කරන බවටත්, 01% පමණ ප්‍රමාණයක් පයින් ගමන් කරන බවටත් නිගමනය කළ හැකිය. නගරයෙහි පවතින වාහන තද බදය අවම කරමින් සුමට ප්‍රවාහන සේවයක් ලබා දීම සඳහා පොදු ප්‍රවාහන සේවය 12%කින් වැඩි දියුණු කළ යුතු අතර පෞද්ගලික ප්‍රවාහන සේවය13%කින් අධෛර්යමත් කළ යුතුව ඇත. ඒ අනුව 70%ක් පමණ ප්‍රමාණයක් පොදු ප්‍රවාහන සේවය (බස් රථ) භාවිතා කරන බවටත්, 04%ක් පමණ දුම්රිය භාවිතා කරන බවටත්, 24%ක් පමණ ප්‍රමාණයක් පෞද්ගලික වාහන භාවිතා කරන බවටත්, 02%ක් පමණ ප්‍රමාණයක් පයින් ගමන් කරන බවටත් වර්ෂ 2030දී අපේක්ෂා කළ හැකිය.

ඒ අනුව මහනුවර නගර තුළ අත්විදිමින් පවතින් රථවාහන තද බදය හේතුවෙන් නගරයට පැමිණෙන්නන් මෙන්ම නගර තුළ ජීවත්වන ජනතාවට දැඩි අපහසුතාවයකට ලක්වෙමින් පවතී. තවද දෛනික කාර්යයන් සිදු කර ගැනීමේදී ඇතිවන අපහසුතාවන් මෙන්ම සේවාවන් ලබා ගැනීමේදී පවතින කාර්යක්ෂමතාවයන් නගරය තුළ කළබලකාරී මෙන්ම නොසන්සුන් වාතාවරණක් ඇති කිරීමට සමත් වී ඇත. භූගෝලීය පිහිටීම අතින් සුවිශේෂී මෙම නගරය තුළ දැඩි වේලාවක් රථ වාහන මාර්ගයන් තුළ රදා පැවතීම හේතුවෙන් නගරය තුළ වායු දූෂණය වැඩි වීමටද වක්‍ර ආකාරයෙන් හේතු වන බව හඳුනාගත හැකිය.

ඒ අනුව මෙම සැලැස්ම තුළින් මහනුවර නගරය තුළ රථවාහන තදබදය අවම කර සුමට ප්‍රවාහනය සේවයක් ඇති කිරීම අපේක්ෂා කරන අතර පුද්ගලික වාහන භාවිතය අධෛර්යමත් කිරීම තුළින් පොදු ප්‍රවාහන සේවය වෙත යොමු කිරීම මෙම සැලැස්මෙහි අරමුණ වේ. ඒ තුළින් මහනුවර නගර වැසියන්ට හා නගරය වෙත පැමිණෙන්නන් හට සුවපහසු ජීවන රටාවක් ලබා දීමට හැකි වන අතර “කන්ද උඩරට තේජාන්විත අගනගරය” යන දැක්ම කරා ගමන් කිරීමටඅවශ්‍යා පසුබිමද මෙම සැලසුම තුළින් සැලසෙනු ඇත.

### 6.3.2.2. ප්‍රවාහන සැලසුම

*සිතියම් අංක 6. 5:ප්‍රවාහන සැපයුම් සැලසුම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

### 6.3.2.3. යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය

සුමට ප්‍රවාහන සේවයක් ලබා දීම තුළින් නගරයෙන් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා පේරාදෙණිය හා කටුගස්තොට දුම්රිය ස්ථාන හා තැන්නේකුඹුර යන උපනාගරික මධ්‍යස්ථාන වල රථවාහන නැවතීම සඳහා පර්ෂද රථ වාහන නැවතුම් ස්ථාන ඇති කිරීමට අපේක්ෂිතය. එමෙන්ම මෙම ස්ථානවල පෞද්ගලික වාහන, පෞද්ගලික බස්, පාසල් බස් රථ හා ත්‍රීරෝද රථ නැවැත්වීම (Park & Ride) සඳහා පහසුකම් ඇති කරනු ලැබීමත් නගර මධ්‍යයේ විවිධ ස්ථාන වල විසිර පවතින බස්රථ නැවතුම් ස්ථාන හා දුම්රිය ස්ථාන හා ප්‍රධාන බස් නැවතම්පොළත් (ගුඩ්ෂෙඩ් බස් නැවතුම් පොළ) ඒකාබද්ධ කරමින් බහු කාර්ය ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඇති කිරීමක් සිදු කිරීමට නියමිතය. ඒ සඳහා බහුකාර්ය පර්යන්තය අවට ප්‍රවාහන කළමණාකරණය හා මාර්ග වැඩිදියුණු කිරීමට අවශ්‍ය වන අතර නගර මධ්‍යට පැමිණෙන වාහන සීමා කිරීමට මහනුවර බහුකාර්ය පර්යන්තය අවට ඉහළ රථ වාහන ගාස්තු අය කර උප නාගරික මධ්‍යස්ථාන වල පවතින පර්ෂද රථවාහන නැවතුම් ස්ථාන තුළ නැවතීම හා පැදවීම දිරිමත් කිරීම සඳහා අඩු නැවතුම් ගාස්තු අය කිරීමක් සිදු කෙරේ.

*රූප අංක 6. 11:යෝජිත බහු විධ ප්‍රවාහන පර්යන්තය*



මුලාශ්‍රය: උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

බහුකාර්යය පර්යන්තය ඵලදායි ලෙස මෙහෙය වීම සඳහා දුම්රිය ස්ථාන අවට මාර්ග වැඩිදියුණු කිරීම සිදු කරනු ලබන අතර එහිදී නව ප්‍රවේශ මාර්ග පළල් කිරීම, මංසන්ධි වැඩි දියුණු කිරීම ආදී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම මෙහිදී සිදු කෙරේ. පේරාදෙණිය, කටුගස්තොට, තැන්නේකුඹුර යන උප නාගරික මධ්‍යස්ථාන සම්බන්ධ කරමින් විකල්ප මාර්ග ඉදිකිරීමත් (Inner Circular Roads) යෝජිත අධිවේගී මාර්ගයට සමගාමීව ප්‍රධාන මාර්ග සම්බන්ධ කරමින් විකල්ප මාර්ග සංවර්ධනය (Outer Circular Roads) කිරීමත් පර්ෂද ප්‍රවාහන පර්යන්තයන් ආශ්‍රිතව නාගරික සංවර්ධනයන්

දිරිමත් කිරීමත් තුළින් නගර මධ්‍යය ප්‍රධාන ප්‍රවාහන පර්යන්තය ආශ්‍රිතව වෙළඳ හා පරිපාලන කාර්යයන් ප්‍රවර්ධනය කිරීමක් සිදු කෙරේ.

පවතින දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීමත් එම දුම්රිය ස්ථාන අවට නැවතීමේ හා ගමන්කිරීමේ දුම්රිය පොළවල් සංවර්ධනය කර නැවතීම හා ගමන්කිරීමේ ප්‍රතිපත්ති අත්හදා බැලේ. එමෙන්ම නගරයට පැමිණෙන්නන්ගේ අවශ්‍යතාවයන් මත මහනුවර ප්‍රධාන දුම්රිය ස්ථානය හා අස්ගිරිය දුම්රිය ස්ථානය අතර නව දුම්රිය ස්ථාන දෙකක් ස්ථාපිත කිරීම තුළින් සුමට ප්‍රවහන සේවයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. බහු කාර්යය මගී ප්‍රවාහන පර්යන්තය ද්විත්ව මන්තීරු දුම්රිය මාර්ග හා විකල්ප මාර්ග ආදී වෙනත් ව්‍යාපෘතීන් සමග සම්බන්ධ කරමින් උප නාගරික ප්‍රදේශ වල ප්‍රවාහන කේන්ද්‍රය ලෙස සංවර්ධනය කිරීමක් සිදු කරනු ලබන අතර පදික පරිසරය වැඩිදියුණු කිරිම සඳහා විවෘත භූමි පදික ගමන් මාර්ග, පදික උමං මාර්ග, පදික පාලම් ආදී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ආදී අංශ පිළිබඳවද මෙම සැලැස්ම මඟින් අවධානය යොමු කෙරේ.

ඒ අනුව මෙම ප්‍රවාහන සැලැස්ම, යෝජිත සේවා සැලැස්ම, යෝජිත ආර්ථික සැලැස්ම හා යෝජිත උරුමයක් හා සංස්කෘතික උත්සව පිලිබඳ වූ සැලසුම් සමඟද සංයුක්ත වන අතර අතර මෙම ව්‍යාපෘතීන් හරහා නාගරික ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම හා වාහන තද බදය අවම කිරීමත් තුළින් නගර වැසියන් හා නගරය භාවිතා කරන්නන් වෙත සුව පහසු ජීවන රටාවක් ලබා දීම යන අරමුණ ඉෂ්ඨ කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. ඒ තුළින් වර්ෂ 2030 වන විට නගර මධ්‍ය තුළ බහුවිධ ප්‍රවාහන පර්යන්තයක් ප්‍රතිස්ථාපනය කිරීම හා පර්ෂද රථවාහන නැවතුම් ස්ථාන පේරාදෙණිය, කටුගස්තොට හා තැන්නේකුඹුරේ ස්ථාපනය කිරීම, පේරාදෙණිය හා කටුගස්තොට යන පර්ෂද නගර අතර පොදු ප්‍රවාහන සේවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වර්ෂ 2030 වන විට වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉෂ්ට කරගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

## 6.3.3. යෝජිත ජල සැපයුම් සැලසුම

### *6.3.3.1. හැඳින්වීම*

මහනුවර නගරය වෙත වර්ෂ 2030 වන විට පැමිණෙන ජනතාව මෙන්ම මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට ජීවත් වනු ලබන ජනතාව සඳහා අවශ්‍ය වන ජල සැපයුම පදනම් කරගනිමින් මෙම සැලැස්ම පිළියෙළ කර ඇත. වර්ෂ 2030දී මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජනගහනය 106,000ක් පමණ වන බවත් වර්ෂ 2030දී දෛනික සංක්‍රමණික ජනගහනය 403,000ක් වන බව පුරෝකථනය කළ හැකිය.

ජල සම්පාදන ක්‍රියාවලිය සිදුකිරීම සඳහා මහවැලි ගඟ, රොස්නික් ජලාශය හා දුනුමඩලාව වැව ආදී ජල මූලාශ්‍රයන් මඟින් ජලය ලබා ගන්නා අතර දිනකට ජලය ඝණ මීටර් 36,000ක් පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලැබේ. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ වර්ෂ 2012දී ජීවත් වන ජනගහනය 102,459ක වන අතර සංක්‍රමණික ජනගහනය 325,000ක් පමණ වන බැවින් අවශ්‍ය ජල ප්‍රමාණය දිනකට ඝණ මීටර් 46,100ක් පමණ වේ. ඒ අනුව ඝණ මීටර් 10,100ක් පමණ ප්‍රමාණයක් ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මඟින් මිලදී ගනී. ඒ අනුව ඒක පුද්ගල ගෘහස්ත ජල පරිභෝජනය දිනකට ලීටර් 210ක් ලෙසත් සංක්‍රමණිකයන්ගේ ඒක පුද්ගල ගෘහස්ත ජල පරිබෝජනය දිනකට ලීටර් 76ක් ලෙස සැලකූ විට වර්ෂ 2030 වන විට ජනගහනය 106,000ක් සඳහා ගෘහස්ත ජල පරිභෝජනය වෙනුවෙන් දිනකට ඝණ මීටර් 22,260ක පමණ ප්‍රමාණයක් අවශ්‍ය වේ. එමෙන්ම සංක්‍රමණික ජනගහනය 403,000ක් සඳහා දිනකට ඝණ මීටර් 30,667ක ප්‍රමාණයක් අවශ්‍ය වන බැවින් සමස්ත පරිභෝජනයන් සඳහා දිනකට ජලය ඝණ මීටර් 52,927ක ප්‍රමාණයක් අවශ්‍ය වේ. ඒ අනුව 2030 වර්ෂයේදී ජලය ඝණ මීටර් 6,027ක පමණ අවශ්‍යතාවයක් පවතී.

මහනුවර මහ නගර සභාව සතු ජල ධාරිතාවය වර්ෂ 2030දි දෛනික අවශ්‍යතාවයන් සඳහා ප්‍රමාණවත් නොවන බව මින් අනාවරණය වේ. එමෙන්ම ජල සම්පාදනයේ පවතින අඩු පීඩන තත්වයන් හේතුවෙන් හීරැස්සගල, පිටකන්ද හා කුරුණෑගල මාර්ගයේ නගර සභා සීමාව හා මඩවල මාර්ගයේ නගර සභා සීමාව යන ප්‍රදේශ වල දවස පුරා ජලය සැපයීමට නොහැකි වීම මහනුවර නගර සභා සීමාව තුළ පවතින ගැටලු ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම මහනුවර මහ නගර සභා සීමාව සඳහා මහනුවර මහ නගර සභා ජල සම්පාදන ක්‍රමයෙන් දිනකට ජලය ඝණ මීටර් 28,400ක් පමණ ප්‍රමාණයක් ලබා ගන්නා අතර එම ජල සම්පාදන ක්‍රමය වර්ෂ 1966දි ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. එය 1992දි ප්‍රතිසංස්කරණය කරන ලද අතර මේ වන විට එය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් මුහුදු මට්ටමේ සිට උස වර්ග මීටර් 1800කට වඩා ඉහල ප්‍රදේශ වෙත ලබා දීම හේතුවෙන් සංවර්ධන කාර්යයන් එම ප්‍රදේශ වෙත ව්‍යාප්ත වී ඇත. එය නගරයෙහි පාරිසරි භූ දර්ශනයට මෙන්ම දර්ශනීය ස්ථාන අවහිර වීම වැනි ගැටලු උද්ගත වීමටද හේතු වී ඇත.

ඒ අනුව ජල අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම, ජල පීඩනය වැඩි කිරීම හා පවතින ජල සම්පාදන ක්‍රමය අනාගත අවශ්‍යතාවයන් සඳහා ලබා ගැනීමට අවශ්‍ය වන පරිදි ධාරිතාවය වැඩි දියුණු කිරීම තුළින් මහනුවර නගර වැසියන්ට හා නගරය වෙත පැමිණෙන්නන් හට ක්‍රමවත් ජල සම්පාදනයක් ලබා දීමට හැකි වන අතර හඳුනා ගන්නා ලද ප්‍රදේශ වල ජල සැපයුම සීමා කිරීම තුළින් "කන්ද උඩරට තේජාන්විත අගනගරය" යන දැක්ම කරා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම මෙම සැලසුම තුළින් ලැබෙනු ඇත.

### 6.3.3.2. ජල සැපයුම් සැලසුම

*සිතියම් අංක 6. 6:යෝජිත ජල සැපයුම් සැලසුම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

### 6.3.3.3. යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය

ඉහත සඳහන් ගැටලු අවම කරමින් මහනුවර මහ නගර සභාව සතු ජල ධාරිතාවය අනාගත දෛනික ජල අවශ්‍යතාවයට ප්‍රමාණවත් සැපයීමක් සිදු කිරීම වෙනුවෙන් ජලය එක්රැස් කිරීම හා පිරිපහදු කිරීම වෙනුවෙන් දෙවන රාජසිංහ මාවතේ මහවැලි ගඟට ආසන්නව භූමි ප්‍රමාණයක් වෙන් කිරීමක් සිදු කරනු ඇත.

එමෙන්ම ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මඟින් මිලදී ගනු ලබන ජල ප්‍රමාණය හා වර්ෂ 2030 සඳහා අවශ්‍ය වන ජල ප්‍රමාණය මහනුවර මහ නගර සභා ජල සම්පාදන ක්‍රමය තුළින් ම නිෂ්පාදනය කරගැනීම සඳහා ගැටඹේ ජල පවිත්‍රාගාරයෙහි ධාරිතාවය වැඩි දියුණු කිරීමක් සිදු කෙරෙනු ඇත. නීල හරිත පරිසරයක් ගොඩ නැගීම සඳහා මුහුදු මට්ටමේ සිට උස මීටර් 1800ට ඉහළ ප්‍රදේශ වල සංවර්ධන කටයුතු සීමා කරන බැවින් මුහුදු මට්ටමේ සිට උස මීටර් 1800ට ඉහළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති පාරිසරික සංවේදී කලාප I ට අයත් ප්‍රදේශවලට ජල සැපයුම ලබා නොදෙන අතර පාරිසරික සංවේදී කලාපය II තුළ අනුමත භාවිතයන් සඳහා පමණක් ජල සැපයුම සිදු කරනු ලැබේ.

මධ්‍ය ඝණත්ව නේවාසික කලාපය, මධ්‍යම ඝණත්ව මිශ්‍ර සංවර්ධන කලාපය, අධි ඝණත්ව වාණිජ කලාපය I, අධි ඝණත්ව වාණිජ කලාපය II හා අධි ඝණත්ව වාණිජ කලාපය III ආදී කලාපයන් තුළ නව ජල සම්පාදනයන් සඳහා ඉඩ ලබා දෙන අතර අඩු ජල පීඩනයක් පවතින ප්‍රදේශ වෙත වැඩි පීඩනයකින් යුක්තව ජල සම්පාදනය කිරීම සඳහා පවතින ජල සම්පාදන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම.

ඒ අනුව මෙම ජල සැලසුම් සැලැස්ම, යෝජිත සේවා සැලැස්ම, යෝජිත ආර්ථික සැලැස්ම හා යෝජිත උරුමයක් හා සංස්කෘතික උත්සව පිලිබඳ වූ සැලසුම් සමඟද තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම සමඟද සංයුක්ත වන අතර මෙම ක්‍රමවේදයන් හරහා නගර වැසියන් මෙන්ම නගරය භාවිතා කරන්නන් වෙත සුව පහසු ජීවන රටාවක් ලබා දීම හා නීල හරිත පරිසරයක් ගොඩනැගීම යන අරමුණු ඉෂ්ට කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. තවද, මහනුවර නගරය තුළ වර්ෂ 2030 වනවිට නගරය දර්ශනය ආරක්ෂා කර ගැනීම සඳහා කඳු පංතිවල උඩත් මායිමේ සිට 1/3ක ප්‍රමාණයක් සංරක්ෂණය කිරීම යන පරමාර්ථ ඉටු කර ගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

## 6.3.4. යෝජිත විදුලි සහ දත්ත රැහැන් සැලසුම

### *6.3.4.1. හැඳින්වීම*

මහනුවර නගරය වෙත වර්ෂ 2030 වන විට පැමිණෙන ජනතාව මෙන්ම මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට ජීවත් වනු ලබන ජනතාව සඳහා අවශ්‍ය වන විදුලි සැපයුම පදනම් කර ගනිමින් මෙම සැලැස්ම පිළියෙළ කර ඇත.

ජාතික විදුලි බල පද්ධතියෙහි කිරිබත්කුඹුර හා පොල්ගොල්ල උපපොළ මඟින් මෙගාවොට් 50ක ධාරිතාවයක් ලබා ගෙන මෘදු උපපොළ 16ක් හා ප්‍රාථමික උපපොළ 03ක් උපයෝගී කරගෙන මහනුවර නගරය තුළ විදුලි බලය සම්පාදන ක්‍රියාවලිය සිදු කරනු ලැබේ. මහනුවර නගරය තුළ වර්තමානයෙහි ජීවත් වන ජනතාවට 100%කම විදුලිය ලබා දෙන අතර විදුලිය ලබා දීම සම්බන්ධයෙන් හිඟතාවයක් නොමැත. ඒ අනුව වර්ෂ 2030දී මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ අපේක්ෂිත 106,000ක් පමණ වන ජනගහනය හා 403,000ක් පමණ වන දෛනික සංක්‍රමණික ජනගහනයට අවශ්‍ය විදුලි සැපයුම ලබා දීමට හැකියාවක්ද පවතී.

නමුත් සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් මුහුදු මට්ටමේ සිට උස වර්ග මීටර් 1800කට වඩා ඉහළ ප්‍රදේශ වෙත ලබා දීම හේතුවෙන් සංවර්ධන කාර්යයන් එම ප්‍රදේශ වෙත ව්‍යාප්ත වී ඇත. එය නගරයෙහි පාරිසරි භූ දර්ශනයට මෙන්ම දර්ශනීය ස්ථාන අවහිර වීම වැනි ගැටලු උද්ගත වීමටද හේතු වී ඇත. නගර මධ්‍ය කලාපය තුළ මෙන්ම එම කලාපයෙන් පිටත ප්‍රදේශය තුළ පවතින විදුලි කණු නගර දර්ශනයට මෙන්ම පදිකයන් හට බාධාකාරී වන ලෙස ස්ථාපනය කොට පැවතීම ගැටලු ලෙස හඳුනාගත හැකිය.

ඒ අනුව හඳුනා ගන්නා ලද ප්‍රදේශ වල සංවර්ධන කාර්යන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සීමා කිරීම තුළින් නගර දර්ශනය ආරක්ෂා කරගැනීම හා මහනුවර නගර වැසියන්ට හා නගරය වෙත පැමිණෙන්නන් හට ක්‍රමවත් විදුලි සම්පාදනයක් ලබා දීම තුළින් "කන්ද උඩරට තේජාන්විත අගනගරය" යන දැක්ම කරා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම ලැබෙනු ඇත.

### 6.3.4.2. විදුලි සැපයුම් සැලසුම

*සිතියම් අංක 6. 7:යෝජිත විදුලි සැපයුම් සැලසුම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

### 6.3.4.3. යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය

මධ්‍ය ඝණත්ව නේවාසික කලාපය, මධ්‍යම ඝණත්ව මිශ්‍ර සංවර්ධන කලාපය, අධි ඝණත්ව වාණිජ කලාපය I, අධි ඝණත්ව කලාපය II හා අධි ඝණත්ව වාණිජ කලාපය III ආදී කලාපයන් තුළ නීල හරිත පරිසරයක් ගොඩ නැගීම සඳහා මුහුදු මට්ටමේ සිට උස මීටර් 1800ට පහළ ප්‍රදේශ වල සංවර්ධන කටයතු සීමා නොකරන බැවින් මුහුදු මට්ටමේ සිට උස මීටර් 1800ට ඉහළ ප්‍රදේශ වල එනම් පාරිසරික සංවේදී කලාප I තුළ විදුලි සැපයුම ලබා නොදෙන අතර පාරිසරික සංවේදී කලාප II තුළ අනුමත භාවිතයන් සඳහා පමණක් විදුලි සැපයුම ලැබ දෙනු ලැබේ.

නගර දර්ශනය ආරක්ෂා කර ගැනීමටත් පදිකයන් හට පතිවන ගැටලු අවම කිරීමටත් වර්ෂ 2030 වන විට සියලුම විදුලි රැහැන් පද්ධති යටිපහන් (භූගත) කිරීම සිදු කිරීමට අනුබල දේ.

ඒ අනුව මෙම විදුලි සහ දත්ත රැහැන් සැලැස්ම, යෝජිත සේවා සැලැස්ම හා යෝජිත උරුමයක් හා සංස්කෘතික උත්සව පිලිබඳ වූ සැලසුම් සමඟද තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම සමඟද සංයුක්ත වන අතර මෙම ක්‍රමවේදයන් හරහා නගර වැසියන් මෙන්ම නගරය භාවිතා කරන්නන් වෙත සුව පහසු ජීවන රටාවක් ලබා දීම හා නීල හරිත පරිසරයක් ගොඩනැගීම යන අරමුණු ඉෂ්ට කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. තවද, මහනුවර නගරය තුළ වර්ෂ 2030 වනවිට නගරය දර්ශනය ආරක්ෂා කර ගැනීම සඳහා කඳු පංතිවල උඩත් මායිමේ සිට 1/3ක ප්‍රමාණයක් සංරක්ෂණය කිරීම යන පරමාර්ථ ඉටු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

## 6.3.5. යෝජිත ජලාපවහන හා මලාපවාහන සැලසුම

### *6.3.5.1. හැඳින්වීම*

මහනුවර නගරය වෙත වර්ෂ 2030 වන විට පැමිණෙන ජනතාව මෙන්ම මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට ජීවත් වනු ලබන ජනතාව සඳහා අවශ්‍ය වන ජලාපවහන හා මලාපවාහන පද්ධතීන් පදනම් කරගනිමින් මෙම සැලස්ම පිළියෙළ කර ඇත.

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ බ්‍රිතාන්‍ය පාලන සමයේ සිට අභ්‍යන්තරව උමං කාණු පද්ධතියක් පැවති නමුත් සෑම මාර්ගයකම කාණු පද්ධතියක් නොමැති බව හඳුනාගත හැකිය. ශ්‍රී ලංකා ජනරජයේ සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය විසින් සපයනු ලබන මූල්‍ය ආධාර මත ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ මහනුවර මහ නගර සභාව ඒකාබද්ධව මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ මූලික වැඩ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර එමඟින් නාගරික භූමි ප්‍රදේශයෙහි හෙක්ටයාර් 733ක් පමණ ආවරණය වේ.

දිනකට එක් පුද්ගලයෙක් විසින් අපජලය හා මලපවාහනය ඝණ මීටර් 0.76, රෝහල් වල එක් ඇඳකින් ඝණ මිටර් 0.78, සංක්‍රමණික ජනගහනයෙන් දිනකට එක් පුද්ගලයෙකු විසින් ගැලුන් 20ක්ද මුදාහරින බවට උපකල්පනය කළ විට වර්ෂ 2012දි ජලාපවහන හා මලප්‍රවහනය සමස්ත මුදාහැරීම ඝණ මීටර් 64,344ක් ලෙස ගණනය කළ හැකිය. පුරෝකථන ජනගහනය, පුරෝකථන සංක්‍රමණික ජනගහනය හා රෝහල් ඇඳන් සංඛ්‍යාවට අනුව වර්ෂ 2030දි ජලාප්‍රවාහන හා මලප්‍රවහනය සමස්ත මුදාහැරීම් ප්‍රමාණය ඝණ මීටර් 71,590ක් පමණ වන බව පුරෝකථනය කළ හැකිය.

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අපජල ව්‍යාපෘතිය මඟින් ඝණ මීටර් 14,000ක් පමණ පිරිපහදු කරන අතර දෛනික සංක්‍රමණිකයන් 150,000ක්, නිවැසියන් 55,000ක් සහ ව්‍යාපාර හා ගොඩනැඟිලි 12,600ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ. ඒ අනුව වර්ෂ 2030හි අවශ්‍යතාවයන් සඳහා පවතින ව්‍යාපෘතිය ප්‍රමාණවත් නොවන බැවින් එම ව්‍යපෘතිය තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. එමෙන්ම නගරය තුළ පවතින ජල මූලාශ්‍ර වලට අපජලය හා මළ නළ මුදා හැරීම තුළින් එම ජල මූලාශ්‍රයන් අපිරිසිදු වී පැවතීම ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම එම ජල මූලාශ්‍රයන් මහවැලි ගඟට සම්බන්ධවීමත් එම ජලය පානිය ජලය ලෙස යොදා ගැනීමත් හේතුවෙන් ජල පිරි පහදුව සඳහා වැය වන මුදල ඉහළ අගයක් ගෙන ඇත. එමෙන්ම නගරය තුළ පවතින කාණු පද්ධතිය ඉතා පැරණි වීමත් සෑම මාර්ගයක්ම ආවරණය වන ලෙස ක්‍රියාත්මක නොවීමත් නගරය තුළ පවතින ගැටලු ලෙස හඳුනාගත හැකිය.

ඒ අනුව හඳුනාගන්නා ලද නේවාසික ප්‍රදේශ වලත්, කටුගස්තොට හා පේරාදෙණිය උප නාගරික කලාප තුළත්, හඳුනාගන්නා ලද සංවර්ධන තීරයක් තුළත් විධිමත් අපජල කළමනාකරණ හා

මළපවාහන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම මෙන්ම විධිමත් කාණු පද්ධතියක් නගරය තුළ ස්ථාපනය කිරීම තුළින් නගරයෙහි පවතින නගර දර්ශනය ආරක්ෂා කරගැනීමට මෙන්ම නගරයෙහි පවතින පාරිසරික සංවේදීතාවය රැක ගැනීමට හැකියාව ලැබේ. එමඟින් ''කන්ද උඩරට තේජාන්විත අගනගරය'' යන දැක්ම කරා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම ලැබෙනු ඇත.

### *6.3.5.2. යෝජිත ජලාපවහන හා මලාපවාහන සැලසුම*

*සිතියම් අංක 6. 8:යෝජිත ජලාපවහන හා මලාපවාහන සැලසුම*




*මූලාශ්‍රය: මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

### 6.3.5.3. යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමග පවතින සංයුක්තතාවය

ගැටඹේ සිට මහනුවර දක්වා මිශ්‍ර සංවර්ධන තීරය හා මහනුවර නගර මධ්‍යය ආවරණය වන ලෙස ක්‍රියාත්මක වන අපජල හා මලප්‍රවාහන ව්‍යාපෘතිය මහනුවර සිට කටුගස්තොට දක්වා සංවර්ධන තීරය හා කටුගස්තොට නගරය ආවරණය වන ලෙස පළල් කිරීමට යෝජනා කෙරේ. අනෙකුත් ප්‍රදේශයන්හි පෞද්ගලික පූතික හා ගවර වලවල් යොදා ගැනීමට යෝජනා කිරීම මඟින් එම ප්‍රදේශවල විශාල පරිමාණ සංවර්ධන කාර්යයන් පාලනය කිරීම අදහස් කෙරේ.

නගර මධ්‍යය තුළ පවතින කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමත්, යෝජිත සංවර්ධන තීරයන් හා උප නාගරික මධ්‍යස්ථාන පර්ෂද නගර ආවරණය වන ලෙසත් කාණු පද්ධතීන් නොමැති ප්‍රදේශ ආවරණය වන ලෙස කාණු පද්ධතීන් සංවර්ධනය කිරීමත් සිදු කරනු ලැබේ. එමෙන්ම නගරය තුළ පවතින ස්වභාවික ජල ප්‍රවාහයන් නැවත ප්‍රතිස්ථාපනය කිරීමත්, එම ජල ප්‍රවාහනයන් සඳහා නියමිත රක්ෂිතයන් හඳුන්වාදීමත් සිදු කෙරෙනු ඇත. එම රක්ෂිතයන් සඳහා භූමි අලංකරණ ක්‍රමවේදයන් හඳුන්වාදීම තුළින් ඇළ ඉවුරු පාංශු ඛාදනය වීම නවතා තබනු ඇත.

ඒ අනුව මෙම ජලාපවහන හා මලාපවාහන සැලසුම, යෝජිත සේවා සැලැස්ම හා යෝජිත උරුමයක් හා සංස්කෘතික උත්සව පිලිබඳ වූ සැලසුම් සමඟද තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම සමඟද සංයුක්ත වන අතර මෙම ක්‍රමවේදයන් හරහා නගර වැසියන් මෙන්ම නගරය භාවිතා කරන්නන් වෙත සුව පහසු ජීවන රටාවක් ලබා දීම හා නීල හරිත පරිසරයක් ගොඩනැගීම යන අරමුණු ඉෂ්ඨ කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. තවද, මහනුවර නගරය තුළ වර්ෂ 2030 වනවිට නගරය දර්ශනය ආරක්ෂා කර ගැනීම සඳහා කඳු පංතිවල උඩත් මායිමේ සිට 1/3ක ප්‍රමාණයක් සංරක්ෂණය කිරීම, මහනුවර නගරය තුළ 1/3ක පමණ ප්‍රදේශයක් ආවරණය වන අපජල කළමනාකරණ ක්‍රමවේදය වර්ෂ 2030 වන විට පර්ෂද නගර හා පේරාදෙණියේ සිට කටුගස්තොට දක්වා හඳුනාගන්නා ලද සංවර්ධන තීරය ආවරණය වන ලෙස ක්‍රියාත්මක කිරීම හා වර්ෂ 2030 වන විට මහනුවර නගරය තුළ පැවති ජල මූලාශ්‍ර 100% ක් නැවත ප්‍රතිස්ථාපනය කිරීම යන පරමාර්ථ ඉටු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

## 6.3.6. යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ සැලසුම

### 6.3.6.1. හැඳින්වීම

මහනුවර නගරය වෙත වර්ෂ 2030 වන විට පැමිණෙන ජනතාව මෙන්ම මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට ජීවත් වනු ලබන ජනතාව සඳහා අවශ්‍ය වන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පදනම් කරගනිමින් මෙම සැලැස්ම පිළියෙල කර ඇත.

මහනුවර නගරය තුළ සාමාන්‍යයෙන් දිනකට ටොන් 80ක් පමණ ඒකරාශි වීම හඳුනාගත හැකි අතර දිරාපත් වන කසළ ප්‍රමාණය 88%ක් වන අතර, දිරාපත් නොවන කසළ ප්‍රමාණය 12%ක් පමණ ප්‍රමාණයකින් යුක්ත වේ. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය කලාප 06කට බෙදා කුණු කසළ ඒකරාශී කිරීම සිදුකරනු ලබන අතර දිරාපත් වන ද්‍රව්‍ය දැනට කටුගස්තොට, ගොහාගොඩ පිහිටි අක්කර 32 ක් පමණ වන භූමියට බැහැර කරනු ලබයි.

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ වර්ෂ 2017දී දිනකට ඝණ අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 136,078ක් එනම් ටොන් 150ක් පමණ බැහැර කරන බවට වාර්තා වේ. ඒ අනුව එක් පුද්ගලයෙක් දිනකට කිලෝග්‍රෑම් 0.31 පමණ ඝණ අපද්‍රව්‍ය බැහැර කරන බවට හඳුනාගත හැකිය. පුරෝකථන ජනගහනය, පුරෝකථන සංක්‍රමණික ජනගහනය අනුව වර්ෂ 2030දී ඝණ අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 157,790ක පමණ ප්‍රමාණයක් එනම් ටොන් 180ක් පමණ බැහැර කරන බවට උපකල්පනය කළ හැකිය.

ඒ අනුව හඳුනාගන්නා ලද නේවාසික ප්‍රදේශ වලත්, කටුගස්තොට හා පේරාදෙණිය යන උප නාගරික මධ්‍යස්ථාන තුළත්, හඳුනාගන්නා ලද සංවර්ධන තීරයන් කේන්ද්‍ර කරගත් මහනුවර මහ නගර සභා බලප්‍රදේශය තුළ විධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම තුළින් නගරයෙහි පවතින නගර දර්ශනය ආරක්ෂා කරගැනීමට මෙන්ම නගරයෙහි පවතින පාරිසරික සංවේදීතාවය රැක ගැනීමට හැකියාව ලැබේ. එමඟින් "කන්ද උඩරට තේජාන්විත අගනගරය" යන දැක්ම කරා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම ලැබෙනු ඇත.

### 6.3.6.2. යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමණාකරන සැලසුම

*සිතියම් අංක 6. 9: යෝජිත අපද්‍රව්‍ය කළමණාකරන සැලසුම*




*මූලාශ්‍රය:නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

### 6.3.6.3. යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය

නීල හරිත පරිසරයක් ගොඩ නැගීම සඳහාත් සුව පහසු ජීවන රටාවක් ලබා දීම සඳහාත් මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි ඝණ අපද්‍රව්‍ය කළමණාකරන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යෝජිත වේ.

නගරය තුළ කුණු කසළ එකතු කිරීම සඳහාත්, ප්‍රවාහනය සඳහාත් විදිමත් ක්‍රමවේදයක් හඳුන්වාදීමත් මෙම සැලැස්ම තුළින් සිදු කෙරෙනු ඇත. ඒ අනුව සතියකට දින තුනක් දිරපත්වන ද්‍රව්‍ය එකතු කිරීමටත් සති අන්තයේදී නොදිරන ද්‍රව්‍ය එකතු කිරීමටත් ක්‍රමවේදයක් ස්ථාපිත කෙරෙනු ඇත. හෝටල් හා වාණිජ භාවිතයන් සහිත ගොඩනැඟිලි වල දිනකට කසළ කිලෝග්‍රෑම් 10කට වඩා වැඩිවන විට මුදලක් අයකර ගැනීමටත්, කිලෝ 100ත වඩා ඝණ අපද්‍රව්‍ය ජනනය කරනු බලන හෝටල් සඳහා ජීව වායු ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමටත්, සැලසුම් අනුමත කිරීමේදී එම සැලැස්මද අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු බවටත් නීති හඳුන්වා දෙනු ඇත.

*වගු අංක 6.3:ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන ක්‍රමවේද*

| කාරණය | විස්තරය | ක්‍රියාමත්මක කිරීමේ ආයතනය , අපේක්ෂිත කණ්ඩායම |
|---|---|---|
| දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වීම | අත්පත්‍රිකා, පෝස්ටර්, ස්ටිකර්ස්, නිවසින් නිවාස අභිප්‍රේරණය කිරීම, කණ්ඩායම් රැස්වීම් පැවැත්වීම, ජන හමු පැවැත්වීම, චිත්‍ර තරඟ පැවැත්වීම | මහනුවර මහ නගර සභාව, NGO, සිවිල් සමාජ, පාරිසරික කණ්ඩායම්, පෞද්ගලික ආයතන, ව්‍යවසායක ආයතන, ප්‍රජා සංවිධාන |
| ආයතනික හා ගොඩනැඟිලි ධාරිතාවයන් වැඩි කිරීම | වැඩමුළු පැවැත්වීම, ක්ෂේත්‍ර පරීක්ෂණ, උපදෙස් ලබාදීම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් පැවැත්වීම | මහනුවර මහ නගර සභාව, ව්‍යවසායක ආයතන |
| ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම | මාර්ග ප්‍රතිස්නාකරණය කිරීම, එකතු කිරීමේ ස්ථාන යාවත්කාලීන කිරීම | මහනුවර මහ නගර සභාව |
| භාෂ්මික ද්‍රව්‍ය | භාෂ්මික ද්‍රව්‍ය එකතු කිරීමේ ස්ථානයක් රෝහල් භූමිය තුළ ස්ථාපනය කිරීම | මහනුවර මහ නගර සභාව, සෞඛ්‍ය සංවිධාන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| ප්‍රතිචක්‍රීකරණය කිරීම | ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් පැවැත්විම | මහනුවර මහ නගර සභාව, NGO, සිවිල් සමාජ, පාරිසරික කණ්ඩායම්, පෞද්ගලික ආයතන, ව්‍යවසායක ආයතන, ප්‍රජා සංවිධාන |

| කාරණය | විස්තරය | ක්‍රියාමත්මක කිරීමේ ආයතනය , අපේක්ෂිත කණ්ඩායම |
|---|---|---|
| කොම්පෝස්ට් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | භූමිය, සැලැස්ම, ඉදිකිරීම, උපකරණ | මහනුවර මහ නගර සභාව, NGO, සිවිල් සමාජ, පාරිසරික කණ්ඩායම්, පෞද්ගලික ආයතන, ව්‍යවසායක ආයතන, කාන්තා සංවිධාන |
| නගරය පිරිසිදු කිරීම | අපිරිසිදු වී ඇති නාගරික කලාපයන් සඳහා ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම | මහනුවර මහ නගර සභාව, NGO, සිවිල් සමාජ, පාරිසරික කණ්ඩායම්, පෞද්ගලික ආයතන, ව්‍යවසායක ආයතන, ප්‍රජා සංවිධාන |
| ගොහාගොඩ කුණු කසළ බැහැර කිරීමේ අවසාන ස්ථානය පුනරුත්ථාපනය කිරීම | ගොහාගොඩ කුණු කසළ බැහැර කිරීමේ ස්ථානයට එකතු වන කුණු කසළ යොදා ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම හා R4ක්‍රමවේදය යටතේ කළමනාකරණය කිරීමත් බල ශක්ති උත්පාදනය කිරීමත් සිදු කිරීම . | මහනුවර මහ නගර සභාව, NGO, සිවිල් සමාජ, පාරිසරික කණ්ඩායම්, පෞද්ගලික ආයතන, ව්‍යවසායක ආයතන, ප්‍රජා සංවිධාන |

මුලාශ්‍රය: උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2030

ඉහත සඳහන් පරිදි මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම පිළිබඳව ක්‍රමෝපායන් හඳුන්වාදෙනු ඇත. තවද දැනට කුණු කසළ බැහැර කිරීම සඳහා ගොහාගොඩ පවතින අක්කර 10ක භූමියෙහි ප්‍රමාණය අක්කර 32ක් දක්වා වැඩි දියුණු කිරීමත් බල ශක්ති උත්පාදනය හා කසළ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය මෙම ස්ථානය තුළ සිදු කිරීමත් අපේක්ෂා කෙරේ.

ඒ අනුව මෙම ඝණ අපද්‍රව්‍ය කළමණාකරන සැලසුම, යෝජිත සේවා සැලැස්ම හා යෝජිත උරුමයක් හා සංස්කෘතික උත්සව පිළිබඳ වූ සැලසුම, ජලාපවහන හා මලාපවාහන සැලසුම සමඟද තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම සමඟද සංයුක්ත වන අතර මෙම ක්‍රමවේදයන් හරහා නගර වැසියන් මෙන්ම නගරය භාවිතා කරන්නන් වෙත සුව පහසු ජීවන රටාවක් ලබා දීම හා නීල හරිත පරිසරයක් ගොඩනැගීම යන අරමුණු ඉෂ්ඨ කරගැනීමට හැකියාව ලැබෙනු ඇත.

# 6.4. ආර්ථික සංවර්ධන උපක්‍රම

## 6.4.1. හැඳින්වීම

මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට පවතිනු ලබන ආර්ථිකය ශක්තිමත් කිරීමට මෙන්ම ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම මෙම සැලැස්ම තුළින් හඳුන්වා දී ඇත.

2015 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදනය සඳහා මධ්‍යම පළාතේ දායකත්වය 10.3% වන අතර එය සියලු පළාත් අතරින් 04 වැනි ස්ථානය ගනු ලබයි. කෘෂිකාර්මික අංශයෙන් 13.8%ක්ද, කර්මාන්ත අංශයෙන් 7.9%ක්ද සේවා අංශයෙන් 11.0%ක්ද ජාතික දළ දේශීය නිෂ්පාදන සඳහා දායකත්වය සපයනු ලැබේ. ඒ අනුව පළාත් දළ දේශීය නිෂ්පාදනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයෙන් කෘෂිකාර්මික අංශය සඳහා 5.5%ක්ද, කර්මාන්ත අංශය සඳහා 22.8%ක්ද සේවා අංශය සඳහා 71.6%ක්ද දායකත්වය සපයනු ලබන බව පුරෝකථනය කළ හැකිය. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජනගහනය මුළු ජනගහනයෙන් 46.9%ක ප්‍රමාණයක් වන අතර ඉන් විරැකියාවෙන් පෙළෙන ප්‍රමාණය ඉවත්කළ විට ආර්ථික වශයෙන් ක්‍රියාකාරි රැකියා නියුක්ත ප්‍රමාණය මුළු ජනගහනයෙන් 43.9%ක් පමණ වේ.

මහනුවර නගරය තුළ 334ක් පමණ හෝටල් ප්‍රමාණයක් ව්‍යාප්තව පවතින අතර කාමර 18,510ට ආසන්න සංඛ්‍යාවක් ඉන් සපයනු ලැබේ. වර්ෂ 2011 හා 2016 අතර කාල පරාසය තුළ ශ්‍රී ලංකාවේ පෞරාණික නගරයන් තුළ සංචාරකයින් රැඳීම ප්‍රමාණය 71.7% සිට 75.46%ක් දක්වා 3.76%ක ප්‍රමාණයකින් වැඩි වී ඇත. ඒ අනුව සංචාරකයින් පෞරාණික නගරයන් තුළ රැඳීම අගයෙහි සාමාන්‍යය අගය 0.75%කින් වාර්ෂිකව වැඩි වී ඇති බව උපකල්පනය කළ විට 2030 වර්ෂයේදී සංචාරකයින් පෞරාණික නගරයන් තුළ රැඳීම ප්‍රමාණය 10.53%කින් වැඩි විය හැකි බව පුරෝකථනය කළ හැකි නමුත් දැනට මහනුවර නගරය වෙත පැමිණෙන සංචාරකයින් නගරය තුළ එක් දිනක් හෝ අවම වශයෙන් රඳවා ගැනීමට හෝටල් හෝ වෙනත් සංචාරක කාමර 850කට වැඩි ප්‍රමාණයක අවශ්‍යතාවයක් පවතී. තවද වර්ෂ 2030 වන විට සංචාරක කර්මාන්තය ආශ්‍රිතව, වෙළඳාම් කටයුතු ආශ්‍රිතව හා අනෙකුත් ක්ෂේත්‍ර අශ්‍රිතව රැකියා ආවස්ථා 15,000ක් පමණ ලබා දීමට හැකියාව ලැබේ.

මහනුවර නගරයෙහි ප්‍රධානතම ආදායම් ප්‍රභවය සේවා අංශයෙන් ලද ආදායම වන අතර සංචාරක කර්මාන්තය මත ගොඩනැගී ඇත. දැනට මහනුවර නගරය තුළ පවතින සම්පත් නගරයෙහි සංචාරක කර්මාන්තය නඟා සිටුවීමට යොදා නොගැනීම නගරය තුළ පවතින ප්‍රධානතම ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම ඉතා ඉහළ අගය පරාසයක් තුළ පවතින ඉඩම් වලින් හෙක්ටයාර 46ක් පමණ දැනට ඌන උපයෝජිත මට්ටමේ පැවතීමත්, නගරය තුළ පවතින වාස්තු

විද්‍යාත්මක ලක්ෂණ ක්‍රමයෙන් හීන වී යාමත් අනෙකුත් ගැටලු ලෙස හඳුනාගත හැකිය.

ඒ අනුව හඳුනාගන්නා ලද සම්පත් උපයෝජනය කිරීම තුළින් නගරයෙහි ආර්ථිකය ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා ගෙනයාමට හැකියාව ලැබෙන අතර එමඟින් ‘‘කන්ද උඩරට තේජාන්විත අගනගරය’’ යන දැක්ම කරා ගමන් කිරීමට අවශ්‍ය පසුබිම ලැබෙනු ඇත.

## 6.4.2. යෝජිත ආර්ථික සංවර්ධන සැලසුම

*සිතියම් අංක 6. 10:යෝජිත ආර්ථික සංවර්ධන සැලසුම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

### 6.4.3. යෝජිත උපායමාර්ග, ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමඟ පවතින සංයුක්තතාවය

ඓතිහාසික නගර කලාපය හා උපයෝගිතා සේවා කලාපය සංක්‍රමණික ජනගහණය අරමුණු කරගත් ව්‍යාපාරික ස්ථාන ඇති කරනු ලබන අතර විවෘත හා විනෝද කටයුතු සඳහා පහසුකම් සහිතව විශේෂ සංවර්ධනයන් එමෙන්ම මහනුවර නාගරික ප්‍රදේශය වටා පිහිටි ප්‍රදේශ වල පාරම්පරික කර්මාන්තකරුවන් විසින් නිපදවනු ලබන දේශීය නිෂ්පාදනය සංචාරකයින්ට අලෙවි කිරීම සඳහා මහනුවර ඓතිහාසික නගර මධ්‍යය කලාපය තුළ අවස්ථාව ලබාදේ. ඓතිහාසික නගර මධ්‍ය කලාපය තුළ පවතින පසු මාවත් හා පටු මාවත් ඒ වෙනුවෙන් විශේෂ නැඹුරුතාවයක් ඇති ප්‍රදේශයක් ලෙසට දියුණු කිරීමට අපේක්ෂා කෙරෙන අතර මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයට අයත් මහවැලි ගඟ හා යාව ඇති භූමිය අයත් මධ්‍යම ඝණත්ව මිශ්‍ර සංවර්ධන කලාපය මෙන්ම හඳුනාගත් ඓතිහාසික නගර මධ්‍ය කලාපය, වැව රවුම කලාපය, උපයෝගිතා සේවා කලාපය තුළ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කටයුතු සඳහා වන ඉදිකිරීම් සඳහා අවස්ථාව දෙනු ලැබේ.

ඓතිහාසික නගර මාධ්‍යය කලාපය තුළ පවතින තොග වෙළඳාම අධෛර්යමත් කිරීම තුළින් කටුගස්තොට ප්‍රදේශයේ විශාල පරිමාණයේ තොග වෙළඳාම් කටයුතු ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපනය කරනු ලැබේ. මෙමඟින් නගරයට පැමිණෙන්නන් සමඟ පවතින ගනුදෙනු ප්‍රමාණය ඉහළ නැංවීම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

එමෙන්ම නගරය තුළ අක්කර 80ක් පමණ ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව පවතින අඩු පහසුකම් සහිත නිවාස හිමියන් හට නව නිවාස ව්‍යාපෘතීන් සඳහා අක්කර 25ක් පමණ ප්‍රදේශයක් හා භූමි අලංකරණ කටයුතු සඳහා අක්කර 15ක් ඒ සඳහා වෙන්කර දීම තුළින් ඉතිරි අක්කර 40ක පමණ ප්‍රදේශ තුළ ඒ ඒ කලාප වල සංවර්ධිත අවශ්‍යතාවයන් සඳහා යොදා ගැනෙනු ඇත.

උපයෝගිතා සේවා කලාපය තුළ පොලිස් නිල නිවාස, බෝගම්බර බන්ධනාගාර, මහ නගර සභා පුස්තකාලය, මහ නගර සභා පොදු රථ ගාලෙහි ඉහළ මහලය, ජෝර්ජ් ඊ. ද සිල්වා උද්‍යානය කේන්ද්‍ර කරගනිමින් විශේෂිත සංවර්ධනයක් දියත් කෙරෙන අතර එය සංචාරක කර්මාන්තය කේන්ද්‍ර කරගනිමින් සිදු කරනු ලැබේ. නගරය වටා පවතින සංචාරක ආකර්ෂණීය ස්ථාන යා කෙරෙමින් වට රවුම් මාර්ගයන් දියුණු කරනු ලබන අතර එම මාර්ගයන් බයිසිකල් පැදීම හා පදික මං මාවත් ලෙස සංවර්ධනය කෙරේ.

ඒ අනුව මෙම ආර්ථික සංවර්ධන සැලසුම, යෝජිත සේවා සැලැස්ම හා යෝජිත උරුමයක් හා සංස්කෘතික උත්සව පිළිබඳ වූ සැලසුම සමඟද සංයුක්ත වන අතර මෙම ක්‍රමවේදයන් හරහා නගරය තුළ ස්වයං පෝෂිත ආර්ථිකයක් ගොඩනැගීම යන අරමුණු ඉෂ්ට කර ගැනීමටත් ඓතිහාසික නගර මධ්‍යය කලාපය තුළ වර්ෂ 2030 වන විට මහනුවරට ආවේණික සුළු හා මධ්‍ය

පරිමාණ කර්මාන්ත වෙනුවෙන් විශේෂ නැඹුරුතාවයක් ඇති කලාපයක් ලෙසට දියුණු කිරීමත්, වර්ෂ 2030 වන විට සංචාරකයින් මහනුවර නගරය තුළ රැඳීම් ප්‍රමාණය 86% ක් දක්වා වැඩි කිරීමටත් අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම හා මහනුවර නගරය තුළ වර්ෂ 2030 වන විට හෙක්ටයාර් 46ක් පමණ ඌන උපයෝජන ඉඩම් සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීම යන පරමාර්ථ ඉෂ්ට කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

# 6.5. තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම

## 6.5.1. හැඳින්වීම

මහනුවර නගර සංවර්ධන සැලැස්මේ දැක්ම සාක්ෂාත් කර ගැනිම සඳහා වන දෙවන අරමුණ වන්නේ ස්වාභාවික පරිසර හා නිර්මිත පරිසරයෙහි සුසංයෝගය තුළින් නීල හරිත පරිසරයක් නිර්මාණය කිරීමයි. ඒ සඳහා වන තිරසාර පරිසර සංවර්ධන උපක්‍රමයන් පරිසර සංරක්ෂණ සැලසුම, භූ දර්ශන කළමනාකරණ සැලසුම්, ආපදා අවදානම් කළමණාකරණ සැලසුම් හා විවෘත භූමි සැලසුම් යන සැලසුම් මෙම තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම යටතේ හඳුනාගෙන ඇත.

## 6.5.2. යෝජිත උපාය මාර්ග ව්‍යාපෘතීන් හා අනෙකුත් සැලසුම් සමග පවතින සංයුක්තතාවය

මහනුවර නගරය තුළ පවත්නා වනාන්තර ලෙස උඩවත්ත රක්ෂිතය සහ වාකරවත්ත හඳුනාගත හැක. එසේ වුවත් මෙම ස්ථාන ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා භාවිතා කිරීම අවම මට්ටමක පවතී එබැවින් ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා යොමු කිරීම හා සංරක්ෂණය කිරීම මෙන්ම මෙම ප්‍රදේශයන් විනෝද පහසුකම් /අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම පොදු විනෝද පහසුකම් සැලැස්ම යටතේ හඳුන්වා දේ.

එමෙන්ම දැනට පවතින පරිසර පද්ධතිය මිනිසා විසින් නිර්මාණය කරන ලද සංවර්ධන කාර්යයන් හේතුවෙන් (නීතිරීති වලින් තොරව) දැඩි ලෙස හානි පැමිණ ඇති අතර එම තත්වය වැලැක්වීම සඳහා ස්වාභාවික පිහිටීම, දර්ශනීය ස්ථාන භූ ලක්ෂණ උපයෝගී කර ගනිමින් ඉඩම් පරිහරණ කලාප සැලසුම් පිළියෙල කිරීම සිදු කරනු ලැබේ. පවත්නා පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම හා මුහුදු මට්ටමේ සිට උස අඩි 2000 ඉහළ ප්‍රදේශය සහ ඉඩමේ බෑවුම් අංශක 45% වැඩි ප්‍රදේශ අධි සංවේදි පාරිසරික කලාපයක් ලෙස කලාපිය ගත කර සංරක්ෂණය කිරීම මෙන්ම මුහුදු මට්ටමේ සිට උස අඩි 1800-2000 අතර ප්‍රදේශයන්ද පාරිසරික සංවේදී ප්‍රදේශයන් ලෙස කලාපීයකරණය කර එම ප්‍රදේශයන් තුළ පවතින ඉඩම්වලින් 75%ක ප්‍රමාණයක් ඉදිකිරීම් වලින් තොරව පවත්වාගෙන යාම හා මුහුදු මට්ටමේ සිට 1600-1800 ප්‍රදේශය තුළ පවතින ඉඩම් වලින් 50%ක ප්‍රමාණයක් ඉදිකිරීම් වලින් තොරව පවත්වාගෙන යාම තුළින් හරිත පරිසරය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

වඳවීමේ තර්ජනයට ලක්වෙමින් පවතින ශ්‍රී ලංකාවට ආවේණික මත්ස්‍ය විශේෂයන් ජීවත්වන මහවැලි ගඟ ආශ්‍රිතව වරාතැන්න හත්කිඳ ප්‍රදේශය 2017 මැයි මස 19 දින අංක 2024/6 මඟින් පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර එහි පවතින නීති රෙගුලාසි මඟින් එම ප්‍රදේශයේ සංවර්ධන කටයුතු පාලනය කිරීමත් සිදු කෙරේ.

රජපිහිල්ල මාවතේ "රජපිහිල්ල" පිහිටා ඇති අතර මේ සඳහා දුනුමඩලාව රක්ෂිතය තුළින් ගමන් ගන්නා ස්වභාවික ඇළ මාර්ගයක් වන හීන්පැන් කඳුර මඟින් ජලය සැපයෙන අතර, අතීතයේදී රජ බිසෝවරු ජල ස්නානය කිරීම සඳහා මේ ස්ථානය යොදාගෙන ඇති බව සඳහන් වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් මෙම ස්ථානය සංරක්ෂණය කළ යුතු ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. එම ස්ථානය සංචාරකයන් නැරඹිය හැකි ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමත් මෙම සැලැස්ම තුළින් සිදු කරනු ලැබේ.

1995 වර්ෂයේදී ස්වභාවික සම්පත් සංරක්ෂණය සඳහා පවතින නීතිමය රාමුව සැලකීමේදී ප්‍රතිපත්ති පිළියෙල කරන ලද අතර 2009 වර්ෂයේදී වන සංරක්ෂණ නීති වනාන්තර ආරක්ෂා කිරීම සඳහා පිළියෙල කර ඇත. වන ජීවී සංරක්ෂණය සඳහා 1990 වර්ෂයේදී ජාතික ප්‍රතිපත්ති පිළියෙල කර ඇත. මෙම නිති රාමු තුළ උඩවත්ත රක්ෂිතය මහනුවර මහ නගර සභා සීමාව තුළ සංරක්ෂිත ප්‍රදේශ ලෙස පිහිටා ඇති අතර මෙම ප්‍රදේශය අධ්‍යාපනික දැනුම වැඩි දියුණු කිරිම සහ පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කිරිමට මෙම සැලැස්ම තුළ යෝජනා කෙරේ.

### 6.5.3. භූ දර්ශන කළමණාකරණය

භූ දර්ශන කළමනාකරණය මඟින් පරිසර පද්ධති සංරක්ෂණය සිදුවන අතර භූ දර්ශනය යනු ස්වාභාවික පරිසරය, භූ දර්ශනය හා (Natural Landscape) හා මිනිසා විසින් නිර්මාණය කරන ලද පරිසර භූ දර්ශනයන්ගේ (Manmade Landscape) එකතුවකි.

මහනුවර භූ දර්ශනය වෙනස් වීම සිදුවීම කාල පරාසයන් 03 ක් තුළ විග්‍රහ කළ හැකිය.

- මහනුවර යටත් විජිතයන් වීමට පෙර
- මහනුවර යටත් විජිතයන් පැවති කාලය
- මහනුවර යටත් විජිතයන් පසු වර්තමානය දක්වා කාලය

මහනුවර රාජධානිය තුළ රජු සහ භික්ෂු සාසනය විසින් දළදා මාළිගාව සහ අවට ප්‍රදේශයට අදාළ භූ දර්ශන නිර්මාණ සැලසුම් සහ කාර්යයන් ඉටුකරන ලදී. යටත් විජිත බලපෑම් සමඟ මහනුවර භූ දර්ශනය වෙනස් වෙමින් වතු ආර්ථිකයත් ඇතිකිරීම තුළින් ව්‍යුහමය සහ ක්‍රියාකාරකම්වල වෙනස් වී සිදුවෙමින් වර්තමාන තත්වය දක්වා ගමන් කර ඇත. මේ තුළ සංස්කෘතික භූ දර්ශනය හා මහනුවරට ආවේණික වූ සම්ප්‍රදායික සංස්කෘතික අංගයන්(දළදා පෙරහැර,කලා නිර්මාණයන්) මහනුවර නගරයේ භූ දර්ශනයට තුළ ඇතුළත් වේ.

මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේදි ශ්‍රී දළදා මාළිගාව හා ඊට යාබද මහනුවර නගරය වටා පවතින කඳු පන්තියන් හා වනාන්තර මහනුවර වැව ආදිය සැලකිල්ලට ගෙන ඇත. එබැවින් මෙම භූ දර්ශනය ආරක්ෂා කර ගැනීම සඳහා පවත්නා පරිසර

පද්ධති ආරක්ෂා කිරීම (ඉහත සංරක්ෂණය උපාය මාර්ග තුළ ඇතුළත්) හා මහනුවර වැවට ජලය සැපයෙන හා මහනුවර නගරය තුළින් මහවැලි ගඟට ජලය සැපයෙන ජල මූලාශ්‍ර රක්ෂිත ප්‍රදේශයන් හූ දර්ශනය කිරීම හා ඇවිදිමේ මංතීරු ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. එමෙන්ම මුහුදු මට්ටමේ සිට උස අඩි 1800-2000 අතර ප්‍රදේශයන්ද පාරිසරික සංවේදී ප්‍රදේශයන් ලෙස කලාපීයකරණය කර මෙම ප්‍රදේශයන් තුළ පවතින ඉඩම්වලින් 75%ක ප්‍රමාණයක් ඉදිකිරීම් වලින් තොරව පවත්වාගෙන යාමත්, මුහුදු මට්ටමේ සිට 1600-1800 ප්‍රදේශය තුළ පවතින ඉඩම් වලින් 50%ක ප්‍රමාණයක් ඉදිකිරීම් වලින් තොරව පවත්වාගෙන යාම තුලින් හරිත පරිසරය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම ඓතිහාසික වටිනාකම් පවතින මිනිසා විසින් නිර්මාණය කරන ලද (Hard landscape) ගොඩනැඟිලි ස්මාරක ආදි ස්ථාන ආරක්ෂා කිරීම සඳහා කලාප වෙන් කිරීම සහ උපදේශන සැලසුම් පිළියෙල කිරීම සිදු කෙරේ.

මහනුවර නගරය වටා පවතින මහවැලි ගඟ රක්ෂිත ප්‍රදේශය හූ දර්ශනය කිරීම හා විවෘත හා විනෝද පහසුකම් සහිතව සංවර්ධනය කිරීම. මෙන්ම මහනුවර නගරය තුළ පවතින ආදාහනාගාරද හූ දර්ශනය කිරීම මඟින් විවෘත හා විනෝද කටයුතු වෙනුවෙන් යොදා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

මහනුවර නගරය තුළ පවතින ප්‍රධාන ගැටලුවක් වන පදික මංතීරු නොමැතිකම සහ පවතින මංතීරු ගමන් කිරීමට සුදුසු නොවන තත්වයේ පවතින බැවින් සියලුම ස්ථානවලට ගමන් කළ හැකි ආකාරයට ඇවිදීමේ මංතීරු ඇති කිරීම සහ එම පොදු විනෝද පහසුකම් අවකාශය සැලැස්ම තුළ ඇතුළත් කිරීම සිදුකර ඇත. මහනුවර නගරයේ පවතින කඳු මුදුන් වල අක්‍රමවත් ලෙස ගොඩනැඟිලි ඉදිකිරීම තුළින් නගරය හූ දර්ශනයට කරනු ලබන බලපෑම අවම කිරීම සඳහා සියලුම ගොඩනැඟිලි සැලසුම් සමග හූදර්ශන සැලසුම් අනුමැතියට යොමු කිරීම හා ඒ අනුව සංවර්ධන කටයුතු පාලනය කිරීම සඳහා සංවර්ධන සැලසුම් රෙගුලාසි හඳුන්වාදෙනු ලැබේ.

### 6.5.4. ආපදා අවදානම් කළමණාකරණ සැලැස්ම

ආපදා අවම පරිසරයක් ගොඩනැගීම සහ ස්වාභාවික පරිසරය හා නිර්මිත පරිසරයේ සමතුලිතතාවය රැක ගැනීම මෙහි ප්‍රධාන අරමුණවේ.

ආපදාවට ලක්වන නමුත් ආපදා අවම ප්‍රදේශ වල භූමි භාවිතය සහ ඉඩම් අනුබෙදුම් සඳහා සැලසුම් රෙගුලාසි හඳුන්වාදීම( Planning Guideline), තුළින් භූමි භාවිතය ක්‍රමවත් කිරීම හා ඉඩම් අනුබෙදුම් සිදු කිරීමේදී ඍජුකෝණාස්රාකාර ලෙස ඉඩම් බෙදීම හැකි සෑම අවස්ථාවකදීම සිදු කිරීම සඳහා අනුබල ලබා දේ.

ආපදා අවම කිරීමේ උපාය ක්‍රමයක් ලෙස භූදර්ශන සැලසුම් හඳුනාගැනීම සහ සියලුම ගොඩනැඟිලි සංවර්ධන කාර්යයන් සමග භූදර්ශන සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා ගොඩනැඟිලි අයදුම්පත් සමඟ අනුමැතිය ලබාගැනීමට කටයුතු කෙරේ. එමෙන්ම පස් කඳු කඩා වැටීම (earth slips)අවම කිරීම සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීමට උපදෙස් ලබාදේ.

සමෝච්ඡ රේඛා සැලකිල්ලට ගනිමින් කඳු මුදුන්වල ගොඩනැඟිලි ඉදිකිරීම් සැලසුම් කිරීම හා පාංශු සංරක්ෂණය සඳහා කෘෂි වගා කිරීම් මෙන්ම අධික බෑවුම් සහිත ප්‍රදේශයන්හි පවත්නා භූ දර්ශනයට හානි නොවන පරිදි පවත්නා වන ගහනය ආරක්ෂා වන පරිදි ගොඩනැඟිලි සැලසුම් කිරීම පිළියෙල කිරීමට උපදෙස් ලබාදේ.

මුහුදු මට්ටමේ සිට අඩි 2000 උස් බිම් ප්‍රදේශ තුළ සංවර්ධන කටයුතු හා අංශක 45 වැඩි බෑවුම් ප්‍රදේශ පාරිසරික කලාප ලෙස කලාප ගත කිරීම සිදුකෙරේ.. මුහුදු මට්ටමේ උස අඩි 1800-1999 අතර කලාපය තුළ අනුබෙදුම් සහ සංවර්ධන කටයුතු සඳහා රෙගුලාසි හඳුන්වාදෙනු ලැබේ.

මහනුවර නගරය තුළ හදිසි ජල ගැලීම්, පස්කඳු කඩා වැටීම් , නායයෑම් බහුලව සිදුවන අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් පවත්නා කඳු පද්ධතිය ඉතා පැරණිම වීම සහ කඳු මුදුන් ප්‍රදේශ වල සැලසුම් අනුමැතියකින් තොරව ගොඩනැඟිලි ඉදිකිරීම් ප්‍රධාන ගැටලු වේ. එබැවින් පහත උපාය මාර්ග හා ව්‍යාපෘතීන් තුළින් මෙම තත්වය අවම කිරීමට අපේක්ෂිතය.

ජල මූලාශ්‍ර ඇතුළත් සිතියමෙහි ඇතුළත් ඇල මාර්ග සඳහා රක්ෂිත සීමා වෙන් කිරීම හා ගොඩනැඟිලි සීමා තීරණය කිරීම හා ඇවිදීමේ මාර්ග සංවර්ධනය කිරීම පොදු විනෝද පහසුකම් අවකාශ සැලැස්ම තුළින් යෝජනා කරනු ලැබේ.

නුවර වැව සහ අනෙකුත් ප්‍රධාන ඇළ මාර්ගයන් සඳහා වැලි රඳවන ඉදිකිරීම සහ පවතින වැලි රඳවන ප්‍රතිසංස්කරණය කිරීම හා හදිසි ජල ගැලීම් පාලනය කිරීම් සඳහා ජල මාර්ග සහ කාණු පද්ධතිය දිය දෝරය විශාල කිරීම (Expansion of the runoff) සිදු කෙරේ.

- මැද ඇල
- හාලි ඇල

*සිතියම් අංක 6. 11:මහනුවර නගරය තුළ පවතින ජල මූලාශ්‍ර*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

*සිතියම් අංක 6. 12:මහනුවර නගරය තුළ පවතින පහත් බිම්*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

එමෙන්ම පහත් බිම් ලෙස පෙන්වා ඇති සිතියමෙහි ඇතුළත් පවත්නා කුඹුරු ඉඩම් තාවකාලිකව ජලය රඳවා ගත හැකි ස්ථාන ලෙස වෙන් කිරීම හා නගර මධ්‍යයේ පවතින පැරණි කාණු පද්ධතිය නැවත ප්‍රතිසංස්කරණය කිරීම තුළින් නගරයේ පවතින හදිසි ජල ගැලීම් තත්වය අවම කිරීම සිදු කෙරේ.

### 6.5.5. විවෘත භූමි සැලැස්ම

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ 2030 වර්ෂයේදී යෝජිත ජනගහනය 106,000 ක් වන අතර ඒ සඳහා යෝජිත පොදු විනෝද පහසුකම් සැලැස්ම (PORS Plan) පිළියෙල කිරීම සහ හෙක්ටයාර් 106 ප්‍රමාණය පොදු විනෝද පහසුකම් ලෙස වෙන්කර සංවර්ධනය කිරීම සිදු කෙරේ. (ඇමුණුම 26)

*වගු අංක 6: 4.මහනුවර නගර සභා සීමාව තුළ පිහිටි ක්‍රීඩාපිටි*

| ක්‍රීඩාපිටිය | | ක්‍රීඩා | වර්ග ප්‍රමාණය (.හෙක්) | උද්‍යානය | සේවා ප්‍රදේශය |
|---|---|---|---|---|---|
| 1 | මාපනාවතුර | පාපන්දු/ක්‍රිකට්/රගර් | 1.2 | මධ්‍ය උද්‍යාන (local park) | 0.4 |
| 2 | වට්ටාරන්තැන්න | පාපන්දු/ක්‍රිකට්/රගර් | 0.5 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 3 | කොස්ම් උද්‍යානය | පාපන්දු/ක්‍රිකට්/රගර් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 4 | නවයාලතැන්න | පාපන්දු/ක්‍රිකට්/රගර් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 5 | නිත්තවෙල | පාපන්දු/ක්‍රිකට්/රගර්/ මලල ක්‍රීඩා | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 6 | මාවිල්මඩ | පාපන්දු/ක්‍රිකට්/රගර්/ මලල ක්‍රීඩා | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 7 | වටපුළුව (H.S) | පාපන්දු/ක්‍රිකට්/රගර්/ අත්පන්දු | 3.5 | මධ්‍ය උද්‍යාන (local park) | 0.4 |
| 8 | වටපුළුව විලේජ් | පාපන්දු/ක්‍රිකට්/රගර් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 9 | අරුප්පල | පාපන්දු/ක්‍රිකට්/රගර් | 2.0 | මධ්‍ය උද්‍යාන (local park) | 0.4 |
| 10 | ලේවැල්ල | පාපන්දු/ක්‍රිකට්/රගර් /වොලිබෝල් | 1.5 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 11 | දෙයියන්නේවෙල | පාපන්දු/ක්‍රිකට්/රගර්/ මලල ක්‍රීඩා | 1.75 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 12 | වේවැල්පිටිය | පාපන්දු/ක්‍රිකට්/රගර්/ මලල ක්‍රීඩා /හොකි | 1.75 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 13 | වටපුළුව පරණ ගංතොට පාර | පාපන්දු/ක්‍රිකට්/රගර්/ මලල ක්‍රීඩා /අත්පන්දු | 1.25 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 14 | ගෝමස් | පාපන්දු/ක්‍රිකට්/රගර් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 15 | නාගස්තැන්න පහළ | පාපන්දු/ක්‍රිකට් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |

*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

| ක්‍රීඩාපිටිය | | ක්‍රීඩා | වර්ග ප්‍රමාණය (.හෙක්) | උද්‍යානය | සේවා ප්‍රදේශය |
|---|---|---|---|---|---|
| 16 | දංගොල්ල | පාපන්දු/ක්‍රිකට්/රගර් | 2.75 | මධ්‍ය උද්‍යාන (local park) | 0.4 |
| 17 | දොඩංවල | පාපන්දු/ක්‍රිකට්/ වොලිබෝල් | 0.75 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 18 | බුවැලිකඩ | පාපන්දු/ක්‍රිකට්/රගර්/ මළල ක්‍රීඩා | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 19 | අම්පිටිය | පාපන්දු/ක්‍රිකට්/වොලි බෝල්/හොකී/රගර්/ මළල ක්‍රීඩා | 2.5 | මධ්‍ය උද්‍යාන (local park) | 0.4 |
| 20 | මේල්වත්ත | පාපන්දු/ක්රිකට්/ලෙදර් බෝල් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 21 | ගැටඹේ | පාපන්දු/ක්‍රිකට්/වොලි බෝල්/හොකී/රගර්/ මළල ක්‍රීඩා /අත්පන්දු | 2.5 | මධ්‍ය උද්‍යාන (local park) | 0.4 |
| 22 | කටුකැලේ | පාපන්දු/ක්‍රිකට් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 23 | අනිවත්ත | පාපන්දු/ක්‍රිකට් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 24 | අස්ගිරිය | පාපන්දු/ක්‍රිකට් | 1.0 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 25 | බර්ඩ් උද්‍යානය | | 0.41 | Pocket park (ඉතා කුඩා උද්‍යාන) | - |
| 26 | ජෝර්ජ් ඊ ද සිල්වා උද්‍යානය | | 0.01 | Pocket park (ඉතා කුඩා උද්‍යාන) | - |
| 27 | වැව රවුම රේඛීය උද්‍යානය | | 19.5 | Lenear park (රේඛීය උද්‍යාන) | - |
| 28 | රේඛීය උද්‍යාන (යෝජිත) | | 12.28 | Lenear park (රේඛීය උද්‍යාන) | - |
| 29 | වටපුළුව ළමා උද්‍යානය | | 0.84 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 30 | මහවැලි (රේඛීය උද්‍යානය) | | 16.9 | Lenear park (රේඛීය උද්‍යාන) | - |
| 31 | වාකරවත්ත ස්වභාවික උද්‍යානය | | 141.0 | Reganal park | - |
| 32 | බෝගම්බර නගර උද්‍යානය | | 0.5 | කුඩා උද්‍යාන (Mini Park) | 0.2 |
| 33 | පොලිස් බැරැක් නගර උද්‍යානය | | 3.0 | මධ්‍යය උද්‍යාන (local park) | 0.4 |

*මූලාශ්‍රය: මහනුවර මහා නගර සභාව, මහවැලි අධිකාරිය හා මධ්‍යම පරිසර අධිකාරිය*

*සිතියම් අංක 6. 13:යෝජිත විවෘත භූමි සැලැස්ම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

## 6.6. සංස්කෘතිය හා උරුමයන් කළමනාකරණය කිරීමේ උපක්‍රම

ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රය හා වළාකුළු බැම්ම, ඓතිහාසික ගොඩනැඟිලි ස්ථාන ගතවී ඇති ප්‍රදේශය, පැරණි කිරි මුහුද හෙවත් මහනුවර වැව හා වැව පෝෂක ප්‍රදේශය හා පැරණි හරිත කඳු පන්තිය ලෙස සැලකෙන උඩවත්ත කැලය, වාකරවත්ත, බහිරවකන්ද කඳු වැටිය හා හන්තාන ආදී ලෙස මහනුවර නගරය තුළ පවතින උරුමයන් හඳුනාගත හැකිය. එලෙස හඳුනාගනු ලබන ස්ථාන කළමණාකරණය කිරීම මෙම උපාය මාර්ගය යටතේ දැක්වේ.

මෙම උරුමයන් කළමනාකරණය කිරීමේ පරමාර්ථ වශයෙන් ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණය කිරීම, ඓතිහාසික මාර්ග ජාලය ආරක්ෂා කිරීම, පදික හිතකාමී පරිසරයක් ඇති කිරීම, දළදා මාළිගාව හා සම්බන්ධ වීමට විවෘත හා පාරිසරික වර්ණ ප්‍රදේශයන් ඇති කිරීම, ප්‍රමාණවත් නාගරික ක්‍රියාකාරකම් ප්‍රමාණයක් හඳුන්වාදීම, ස්වාභාවික ආපදාවන් අවම කිරීම, උපයෝගිතා සේවා කලාපය හා ඓතිහාසික නගර කලාපය අතර සම්බන්ධතාවයක් ඇති කිරීම, පෙරහැර ගමන් කරන මාර්ග වල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා පෙරහැර හා ගොඩනැඟිලි වල ව්‍යුහය අතර සම්බන්ධතාවය ගොඩනැඟීම ආදී ලෙස හඳුනාගත හැකිය.

"කන්ද උඩරට තේජාන්විත අග නගරය" යන දැක්ම ළගා කරගැනීම සඳහා ඇති කරගත් අරමුණු අතර එක් අරමුණක් ලෙස කන්ද උඩරට අද්විතීයත්වය සුරැකීම සඳහා උරුමයන්ගේ ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම හැඳින්විය හැකිය. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා සංස්කෘතික හා උරුමයන් කළමණාකරණ උපාය මාර්ගය යොදා ගනු ලබන අතර සංරක්ෂණය, හඳුනාගත් විශේෂ ගොඩනැඟිලි සඳහා අනුවර්තන භාවිතයන් ලබා දීම හා සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ මාර්ගෝපදේශ යටතේ මෙම උපායමාර්ග හඳුනාගෙන ඇත.

10 වන උපලේඛනයේ දැක්වෙන පරිදි පවතින A, B, C ගොඩනැඟිලි සංරක්ෂණය කිරීමේදී, නවීකරණය කිරීමේදී හා අලුත් වැඩියා කිරීමේදී 6.6.1.හි සඳහන් සංරක්ෂණ උපදෙස් අනුගමනය කළ යුතුය. තවද, හඳුනාගත් විශේෂ ගොඩනැඟිලි සඳහා අනුවර්ථන භාවිතයන් පහත පරිදි හඳුන්වා දෙනු ඇත.

*වගු අංක 6: 5:හඳුනාගත් විශේෂ ගොඩනැගිලි සඳහා අනුවර්ථන භාවිතයන්*

| ලෝක උරුම ගොඩනැඟිලි | අනුවර්තන භාවිතය |
|---|---|
| ඇහැලේ පොල වලව්ව | සංස්කෘතික සංචාරක ප්‍රවර්ධන කාර්යයන් සඳහා |
| බෝගම්බර බන්ධනාගාර | සංස්කෘතික හා සංචාරක ප්‍රවර්ධන කාර්යයන් සඳහා |
| නාගරික සංවර්ධන අධිකාරිය ගොඩනැගිල්ල | සංචාරක ප්‍රවර්ධන කාර්යයන් |
| පැරණි නීතිඥ කාර්යාලය | සංස්කෘතික හා සංචාරක ප්‍රවර්ධන කාර්යයන් |
| පැරණි තැපැල් කාර්යාල | සංචාරක ප්‍රවර්ධන කාර්යය ගොඩනැඟිල්ල |
| දුම්රිය ස්ථාන ගොඩනැඟිල්ල | ප්‍රවාහන කාර්යයන් |
| පොලිස් නිල නිවාස පරිශ්‍රය | විවෘත හා විවේක කටයුතු සඳහා |
| ගැරිසන් ආදාහනාගාරය | විවෘත හා විවේක කටයුතු සහ සංචාරක ප්‍රවර්ධනය |
| යුධ ආදාහනාගාරය | විවෘත හා විවේක කටයුතු සහ සංචාරක ප්‍රවර්ධනය |
| කටුගස්තොට පැරණි පාලම | වාණිජ හා සංචාරක ප්‍රවර්ධනය |

*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

## 6.6.1. සංරක්ෂණ උපදෙස්

### *6.6.1.1. A ශ්‍රේණිය සංරක්ෂණ උපදෙස්*

මෙවැනි ගොඩනැඟිල්ලක් වෙනස් කිරීම හෝ කඩා දැමීම කළ නොහැකි අතරම එවන් ගොඩනැඟිල්ලක යම් වෙනසක් සිදු කරන්නේ නම් එකී සැලසුම අනිවාර්යයෙන්ම ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණ හා තාක්ෂණ අනු කමිටුවේ සහ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබාගත යුතුය.

1. සැලසුම ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණය හා තාක්ෂණ අනුකමිටුව මඟින් අධික්ෂණය කළ යුතුය.
2. අමුද්‍රව්‍ය නුසුදුසු ලෙස භාවිතයට අවකාශ නොමැත.
3. සංරක්ෂණය විනා නවීකරණය සඳහා අවකාශ නොමැත.
4. වහල බිත්ති ඉදිරිපස පෙනුම ඒ ආකාරයෙන්ම පැවතිය යුතුය.
5. ලෝක උරුම සීමාවේ අඩි 40ට වඩා උස මට්ටම ඉක්මවිය නොහැක.
6. ගොඩනැඟිල්ලේ අළුත්වැඩියා කටයුතු ආරම්භයේ සිට අවසානය දක්වා ලෝක උරුම ගොඩනැඟිල්ලේ සංරක්ෂණ හා තාක්ෂණ කමිටුවේ නිල අධික්ෂණයට එකඟ විය යුතුය.
7. වරලත් වාස්තු විද්‍යාඥයෙකු විසින් සැලසුම ඉදිරිපත් කිරීම සහ අධික්ෂණය කිරීම සිදු කළ යුතුය.
8. ලෝක උරුම ගොඩනැඟිලි අනු කමිටු නිර්දේශ සියල්ල ලෝක උරුම කමිටුවේ දැන ගැනීම පිණිස යොමු කළ යුතුය.

### 6.6.1.2. B ශ්‍රේණිය සංරක්ෂණ උපදෙස්

1. අභ්‍යන්තර වෙනස් කිරීමේ හැකියාව ඇත.
2. ඉදිරිපස පෙනුම එලෙසම පවත්වා ගත යුතුය.
3. අමුද්‍රව්‍ය භාවිතයේදී 100% සැලකිලිමත් විය යුතු නැත.
4. ලෝක උරුම සීමාවේ අඩි 40ට වඩා උස මට්ටම ඉක්මවිය නොහැක.
5. ඓතිහාසික හෝ සංස්කෘතික සන්දර්භයට හානි කිරීම හෝ විකෘති කිරීම නොකළ යුතුය.
6. සැලසුම් කමිටුවේ පූර්ණ අධීක්ෂණයට ලක්විය යුතුය.
7. ලෝක උරුම කමිටුවේ අනුමැතිය ලබාගත යුතුය.
8. සංස්කෘතික උරුමයට ගැලපෙන තීන්ත ආලේප කළ යුතුය.
9. ගෙබිම සහ වහලයේ හැඩය වෙනස් නොකළ යුතුය.
10. සෙවිල්ල සුදුසු පරිදි වෙනස් කිරීමේ හැකියාව ඇත.
11. ගෙබිම සුදුසු පරිදි වෙනස් කිරීමේ හැකියාව ඇත.

### 6.6.1.3. C ශ්‍රේණිය සංරක්ෂණ උපදෙස්

1. ඉදිරිපස පෙනුමේ පෞරාණික ලක්ෂණ ඇත්නම් එය ආරක්ෂා කළ යුතුය.
2. ප්‍රතිසංස්කරණය සඳහා හැකියාව ඇත.

### 6.6.2. සංස්කෘතිය හා උරුමයන් කළමණාකරණය කිරීමේ සැලැස්ම

*සිතියම් අංක 6. 14: සංස්කෘතිය හා උරුමයන් කළමණාකරණය කිරීමේ සැලැස්ම*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

# 7. ක්‍රියාත්මක කිරීමේ උපක්‍රම

## 7.1. ප්‍රමුඛතා ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | වගකිව යුතු ආයතනික රාමුව |
|---|---|---|
| 1 | මහනුවර මහ රෝහල් පරිශ්‍රය තුළ රථ වාහන නැවත්වීම සඳහා රථවාහන නැවතුම් ස්ථානයක් ස්ථාපනය කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය |
| 2 | රෝහල් පරිශ්‍රය තුළ ජීවත්වන අනවසර පදිංචිකරුවන් පදිංචි කිරීම සඳහා වූ නිවාස යෝජනා ක්‍රමය | සෞඛ්‍ය අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය |
| 3 | මහනුවර නගර මධ්‍යය තුළ පවතින පෞද්ගලික වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන ඊරියගම නගරය වෙත ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය මහනුවර මහනගර සභාව |
| 4 | පේරාදෙණියේ රෝහල් කාර්යයන් ප්‍රවර්ධනය සඳහා පේරාදෙණියේ සිට ගැටඹේ දක්වා පවතින ඉඩම් තීරු යොදා ගැනීමේ ව්‍යාපෘතිය | සෞඛ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 5 | ගන්නෝරුව හා ඊරියගම කේන්ද්‍රගත කරමින් උසස් අධ්‍යාපන පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | අධ්‍යාපන අමාත්‍යාශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 6 | මහයියාව, නිත්තවෙල, නාථ දේවාලය, බෝගම්බර, කටුගස්තොට මැණික්කුඹුර අඩුපහසුකම් සහිත නිවාස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය මහනුවර මහනගර සභාව |
| 7 | යෝජිත මගී ප්‍රවාහන පර්යන්තයේ සිට දළදා මාළිගා පරිශ්‍රය දක්වා පදික මංතීරු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය මහනුවර මහනගර සභාව |
| 8 | ළමාගාර මාවතේ සිට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත දක්වාත් මීරමක්කම පල්ලිය දක්වාත් නව පදික මංතීරු මංතීරුවක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය මහනුවර මහනගර සභාව |
| 9 | ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පොළ හා දුම්රිය ස්ථානය ඒකාබද්ද කරමින් මහනුවර බහුවිධ මගී ප්‍රවාහන පර්යන්තයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| 10 | බහුවිධ මගී ප්‍රවාහන පර්යන්තයේ සිට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත හා බෝගම්බර රථ ගාල දක්වා ප්‍රවේශයන් සැපයීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| 11 | පේරාදෙණියේ සිට කටුගස්තොට දක්වා දුම්රිය මාර්ගය මංතීරු දෙකක් වනසේ සංවර්ධනය කිරීම හා පවතින දුම්රිය නැවතුම් ස්ථාන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | දුම්රිය දෙපාර්තමේන්තුව |
| 12 | මහනුවර හා අස්ගිරිය දුම්රිය ස්ථාන අතර නව දුම්රිය ස්ථාන 02ක් ස්ථාපනය කිරීම | දුම්රිය දෙපාර්තමේන්තුව |
| 13 | <u>**පොදු රථ ගාල් ස්ථාපනය කිරීම**</u><br>I. සංඝරාජ මාවතේ පිහිටි නුවරවෙල ඉඩම තුළ<br>II. කුඩා පොලිස් ක්‍රීඩා පිටිය ඉදිරිපස පුෂ්පදාන මාවත හා දුම්රිය මාර්ගය අතර<br>III. සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ පිහිටි මහනුවර දකුණු ඩිපෝව පවතින ස්ථානය තුළ | නාගරික සංවර්ධන අධිකාරිය මහනුවර මහනගර සභාව |

| | | |
|---|---|---|
| | IV. බෝගම්බර පොරොත්තු බස් රථ ගාල පවතින ස්ථානය තුල<br>V. යටිනුවර වීදියෙහි සිංහ රෙජිමේන්තුවට අයත් ඉඩම තුල | |
| 14 | **<u>පවත්නා මාර්ග සංවර්ධනය</u>**<br><br>I. හන්තාන මාර්ගය මහනුවර රෝහල දක්වා මාර්ගය මංතීරු 04ක් වනසේ සංවර්ධනය කිරීම.<br>II. අනිවත්ත උමගද සමඟ දොඩම්වල අනිවත්ත මාර්ගය හල්ලොලුව දක්වා සංවර්ධනය කිරීම<br>III. ගලහා හංදියේ සිට ගැටඹේ දක්වා මංතීරු 4 ක් ලෙස සංවර්ධනය කිරීම<br>IV. ගලගෙදර සිට කටුගස්තොට දක්වා මාර්ගය මංතීරු 4ක් දක්වා සංවර්ධනය කිරීම<br>V. සිරිමාවෝ බණ්ඩාරනායක මාවත හා විලියම් ගොපල්ලව මාවත අතර පවතින අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |
| 15 | **<u>අතුරු මාර්ග සංවර්ධනය</u>**<br><br>I. ලූවී පීරිස් මාවත මංතීරු 02ක් වනසේ සංවර්ධනය කිරීම<br>II. අස්ගිරිය සිට කටුගස්තොට දක්වා මාපනාවතුර මාර්ගය සංවර්ධනය කිරීම<br>III. II රාජසිංහ මාවත හා කුඩා රත්වත්තේ මාවත මංතීරු 02ක් වනසේ සංවර්ධනය කිරීම<br>IV. දුටුගැමුණු මාවත සංවර්ධනය කිරීම<br>V. කටුගස්තොට කහල්ල මාර්ගය දුම්රිය ස්ථානය හා මඩවල මාර්ගය සම්බන්ධ කිරීම<br>VI. කටුගස්තොට, කුරුණෑගල මාර්ගය හා මාතලේ මාර්ගය සම්බන්ධ කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |
| 16 | **<u>නව මාර්ග සංවර්ධනය</u>**<br><br>I. පේරාදෙණිය පැරණි පාලම මංතීරු 04ක් ලෙස මාර්ග සංවර්ධනය කිරීම<br>II. විලියම් ගොපල්ලව මාර්ගයේ සිට එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මාවත දක්වා දෙය්යන්නේවෙල ක්‍රීඩාංගනය අසලින් ගුවන් පාලමක් ඉදි කිරීම.<br>III. කටුගස්තොට මාවිල්මඩ මං සන්ධියේ සිට දුම්රිය මාර්ගයට සමාන්තරව මඩවල මාර්ගය දක්වා නව පාලමක්ද සහිතව නව මාර්ගයක් සංවර්ධනය.<br>IV. සංඝරාජ මාවත මහමායා මාවත ඉදිරිපස ලූවී පිරිස් මාවත හමුවන මං සන්ධිය දක්වා විකල්ප මාර්ගයන් සංවර්ධනය කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |
| 17 | **<u>මංසන්ධි සංවර්ධනය</u>**<br><br>I. ගැටඹේ මංසන්ධිය<br>II. හීරස්සගල මංසන්ධිය<br>III. පේරාදෙණිය පාලම මංසන්ධිය හා ගන්නොරුව මංසන්ධිය<br>IV. මහනුවර දුම්රිය ස්ථාන මංසන්ධිය<br>V. වේල්ස් පාර්ක් මංසන්ධිය<br>VI. කටුගස්තොට ගොහාගොඩ මාර්ග මංසන්ධිය<br>VII. බූවැලිකඩ මං සන්ධිය මාර්ග මංසන්ධිය<br>VIII. උසස් බාලිකා මංසන්ධිය<br>IX. විලියම් ගොපල්ලව මාවත සුදුහුම්පොල මංසන්ධිය<br>X. දළදා වීදිය හා සංඝරාජ මාවත හමුවන මංසන්ධිය (ක්වීන්ස් හෝටලය ඉදිරිපිට) | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |

| | | |
|---|---|---|
| 18 | **මගී උමං මාර්ග සංවර්ධනය**<br>I. පේරාදෙණිය රෝහල ඉදිරිපස<br>II. බර්ඩ්ස් පාර්ක් සිට ඔරලෝසු කණුව දක්වා<br>III. බෝගම්බර මංසන්ධියේ සිට පුස්තකාලය දක්වා<br>IV. බුවැලිකඩ ඩී. එස්. සේනානායක මාවත අසල<br>V. ත්‍රිත්ව විද්‍යාලය ඉදිරිපිට<br>VI. විද්‍යාර්ථ විද්‍යාලය ඉදිරිපිට<br>VII. හිල්වුඩ් විද්‍යාලය ඉදිරිපිට<br>VIII. ස්වර්ණමාලි විදුහල ඉදිරිපිට<br>IX. කිංස්වුඩ් විදුහල ඉදිරිපිට<br>X. පුෂ්පදාන විද්‍යාලය ඉදිරිපිට | මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |
| 19 | මහනුවර නගර මධ්‍යයේ සිට කටුගස්තොට දක්වා අපජල කළමණාකරන ව්‍යාපෘතිය පුළුල් කිරීම | ජාතික ජාල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 20 | මතුපිට කාණු හා භූ ගත කාණු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | ජාතික ජාල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>මහනුවර මහනගර සභාව |
| 21 | **ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම**<br>I. මැද ඇළ<br>II. හාලි ඇළ<br>III. දුනුමඩලාව ඇළ<br>IV. හීන් පැන් කඳුර ඇළ | ජාතික ජාල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>මහනුවර මහනගර සභාව |
| 22 | ගොහාගොඩ ඝණ අපද්‍රව්‍යය කළමනාකරණ ව්‍යාපෘතිය | මහනුවර මහනගර සභාව |
| 23 | මැණික්කුඹුර - තොග වෙළඳ, ගොඩනැඟිලි ද්‍රව්‍ය වෙළඳ ස්ථාන හා ගබඩා ස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |
| 24 | ඊරියගම නගර සංවර්ධන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය |
| 25 | පේරාදෙණිය දුම්රිය ස්ථානය හා පේරාදෙණිය පර්ෂද රථ වාහන නැවතීමේ ස්ථානය ඒකාබද්ධ කිරීමේ සංවර්ධනය ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය<br>උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| 26 | මධ්‍යම වෙළඳපොල සංවර්ධනය | නාගරික සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |
| 27 | කටුගස්තොට දුම්රිය ස්ථානය හා හා කටුගස්තොට පර්ෂද රථ වාහන නැවතීමේ ස්ථානය ඒකාබද්ධ කිරීමේ සංවර්ධනය ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය<br>උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| 28 | ගැරිසන් සුසාන භූමිය ප්‍රජා හා විනෝද කටයුතු හා සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන් සංවර්ධනය කිරමේ ව්‍යාපෘතිය | මහනුවර මහනගර සභාව |
| 29 | යුධ සුසාන භූමිය ප්‍රජා හා විනෝද කටයුතු හා සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | මහනුවර මහනගර සභාව |
| 30 | පුරාවිද්‍යා වැදගත්කමක් පවතින “රජපිහිල්ල” සංචාරක ආකර්ෂණය උදෙසා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | මහනුවර මහනගර සභාව |
| 31 | කටුගස්තොට පැරණි පාලම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය | මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික සංවර්ධන අධිකාරිය |

| | | |
|---|---|---|
| 32 | **<u>මහවැලි ගඟ අතර ගඟ ඉවුරු භූමි අලංකරණය කිරීම</u>**<br><br>I. ගන්නොරුව මාර්ගය හා මහවැලි ගඟ අතර<br>II. කටුගස්තොට සිට නවයාලතැන්න දක්වා<br>III. II රාජසිංහ මාවත හා මහවැලි ගඟ අතර<br>IV. කුඩා රත්වත්තේ මාර්ගය හා මහවැලි ගඟ අතර<br>V. දුටුගැමුණු මාවත හා මහවැලි ගඟ අතර ගඟ අතර<br>VI. ගලහ හංදියේ සිට ගැටඹේ පාලම දක්වා මාර්ගය | නාගරික සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |
| 33 | **<u>ඇළ ඉවුරු භූමි අලංකරණය කිරීම</u>**<br><br>I. වාකරවත්තේ සිට නගර මධ්‍ය දක්වා දුනුමඩලාව ඇළ<br>II. වාකරවත්තේ සිට අම්පිටිය හංදිය දක්වා හීල්පැන්කඳුර ඇළ<br>III. මහයියාවේ සිට කටුගස්තොට දක්වා භාලි ඇළ<br>IV. මැද ඇල දෙපස | නාගරික සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව |
| 34 | **<u>මධ්‍ය උද්‍යාන සංවර්ධනය කිරීම</u>**<br><br>I. මාපනාවතුර<br>II. වටපුළුව<br>III. අරුප්පල<br>IV. දංගොල්ල<br>V. ගැටඹේ<br>VI. අම්පිටිය යන ක්‍රිඩාපිටි | මහනුවර මහනගර සභාව |
| 35 | **<u>කුඩා උද්‍යාන සංවර්ධනය කිරීම</u>**<br><br>I. වට්ටාරන්තැන්න<br>II. කොස්මි උද්‍යානය<br>III. නවයාලතැන්න<br>IV. නිත්තවෙල<br>V. මාවිල්මඩ<br>VI. වටපුළුව විලේජ්<br>VII. ලේවැල්ල<br>VIII. දෙයියන්නේවෙල<br>IX. වේවැල්පිටිය<br>X. වටපුළුව<br>XI. පරණගංතොටපාර<br>XII. ගෝමස්<br>XIII. නාගස්තැන්න පහල<br>XIV. දොඩංවල<br>XV. බුවැලිකඩ<br>XVI. මේල්වත්ත<br>XVII. කටුකැලේ<br>XVIII. අනිවත්ත<br>XIX. අස්ගිරිය<br>XX. වටපුළුව ළමා උද්‍යානය | මහනුවර මහනගර සභාව |
| 36 | **<u>ඉතා කුඩා උද්‍යාන සංවර්ධනය කිරීම</u>**<br><br>I. බර්ඩ් උද්‍යාන<br>II. ජෝර්ජ් ඊ ද සිල්වා උද්‍යානය | මහනුවර මහනගර සභාව |
| 37 | **<u>ලෝක උරුම ගොඩනැගිලි සංරක්ෂණය කිරීම</u>**<br><br>I. බෝගම්බර බන්ධනාගාරය පරිශ්‍රය | නාගරික සංවර්ධන අධිකාරිය<br>මහනුවර මහනගර සභාව<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| | II. පොලිස් නිල නිවස පරිශ්‍රය<br>III. ඇහැළේපොල වලව්ව<br>IV. බෝගම්බර බන්ධනාගාරය<br>V. නාගරික සංවර්ධන අධිකාරිය<br>VI. පැරණි නීතිඥ කාර්යාල ගොඩනැගිල්ල<br>VII. පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිලි<br>VIII. දුම්රිය ස්ථාන ගොඩනැගිල්ල | |
| 38 | දළදා මාලිගා පරිශ්‍රය හා දේවාල පරිශ්‍රයන් තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී දළදා මාලිගාව |

# 7.2. උපායමාර්ගික ව්‍යාපෘති

**ව්‍යාපෘතිය හඳුනාගැනීම (ප්‍රමුඛතාවය අනුව ව්‍යාපෘති අංකය) :**

| | |
|---|---|
| ව්‍යාපෘතියේ නම | මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර II |
| ව්‍යාපෘතිය | මහනුවර නගරය තුළ අපරව්‍යුහ පහසුකම් වැඩිදියුණු කිරීම. |
| ව්‍යාපෘති යෝජනාව | අපජල කළමනාකරණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම. |

**ව්‍යාපෘතිය සිදු කරන ස්ථානය :**

<table>
<tr><td rowspan="2">ස්ථානය</td><td><u>පළාත</u></td><td><u>දිස්ත්‍රික්කය</u></td><td><u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය</u></td><td><u>පළාත් පාලන ආයතනය</u></td></tr>
<tr><td>මධ්‍යම</td><td>මහනුවර</td><td>ගඟවටකෝරළය</td><td>මහනුවර මහා නගර සභාව</td></tr>
<tr><td rowspan="2">මායිම්</td><td><u>උතුර</u></td><td><u>නැගෙනහිර</u></td><td><u>දකුණ</u></td><td><u>බටහිර</u></td></tr>
<tr><td>නවයාලතැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාශය</td><td>මාවිල්මඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශය</td><td>මහයියාව ග්‍රාම නිලධාරි කොට්ඨාශය</td><td>වට්ටාරන්තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසය</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">මෙම ව්‍යාපෘති ප්‍රදේශය වෙත මහනුවර - කටුගස්තොට - කුරුණෑගල මාර්ගය (A 10) හා මහනුවර - මාතලේ මාර්ගය (A9) ඔස්සේ පිවිසිය හැක.</td></tr>
<tr><td>ස්ථානීය පිහිටීම දැක්වෙන සිතියම</td><td colspan="4">
</td></tr>
<tr><td>අවට භූමි භාවිතය<br>(සිතියමකින් විස්තර කරන්න)</td><td colspan="4">මෙම ව්‍යාපෘතියට අදාළ භූමි ප්‍රදේශය තුළ අධි ඝණත්ව ගොඩනැඟිලි පවතින අතර ඒවා වාණිජ භාවිතයන් වෙත වැඩි නැඹුරුතාවයක් දක්නට ලැබේ. මෙම ව්‍යාපෘති ප්‍රදේශයට A9 හා A10 මාර්ගයන් ඔස්සේ ළඟාවිය හැකිය. ව්‍යාපෘති භූමිය අවට ප්‍රදේශය තුළ මිශ්‍ර සංවර්ධනයක් පවතී.</td></tr>
</table>

**ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ ස්වභාවය | නව | | වැඩි දියුණු කිරීම | | දීර්ඝ කිරීම | ✓ | ඉඩම් සංවර්ධනය කිරීම පමණි | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශනය කිරීම හා අලංකරණය | ලෝක උරුම | නිවාස | නැවත පදිංචි කිරීම | යටිතල පහසුකම් | |
| | | | | | | | ✓ | |
| ව්‍යාපෘති ක්ෂේත්‍රය | පාරිසරික | ✓ | ආර්ථික | | | සාමාජීය | ✓ | |
| ව්‍යාපෘතියේ අරමුණු | • මහනුවර නගර මධ්‍යය තුළ පවතින කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.<br>• නගරය තුළ කාණු පද්ධතිය නොමැති ප්‍රදේශ තුළ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.<br>• නාගරික ජල මූලාශ්‍ර තුළට අපජලය හා මළපහ මුදා හැරීම නවතාලීම.<br>• පිරිපහදු ජල ප්‍රවාහයක් මහවැලි ගඟට මුදා හැරීම තුළින් මහවැලි ගඟෙහි ජලයෙහි ගුණාත්මක බව වැඩිදියුණු කිරීම.<br>• භූගත ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම වැළැක්වීම.<br>• අක්‍රමවත් පූතික හා පවර වලවල් ස්ථාපනය කිරීම අවම කිරීම. | | | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අපජල ව්‍යාපෘතිය මඟින් වර්ග මීටර් 14,000ක් පමණ පිරිපහදු කරන අතර, දෛනික සංක්‍රමණිකයින් 150,000ක් නිවැසියන් 55,000ක් සහ ව්‍යාපාර හා ගොඩනැඟිලි 12,600ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ. ඒ අනුව, 2030 වර්ෂයෙහි පවතින අවශ්‍යතාවයක් සඳහා පවතින ව්‍යාපෘතිය ප්‍රමාණවත් නොවන බැවින්, එම ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. එමෙන්ම නගරය තුළ පවතින ජල මූලාශ්‍ර වලට අපජලය හා මළපහ ජලය මුදා හැරීම තුළින් එම ජල මූලාශ්‍රයන් අපිරිසිදු වී පැවතීම ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය. එම ජල මූලාශ්‍ර මහවැලි ගඟට සම්බන්ධ වීමෙන් පාරිසරික පද්ධතියට විශාල තර්ජනයක් එල්ල වීමේ අවධානමක් පවතින බැවින්, දැනට ක්‍රියාත්මක වන අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ආවරණය නොවන ප්‍රදේශ වල ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් පවතී. | | | | | | | | |

**ව්‍යාපෘති භූමියේ තොරතුරු :**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඉඩමේ වර්තමාන අයිතිය | පුද්ගලික | ✓ | රාජ්‍ය | ✓ | වෙනත් | | |
| ඉඩමේ භුක්තිය නිරවුල්ද යන වග | ඔව් | | නැත | ✓ | නැති නම් හේතු දක්වන්න | - | |
| අයිතිය පිළිබඳ විස්තර | - | | | | | | |
| මිනින්දෝරු සැලැස්මේ විස්තර | මිනින්දෝරු සැලසුම් අංකය | මිනින්දෝරු තැනගේ නම | | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | | - | | - | - | - | - |

**ව්‍යාපෘතියේ විස්තරය :**

<table>
<tr><td>ව්‍යාපෘති කාලසීමාව</td><td>කෙටි කාලීන (1>අවුරුදු)</td><td></td><td>මධ්‍ය කාලීන (1-3 අවුරුදු)</td><td></td><td>දිගු කාලීන (3>අවුරුදු)</td><td>-</td><td>මුළු ඇස්තමේන්තුගත වියදම</td><td>-</td></tr>
<tr><td>මූල්‍ය ප්‍රතිපාදන ක්‍රමය</td><td colspan="8">ශ්‍රී ලංකා රජය හා විදේශීය මූල්‍ය ප්‍රතිපාදන</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ විස්තර (සිතියමකින් දක්වන්න)</td><td colspan="8">මෙම ව්‍යාපෘතිය අධි ඝණත්ව වාණිජ කලාප II හා III ප්‍රදේශ ආවරණය වන අතර, එම ව්‍යාපෘතිය භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 121.45ක් පමණ ආවරණය වේ. 2030 වර්ෂය සඳහා අපේක්ෂිත සංසරණ ජනගහනයෙන් 45,000ක් පමණ පිරිසක් මෙන්ම, 2030 වර්ෂය සඳහා අපේක්ෂිත ජනගහනයෙන් 10,000ක් පමණ පිරිසක් මෙම ප්‍රදේශය තුළ ජීවත් වන බවට උපකල්පනය කළ හැක.<br><br>ඒ අනුව, මළපවාහනය වර්ෂ 2030දී ගැලුම් 1,092,000ක් පමණ උත්පාදනය විය හැකි බවට උපකල්පනය කළ හැකි අතර, එය මෙම ව්‍යාපෘතියෙන් කළමනාකරණය කිරීමට අපේක්ෂා කෙරේ.</td></tr>
<tr><td rowspan="6">පවතින යටිතල පහසුකම්</td><td rowspan="5">ජලය</td><td colspan="4">අවශ්‍ය ධාරිතාවය</td><td>විදුලිය</td><td colspan="2">අවශ්‍ය ධාරිතාවය</td></tr>
<tr><td colspan="4">පානීය අවශ්‍යතාවය :</td><td rowspan="4">-</td><td colspan="2">-</td></tr>
<tr><td colspan="4">ස්නානය ඇතුළු සෞඛ්‍ය පහසුකම් සඳහා අවශ්‍යතාවය</td><td colspan="2">-</td></tr>
<tr><td colspan="4">භූමි අලංකරණ කටයුතු :</td><td colspan="2">-</td></tr>
<tr><td colspan="4">පවතින ධාරිතාවය</td><td colspan="2">පවතින ධාරිතාවය :</td></tr>
<tr><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කරන ක්‍රමය</td><td>ඇත</td><td>-</td><td>නැත</td><td>-</td><td>නැති නම් සුදුසු යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමය</td><td colspan="2">-</td></tr>
<tr><td>කලාපය</td><td colspan="2">අධි ඝණත්ව වාණිජ කලාපය II හා III</td><td colspan="2">කලාපීය අනුකූලතාවය</td><td>ඇත</td><td>✓</td><td>නැත</td><td></td></tr>
<tr><td colspan="9">ඉතිහාසය (අදාළ නම්)</td></tr>
<tr><td colspan="9">- නැත -</td></tr>
<tr><td colspan="9">වර්තමාන තත්වය (මිනුම් සහිතව විස්තරය)</td></tr>
<tr><td colspan="9">-</td></tr>
</table>

පවතින ස්වභාවය

-

| විස්තරය | ඒකක ගණන | දිග | පළල |
|---|---|---|---|
| - | - | - | - |
| - | - | - | - |

පවතින ස්වභාවයේ ඡායාරූප

-

යෝජිත සැලැස්ම සහ නිර්මාණාත්මක අවශ්‍යතා

-

ව්‍යාපෘති පිරිවැය

| කාර්යය | පිරිවැය (රු: මිලි.) |
|---|---|
| මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර II | 300 |
| මුළු එකතුව | 300 |

**අනුමැතිය ලබා ගත යුතු ආයතන :**

| කාර්යය | අදාළ ආයතනය | බලයලත් නිලධාරියා |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරිය | පළාත් අධ්‍යක්ෂ |
| පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීම | මධ්‍යම පරිසර අධිකාරිය | සභාපති |
| මළ අපවහන නල එළීම සඳහා අවසර ලබා ගැනීම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | සාමාන්‍යාධිකාරී |
| | මාර්ග සංවර්ධන අධිකාරිය | ප්‍රධාන ඉංජිනේරු |
| | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | ප්‍රධාන ඉංජිනේරු |
| | මහනුවර මහා නගර සභාව | නාගරික කොමසාරිස් |
| | ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් | ප්‍රාදේශීය කළමනාකරු |

| රෙගුලාසි සහ | රෙගුලාසි | මාර්ගෝපදේශ |
|---|---|---|

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශ | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් සහ ගොඩනැඟිලි රෙගුලාසි | නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, මහනුවර මහ නගර සභාව, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ආදී ආයතන තුළින් මූලික සැලසුම් නිරාකරණයක් ලබා ගත යුතුය. |
| ඇමුණුම් වල විස්තර (මිනින්දෝරු සැලසුම්, වාස්තු විද්‍යාත්මක සැලසුම් හෝ වෙනත් සැලසුම් වල පිටපත් ඇත්නම් ඒවායේ විස්තර) | | |
| | | |

**ව්‍යාපෘතිය හඳුනාගැනීම (ප්‍රමුඛතාවය අනුව ව්‍යාපෘති අංකය) :**

| | |
|---|---|
| ව්‍යාපෘතියේ නම | ඇහැලේපොල වලව්ව සංරක්ෂණ ව්‍යාපෘතිය |
| ව්‍යාපෘතිය | ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණය කිරීම තුළින් ඓතිහාසික ශ්‍රී විභූතිය වැඩි දියුණු කිරීම. |
| ව්‍යාපෘති යෝජනාව | මහනුවර නගරය තුළ ව්‍යාප්තව පවතින ලෝක උරුම ගොඩනැගිලි සංරක්ෂණය කිරීම. |

**ව්‍යාපෘතිය සිදු කරන ස්ථානය :**

| | | | | |
|---|---|---|---|---|
| ස්ථානය | **පළාත** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **පළාත් පාලන ආයතනය** |
| | මධ්‍යම | මහනුවර | ගඟවටකෝරළය | මහනුවර මහ නගර සභාව |
| මායිම් | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | කැබලි අංක 01 | කැබලි අංක 01 ජී.එල්.එෆ්. වික්ටර් සහ ටී.බී.එස්. ගොඩමුන සහ පුත්‍රයෝ | කැබලි අංක 03 ඒ.එම්. උදේශි හා එස්.එස්. කරුණාමූර්තිට අයිතිව පවතින ඉඩම | එස්. කරුණාමූර්ති හා ඒ.කේ. හෂීඩ්ට අයිතිව පවතින ඉඩම |
| ප්‍රවේශය | ඩී.එස්. සේනානායක වීදියේ සිට රජ වීදිය ඔස්සේ මීටර් 100ක් පමණ මාලිගාව දෙසට ගමන් කිරීමේදී ඇහැලේපොල වලව්ව හමුවේ. | | | |

| | |
|---|---|
| ස්ථානීය පිහිටීම දැක්වෙන සිතියම | <br> |
| අවට භූමි භාවිතය (සිතියමකින් විස්තර කරන්න) | ඇහැලේපොල වලව්ව මහනුවර නගර මධ්‍යය තුළ පිහිටා ඇති අතර, මහනුවර දුම්රිය ස්ථානයට කි.මී. 2.8ක් පමණ දුරකින් පිහිටා ඇත. මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලාංකේය ඓතිහාසික අනන්‍යතාවය පිළිඹිබු කරන මෙන්ම ශ්‍රී ලංකාවේ අවසාන රාජධානී වංශකථාවේ අවසන් රාජධානිය මහනුවර රාජධානියට අයත් ගොඩනැගිල්ලකි. "බෝගම්බර රිමාන්ඩ්" බන්ධනාගාරය ලෙස පෙර මෙම ගොඩනැගිල්ල භාවිතා කොට ඇති අතර, එය ඓතිහාසික නගර කලාපය තුළ පිහිටා ඇත. 2005 වර්ෂයේදී මෙම ගොඩනැගිල්ල A ශ්‍රේණියේ ලෝක උරුම ගොඩනැගිල්ලක් ලෙසට නම් කර ඇත.<br><br>එමෙන්ම, මෙම ගොඩනැගිල්ල ශ්‍රී දළදා මාළිගාවට ඉතා ආසන්නව පිහිටා ඇති අතර, පැරණි නීතිඥ කාර්යාලය, ජනාධිපති මන්දිරයටද ආසන්නව පිහිටා ඇත. |

**ව්‍යාපෘතියේ අවශ්‍යතාවය :**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ ස්වභාවය | නව | | වැඩි දියුණු කිරීම | ✓ | දීර්ඝ කිරීම | | ඉඩම් සංවර්ධනය කිරීම පමණි | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශනය කිරීම හා අලංකරණය | ලෝක උරුම | නිවාස | නැවත පදිංචි කිරීම | යටිතල පහසුකම් | |
| | ✓ | | | | | | | |
| ව්‍යාපෘති ක්ෂේත්‍රය | පාරිසරික | | ආර්ථික | ✓ | | සාමාජයීය | | |

| | |
|---|---|
| ව්‍යාපෘතියේ අරමුණු | • ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණය කිරීම.<br>• නාගරික දර්ශනය ආරක්ෂා කර ගැනීම.<br>• මහනුවර යුගයට ආවේනික ලෝක උරුම ගොඩනැගිලි හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ආරක්ෂා කර ගැනීම.<br>• ලෝක උරුම ගොඩනැඟිලි සඳහා අනුවර්තන භාවිතයන් ලබා දීම.<br>• ලෝක උරුම ගොඩනැඟිලි සංරක්ෂණය කිරීම තුළින් මහනුවර නගරයෙහි ආර්ථික ඵලදායිතාවය සඳහා යොදා ගැනීම. |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | මහනුවර නගරය UNESCO සංවිධානය විසින් ලෝක උරුම නගරයක් ලෙසට නම් කර ඇත. ඒ අනුව, ලෝක උරුම ගොඩනැඟිලි 490කට ආසන්න ප්‍රමාණයක් හඳුනාගෙන ඇති අතර, ඒවායෙහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ යොදාගෙන ඇති අමුද්‍රව්‍ය ගොඩනැඟිල්ලේ ආයු කාලය ආදී කරුණු මත ගොඩනැඟිලි හඳුනාගෙන ඇත.<br><br>නමුත්, කාලයත් සමඟ මෙම ගොඩනැඟිලිවල පවතින වාස්තු විද්‍යාත්මක ලක්ෂණ, අමු ද්‍රව්‍ය ආදිය පරිහානියට පත්වෙමින් පවතින බව හඳුනාගත හැකිය. එබැවින්, මහනුවර නගරය වෙත උරුම වී පවතින ඓතිහාසික ශ්‍රී විභූතිය මෙම ලෝක උරුම ගොඩනැඟිලි මත රඳා පවතින බැවින්, ඒවා සංරක්ෂණය කර අනාගත පරපුර වෙත ලබා දීමේ අවශ්‍යතාවයක් පවතී. |

**ව්‍යාපෘති භූමියේ තොරතුරු :**

<table>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>පුද්ගලික</td><td></td><td>රාජ්‍යය</td><td>✓</td><td>වෙනත්</td><td colspan="2"></td></tr>
<tr><td>ඉඩමේ භුක්තිය නිරවුල්ද යන වග</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td><td>නැති නම් හේතු දක්වන්න</td><td colspan="2">-</td></tr>
<tr><td>අයිතිය පිළිබඳ විස්තර</td><td colspan="7">නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමකි.</td></tr>
<tr><td rowspan="2">මිනින්දෝරු සැලැස්මේ විස්තර</td><td>මිනින්දෝරු සැලසුම් අංකය</td><td colspan="2">මිනින්දෝරු තැනගේ නම</td><td>දිනය</td><td colspan="3">ඉඩමේ ප්‍රමාණය<br>(හෙක්ටයාර 0.3866)</td></tr>
<tr><td>මහ/එම්එච්එන්/2013/1688</td><td colspan="2">ජේ.ඒ.බී.එන්. ජයවර්ධන</td><td>2013 සැප්. සිට 2013 ඔක්.</td><td>00</td><td>03</td><td>21.30</td></tr>
</table>

**ව්‍යාපෘතියේ විස්තරය :**

<table>
<tr><td>ව්‍යාපෘති කාලසීමාව</td><td>කෙටි කාලීන (1>අවුරුදු)</td><td></td><td>මධ්‍යය කාලීන (1-3 අවුරුදු)</td><td></td><td>දිගු කාලීන (3>අවුරුදු)</td><td>✓</td><td>මුළු ඇස්තමේන්තුගත වියදම</td><td>රු.මි ලි.140</td></tr>
<tr><td>මූල්‍ය ප්‍රතිපාදන ක්‍රමය</td><td colspan="8">නාගරික සංවර්ධන අධිකාරිය මූල්‍ය ප්‍රතිපාදනය කරනු ලබයි.</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ විස්තර (සිතියමකින් දක්වන්න)</td><td colspan="8">ඇහැළේපොල වලව්ව පුනර්ජීවනය කිරීම, මායිම් බැමීම ප්‍රතිසංස්කරණය කිරීම, භූමිය භූමි අලංකරණය කිරීම, තට්ටු 02ක් සහිත ගොඩනැඟිල්ල පුනර්ජීවනය කිරීම, අදාළ පරිශ්‍රය තුළ විධිමත් ජල, විදුලි සැපයුමක් ලබා දීම හා ගොඩනැඟිලි පරිශ්‍රය තුළ විධිමත් ගිනි ආරක්ෂණයක් ඇති කිරීම ආදී උප ව්‍යාපෘති තුළින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ.<br><br></td></tr>
</table>

<table>
<tr><td rowspan="6">පවතින යටිතල පහසුකම්</td><td colspan="2" rowspan="5">ජලය</td><td colspan="3">අවශ්‍ය ධාරිතාවය</td><td>විදුලිය</td><td colspan="3">අවශ්‍ය ධාරිතාවය</td></tr>
<tr><td colspan="3">පානීය අවශ්‍යතාවය :</td><td rowspan="4">-</td><td colspan="3">-</td></tr>
<tr><td colspan="3">ස්නානය ඇතුළු සෞඛ්‍ය පහසුකම් සඳහා අවශ්‍යතාවය</td><td colspan="3">-</td></tr>
<tr><td colspan="3">භූමි අලංකරණ කටයුතු :</td><td colspan="3">-</td></tr>
<tr><td colspan="3">පවතින ධාරිතාවය</td><td colspan="3">පවතින ධාරිතාවය :</td></tr>
<tr><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කරන ක්‍රමය</td><td>ඇත</td><td>-</td><td>නැත</td><td>-</td><td colspan="2">නැති නම් සුදුසු යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමය</td><td colspan="2">-</td></tr>
<tr><td>කලාපය</td><td colspan="2">පූජා භූමි කලාපය</td><td colspan="2">කලාපීය අනුකූලතාවය</td><td>ඇත</td><td>√</td><td>නැත</td><td colspan="2">-</td></tr>
<tr><td colspan="10">ඉතිහාසය (අදාළ නම්)</td></tr>
<tr><td colspan="10">- නැත -</td></tr>
<tr><td colspan="10">වර්තමාන තත්වය (මිනුම් සහිතව විස්තරය)</td></tr>
<tr><td colspan="10">-</td></tr>
<tr><td colspan="10">පවතින ස්වභාවය</td></tr>
<tr><td colspan="10">දැනට මෙම ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීමේ මට්ටමක පවතී.</td></tr>
</table>

| විස්තරය | ඒකක ගණන | දිග | පළල |
|---|---|---|---|
| තනි මහලක් සහිත ගොඩනැගිල්ල | - | ගෙබිම් ප්‍රමාණය<br>වර්ග අඩි 2185 | |
| මහල් දෙකක් සහිත ගොඩනැගිල්ල | - | ගෙබිම් ප්‍රමාණය වර්ග අඩි 3500 | |

**පවතින ස්වභාවයේ ඡායාරූප**









**යෝජිත සැලැස්ම සහ නිර්මාණාත්මක අවශ්‍යතා**

- දැනට පවතින හා යෝජිත මට්ටමේ සැලසුම්.
- මෘදු භූමි අලංකරණ සැලසුම්.
- ඝන භූමි අලංකරණ සැලසුම්.
- තනි මහල් ගොඩනැගිල්ල සඳහා වූ යෝජිත සැලසුම්.
- දෙමහල් ගොඩනැගිල්ල සඳහා වූ යෝජිත සැලසුම්.

**ව්‍යාපෘති පිරිවැය**

| කාර්යය | පිරිවැය (රු. මිලි.) |
|---|---|
| බිම් සැකසීම | 140 |
| ඉදිකිරීම් | |
| භූමි අලංකරණය කිරීම | |
| අනෙකුත් අවශ්‍යතා | |
| මුළු එකතුව | 140 |

**අනුමැතිය ලබා ගත යුතු ආයතන :**

| කාර්යය | අදාළ ආයතනය | බලයලත් නිලධාරියා |
|---|---|---|
| බිම් සැකසීම | නාගරික සංවර්ධන අධිකාරිය | පළාත් අධ්‍යක්ෂ |
| භූමි අලංකරණය | | |
| මායිම් බැම්ම නවීකරණය කිරීම | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල් |
| ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම | මහනුවර මහ නගර සභාව | නාගරික කොමසාරිස් |

| රෙගුලාසි සහ | රෙගුලාසි | මාර්ගෝපදේශ |
|---|---|---|

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශ | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් සහ ගොඩනැඟිලි රෙගුලාසි | • නාගරික සංවර්ධන අධිකාරිය<br>• පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තුළින් මූලික සැලසුම් නිරාකරණයක් ලබා ගත යුතුය. |

ජනපදයට යන ගම්සභා පාර හමුවන මංසන්ධියේ මධ්‍යය දක්වා නිරිත දෙසට ද එතැන් සිට එලගොල්ල ඇල නමැති ඇල ඉහලින් ඇති බෝක්කුවේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට හා වයඹ දෙසට ද එතැන් සිට එලගොල්ල ඇල මධ්‍ය රේඛාව ඔස්සේ එකී එලගොල්ල ඇල වගලේ ඇල නමැති පී. පී. ඒ. 1407 සී. පී. නමැති සැලැස්මේ 24, 30 සහ 42 දරන බිම් කට්ටිවල නැගෙනහිර මායිම ඔස්සේ ගලා බසින ඇල හමුවන ස්ථානය දක්වා වයඹ දෙසට ද, එතැන් සිට අවසන් වරට සඳහන් කළ වගලෙ ඇල මධ්‍ය රේඛාව ඔස්සේ පී. පී. ඒ. 1407 සී. පී. දරන සැලැස්මේ 44 වන බිම් කට්ටියේ ඉතා උතුරින් වූ ලක්ෂ්‍යය මත ඇති ඉම් දක්වා නිරිත දෙසට හා ගිනිකොණ දෙසට ද එතැන් සිට අංක පී. ඒ. 1407 සී. පී. දරන සැලැස්මේ 44 සහ 45 දරන බිම් කට්ටිවල උතුරු මායිම් ඔස්සේ ගිනිකොණ දෙසට ද, එකී 45 වන බිම් කට්ටියේ නැගෙනහිර මායිම් ඔස්සේ පී. පී. ඒ. 1407 සී.පී. දරන සැලැස්මේ අංක 48 දරන බිම් කට්ටියේ ඉතා උතුරින් වූ ලක්ෂ්‍යය මත ඇති ඉම් තෙක් දකුණු දෙසට ද, එතැන් සිට අංක පී. පී. ඒ. 1407 සී. පී. දරන සැලැස්මේ 48 වන බිම් කට්ටියේ උතුරු මායිම ඔස්සේ සුසාන භූමියේ ඉතා උතුරින් වූ ලක්ෂ්‍යය හමුවන තෙක් ගිනිකොණ දෙසට ද, එතැන් සිට එකී සුසාන භූමියේ වයඹ දිග සීමාව ඔස්සේ (අංක පී. පී. ඒ. 1407 සී. පී.) දරන සැලැස්මේ අංක 48, 47 සහ 21 දරන බිම් කට්ටි හරහා බකල්වත්ත වෙල්යාය නමින් හඳුන්වන කුඹුරේ ගිනිකොණ කොන හමුවන තෙක් එකී 21 වන බිම් කට්ටියේ දකුණු මායිමේ ලක්ෂ්‍යය දක්වා නිරිත දෙසට ද, එතැන් සිට මගස්වා වත්තේ උතුරු සීමාවේ ශ්‍රී අමරවංශ මාවතේ බෝක්කුවේ මධ්‍යය සම්බන්ධ කෙරෙන සෘජු රේඛාවකින් නිරිත දෙසට ද, එතැන් සිට මගස්වා වත්ත පාර මධ්‍ය රේඛාව ඔස්සේ අංක 1.25/28 3 නැගෙනහිර දරන මහනුවර නගර මිනුම් පත්‍රයේ 17 වන බිම් කට්ටියේ බටහිර සීමාවේ දකුණු කෙළවරට ඉදිරියෙන් ඇති ලක්ෂ්‍යය හමුවන තෙක් වයඹ දෙසට ද, උතුරු දෙසට හා ඊසාන දෙසට ද එතැන් සිට එකී බටහිර මායිම් ඔස්සේ අංක 1.25/25 3 නැගෙනහිර දරණ මහනුවර නගර මැනුම් පත්‍රයේ 16 වන බිම් කට්ටියේ නැගෙනහිර සීමාවේ මායිම ගල හමුවන තෙක් උතුරු දෙසට ද, එතැන් සිට අංක 1.25/28 3 නැගෙනහිර දරන මහනුවර නගර මිනුම් පත්‍රයේ 16 හා 29 දරන බිම් කට්ටි හරහා වූ සෘජු රේඛාවකින් අංක 1.25/28 3 නැගෙනහිර දරන මහනුවර නගර මිනුම් පත්‍රයේ 15 වන බිම් කට්ටියේ ඉතා දකුණින් වූ කොන දක්වා වයඹ දෙසට ද, එතැන් සිට එකී 15 වන බිම් කට්ටියේ බටහිර මායිම ඔස්සේ අංක 1.25/28 3 නැගෙනහිර දරන මහනුවර නගර මිනුම් පත්‍රයේ 87 වන බිම් කට්ටිය ලෙස විස්තර කොට ඇති දුම්රිය රක්ෂිත ප්‍රදේශයේ දකුණු මායිම හමුවන තෙක් වයඹ දෙසට ද, එතැන් සිට අංක 2.25/36 1 බටහිර, 1.25/35 4 නැගෙනහිර දරන නගර මිනුම් පත්‍රවල පෙන්නුම් කොට ඇති දුම්රිය රක්ෂිත ප්‍රදේශය ඔස්සේ මහවැලි ගඟ දකුණු ඉවුර දක්වා නිරිත දෙසට ද, එකී දුම්රිය රක්ෂිත ප්‍රදේශයේ ම සීමා රේඛාවේ දීර්ඝ කිරීම ඔස්සේ මහවැලි ගඟ හරහා මධ්‍ය රේඛාව දක්වා නැවතත් නිරිත දෙසට ද ඇඳි රේඛාවකින් ද;

බටහිරට: අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට මහවැලි ගඟ මධ්‍ය රේඛාව ඔස්සේ ඉනිගල්වල ඇල මහවැලි ගඟට සම්බන්ධ වන මධ්‍යයට ඉදිරියේ ඇති ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ද, ගිනිකොණ දෙසට ද, දකුණු දෙසට හා ඊසාන දෙසට ද, එතැන් සිට ඉනිගලවෙල ඇල මහවැලි ගඟට සම්බන්ධ වන ස්ථානයේ මධ්‍යය දක්වා බස්නාහිර දෙසට ද, එතැන් සිට ඉනිගලවෙල ඇල මධ්‍ය රේඛාව ඔස්සේ අංක 1.25/5 3 බටහිර මහනුවර නගර මිනුම් පත්‍රයේ අංක 30 දරන බිම් කට්ටියේ ගිනිකොන කොණට ඉදිරියෙන් වූ ලක්ෂ්‍යය හමුවන තෙක් වයඹ දෙසට ද, එතැන් සිට එකී පත්‍රිකාවේ 30 වන බිම් කට්ටියේ ගිනිකොන කොණ දක්වා බටහිර දෙසට ද. එතැන් සිට අංක 30, 34 සහ 35 බිම් කට්ටිවල දකුණු මායිම් ඔස්සේ එකී පත්‍රිකාවේ 35 වන බිම් කට්ටියේ නිරිත දිග කොණෙහි වූ ඉම දක්වා බටහිර දෙසට ද. එතැන් සිට අංක 1.25/5 3 බටහිර දරන මහනුවර නගර මිනුම් පත්‍රිකාවේ 36, 38, 39 සහ 40 දරන බිම් කට්ටිවල නිරිත දිග මායිම් ඔස්සේ වයඹ දෙසට ද, එකී පත්‍රිකාවේ 3 වන බිම් කට්ටියේ නිරිත දිග සීමාව ඔස්සේ ඉනිගලවෙල ඇල එතෙර වෙමින් වයඹ දෙසට ඉනිගල සිට ගම්සභා පාරේ දකුණු මායිම හමුවන තෙක් ද, (එකී පත්‍රිකාවේ උයන්වල සිට යන අවිපාර දක්වෙන) එතැන් සිට එකී පාරේ එකී මායිම ඔස්සේ ඉනිගලවෙල ඇල වම් ඉවුර හමුවන තෙක් වයඹ දෙසට ද, එතැන් සිට අංක 1.25/5 3 බටහිර දරන මහනුවර නගර මැනුම් පත්‍රිකාවේ 2 බිම් කට්ටියේ ගිනිකොන කොන මත වූ ඉමට ඇති එකී පාර හරහා උතුරු දෙසට ද, එතැන් සිට ඉනිගලවෙල ඇල හරහා වයඹ දෙසට සහ පත්‍රිකාවේ 1 සහ 2 දරන එකී බිම් කට්ටිවල දකුණු මායිම, 16 සහ 15 දරන බිම් කට්ටිවල දකුණු මායිම් අංක 1.25/4 2 නැගෙනහිර දරන මහනුවර මැනුම් පත්‍රිකාවේ 10 සහ 14 දරන බිම් කට්ටිවල බටහිර මායිම් ද, පසු කරමින් එකී පත්‍රිකාවේ 9 වන බිම් කට්ටියේ ඉතා දකුණින් වූ ලක්ෂ්‍යය හමුවන තෙක් වයඹ දෙසට ද, එතැන් සිට යටිවාවල වසමේ දෙඩම්ගස්ඇල වෙල්යායේ උතුරු මායිම් ඔස්සේ ලිදගාව ගෙදර වත්ත නැමැති ඉඩමේ දකුණින් වූ ලක්ෂ්‍යය හමුවන තෙක් බටහිර දෙසට ද. වයඹ දෙසට ද, උතුරු දෙසට හා වයඹ දෙසට ද. එතැන් සිට එකී ලක්ෂ්‍යයේ සිට ප්‍රසිද්ධ ලිඳේ දකුණු කෙළවර දක්වා බටහිර දෙසට ඇඳි රේඛාවකින් ද, එතැන් සිට ඇටම්බුරුගොඩ වත්තේ සිට නුවර -කුරුණෑගල ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තු පාරට යන අඩි පාරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් යාර 9 ක දුර ප්‍රමාණයක් බටහිර දෙසට ද, එතැන් සිට එකී අඩි පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ එය නුවර-කුරුණෑගල ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තු පාර හමුවන මංසන්ධියේ මධ්‍ය හමුවන තෙක් උතුරු දෙසට ද, එතැන් සිට නුවර-කුරුණෑගල ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ එය යටිවාවල පොල්වත්ත ගම්සභා පාර හමුවන මංසන්ධියේ මධ්‍යය හමුවන තෙක් බටහිර දෙසට ද, එතැන් සිට එකී ගම් සභා පාරේ මධ්‍යම රේඛාව ඔස්සේ යටිවාවල වසමේ වෙලකුඹුර වෙල්යාය නැමැති කුඹුරේ දකුණු කෙළවර හමුවන තෙක් උතුරු දෙසට හා වයඹ දෙසට ඇඳි රේඛාවකින් ද වේ.



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

32

ඇමුණුම් I

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 301 — 1984 ජුනි 08 වැනි සිකුරාද — 1984.06.08

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)

## I වැනි කොටස: (I) වැනි ජෙදය -- සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය ... | 520 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන පත්කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන පත්කිරීම් ආදිය ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... | 520 |
| මිළ පාලන දැන්වීම් ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| ශ්‍රී ලංකා ආණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... | — |
| ආදයම් සහ වියදම් පිළිබඳ වාර්තා ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 538 |
| '' සුරාබද්ද ආඥා පනත '' පිළිබඳ දැන්වීම් ... | — |



**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා බාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සැම කොටසකම අග පිටුවෙහි සැම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසන් දිනය සහ වේලාව සඳහන් නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සැම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාරගන්නා වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර පළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. ඝනතුරු-ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් [illegible] සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව—එනම් දැන්වීම, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළකරන දින අතර සැහෙන කාලවේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන [illegible] වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාව සැළසෙන සේ සකස් කරන මෙන් සියළුම දෙපාර්තමේන්තු, [illegible] මින් ඉල්ලා සිටිනු ලැබේ.

[illegible] සැම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනයට සති දෙකකට පෙර—එනම්, 1984 [illegible] ගැසට් පත්‍රයට යාපුතු දැන්වීම 1984 ජුනි 01 දින දහවල් 12 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට [illegible]

[illegible]

හෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

[illegible]
A 1

### මහනුවර පූජා ප්‍රදේශ සැලසුම් යෝජනා ක්‍රමය

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයට අයත් නාගරික ප්‍රදේශය වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇති අතර, එහි පිහිටි දළදා මාළිගාව අවට ප්‍රදේශය "පූජා ප්‍රදේශයක්" ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් නම් කොට ඇති බව මහජනතාව වෙත මෙයින් දන්වනු ලැබේ. එම පූජා ප්‍රදේශය පිළිබඳ වඩාත් පුළුල් විස්තරයක් පහත දැක්වේ.

2. දළදා මාළිගාව අවට ප්‍රදේශය පූජා ප්‍රදේශයක් ලෙස හැඳින්වීමේ ප්‍රධාන පරමාර්ථ මෙසේ ය:

(i) ප්‍රධාන කාර්යයට එනම්, දළදා මාළිගාව හා සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාමේ කාර්යයට අනුකූල නොවන්නා වූ සිය එම පාවිච්චි කිරීම් හා සංවර්ධනයන් සීමාකිරීමෙන් හෝ නගනම් කිරීමෙන් හෝ දළදා මාළිගාවේ පාරිශුද්ධත්වය ආරක්ෂා කිරීමට හා එම අරමුණ ඉටුකරනුවස් වෙනත් පියවරවලට අමතරව, නවදුරටත් තිබෙන්නට හැරිය යුතු ගොඩනැගිලි කවරේද, වෙනස් කොට තැනිය යුතු ගොඩනැගිලි කවරේද, කඩා ඉවත් කළයුතු ගොඩනැගිලි කවරේද, අලුතින් ඉදි කළයුතු ගොඩනැගිලි කවරේද යන්නත් එම ප්‍රදේශය තුළ සංරක්ෂණය කළ යුතු ඉඩම් හා ගොඩනැගිලි කවරේද යන්නත් නියම කිරීම.

(ii) වාහන ගාල් කිරීමේ අවශ්‍ය පහසුකම්, පදික යන්නන් සඳහා ඉඩකඩ සැපයීම, තදබදය තරහා යන වාහන සීමාකිරීම ආදී වශයෙන් ගමනා ගමන පහසුකම් ඇතුළු ප්‍රදේශයේ පහසුකම් දියුණු කිරීම.

(iii) පූජා ප්‍රදේශය ඇතුලත හා ඉන් පිටතත් සංවර්ධන කටයුතු වල වාස්තු විද්‍යාත්මක භූමි දර්ශනාත්මක හා පාරිසරික තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සහ එම අරමුණ ඉටු කරනු වස් සියලුම ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වලදී ඒවායේ උස, වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ආදිය පාලනය කිරීම.

(iv) ප්‍රදේශය තුළ හා අවට දැන්වීම් ප්‍රදර්ශක පුවරු පිහිටුවීම, නියෝන් ප්‍රචාරක දැන්වීම් ආදිය ඇතුළු සියළුම ආකාරවල ප්‍රචාරක දැන්වීම් පාලනය කිරීම සහ

(v) ඉහත (i) සිට (iv) තෙක් සඳහන් කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එවැනි සියලු දේ සහ ඊට අනුපූරක වන කවර හෝ කටයුතු ක්‍රියාත්මක කිරීමට ඉඩකඩ සැලසීම.

3. මධ්‍යම සංස්කෘතික අරමුදල සහ යුනෙස්කෝ ආධාර සහිතව ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති යටතට වැටෙන කටයුතු ද ඇතුළුව එකී ප්‍රදේශය තුළ ක්‍රියාවේ යෙදෙන සියලුම සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් [illegible] දීමට හරු අග්‍රාමාත්‍ය සහ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් [illegible] පත් කරනු ලැබ ඇත.

4. මෙම ප්‍රදේශය තුළ හෝ [illegible] ප්‍රදේශයෙන් පිටත එහෙත් මහනුවර මහ නගර සභා [illegible] වෙනත් ප්‍රදේශයන් හි (දැනට පවත්නා ගොඩනැගිලි [illegible], ඒවාට නව කොටස් එකතු කිරීම ආදිය ද, [illegible] ගොඩනැගිලි වල භාවිතය වෙනස් කිරීම, නව ගොඩනැගිලි ඉදිකිරීම, ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් ඇතුරු [illegible] අවහිර වන පරිදි මාවත් හෝ [illegible]) කවර හෝ සංවර්ධන කාර්යයක් ක්‍රියාත්මක [illegible] කරන සෑම පුද්ගලයකුම එම කාර්යයන් ආරම්භ [illegible] නාගරික සංවර්ධන අධිකාරයට [illegible] කළ යුතු වන අතර, තම විසින් ඉදිරිපත් කරන ලද [illegible] නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිසි පරිදි [illegible] සංවර්ධන කාර්යයක් ඇරඹීම නොකළ යුතුය.

5. මහනුවර [illegible] සීමා :

උතුරට : [illegible] ; නැගෙනහිරට : හෝර්ටන් ආයාම [illegible] ; දකුණට : සංඝරාජ මාවත හා දළදා විදියටත් ; බස්නාහිරට : ඩී. එස්. සේනානායක වීදිය, ශ්‍රීමත් බෙනට් සොයිසා වීදිය, [illegible] නිවාස භූමියේ බස්නාහිර මායිමෙනුත්.

මායිම්ව ඇත්තාවූත්, [illegible] අරමුදල මගින් 58 යෙල කරන ලද අංක [illegible] දරණ සිතියමෙහි මායිම් සලකුනු කොට දක්වා ඇත්තාවූත් [illegible] ප්‍රදේශය.

6. මෙම [illegible] සඳහා මහජනයාගේ පූර්ණ සහයෝගය හා ආධාරය දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය පොදු මහජනතාවගෙන් ඉල්ලා සිටී.

[illegible] අබේරත්න,
[illegible] ලේකම්,
පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය.

1984 මැයි මස 11 දින,
පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය,
"සෙත් සිරිපාය"
ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ,
බත්තරමුල්ල.

6-76—84.06.08 දින අංක [illegible] දරණ ගැසට් පත්‍රය

---

**1980 අංක 56, 1977 අංක 9, 1976 අංක 18 සහ 1974 අංක 34 දරණ නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධිත) නීතිවලින් සංශෝධිත**

**1973 අංක I දරණ නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 20 වන වගන්තිය යටතේ නිවේදනය**

ඉහත කී 1973 අංක I දරණ නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධිත) නීතියේ විධිවිධානයන් ක්‍රියාත්මක [illegible] මේ සමඟ ඇති උපලේඛනයේ විස්තරාත්මක ලෙසින් දැක්වෙන නිවස/නිවාස මා වෙත පැවරී ඇති බැවින්,

එකී නීතියේ 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි පහත උප ලේඛනයෙහි [illegible] නිවාස මා වෙත සතුවූ දිනට පෙරාතුවම වූ දිනයෙහි එම නිවාසය හෝ නිවාස පිළිබඳ සම්බන්ධතාවයක් ඇරූ සියලුම පුද්ගලයන් විසින් [illegible] සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසකට මෙම නීතිය යටතේ ගෙවිය යුතු මිල පිළිබඳව ලිඛිත හිමිකම් පෑම් මෙම ගැසට් නිවේදනය [illegible] ලියාපදිංචි තැපැලෙන් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරමි. එම හිමිකම් පෑමෙහි මතු සඳහන් [illegible] යුතුයි.

(අ) ඔහුගේ/ඇයගේ නම සහ ලිපිනය :

(ආ) එම නිවාසය පිළිබඳ වූ ඔහුගේ/ඇයගේ සම්බන්ධතාවයෙහි ස්වභාවය :

(ඇ) ඔහුගේ/ඇයගේ හිමිකම් පෑමේ විස්තරය :

(ඈ) ඔහු/ඇය එම මිලෙන් හිමිකම් කියන ප්‍රමාණය :

නිවාස දේපළ උපරිම ශාඛාව, ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
1984 මැයි මස 23 වැනි දින,
කොළඹ 2.

ඩබ්. බී. [illegible],
[illegible] නිවාස කොමසාරිස්.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1209/19 - 2001 නොවැම්බර් 08 වැනි බ්‍රහස්පතින්දා - 2001.11.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**දළදා මාලිගාව ආශ්‍රිත මහනුවර ආගමික ප්‍රදේශ සැලසුම් යෝජනා ක්‍රමය සම්බන්ධව 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පනවනු ලබන රෙගුලාසි**

මහනුවර මහ නගර සහා බල ප්‍රදේශයට අයත් මෙහි පහත 1 වන උපලේඛනයේ දැක්වෙන බලප්‍රදේශය 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වන වගන්තිය යටතේ "නාගරික සංවර්ධන ප්‍රදේශයක්" ලෙස 1979.03.07 දිනැති අංක 26/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර, එම ප්‍රදේශය ආවරනය වන ඒකාබද්ධ නාගරික සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනට පිලියෙල කරමින් පවති. එම ඒකාබද්ධ නාගරික සංවර්ධන සැලැස්මේ හඳුනාගත්, මෙහි පහත 2 වන උපලේඛනයේ දැක්වෙන මායිම් තුළ පිහිටි "දළදා මාලිගාව ඇතුලු අවට බල ප්‍රදේශය ආගමික කටයුතු සඳහා වූ, සංරක්ෂණය කළයුතු කලාපයක්" ලෙස හඳුනා ගෙන ඇති අතර, එම කලාපයට අදාල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන රෙගුලාසි1984.06.08 දිනැති අංක 301 දරන ගැසට් පත්‍රය මගින් මහජනයාගේ දැනගැනීමට සලස්වා තිබේ.

දැනට පිලියෙල වෙමින් පවතින ඒකාබද්ධ නාගරික සැලැස්ම විසින් ඉහත විස්තර කල පහත 2 වන උපලේඛනයේ දැක්වෙන ආගමික කටයුතු සඳහා වූ කලාපයට අමතරව ඊට යාබදව පිහිටි මෙහි පහත 3 වන උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශයද ආගමික කටයුතු සඳහා සංරක්ෂණය කළයුතු කලාපයක් ලෙස හඳුනා ගෙන ඇති අතර, එම කලාපය තුළ ඉහතකී 1984.06.08 දිනැති අංක 301 දරන ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසිවලට අතිරේකව පහත සඳහන් රෙගුලාසිද බලපැවැත්වෙන පරිදි මහජනයාගේ දැනගැනීමට සලස්වනු ලැබේ.

* දළදා මාලිගාවේ හා දේපළ සම්බන්ධව කටයුතු පවත්වා ගෙන යාමේ කාර්යයට අනුකූල වන්නා වූ සහ එම කාර්යයන්ට ගැලපෙන්නා වූ වාණිජමය කාර්යයන් සඳහා පමණක් මෙම ප්‍රදේශයේ අවසර දෙනු ලැබේ. එසි වාණිජමය කාර්යයන් වන්නේ, රථගාල් කර ගැනීමේ ස්ථාන, බැතිමතුන් සඳහා වූ නැවතීමේ පහසුකම්, වැසිකිළි පහසුකම් සඳහා වූ ස්ථාන, පළතුරු, රසකැවිලි හා පූජා භාණ්ඩ වෙළඳසැල්, ආපනශාලා, සිසිල්පැන් ශාලා, සමරු භාණ්ඩ වෙළඳසැල්, කුඩා පරිමානයේ බැංකු සහ සන්නිවේදන පහසුකම් සහිත ස්ථාන ආදිය.

* සියලුම ගොඩනැගිලිවල නවීකරණ හා අලුත්වැඩියා කටයුතු එම ප්‍රදේශයට අනුකූල වූ භෞතික ගුණාංග ද, වාස්තු විද්‍යාත්මක ස්වභාවයට අනුකූල විය යුතු අතර, සියලුම නවීකරණ හා අලුත්වැඩියා කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ අවසරය ලබාගත යුතුය.

* සියලුම නව ගොඩනැගිලිවල හෝ අලුත් කළයුතු දැනට පවතින ගොඩනැගිලිවල සැලසුම්, උස, ඉදිරි පෙනුම, වර්ණයන් පෘෂ්ඨිය ගුණාංග, වහල සැකසුම් ආකාරය සහ අමුද්‍රව්‍ය පාවිච්චිය දැනට එම පූජා භූමි ප්‍රදේශය තුළ නිර්මාණය කර ඇති පෞරාණික ස්වභාවයන්ට අනුකූල විය යුතුය. නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ අනුමැතිය ඒ සඳහා ලබාගත යුතුය. සියලුම ගොඩනැගිලිවල උස පොළව මට්ටමේ සිට මීටර් 12 කට නොවැඩි වනසේ වහලවල මුදුන් සැකසිය යුතු වන අතර, ඒවා විදියේ දැනට පවත්නා ගොඩනැගිලිවලට ගැලපෙන ලෙස සමාන උසින් පැවතිය යුතුය.

1A- G-000699- 565 (2001/11)

* මෙම පූජා භූමි ප්‍රදේශය තුළ සවිකරනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන සියලුම ප්‍රචාරක සහ දැන්වීම් පුවරුවල ප්‍රමාණය, ස්වභාවය, අක්ෂර සහ ලාංඡනවල ස්වභාවය, අක්ෂර සහ ලාංඡනවල ප්‍රමාණය, වර්ණ ගැන්වීම, ආලෝකමත් කිරීම, පුවරු සවිකරනු ලබන ස්ථානය හා උස ආදිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරනු ලබන මහනුවර නගර සංවර්ධන සැලැස්මට් අනුකූලව ද විය යුතු අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ අවසරය ද ලබාගත යුතුයි.

* සියලුම ගොඩනැගිලිවල නිර්මාණ හා සැලසුම් කටයුතු පුරාණ ගොඩනැගිලි සංරක්ෂණ කටයුතු සඳහා වූ නිපුණත්වයක් ඇති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ සංගමයේ වරලත් වාස්තු විද්‍යාඥයකු විසින් කළ යුතුය.

* ආරක්ෂාව සඳහා වූ මුරකුටි වලට අමතරව මොනයම් හෝ සංවර්ධන කටයුත්තක් සඳහා මෙම ප්‍රදේශය යටතේ පවතින වන සංරක්ෂිත භූමියේ අවසර දෙනු නොලැබේ.

* අවදානම් සහ අන්තරායකාරී කටයුතු ඇතුළු පූජා භූමි ප්‍රදේශයට අනුකූල නොවන සංවර්ධන කාර්යයන් සහ භාවිතයන් වෙනස් කිරීම සඳහා මෙම ප්‍රදේශය තුළ අවසර දෙනු නොලැබේ.

මංගල සමරවීර,
නාගරික සංවර්ධන, ඉදිකිරීම්, මහජන
උපයෝගීතා, නිවාස හා ක්‍රීඩා අමාත්‍ය.

### 1 වන උපලේඛනය

1979 මාර්තු මස 07 වැනි බදාදා දිනැති, අංක 26/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර ඇති, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරලය තුළ පිහිටි මහනුවර මහ නගර සහා බලසීමාවට අයත් ප්‍රදේශය වේ.

### 2 වන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ පිහිටි : උතුරට : හෝර්ටන් ආර්යා මාවතිනුත් නැගෙනහිරට : හෝර්ටන් ආර්යා මාවත හා වැව පාරෙනුත් දකුණට : සංඝරාජ මාවත හා දළදා වීදියෙනුත් බස්නාහිරට : ඩී. එස්. සේනානායක වීදිය, ශ්‍රීමත් බෙනට් සොයිසා වීදිය, දේව වීදිය සහ දිසාපති නිල නිවාස භූමියේ බස්නාහිර මායිමෙනුත් වටවූ භූමි ප්‍රමාණය වේ.

### 3 වන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ පිහිටි : උතුරට : රජ වීදියෙන්ද, නැගෙනහිරට : දේව වීදියෙන්ද, දකුණට : ශ්‍රීමත් බෙනට් සොයිසා වීදියෙන්ද, බස්නාහිරට : ඩී. එස්. සේනානායක වීදියෙන්ද මායිම් වී ඇති භූමි ප්‍රමාණයක් වේ.

11-745

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

**ඇමුණුම 02**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை

The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1120 / 15 – 2000 පෙබරවාරි 23 වැනි බදද – 2000.02.23

1120 / 15ஆம் இலக்கம் - 2000 ஆம் ஆண்டு பெப்புருவரி மாதம் 23 ஆம் திகதி புதன்கிழமை

No. 1120 / 15 – WEDNESDAY, FEBRUARY 23, 2000

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

# I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### මහනුවර ගැටඹේ රාජෝපවනාරාමය පූජා ප්‍රදේශ සැලසුම් යෝජනා ක්‍රමය

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයට අයත් නාගරික ප්‍රදේශය, වර්ෂ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 03 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කොට ඇති අතර, එහි පිහිටි ගැටඹේ රාජෝපවනාරාමය අවට ප්‍රදේශය පූජා ප්‍රදේශයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් නම් කොට ඇති බව මහජනතාව වෙත මෙයින් දන්වනු ලැබේ. එම පූජා ප්‍රදේශය පිළිබඳ වඩාත් පුළුල් විස්තරයක් පහත දැක්වේ.

2. ගැටඹේ රාජෝපවනාරාමය අවට ප්‍රදේශය පූජා ප්‍රදේශයක් ලෙස හැඳින්වීමේ ප්‍රධාන පරමාර්ථය මෙසේය :

(1) ප්‍රධාන කාර්යයට එනම්, ගැටඹේ රාජෝපවනාරාමය හා සම්බන්ධ කටයුතු පවත්වා ගෙන යාමේ කාර්යයට අනුකූල නොවන්නා වූ සියලුම භාවිතා කිරීම් හා සංවර්ධනයන් සීමා කිරීමෙන් හෝ ගැටඹේ රාජෝපවනාරාමය පාරිශුද්ධත්වය ආරක්ෂා කිරීමට හා එම අරමුණ ඉටු කරනු වස් වෙනත් පියවරවලට අමතරව තවදුරටත් තිබෙන්නට හැරිය යුතු ගොඩනැගිලි කවරේද, කඩා ඉවත් කළ යුතු ගොඩනැගිලි කවරේද, වෙනස් කොට ඉදිකළ යුතු ගොඩනැගිලි කවරේද, එම ප්‍රදේශය තුළ සංරක්ෂණය කළ යුතු ඉඩම් හා ගොඩනැගිලි කවරේද යන්නත් නියම කිරීම ;

(2) වාහන ගාල් කිරීමේ ඉඩකඩ සැපයීම, පයින් යන්නන් සඳහා ඉඩකඩ සැපයීම, ආදී රිය ගමනාගමන පහසුකම් ඇතුළු ප්‍රදේශයේ පහසුකම් දියුණු කිරීම ;

(3) පූජා ප්‍රදේශය ඇතුළත හා ඉන් පිටතත් සංවර්ධන කටයුතුවල වාස්තු විද්‍යාත්මක, භූ දර්ශනාත්මක හා පාරිසරික තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සහ එම අරමුණු ඉටු කරනු වස් සියලුම ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වලදී ඒවායේ උස, වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ආදිය පාලනය කිරීම ;

(4) ප්‍රදේශය තුළ හා අවට දැන්වීම් ප්‍රදර්ශන පුවරු පිහිටුවීම, නියොන් ප්‍රචාරක දැන්වීම් ආදිය ඇතුළු සියළුම ආකාරවල ප්‍රචාරක දැන්වීම් පාලනය කිරීම ; සහ

(5) ඉහත (1) සිට (4) යටතේ සඳහන් කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එවැනි සියලු දේ සහ ඊට අනුපූරක වන කවර හෝ කටයුතු ක්‍රියාත්මක කිරීමට ඉඩකඩ සැලසීම.

1 A – H 006765 – 840 (2000/02)

3. මෙම ප්‍රදේශය තුළ හෝ මෙම ප්‍රදේශයෙන් පිටත, එහෙත් මහනුවර මහ නගර සභා සීමාව තුළ වන වෙනත් ප්‍රදේශයන්හි කවර හෝ සංවර්ධන කාර්යයක්, (එනම් දැනට පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම, ඒවාට නව කොටස් එකතු කිරීම ආදියද, දැනට පවත්නා ඉඩම් හා ගොඩනැගිලිවල භාවිතයන් වෙනස් කිරීම, නව ගොඩනැගිලි ඉදිකිරීම්, ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් අතුරු කොටස්වලට බෙදීම, භූ දර්ශනයන්ට අනුකූලවන පරිදි මාවත් හෝ විදි තැනීම ආදිය ඇතුළත් වන) ක්‍රියාත්මක කිරීමට අදහස් කරන සෑම පුද්ගලයෙකුම ඒ කාර්යයන් ආරම්භ කිරීමට ප්‍රථම ඊට අනුමැතිය පතා නාගරික සංවර්ධන අධිකාරියට අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, තමන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම් පත නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිසි පරිදි අනුමත කරන තුරු කිසිදු සංවර්ධන කාර්යයක් ඇරඹීම නොකළ යුතුය.

4. ගැටඹේ රාජෝපවනාරාමය පූජා භූමි ප්‍රදේශයේ මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | මහවැලි ගඟිනුත්, |
| නැගෙනහිරට | : | පේරාදෙණිය මහනුවර මාර්ගයේ බෝක්කු අංක 111/2 දරන බෝක්කුව තුළින් මහවැලි ගඟට ගලාබස්නා ස්වාභාවික ඇල මාර්ගයෙනුත්, |
| දකුණට | : | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු භූමියේ උතුරු මායිමෙනුත්, |
| බටහිරට | : | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතු වරිපනම් අංක 1141/1 දරන පරිශ්‍රයේ නැගෙනහිර හා උතුරු මායිම්හි කොටසක් ද, එකී පරිශ්‍රය සඳහා ප්‍රධාන මාර්ගයෙන් ඇති ප්‍රවේශ මාර්ගයක්ද රාජකීය උද්භිත උද්‍යානයේ වරිපනම් අංක 1078 දරන පරිශ්‍රයේ නැගෙනහිර මායිමෙනුත් මායිම් වන්නාවූ සහ මිනුම්පතිගේ 1997.02.17 දින මූලික පිඹුරු අංක මහ 4726 න් එකී මායිම් සලකුණු කොට ඇත්තාවූත් සම්පූර්ණ භූමි ප්‍රදේශය. |

මෙම ශුද්ධ වූ කර්තව්‍යය ඉටුකර ගැනීමට පූර්ණ සහයෝගය හා ආධාරය ලබා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය පොදු මහජනතාවගෙන් ඉල්ලා සිටී.

ඉන්දික ගුණවර්ධන,
නාගරික සංවර්ධන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

2000 ජනවාරි මස 18 වන දින,
නාගරික සංවර්ධන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය,
සෙත්සිරිපාය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.

03 – 248

**ඇමුණුම 03**

ඇමුණුම II

**මහනුවර මහනගර සහා බල ප්‍රදේශය තුළ සංරක්ෂණය වීය යුතු ගොඩනැගිලි නාම ලේඛණය**

| වීදිය | වරිපනම් අංක / ගොඩනැගිලි වල නම් |
|---|---|
| 01. යටිනුවර වීදිය | 02, 04, 06, 08, 08 A, මෙතෝදිස්ත පල්ලිය, 24, 26, 28, 30, 32, 57, 58, 68, 69, 70, 72, නුවර ක්‍රිස්තියානි පල්ලිය, 77, 88, 98, 104, 106, 114, 116, 120, ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලය |
| 02. ශ්‍රී දළදා තපෝවන මාවත | ජනාධිපතිගේ නිල නිවස භාරකරුගේ නිවස, නුවර මහනගර සභාව සහ තැපැල් කන්තෝරුව |
| 03. කන්දේ වීදිය | 09, 17, 24, 26, 28, 35, 40, 42, 44, 46 |
| 04. කටුගොඩැල්ල වීදිය | ඔසුසල, 04, 06, 08, 10, 22, 27, 29, 31, 31A, 33, 34, 35, කතරගම දේවාලය, 38, 40, 42, 51, 52, 54, 55, 56, 60, 64, 70-72, මුස්ලිම් ධර්ම විද්‍යාලය, 75, 81, 83, 83A, 87, 91,93, 95, 97, 109-115, 114, 119, 121, 123, 125, 132, 132A, ද ග්‍රීන් කැෆේ, වරිපනම් අංක. 141-143 අතර නිවස, 155, වරිපනම් අංක. 155 ට යාබද මුල්ලෙහි ගොඩනැගිල්ල, 157, 159, ශාන්ත අන්තෝනීස් ප්‍රධාන දේවස්ථානය, 181, ශාන්ත අන්තෝනිස් ප්‍රධාන දේවස්ථානය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර ගොඩනැගිල්ල. |
| 05. පන්සල වීදියේ සිට දේව වීදිය හන්දිය | කොපි ප්ලාන්ටර්ස් ෆවුන්ඩේෂන් |
| 06. දේව වීදිය | 05, 15, 17 - 39, 41, 43, 45, ශාන්ත පාවුල්ගේ පල්ලිය, පැරණි ලක්සල ගොඩනැගිල්ල. |
| 07. පන්සල මාවත | 15/17, 15/1, 21 |
| 08. හරස් වීදිය | 02, 05, 06, 08, 12, 14, 16, 21, 35, 41, 42, 43, 45, 47, 49, 51 |
| 09. ඩී.එස්. සේනානායක වීදිය | 01, 07, 11, 11A, 15, 17, 28, 29, 30, 31, 32, 34, 39, 41, 43, 45, 46, 48, 50, 51, 53, 55, 63, 67-69, 72, 75, 77, 83/1, 83/2, 85, 87, 89, 91, 93, 95, 97, 99, 105, 107, 109, 127, 112, 114, 118, 120, 122, 124, 126, 135, 128, 130-132A, 134, 136/1, 136, 137, 138, 139, 140, 141, 142, 144, 146, 148, 150, 152/1, 152, 158, 160, 162, 163, 184, 185, 187, 188, 189, 190, 193-195, 196, 198, 200, 202, 203, 204, 207, 209, 213, 216, 218, 220, 226, 227, 229, 236, 238, ට්‍රිනිටි විද්‍යාලය, 239, 263, 266, 270, 275, 283, 285, 289, 291, 293, 308, 324, 328, අශෝක විද්‍යාලය, 355, 357, 361, 363, 365, අශෝක විද්‍යාලය |

| විදිය | වරිපනම් අංක / ගොඩනැගිලි වල නම් |
|---|---|
| 10. දළදා විදිය | උල්පැන්ගේ, දළදා මාළිගාව, ක්වීන්ස් හෝටලය, හැටන් නැෂනල් බැංකුව, 12, 14, 16, 20, කාගිල්ස් ගොඩනැගිල්ල, කාගිල්ස් සහ ඩෙවෝන් අතර ඇති ගොඩනැගිල්ල, ලංකා බැංකු ගොඩනැගිල්ල, ඔසුසල, ඩෙවෝන් රෙස්ටුරන්ට්, බැප්ටිස් පල්ලිය, 24, 26, 28, 30, 32, 34, මහජන බැංකු ගොඩනැගිල්ල, 40, 42, 44, 46, මුස්ලිම් හෝටලය, 74A - 74 B, 76 A, ඉම්පීරියල් ගොඩනැගිල්ල. |
| 11. රජ විදිය | 03, නුවර රැඳවුම් බන්ධනාගාරය, 09, 26, 28, 30, 32, 44, 46, 67, 69, 76A, 76 B, නුවර ක්‍රිස්තියානි පල්ලිය, 73, සිංහ රෙජිමේන්තු මූලස්ථාන ගොඩනැගිල්ල |
| 12. කුමාර විදිය | 08, 10, 12, 14, 14A |
| 13. කොළඹ විදිය | 05, 09, 13, 21, 45, 49, 51, 53, 57, 57A, 85, 87, 89, 91, 93, 95, 97, 99, 101, 103, 105, 107, 109, 111, 113, 115, 167, 169, ගිරංගම වලව්ව, 209, 215 - 217, 243, 245, 02, 04, 06, 08, 22, 26, 28, 48, 50, 52, 54, 56, 58, 60, 64, 68, 68B, 70, 72, 80, 82, 84, 86, 88, 90, 92, 94, 96, 106, 108, 110, 112, 114, 120, 122, 124, 126, 134, 134A, 136, 138, 142, 144, 146, 148/1, 148, 150, 154, 156, 158, 162, 164, 166, 168, 172, 174, 176, 178, 180, 182, 184, 192B, 192, 194, 196, 198-202, 204, 206, 208, 210 |
| 14. පේරාදෙණිය පාර | 34, 36, 37, 38, 40, 42, 44, 49, 51, 53, 55, 57, 66, 76, 78, 80, 81, 82, 83, 88, 91, 92, 95, 96, 97, සෙපත් එඩේරගේ කන්‍යාරාමය, 101, 103, 105, 111, 115, 120, 122, 124, 126, 128, 153, 158, 211, 225, 227, 258, 265, 267, 269, 271, 273, 281, 297, 299, 301, 303, 305, 307, 292, 294, 296, 333, 337, 339, ක්‍රිස්තියානි උසස් බාලිකා විද්‍යල පල්ලිය, 322, 326, 344, 346, 353, 355, 355 A, 356, 358, 369, 371, 373, 375, 409, 443, 445, 447, 449, 449 A, 451, 453A, 455, 457, 459. |
| 15. අනගාරික ධර්මපාල මාවත | ශ්‍රී දළදා මාළිගා විශ්‍රාම ශාලාව, නුවර බෞද්ධ මධ්‍යස්ථානය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, 04, 06, 08, 12, 14, 19, 20, 22, 23, 25, 27, 31, ශ්‍රී දළදා මාලිගාව සහ එහි අවට ඇති සතර දේවාල, රජමාළිගාව, ශ්‍රවණාගාරය, ක්වීන්ස් බාත්. |
| 16. යටිනුවර විදිය කොළඹ විදිය හන්දිය | 55 |

**ඇමුණුම 04**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2024/6 - 2017 ජූනි මස 19 වැනි සඳුදා - 2017.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/81 (VI)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

24ඇ සහ 24ඈ වගන්ති යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මා විසින් මේ නියමය මගින් -

(අ) මෙහි 1 වන උපලේඛනයේ විස්තර කර ඇති සීමා තුළ පිහිටි භූමි ප්‍රදේශය ඉහත කී පනතේ කාර්ය සඳහා පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් විය යුතු බවටත්, එම ප්‍රදේශය "වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ;

(ආ) මෙම නියමය බලාත්මකව පවතිනතාක් කල් -

(i) ඉහත කී වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ වූ ද, ඉහත කී පනතේ විධිවිධානවලට පටහැනි වූ ද, යම් සැළසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් මේ නියමය නිකුත් කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වීම නතර විය යුතු බවටත් ;

(ii) ඉහත කී වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ සීමා ඇතුළත බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ සිදුකිරීම අධිකාරිය හෝ අධිකාරිය විසින් බලය පවරන යම් තැනැත්තකු හැර වෙනත් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු බවටත් ; සහ

(iii) වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ යම් කටයුත්තක් පවත්වාගෙන යෑමට අදහස් කර සිටින යම් තැනැත්තකු විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවසරලත් භාවිතයන් පමණක් පවත්වාගෙන යා යුතු අතර මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් ප්‍රකාරව ඒ සඳහා අධිකාරියේ අනුමතය ලබා ගත යුතු බවටත් ;

ප්‍රකාශයට පත් කරමි.

1A - PG 3574 — 1,007 (2017/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


| | | | | | |
|---|---|---|---|---|---|
| Fax | 2872601 (Admin), 2863984 (Finance) | 2872606 (Lab) 2882335 (WM) | 2867263 (R&D) Fax : 2872296 | Fax : 2872609 Media Unit : 2873449 | (Western Province) Tel : 2862831 Fax : 2865293 |

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு | Ministry of Mahaweli Development & E...

2 A I කොටස: (I) ඡේදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2017.06.19

(ඇ) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ සිදුවන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා පහත දක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත අධීක්ෂණ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය :-

(i) කමිටුවේ සභාපතිවරයා වශයෙන් ක්‍රියා කළ යුතු අධ්‍යක්ෂවරයකුගේ තත්ත්වයට අඩු නොවන තනතුරක් දරන අධිකාරියේ නියෝජිතයෙකු ;

(ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නියෝජිතයෙකු ;

(iii) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නියෝජිතයෙකු ;

(iv) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නියෝජිතයෙකු ;

(v) නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු ;

(vi) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ;

(vii) ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ;

(viii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ නියෝජිතයෙකු ;

(ix) මහනුවර මහනගර සභාවේ නියෝජිතයෙකු ;

(x) හාරිස්පත්තුව සහ යටිනුවර යන ප්‍රාදේශීය සභාවලින් එක් නියෝජිතයෙකු බැගින් ;

(xi) මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ, හාරිස්පත්තුව සහ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් එක් නියෝජිතයෙකු බැගින් ;

(xii) ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින ප්‍රජා මූල සංවිධානයකින් එක් නියෝජිතයෙකු.

මේ නියමයේ කාර්ය සඳහා "අධිකාරිය" යන්නෙන් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 ක් වූ ජූනි මස 13 දින,
කොළඹ දී ය.

I වන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ, හාරිස්පත්තුව සහ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටියා වූ මහවැලි ගඟ සහ එහි පිහිටි සියලුම දූපත් ඇතුළත්ව, ප්‍රමාණයෙන් හෙක්ටයාර 59.4 ක් වන්නා වූ පහත සඳහන් මායිම්වලින් වට වූ පහත සිතියමෙහි දක්වෙන ප්‍රදේශය වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ලෙස හැඳින්වේ. එනම්,

උතුරට : පේරාදෙණිය-හල්ඹලුව-කටුගස්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව සහ දෙඩම්වල සංගිලි පාලමේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යයේ සිට දෙඩම්වල සංගිලි පාලමේ මධ්‍ය රේඛාව ඔස්සේ, එකී මධ්‍ය රේඛාව සහ ශ්‍රීමත් කුඩා රත්වත්තේ මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා,

නැගෙනහිරට : ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ශ්‍රීමත් කුඩා රත්වත්තේ මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ, දෙවැනි රාජසිංහ මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ හා කොළඹ-මහනුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගැටඹේ වටරවුමේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා,

දකුණට : ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ගැටඹේ පාලමේ මධ්‍ය රේඛාව සහ කොළඹ-මහනුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ, එකී මධ්‍ය රේඛාව, ගන්නෝරුව කෘෂිකර්ම මධ්‍යස්ථාන හන්දියේ දී පේරාදෙණිය-හල්ඹලුව-කටුගස්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා,

බටහිරට : ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට පේරාදෙණිය-හල්ඹලුව-කටුගස්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ එකී මධ්‍ය රේඛාව, දෙඩම්වල සංගිලි පාලමේ මධ්‍ය රේඛාව හමුවන ස්ථානය දක්වා

වූ මායිම් තුළ පිහිටි ප්‍රදේශය වේ.



වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ (පා. ආ. ප්‍ර.) සිතියම

## II වැනි උපලේඛනය

### අවසරලත් භාවිතයන්

වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ අවසරලත් භාවිතයන් පහත දක්වේ :-

1. නාගරික සංවර්ධන අධිකාරිය සහ අදාළ පළාත් පාලන ආයතන විසින් අනුමත කරනු ලබන පදිංචිය සඳහා වන නිවාස, කාර්යාල, කුඩා පරිමාණ ව්‍යාපාරික ස්ථාන ඉදිකිරීම්.
2. දැනට පවත්නා පදිංචිය සඳහා වන නිවාස සහ නිවාස සංකීර්ණවල පුළුල් කිරීම්, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් හා නවීකරණය කිරීම්.
3. දැනට පවත්නා කාර්යාල සහ ව්‍යාපාරික ස්ථානවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් හා නවීකරණය කිරීම්.
4. දැනට පවත්නා මං මාවත්, ජල සැපයුම් සහ විදුලි සැපයුම් මාර්ග නඩත්තුව සහ අලුත්වැඩියා කිරීම්.
5. ආගමික, අධ්‍යාපනික හා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.
6. අධ්‍යාපනික සහ පර්යේෂණ කටයුතු සඳහා පමණක් තාවකාලික කඳවුරු භූමි ඉදිකිරීම්.
7. දේශීය ශාක විශේෂ පමණක් භාවිතා කරමින් වන වගාවන් කිරීම සහ පැල තවාන් හා ඔසු උයන් ඇති කිරීම සහ පවත්වාගෙන යාම.

## III වන උපලේඛනය

### අවසරලත් භාවිතයන් ක්‍රියාත්මක කිරීමේ දී යටත් විය යුතු කොන්දේසි

වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ සිදු කරනු ලබන අවසරලත් භාවිතයන්ට අදාළ සියලුම කටයුතු පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව සිදු කළ යුතු වේ.

1. II වැනි උපලේඛනයෙහි සඳහන් වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ අවසරලත් භාවිතයන් සඳහා අනුමතය ලබා ගැනීමට අදාළ සියලුම අයදුම්පත් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.
2. II වන උපලේඛනයෙහි සඳහන් අනුමතය අපේක්ෂිත කිසියම් අවසරලත් භාවිතයක්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ IV ඇ කොටස යටතේ නියම කරන ලද නියමිත ව්‍යාපෘතියක් වන අවස්ථාවක දී, අදාළ අධිකාරියෙන් එම නියමිත ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පූර්ව අනුමතය ලබා ගත යුතු ය.
3. II වන උපලේනයෙහි සඳහන් කිසියම් අවසරලත් භාවිතයක්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ IVඇ කොටස යටතේ නියම කරන ලද නියමිත ව්‍යාපෘතියක් නොවන අවස්ථාවක දී,

    (අ) ව්‍යාපෘති යෝජනාවක් අධිකාරිය විසින් සපයනු ලබන නිර්ණේය විෂයයන්ට හෝ ප්‍රශ්නාවලියකට අනුකූලව අනුමතය සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

    (ආ) අධිකාරිය විසින් පත් කරනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් එම ව්‍යාපෘති යෝජනාව ඇගයීමට ලක් කර අධිකාරිය විසින් ;

        (i) කොන්දේසිවලට යටත්ව යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමතය ලබා දීම හෝ

        (ii) හේතු දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමතය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම,

    සිදු කළ යුතු ය.

    (ඇ) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන පාරිසරික අනුමැතිය ලබා දෙන ලද දින සිට වසර තුනක කාලයක් සඳහා වලංගු වේ.

(ඈ) පාරිසරික අනුමැතියේ වලංගු කාලය අවසන් වන දින සිට වැඩ කරන දින තිහකට (30) පෙරාතුව අයදුම්කරු විසින් අනුමතය අලුත් කිරීම සඳහා අයදුම් කළ යුතු ය.

4. වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ පවත්නා ;

(අ) දූපත් තුළ හෝ

(ආ) රජයේ යම් ඉඩමක් තුළ

තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ කිසිදු ආකාරයක සංවර්ධන කටයුත්තක් හෝ සිදු නොකළ යුතු ය.

5. පාරම්පරික ඉඩම් ඥාතීන් අතර බෙදදීම සඳහා සිදු කෙරෙන ඉඩම් කට්ටි කිරීම හැර වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ නිවාස ඉදිකිරීම් සඳහා හෝ වෙනත් සංවර්ධන කටයුතු සඳහා වාණිජ මට්ටමේ ඉඩම් කට්ටි කිරීම් සිදු නොකළ යුතු ය.

6. වරාතැන්න-හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ තිරසාර පැවැත්මට අවහිරවන කිසිදු බාධාවක් හෝ ක්‍රියාකාරකමක් සඳහා අවසර දෙනු නොලැබිය යුතු ය. එවැනි යම් ඉදිකරන ලද බාධකයක් ඉවත් කිරීම සඳහා හෝ පවත්වාගෙන යනු ලබන ක්‍රියාකාරකමක් නැවැත්වීම සඳහා අධිකාරිය විසින් විධාන කරනු ලැබිය යුතු ය.

7. අවසරලත් භාවිතයන්ට අදාළ සියලු සංවර්ධන ක්‍රියාකාරකම් අධිකාරිය විසින් ලබා දෙන මාර්ගෝපදේශවලට අනුව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

8. සියලු අවසරලත් භාවිතයන් පරිසරයට හානියක් හෝ අවහිරයක් නොවන පරිදි හෝ මහජනතාවට පීඩාවක් නොවන පරිදි පවත්වාගෙන යා යුතු ය.

9. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විමසා ගං ඉවුරේ සිට ගොඩබිම දෙසට මීටර් පහක (5m) රක්ෂිත ප්‍රදේශයක් සලකුණු කළ යුතු ය.

10. ඉහත 9 වන කොන්දේසියෙහි සඳහන් මීටර් 5ක ගඟ රක්ෂිත ප්‍රදේශය තුළ,

(අ) කිසිදු තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සිදු නොකළ යුතු ය ;

(ආ) අධිකාරියේ හෝ වෙනත් අදාළ ආයතනවල අනුමතය ලබා ගැනීමෙන් තොරව, පවත්නා ගොඩනැගිලි නවීකරණය කිරීම සිදු නොකළ යුතු ය ;

(ඇ) පවත්නා කිසිදු දේශීය සත්ත්ව හෝ වෘක්ෂලතා විශේෂයන්ට හානියක් සිදු කිරීම හෝ හානි සිදු විය හැකි කිසිදු කටයුත්තක් සිදු නොකළ යුතු ය ;

(ඈ) කිසිදු භූ අලංකරණ කටයුත්තක් සිදු නොකළ යුතු ය ;

(ඉ) කිසිදු ඉඩම් ගොඩකිරීමේ කටයුත්තක් සිදු නොකළ යුතු ය.

11. අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සිදු කිරීමේ දී, කිසිදු රසායනික හෝ වෙනත් භෞතික ද්‍රව්‍යයක් පරිසරයට එකතු කිරීමක් හෝ පවත්නා පරිසර තත්ත්වයන් වෙනස් කිරීමක් සිදු නොකළ යුතු ය.

12. ආක්‍රමණශීලී ලක්ෂණ දරන හෝ ආක්‍රමණශීලී විය හැකියැයි අනුමාන කළ හැකි කිසිදු ආගන්තුක ශාක හෝ සත්ත්ව විශේෂයක් පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ වගා කිරීම හෝ ඇති කිරීම හෝ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට හඳුන්වා දීම සිදු නොකළ යුතු ය.

13. පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ සිදු කරන කිසිදු ඉදිකිරීමක් ප්‍රදේශයේ ස්වභාවික සෞන්දර්යය හා දර්ශනය අවහිර වන පරිදි හෝ ඊට බාධාවක් වන පරිදි සිදු නොකළ යුතු ය.

14. කුඹුරු, වගුරු, ගොහොරු, මුඩු හෝ පහත් බිම් ගොඩ කිරීම සිදු නොකළ යුතු ය.

15. අපජලය සහ ඝන අපද්‍රව්‍ය, ඉහත සඳහන් සීමාව තුළ මහවැලි ගඟට හෝ ගඟ රක්ෂිතයට හෝ ගඟට සම්බන්ධවන ජල මාර්ගයකට හෝ ගොඩබිමට බැහැර කිරීම සිදු නොකළ යුතු ය.

16. මහවැලි ගඟෙහි භෞතික හෝ රසායනික තත්ත්වය වෙනස් කළ හැකි හෝ එහි ජීවත්වන සතුන්ට හෝ ශාකවලට අහිතකර විය හැකි කිසිදු රසායනික ද්‍රව්‍යයක් ඉහත කී සීමාව තුළ මහවැලි ගඟට හෝ ගඟ රක්ෂිතයට හෝ ගඟට සම්බන්ධවන ජල මාර්ගයකට හෝ බැහැර කිරීම සිදු නොකළ යුතු ය.

17. පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ කිසිදු යාන්ත්‍රික හෝ ශිල්පීය ක්‍රමයක් භාවිතයෙන් ඛනිජ ද්‍රව්‍ය උකහා ගැනීම හෝ ගවේෂණ කටයුතු සිදු කිරීම නොකළ යුතු ය.

18. පවත්නා හෝ යෝජිත සියලු අවසරලත් භාවිතයන් සඳහා ;

    (අ) පාංශු සංරක්ෂණය, වර්ෂා ජලය බැහැර කිරීම, අපද්‍රව්‍ය (ඝන හෝ ද්‍රව) කළමනාකරණය, අප ජලය කළමනාකරණය සහ භූ අලංකරණ කටයුතු සඳහා වන ඒකාබද්ධ කළමනාකරණ සැලැස්මක් පැවතිය යුතු ය.

    (ආ) එවැනි සැලසුමක් සකස් කිරීමේ දී අධිකාරිය, පළාත් පාලන ආයතන හෝ අදාළ ආයතන විසින් නිකුත් කළ මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කළ යුතු ය.

    (ඇ) සංවර්ධනය කරනු ලබන තැනැත්තා විසින් මෙම සැලැස්ම ක්‍රියාත්මක කර පවත්වාගෙන යා යුතු ය.

19. අවසරලත් භාවිතයක් අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ අවසරලත් භාවිතයට අදළ ක්‍රියාකාරකම් පසු විපරම් කිරීම සඳහා පරිපාලන ගාස්තුවක් (අධිකාරිය විසින්) ව්‍යාපෘති යෝජක වෙතින් අයකර ගත යුතු ය.

20. ගම්වැසියන්ගේ සම්ප්‍රදායික ජන ජීවිතයට බාධාවන පරිදි කිසිදු ක්‍රියාකාරකමක් සිදු නොකළ යුතු ය.

21. මෙහි සඳහන් ඕනෑම කොන්දේසියක් කඩකරනු ලබන තැනැත්තෙක් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කරන්නේ ය.

07-67

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

**ඇමුණුම 05**

*ඇමුණුම 5. ජාතික භෞතික සැලැස්ම -2050 (කෙටුම්පත්)*




**මූලාශ්‍රය:** ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව,2017

**ඇමුණුම 06**

*ඇමුණුම 6. මහනුවර නගර සංවර්ධන සැලැස්ම 2002-2016*




මූලාශ්‍රය: *නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

**ඇමුණුම 07**

*ඇමුණුම 7. 2008 - 2020 විසල් මහනුවර නගර සංවර්ධන සැලසුම*




මූලාශ්‍රය: *නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

# ඇමුණුම 08

*ඇමුණුම 8. 2030 විසල් මහනුවර උපාය මාර්ගික නගර සැලසුම*




මූලාශ්‍රය : විසල් මහනුවර උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය , යුනි කන්සල්ටන්සිස් ආයතනය, මොරටුව විශ්ව විද්‍යාලය, 2015

## ඇමුණුම 09

*ඇමුණුම 9. 2020 විසල් මහනුවර නගර සංවර්ධන සැලසුම*




මූලාශ්‍රය : විසල් මහනුවර නගර සංවර්ධන සැලැස්ම කෙටුම්පත, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය

# ඇමුණුම 10

*ඇමුණුම 10. අධ්‍යයන කලාපය තුළ මහා මාර්ග වල ව්‍යාප්තිය*




මූලාශ්‍රය: *නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

# ඇමුණුම 11

*ඇමුණුම 11. අධ්‍යයන කලාපය තුළ ජනගහන ව්‍යාප්තිය - 2012*




මූලාශ්‍රය: 2011 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපර්තමෙන්තුවේ ජන හා සංසණන වාර්තා ඇසුරෙන් නාගරික සංවර්ධන අධිකාරිය, *මධ්‍යම පළාත් කාර්යාලය*, විසින් සකස් කරන ලදී.

# ඇමුණුම 12

*ඇමුණුම 12. අධ්‍යයන කලාපය තුළ ජන ඝණතත්වයේ ව්‍යාප්තිය - 2012*




මූලාශ්‍රය: 2011 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපර්තමෙන්තුවේ ජන හා සංඝණන වාර්තා ඇසුරෙන් නාගරික සංවර්ධන අධිකාරිය, *මධ්‍යම පළාත් කාර්යාලය,* විසින් සකසන ලදී.

**ඇමුණුම 13**

*ඇමුණුම 13. මහනුවර මහ නගර සහා බල සීමාව තුළ අඩු පහසුකම් නිවාස ව්‍යාප්තිය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2015*

**ඇමුණුම 14**

*ඇමුණුම 14. අධ්‍යයන කලාපය තුළ ගොඩනැඟිලි ඝණත්වය 2012*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017*

**ඇමුණුම 15**

*ඇමුණුම 15. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ කාණු පද්ධතියෙහි ව්‍යාප්තිය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017*

# ඇමුණුම 16

*ඇමුණුම 16. මහනුවර නගරය තුළ ක්‍රියාත්මක කෙරන අපජල ව්‍යාපෘතිය*




මූලාශ්‍රය: ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය

## ඇමුණුම 17

*ඇමුණුම 17. මහනුවර මහ නගර සභා සීමාව තුළ නායයෑමේ අවධානම් සහිත ස්ථාන*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017*

# ඇමුණුම 18

*ඇමුණුම 18: මහනුවර මහ නගර සභා බල ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

**ඇමුණුම 19**

*ඇමුණුම 19.අධ්‍යයන ප්‍රදේශය තුළ ස්වාභාවික ජල මාර්ගයන්හි ව්‍යාප්තිය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017*

# ඇමුණුම 20

*ඇමුණුම 20.අධ්‍යයන කලාපය තුළ සංවර්ධක පීඩනය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017*

# ඇමුණුම 21

*ඇමුණුම 21. මහනුවර මහ නගර සහා සීමාව තුළ පවතින පාරිසරික සංවේදීතාවය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2017*

# ඇමුණුම 22

*ඇමුණුම 22.පාර්ශවකරුවන්ගේ රැස්වීම තුලින් ඉදිරිපත් කරන ලද ගැටළු*

A. මහනුවර නගරයේ පවතින පුරාවිද්‍යාත්මක හා ගෘහ නිර්මාණාත්මක වටිනාකම් ක්‍රමයෙන් හීන විය.
B. නගරය හා සම්බන්ධ ප්‍රධාන මාර්ගයන් ආශ්‍රිතව මෙන්ම පාරිසරික සංවේදී ප්‍රදේශවලට නාගරීකරණය ව්‍යාප්ත වීම
C. නගර මධ්‍යයේ ප්‍රවාහන ස්ථාන (බස් නැවතුම් ස්ථාන) තැනින් තැන පිහිටා තිබීම.
D. රථවාහන නැවතුම් ස්ථානවල හිඟකම හා මාර්ග දෙපස රථවාහන නවතා තැබීම.
E. පදික ගමනාගමනයට හිතකර පරිසරයක් නගර මධ්‍යය තුළ නොමැති වීම.
F. විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති විම.
G. අධික රථවාහන තදබදය
H. විධිමත් නොවන ආකාරයෙන් සංවර්ධන කටයුතු ව්‍යාප්ත වීම.
I. පාරිසරික සංවේදි ප්‍රදේශ හා ජල මාර්ග වලට පවතින අහිතකර බලපෑම
J. වායු දූෂණය

ලෙස හඳුනාගත හැකි අතර එය Delphi technique (ඩෙල්ෆි ක්‍රමවේදය) යොදා ගනිමින් ගැටලු පහත පරිදි ප්‍රමුඛතාකරණය කරනය කරන ලදී.

| හඳුනාගත් ප්‍රවීණයන් | පාර්ශවකරුවන්ගේ සමුළුව (Stakeholder Meeting) තුළින් හඳුනාගන්නා ලද ගැටලු | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | A | B | C | D | E | F | G | H | I | J |
| අධ්‍යක්ෂ (මධ්‍යම පළාත), නා.සං.අධි. | 10 | 1 | 3 | 2 | 4 | 5 | 9 | 6 | 8 | 7 |
| නි.අධ්‍යක්ෂ (සැලසුම්), නා.සං.අධි. | 7 | 2 | 1 | 5 | 3 | 4 | 8 | 6 | 9 | 10 |
| ස. අධ්‍යක්ෂ (සැලසුම්), නා.සං.අධි. | 8 | 2 | 1 | 3 | 4 | 5 | 7 | 9 | 10 | 6 |
| නි.අධ්‍යක්ෂ (ඉඩම්), නා.සං.අධි. | 10 | 7 | 4 | 3 | 5 | 6 | 8 | 2 | 9 | 1 |
| පාරිසරික සැලසුම්කරු, නා.සං.අධි. | 9 | 5 | 6 | 1 | 2 | 3 | 10 | 4 | 8 | 7 |
| නගර නිර්මාණ ශිල්පී, නා.සං.අධි. | 9 | 4 | 2 | 1 | 3 | 8 | 7 | 5 | 10 | 6 |
| සැලසුම් නිලධාරි -1, නා.සං.අධි. | 10 | 2 | 1 | 7 | 6 | 3 | 5 | 4 | 8 | 9 |
| සැලසුම් නිලධාරි -2, නා.සං.අධි. | 10 | 1 | 4 | 2 | 5 | 3 | 8 | 6 | 7 | 9 |
| සැලසුම් නිලධාරි -3, නා.සං.අධි. | 9 | 3 | 5 | 1 | 2 | 4 | 7 | 8 | 10 | 6 |
| සැලසුම් නිලධාරි - 4 නා.සං.අ | 10 | 2 | 6 | 3 | 1 | 4 | 9 | 5 | 7 | 8 |
| **එකතුව** | **92** | **29** | **33** | **28** | **35** | **45** | **78** | **55** | **86** | **69** |
| **ශ්‍රේණිය** | **1** | **10** | **8** | **9** | **7** | **6** | **3** | **5** | **2** | **4** |

*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

# ඇමුණුම 23

*ඇමුණුම 1:යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම විදහා දැක්වීමේ හරස්කඩ*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර 2018*

## ඇමුණුම 24

ඇමුණුම 24:පවතින සෞඛ්‍ය සේවා සැපයුම් ප්‍රමිතිගත ප්‍රදේශය




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

## ඇමුණුම 25

*ඇමුණුම 25:පවතින අධ්‍යාපන සේවා සැපයුම් ප්‍රමිතිගත ප්‍රදේශය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

## ඇමුණුම 26

*ඇමුණුම 26:පවතින විවෘත භූමි සැපයුම් ප්‍රමිතිගත ප්‍රදේශය*




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය,මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2129/96 - 2019 ජුනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**මහනුවර මහ නගර සභාව, බල ප්‍රදේශය සමන්විත වන මහනුවර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මහනුවර මහ නගර සභාව, බල ප්‍රදේශයෙන් සමන්විත මහනුවර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද මහනුවර නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජුනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජුනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ජූනි මස 28 දින.

07 - 4555/14